සියළු රටවල නිර්ධනයිනි, එක්වව්

වී.අයි.ලෙනින්

# ප්‍රජාතන්ත්‍රික විප්ලවයේ සමාජ ප්‍රජාතන්ත්‍රවාදී උපක්‍රම දෙකක්

# පටුන


පූර්විකාව . . . . . . . . . . . . . . . . . . 5

1. හදිසි දේශපාලන ප්‍රශ්නයක් . . . . . . . . . . . 10

2. රු.ස.ප්‍ර.ක. පක්ෂයේ තුන්වන සම්මේලනයේ විප්ලවකාරී තාවකාලික ආණ්ඩුවක් පිළිබඳ යෝජනාවෙන් අපට උගන්වන්නේ කුමක්ද? . . . . . . . . . . 14

3. 'සාර්වාදය පරදවා විප්ලවය ලබන තීරණාත්මක ජයග්‍රහණය' යන්නෙහි අර්ථය කුමක්ද? . . . . . . . . . . . 21

4. රාජාණ්ඩු ක්‍රමය අහෝසි කිරීම. සමූහාණ්ඩුව . . . . . . 29

5. 'විප්ලවය ඉදිරියට ගෙන යා යුත්තේ' කෙසේද? . . . . . 35

6. අස්ථිර ධනපති පංතියට විරුද්ධව කරන සටනේදී නිර්ධන පංතිය කෙරෙහි තම අත් පා බැඳ දැමීමේ තර්ජනය එල්ල වන්නේ කවර දිසාවකින්ද? . . . . . . . . . . . 39

7. 'ආණ්ඩුවෙන් ගතානුගතිකවාදීන් තුරන් කිරීමේ' උපක්‍රම 55

8. "අස්වබණ්ජේනිය" හා නව "ඉස්ක්‍රා" ප්‍රවනතා . . . . 60

9. විප්ලව සමයේදී අන්ත විරුද්ධවාදී පක්ෂයක් වීම යනුවෙන් කුමක් අදහස් වේද? . . . . . . . . . . . . . . 70

10. 'විප්ලවකාරී කොමියූන' හා නිර්ධන පංතියේ සහ ගොවීන්ගේ විප්ලවකාරී ප්‍රජාතන්ත්‍රික ආඥාදායකත්වය . . . . . . 74

11. රු.ස.ප්‍ර.ක. පක්ෂයේ තුන්වන සම්මේලනයේ හා 'සාකච්ඡා සභාවේ' ඇතැම් යෝජනා පිළිබඳ කඩිනම් සැසඳීමක් . . 86

12. ධනපති පංතිය ආපසු හැරී ගියොත් ප්‍රජාතන්ත්‍රික විප්ලවයේ ගමන් වේගය හීනවේද? . . . . . . . . . . . . . 91

13. අවසානය. අපට ජයගත හැකිද? . . . . . . . . . . 102

පසුවදන. යළිත් වරක් ''අස්වබඡ්ජේනිය'' වාදය, යළිත් වරක් නව ''ඉස්ක්‍රා'' වාදය . . . . . . . . . . . . . . . 114

I. ලිබරල්වාදී ධනපති යථාර්ථවාදීන් විසින් සමාජ–ප්‍රජාතන්ත්‍රික 'යථාර්ථීන්' වර්ණනා කරනුයේ කුමටද? . . . . . . 114

II. මර්තිනව් සහෝදරයා යළිත් ප්‍රශ්නය 'අරුත්සරු' කරයි . . . . . . . . . . . . . . . . . 122

III. ආඥාදායකත්වය පිළිබඳ විකෘත ධනපති පංතික අර්ථ නිරූපනය හා ඒ පිළිබඳ මාක්ස්ගේ මතය . . . . . . . . . . 132

සටහන් . . . . . . . . . . . . . . . . . . 145

නාමාවලිය . . . . . . . . . . . . . . . . . 165

## පූර්විකාව

විප්ලවීය කාල පරිච්ඡේදයකදී, විප්ලවකාරී පක්ෂවල උපක්‍රමීය සටන් පාඨ තක්සේරු කිරීමට ඉවහල් වන අලුත් කරුණු පුදුමාකාර ප්‍රමාණයකින් සපයනු ලබන සිද්ධීන් සමග පා තැබීම ඉතා දුෂ්කර කාරියකි. මෙම පොත් පිංච ලියන ලද්දේ, ඔඩෙස්සා සිද්ධීන්* ඇති වීමට ඉහතදීය. විප්ලවීය නැගිටීම නිරායාස ක්‍රියාදාමයකි යන න්‍යාය නිර්මාණය කළා වූද, තාවකාලික විප්ලවීය ආණ්ඩුවක් සඳහා ප්‍රචාරක කටයුතු ප්‍රතික්ෂේප කළා වූද සමාජ-ප්‍රජාතන්ත්‍රිකයන්ට පවා සිය විරුද්ධවාදීන්ගේ පිලට ඇත්ත වශයෙන්ම මාරුවීමට හෝ මාරුවීම ආරම්භ කිරීමට හෝ එම සිද්ධීන් විසින් බල කරන ලද බව අපි ඉහතදී ''ප්‍රොලිතාරි'' පුවත්පතෙන්[3] (9 වැනි කලාපය, ''විප්ලවය පාඩම් උගන්වයි'') පෙන්වා දී ඇත්තෙමු. දේශපාලන වර්ධනය සාමකාමීව සිදුවන කාල පරිච්ඡේදවලදී සිදුවේ යැයි විශ්වාස කළ නොහැකි තරම් වේගයකින් හා පූර්ණත්වයකින් යුතුව විප්ලවය නිසැකවම පාඩම් උගන්වයි. විශේෂයෙන්ම වැදගත් කරුණ නම්, එමගින් නායකයන්ට පමණක් නොව බහුජනතාවටද පාඩම් උගන්වනු ලැබීමයි.

විප්ලවය විසින් රුසියාවේ කම්කරු බහුජනතාවට සමාජ-ප්‍රජාතන්ත්‍රවාදය උගන්වන බවට මඳ සැකයකුදු නැත. සමාජයේ විවිධ පංතීන්ගේ නියම ස්වභාවය විදහා දැක්වීමෙන්ද අපේ ප්‍රජාතන්ත්‍රවාදයේ ධනපති පංතික ස්වභාවය මෙන්ම ධනපති ප්‍රජාතන්ත්‍රික අර්ථයෙන් විප්ලවකාරී වන නමුත්, 'සමාජමය කිරීමේ' අදහස නොව ගොවි ධනපතියන් හා ග්‍රාමීය නිර්ධනයින් අතර අලුත් පංති අරගලයක් කිරීමේ

* මෙය ''පොටෙම්කින්'' සන්නද්ධ නෞකාවේ භටයින්ගේ කැරැල්ල පිළිබඳ සටහන් කිරීමකි[2]. (1907 මුද්‍රණයට කර්තෘගේ සටහනකි. — සංස්කාරක)

අදහස දරන්නාවූ ගොවි ජනයාගේ නියම අභිප්‍රායයන් විදහා දක්වීමෙන්ද විප්ලවය විසින් සමාජ-ප්‍රජාතන්ත්‍රවාදයේ උපාය මාර්ගය හා වැඩ සටහන ප්‍රත්‍යක්ෂ ව්‍යවහාරයෙන් තහවුරු කරනු ඇත. පැරණි නරෝද්නික්වාදයේ[4] දුර්මතයන්, නිදසුනක් වශයෙන් දක්වතොත්, 'සමාජවාදී විප්ලවවාදීන්ගේ පක්ෂයේ'[5] කෙටුම්පත් වැඩ සටහනෙහි දක්වෙන, රුසියාව තුළ ධනවාදය වැඩීම පිළිබඳ ප්‍රශ්නය, අපේ 'සමාජයේ' ප්‍රජාතන්ත්‍රවාදී ස්වභාවය පිළිබඳ ප්‍රශ්නය හා ගොවිජන නැගිටීමේ පූර්ණ ජයග්‍රහණයක වැදගත්කම වැනි ප්‍රශ්නයන් ගැන සඳහන් කිරීමේදී පැහැදිලිව පෙනෙන එම සියලුම පැරණි දුර්මතයන් විප්ලවය විසින් නිර්දය අන්දමින් හා සම්පූර්ණයෙන් සුනු විසුණු කර දමනු ඇත. ප්‍රථම වරට, එය විවිධ පන්තීන්ට ඔවුන්ගේ නියම දේශපාලන බව්තීස්මය ලබා දෙනු ඇත. මෙම පංති නිශ්චිත දේශපාලන හැඩහුරුකමක් සහිතව විප්ලවය තුළින් කල එළි බසිනු ඇත. මන්ද යත්, ඔවුන්ගේ දෘෂ්ටිවාදීන්ගේ උපක්‍රමීය සටන් පාඨ හා වැඩ සටහන් තුළින් පමණක් නොව, බහු ජනයාගේ විවෘත දේශපාලන ක්‍රියාකාරිත්වය තුළින්ද ඔවුන්ගේ යථා ස්වරූපය එළිදරව් වී ඇති බැවිනි.

නිසැක වශයෙන්ම විප්ලවය විසින් අපට පාඩම් උගන්වනු ඇත. එමෙන්ම බහු ජනතාවටද පාඩම් උගන්වනු ඇත. එහෙත් සටන්කාමී දේශපාලන පක්ෂයක් හමුවේ දැන් උද්ගතව ඇති ප්‍රශ්නය නම්, මෙයයි: විප්ලවයට යම් කිසිවක් උගැන්වීමට අප සමත් වේද? අපේ සමාජ-ප්‍රජාතන්ත්‍රවාදී උගැන්වීමේ නිවැරදි බවෙන් හා එකම දැඩි විප්ලවකාරී පන්තිය වූ නිර්ධන පංතිය සමග අපේ ඇති බැඳීම්වලින් ප්‍රයෝජනය ගෙන විප්ලවය මතුයෙහි නිර්ධන පංතික සටහනක් තැබීමට හෙවත් විප්ලවය නිර්ධන පංතික ස්වභාවයට පත් කිරීමටත්, වචනයෙන් නොව ක්‍රියාවෙන් විප්ලවය නියම තීරණාත්මක ජයග්‍රහණයක් කරා ගෙන යෑමටත්, එසේම ප්‍රජාතන්ත්‍රික ධනපතියන්ගේ චපල බව, උදාසීන බව හා ද්‍රෝහී බව ක්‍රියා විරහිත කිරීමටත් අපට හැකි වේද?

අපේ සියලුම ප්‍රයත්නයන් යොමු කළ යුත්තේ ඒ පරමාර්ථය කෙරෙහිය. එහි සාර්ථකත්වය රඳා පවත්නේ එක් අතකින් දේශපාලන තත්ත්වය පිළිබඳව අපේ තක්සේරුවේ නිරවද්‍යතාවය හා අපේ උපක්‍රමීය සටන් පාඨවල නිවැරදි භාවයත් අනෙක් අතින්, එම සටන් පාඨ පිටුපසින් බහුතර කම්කරු ජනතාවගේ නියම සටන්කාමී ශක්තිය යොදවනු ලබන්නේද යන්නත් මතයි. අපේ පක්ෂයේ සියලුම කණ්ඩායම්වල හා සංවිධානවල දැනට කෙරෙන ප්‍රචාරක, උද්ඝෝෂණ හා සංවිධාන ආදී සියලුම නිත්‍ය සාමාන්‍ය කටයුතු, බහුජනතාව හා පවත්නා සම්බන්ධතාවයන් ශක්තිමත් කිරීම හා පුළුල් කිරීම කෙරෙහි යොමුකර තිබේ. මෙම කටයුතු නිරන්තරයෙන් අවශ්‍ය ඒවායි. එහෙත් අන්කිසි කාල පරිච්ඡේදයකදීට වඩා විප්ලවකාරී කාල පරිච්ඡේදයකදී එපමණක් සෑහේයැයි සැලකිය නොහැකිය. එබඳු අවස්ථාවකදී විවෘත විප්ලවකාරී ක්‍රියා සඳහා ස්වභාවික උවමනාවන් කම්කරු පංතියට හැඟෙනු ඇත. එහෙයින්, එම ක්‍රියාවන්හි අරමුණු නිවැරදිව සකස් කිරීමටත්, එම අරමුණු හැකි තරම් පුළුල් ලෙස ප්‍රචලිත කිරීමටත්, අවබෝධ කරවීමටත් අප ඉගෙන ගත යුතු වෙයි. බහුජනතාව සමග පවතින අපේ සම්බන්ධතාවය පිළිබඳ වර්තමාන උදාසීනත්වය විප්ලවයේදී නිර්ධන පංතිය සතු කාර්ය භාරය පිළිබඳව තිබෙන ධනපති අදහස්වලට කඩතුරාවක් වශයෙන් මෙකල බොහෝ විට යොදා ගන්නා බව අමතක කළ යුතු නොවේ. කම්කරු පංතියට අවබෝධය දී ඔවුන් සංවිධානය කිරීම සඳහා නිසැකවම තවමත් විශාල වැඩ කොටසක් අප විසින් කළ යුතුව තිබේ. එහෙත්, ප්‍රශ්නය වනුයේ මෙයයි. අවබෝධය දීමේ හා සංවිධානය කිරීමේ මෙම වැඩ කටයුතුවලදී ප්‍රධාන දේශපාලන අවධානය යොමු කළ යුත්තේ කොතැනටද? වෘත්තීය සංගම් හා නීත්‍යානුකූලව පවත්නා සමිති සමාගම් කෙරෙහිද? නැතහොත් සන්නද්ධ නැගිටීමක්, විප්ලවකාරී හමුදාවක් හා විප්ලවකාරී ආණ්ඩුවක් නිර්මාණය කිරීම කෙරෙහිද? කම්කරු පංතියට අධ්‍යාපනය දී ඔවුන් සංවිධානය කිරීම සඳහා මේ දෙකම ඉවහල් වේ. ඇත්ත වශයෙන්ම ඒ දෙකම අවශ්‍යයි. එහෙත් වත්මන් විප්ලවයේ වැදගත්ම ප්‍රශ්නය වන්නේ කම්කරු පංතියට අධ්‍යාපනය දීමේ හා ඔවුන් සංවිධානය කිරීමේ කටයුතුවලදී අවධාරනය කළ යුත්තේ කුමක්ද? කලින් කී දෙයටද නැතහොත් පසුව කී දෙයටද?

විප්ලවයේ ප්‍රතිඵල රැඳී ඇත්තේ, කම්කරු පංතිය ධනපති පංතියේ ආධාරකරුවෙකු ලෙස, එනම්, අත්තනෝමතික පාලනයට විරුද්ධව කරනු ලබන ප්‍රහාරයේදී ශක්තියෙන් බලවත් වන නමුත් දේශපාලන වශයෙන් බෙලහීන ආධාර කරුවෙකු ලෙස සිටිනු ඇත්ද, නැතිනම් ජනතා විප්ලවයේ නායකත්වය ගෙන ක්‍රියා කරනු ඇත්ද යන ප්‍රශ්නය උඩය. ධනපති පංතියේ වඩාත් බුද්ධිමත් නියෝජිතයෝ මේ බව හොඳින් දනිති. වෘත්තීය සංගම් හා නීත්‍යානුකූලව පවත්නා සමිති සමාගම් දැන් පෙරමුණට ගෙනෙන නැඹුරුවීම වන, සමාජ-ප්‍රජාතන්ත්‍රවාදීන්ගේ 'අකීමව්වාදයත්'[6], 'ආර්ථිකවාදයත්'[7] ''අස්වබෂ්ජේනිය''[8] සහරාව විසින් වර්ණනා කරනු ලබන්නේ ඒ නිසාමය. අලුත් ''ඉස්ක්‍රා''[9] පත්‍රයේ අකීමව්වාදී නැඹුරුවීම් ස්ත්‍රුවේ මහතා විසින් (''අස්වබෂ්ජේනිය'' අංක 72) අගයනු ලබන්නේද ඒ නිසාමයි. එසේම, රුසියානු සමාජ-ප්‍රජාතන්ත්‍රවාදී කම්කරු පක්ෂයේ තුන්වැනි සම්මේලනයේ පිළිකුල්

කටයුතු විප්ලවකාරී පටුබව කෙරෙහි ඔහු එතරම් පහර දෙන්නේද එහෙයිනි.

බහු ජනයාට නායකත්වය දෙනු සඳහා මෙම අවධියේ සමාජ-ප්‍රජාතන්ත්‍රවාදයට නිවැරදි උපක්‍රමීය සටන් පාඨ තිබීම අතිශයින්ම වැදගත්ය. ප්‍රතිපත්තිමය වශයෙන් නිරවද්‍ය උපක්‍රමීය සටන් පාඨවල වැදගත්කම සුළුකොට දැක්වීම තරම් භයංකර දෙයක් විප්ලවීය කාල පරිච්ඡේදයකදී වෙනත් නැත. නිදසුනක් දක්වතොත්, ''ඉස්ක්‍රා'' පත්‍රයේ 104 වැනි කලාපය සමාජ-ප්‍රජාතන්ත්‍රවාදී ව්‍යාපාරය තුළ සිටින ස්වකීය විරුද්ධවාදීන්ගේම අදහස් නියත වශයෙන්ම අනුමත කරන නමුත්, ඒ අතරම, කාලෝචිත සටන් පාඨ හා උපක්‍රමීය තීරණවල වැදගත්කම බැහැර කරමින්, වැරදි හා පසුබෑම් රාශියක් සහිතව වුව ව්‍යාපාරය ඉදිරියට ගමන් ගන්නා මාවත දක්වයි. සිදුවීම් පසු පස්සේ නිකම්ම ඇදී යාමට නොව නිරවද්‍ය මාක්ස්වාදී ප්‍රතිපත්තිවල ජීවය යටතේ නිර්ධන පංතියට නායකත්වය දීමට උනන්දුවන පක්ෂයකට, නිවැරදි උපක්‍රමීය තීරණ සකසා ගැනීම ඉතා වැදගත් වෙයි. රුසියානු සමාජ-ප්‍රජාතන්ත්‍රවාදී කම්කරු පක්ෂයේ තෙවැනි සමුලුවේ හා පක්ෂයෙන් ඉවත්වූ කණ්ඩායමේ* සම්මේලනයේද යෝජනා තුළ ඉතාමත් පරීක්ෂාකාරීව සකස් කරන ලද්දවූත්, සම්පූර්ණයෙන්ම ප්‍රකාශ කරන ලද්දවූත් උපක්‍රමීය අදහස් තිබේ. එම අදහස් තනි තනි ලේඛකයන් විසින් අහම්බෙන් දක්වන ලද දේ නොව සමාජ-ප්‍රජාතන්ත්‍රවාදී නිර්ධන පංතියේ වගකිව යුතු නියෝජිතයින් විසින් පිළිගනු ලැබූ ඒවා වෙයි. අපේ පක්ෂය අන් සියලුම පක්ෂවලට වඩා ඉදිරියට ගිය එකකි. මන්ද යත්, නිවැරදි හා පොදුවේ පිළිගනු ලැබූ නියමිත වැඩ සටහනක් ඊට ඇති හෙයිනි. ''අස්වබෂ්ජේනිය'' ධනපති ප්‍රජාතන්ත්‍රික අවස්ථාවාදයට මෙන්ම, විප්ලව සමයේදී පමණක් වැඩ සටහන් 'කෙටුම්පතක්' ඉදිරිපත් කරමින්. පෙරට පැමිණ තමන් ඉදිරියේ සිදුවන්නේ ධනපති පංති විප්ලවයක්දැයි පළමුවරට පරීක්ෂා කිරීමට කල්පනා කරන සමාජවාදී විප්ලවකාරීන්ගේ විප්ලවීය වදන් හරඹයටද වෙනස්ව යමින්, මේ පක්ෂය විසින් උපක්‍රමීය

* රුසියානු සමාජ-ප්‍රජාතන්ත්‍රවාදී කම්කරු පක්ෂයේ තුන්වන සම්මේලනයට (1905 මැයි, ලන්ඩන්) සහභාගි වූයේ බොල්ෂෙවික්වාදීන් පමණක් වන අතර 'සාකච්ඡා සභාව'ට (එම කාලයේම, ජිනීවා) මෙන්ෂෙවික්වාදීන්[10] පමණක් සහභාගි වූහ. මෙම පොතෙහි මෙන්ෂෙවික්වාදීන් නිතරම 'නව ඉස්ක්‍රා කණ්ඩායම' ලෙනින් හැඳින්වේ. මන්ද යත්, ''ඉස්ක්‍රා'' දිගටම පත් කළ මුත් පැරණි හා නව ''ඉස්ක්‍රා'' අතර වෙනසක් ඇතැයි ඔව්හු තම සගයකුවූ ට්‍රොට්ස්කි මාර්ගයෙන් කියා සිටි බැවිනි. (1907 මුද්‍රණයට කර්තෘගේ සටහනකි. — සංස්කාරක)



යෝජනා හොඳින් පිළිපැදීම ගැන සෙසු පක්ෂවලට ආදර්ශයක්ද දිය යුතු වෙයි.

රුසියානු සමාජ-ප්‍රජාතන්ත්‍රවාදී කම්කරු පක්ෂයේ හා පක්ෂයෙන් ඉවත්වූ අයගේ සමුළුවේ උපක්‍රමීය යෝජනා හොඳින් පරීක්ෂා කොට, එහි මාක්ස්වාදී ප්‍රතිපත්තිවලින් පිට පැන ගිය තැන් කවරේදැයි සොයා බැලීමත්, ප්‍රජාතන්ත්‍රවාදී විප්ලවයකදී සමාජ-ප්‍රජාතන්ත්‍රවාදී නිර්ධන පංතියේ නිශ්චිත කාර්යභාරයන් පිළිබඳ පැහැදිලි අවබෝධයක් දැරීමත්, විප්ලවකාරී සමාජ-ප්‍රජාතන්ත්‍රිකයන් සතු ඉතාමත් හදිසි කාර්යයක් බව අප විසින් කල්පනා කරනු ලබන්නේ ඒ නිසායි. මෙම පොත් පිංච කැපකොට ඇත්තේ මේ කටයුත්ත සඳහාය. වචනයෙන් දෙන අවවාදයට සීමා නොවී, සමස්ත රුසියානු සමාජ-ප්‍රජාතන්ත්‍රවාදී කම්කරු පක්ෂයේ අනාගත පූර්ණ සමගිය සඳහා පදනමක් වශයෙන් උපක්‍රමීය ක්‍රියා මාර්ග පිළිබඳ එකමුතුවක් සඳහා නියම වශයෙන්ම මඟ හෙළි කිරීමට කැමැත්ත දක්වන්නවුන්ටද, මාක්ස්වාදී ප්‍රතිපත්ති මත පිහිටීමෙනුත්, විප්ලවයේ පාඩම් අනුසාරයෙනුත්, අපේ උපාය මාර්ග පරීක්ෂා කොට බැලීම අවශ්‍ය වෙයි.

1905 ජූලි

එන්. ලෙනින්

## 1. හදිසි දේශපාලන ප්‍රශ්නයක්

වර්තමාන විප්ලවීය මංසන්ධියේදී ජනතා ව්‍යවස්ථාදයක මණ්ඩලයක් පිහිටුවීමේ ප්‍රශ්නය පෙරට විත් තිබේ. මෙම ප්‍රශ්නය නිරාකරණය කළ යුත්තේ කෙසේද යන්න ගැන විවිධ මත තිබේ. මෙහිදී දේශපාලන ප්‍රවනතා තුනක් හැඩ ගැසෙමින් ඇත. ජනතා නියෝජිතයින් රැස් කිරීමේ අවශ්‍යතාවය සාර් ආණ්ඩුවද පිළිගනී. එහෙත් මොන යම් තත්ත්වයක් යටතේ හෝ ස්වකීය මන්ත්‍රන සභාව ජනතා ව්‍යවස්ථාදයක මණ්ඩලයක් වීමට ඔව්හු ඉඩ නොදෙති. බුලීගින් කොමිසමේ[11] කටයුතු පිළිබඳ පුවත්පත් වාර්තා අනුව විශ්වාස කටයුතුව ඇත්තේ, උද්ඝෝෂණ ගෙනයාමේ නිදහස රහිතව, සීමිත සුදුසුකම් හෝ සීමිත සමාජ පදනමක් මත හෝ තෝරා ගනු ලබන උපදේශක මණ්ඩලයකට එකහවීමට ඔවුන් කැමති බව ය. සමාජ-ප්‍රජාතන්ත්‍රවාදී පක්ෂය විසින් මෙහෙය වනු ලැබූ නිසා විප්ලවකාරී නිර්ධන පංතිය ව්‍යවස්ථාදයක මණ්ඩලයකට සම්පූර්ණ බලය පවරන ලෙස තරයේ ඉල්ලා සිටී. මේ සඳහා සර්වජන ඡන්දය හා උද්ඝෝෂණ ගෙන යාමේ සම්පූර්ණ නිදහස ලබා ගැනීමට පමණක් නොව සාර් ආණ්ඩුව වහාම බලයෙන් නෙරපා දමා ඒ වෙනුවට තාවකාලික විප්ලවකාරී ආණ්ඩුවක් පිහිටුවා ගැනීමටද ඔව්හු උත්සාහ දරති. අවසාන වශයෙන් ලිබරල්වාදී ධනපති පංතිය, ඊනියා 'ව්‍යවස්ථාදයක ප්‍රජාතන්ත්‍රික පක්ෂයේ'[12] නායකයන් මගින් තම සිතැඟි ප්‍රකාශ කරමින් සිටී. ඔව්හු සාර් ආණ්ඩුව බලයෙන් නෙරපීමට බල නොකරන අතරම තාවකාලික ආණ්ඩුවක් ඇති කිරීමේ සටන් පාඨය ඉදිරියට ගෙන නො යති. එසේම මැතිවරණය සම්පූර්ණයෙන්ම සාධාරණ හා නිදහස් එකක් වනු ඇති බවට මෙන්ම නියෝජිත මන්ත්‍රී මණ්ඩලය නියම වශයෙන්ම මහජන වූත් නියම වශයෙන්ම ඡන්ද කොට්ඨාශ අනුව පත්වූත් එකක් වනු ඇති බවට කෙරෙන අවංක සහතිකයක් සඳහා ඔව්හු බල නොකරති. ඇත්ත වශයෙන්ම, ''අස්වබෂ්ජේනිය'' නැඹුරුවීමේ



එකම ප්‍රබල සමාජ සහායකයා වන ලිබරල්වාදී ධනපති පංතිය උත්සාහ කරන්නේ සාර් ආණ්ඩුව හා විප්ලවකාරී ජනතාව අතර හැකිතරම් සාමකාමී ජාවාරමක් කිරීම සඳහාය. එපමණක් නොව, තමන්ට, එනම් ධනපති පංතියට වැඩිම බලයක් හා විප්ලවකාරී ජනතාවට, එනම් නිර්ධන පංතියට හා ගොවීන්ට අඩුම බලයක් ලැබෙන ජාවාරමක් සඳහා ය.

වර්තමාන දේශපාලන තත්ත්වය එයයි. වර්තමාන රුසියාවේ ප්‍රධාන සමාජ බලවේග තුනට සම්බන්ධ ප්‍රධාන දේශපාලන ප්‍රවනතා තුන එබඳුය. අස්වබෂ්ජේනිය වාදීන් විසින් ස්වකීය අස්ථිර ප්‍රතිපත්තිය, වඩාත් කෙලින් පැහැදිලිව කියතොත්, විප්ලවය කෙරෙහි දක්වන ද්‍රෝහී භයානක ප්‍රතිපත්තිය වසන් කිරීම සඳහා ව්‍යාජ ප්‍රජාතන්ත්‍රවාදී වාග්මාලා භාවිතා කරන අයුරු මීට පෙර ද කිහිප වතාවකම (''ප්‍රොලිතාරි'' පත්‍රයේ 3—4—5 කලාප)* අප විසින් පෙන්වා දී ඇත. සමාජ-ප්‍රජාතන්ත්‍රවාදීන් විසින් අවස්ථාවේ කටයුතු තක්සේරු කරන ආකාරය අපි දැන් සොයා බලමු. රුසියානු සමාජ-ප්‍රජාතන්ත්‍රවාදී කම්කරු පක්ෂයේ තුන්වැනි සමුළුවේදී හා පක්ෂයෙන් ඉවත් වූ කණ්ඩායමේ 'සාකච්ඡා සභාවේ' දීත් ඉතා මෑතදී සම්මත කර ගන්නා ලද යෝජනා දෙකෙන් මේ සඳහා ඉතා වැදගත් කරුණු ඉදිරිපත් වේ. මේ යෝජනා දෙක අතුරෙන් දේශපාලන තත්ත්වය වඩාත් නිවැරදිව තක්සේරු කරනු ලබන්නේත්, විප්ලවකාරී නිර්ධන පංතියේ උපාය මාර්ග වඩාත් හොඳින් විග්‍රහ කරන්නේත් කුමන යෝජනාවක් විසින් ද යන්න ඉතා වැදගත්ය. එසේම, උද්ඝෝෂකයෙකු, ප්‍රචාරකයෙකු හා සංවිධායකයෙකු හැටියට තම යුතුකම් ඉටු කිරීමට උනන්දු වන සෑම සමාජ-ප්‍රජාතන්ත්‍රවාදියෙකු විසින්ම අදාල නොවන සියලු අදහස් නොසලකා හැර මෙම ප්‍රශ්නය ඉතාමත් හොඳින් බුද්ධිමත්ව විමසා බැලිය යුතු වෙයි.

පක්ෂයේ උපක්‍රම යනුවෙන් අප අදහස් කරන්නේ, පක්ෂයේ දේශපාලන හැසිරීම හෝ දේශපාලන ක්‍රියාකාරීත්වයේ ස්වභාවය දිසාව හා විධිය ය අලුත් කටයුතු හෝ අලුත් දේශපාලන තත්ත්වය හෝ සම්බන්ධයෙන් සමස්තයක් වශයෙන් පක්ෂයේ දේශපාලන හැසිරීම හරියටම විග්‍රහ කරනු සඳහා පක්ෂ සම්මේලන විසින් උපක්‍රමීය යෝජනා සම්මත කරගනු ලැබේ. රුසියාව තුළ ආරම්භ වී තිබෙන විප්ලවය විසින් එබඳු අලුත් දේශපාලන තත්ත්වයක්, එනම් ජනතාවගෙන් විශාල වැඩි

* ''විප්ලවීය අරගලය හා ලිබරල් බ්‍රෝකර්කම'', 1905; ''විප්ලවීය නිර්ධන පංතියේ ප්‍රජාතන්ත්‍රික කටයුතු'', 1905 සහ ''ධනපති පාවාදීමේ පළමු පියවර,'' 1905. ලෙනින් එකතු කළ කෘති, 8 වෙළුම, 486—494, 511 පිටු බලන්න. — සංස්කාරක

සංඛ්‍යාවක් හා සාර් ආණ්ඩුව අතර සම්පූර්ණ, තීරණාත්මක හා විවෘත භේදයක් නිර්මාණය කර ඇත. අලුත් ප්‍රශ්නය නියම වශයෙන්ම ජනප්‍රිය වූත්, ඡන්ද කොට්ඨාශ වශයෙන් තේරී පත් වන්නා වූත්, මන්ත්‍රී මණ්ඩලයක් පිහිටු වීමේදී අනුගමනය කළ යුතු ව්‍යවහාරික විධි සම්බන්ධ වූවකි (එබඳු මන්ත්‍රී මණ්ඩලයක් පිළිබඳ න්‍යායික ප්‍රශ්නය, අන් සියලු පක්ෂවලට වඩා බොහෝ ඉහතදීම සමාජ-ප්‍රජාතන්ත්‍රවාදී පක්ෂය විසින් ස්වකීය පක්ෂ වැඩ සටහන තුළින් විසඳා ඇත). බහු ජනයා ආණ්ඩුව කෙරෙහි කළකිරී ඇති හෙයින්ද, අලුත් පාලනයක් ඇති කිරීමේ අවශ්‍යතාවය බහු ජනතාවට අවබෝධ වී ඇති හෙයින්ද, ආණ්ඩුව පෙරලා දැමීම අරමුණු කොටගත් පක්ෂය විසින්, ඉවත් කළ පැරණි ආණ්ඩුව වෙනුවට පිහිටු වනු ලබන අලුත් ආණ්ඩුව කුමක්දැයි අවශ්‍යයෙන්ම සලකා බැලිය යුතු වෙයි. මෙහිදී විප්ලවකාරී තාවකාලික ආණ්ඩුවක් පිළිබඳ අලුත් ප්‍රශ්නයක් මතු වේ. මෙම ප්‍රශ්නයට සම්පූර්ණ පිළිතුරක් දෙනු සඳහා පංති හැඟීමෙන් යුතු නිර්ධන පංතියේ පක්ෂය විසින්: (1) දැනට කෙරෙන විප්ලවයේදී මෙන්ම, පොදුවේ නිර්ධන පංතියේ සමස්ත අරගලය තුළද විප්ලවකාරී තාවකාලික ආණ්ඩුවක ඇති වැදගත්කම; (2) විප්ලවකාරී තාවකාලික ආණ්ඩුවක් කෙරෙහි දක්වන ස්වකීය ආකල්පය; (3) මෙම ආණ්ඩුවට සමාජ-ප්‍රජාතන්ත්‍රවාදී පක්ෂය හවුල්වීමේ නියත කොන්දේසි; (4) ආණ්ඩුව තුළ සමාජ–ප්‍රජාතන්ත්‍රවාදීන් නොමැති වූයේ නම්, එහිදී එම ආණ්ඩුව කෙරෙහි පහළින් බලපෑම ඇති කරවන තත්ත්වයන්, ආදිය පැහැදිලි කළ යුතුය. මෙම ක්ෂේත්‍රයෙහි දේශපාලන හැසිරීම ස්ථිර පැහැදිලි හා ප්‍රතිපත්ති අනුකූලව කළ හැක්කේ මෙම සියලු ප්‍රශ්න පැහැදිලි කිරීමෙන් පසුවයි.

රුසියානු සමාජ-ප්‍රජාතන්ත්‍රවාදී කම්කරු පක්ෂයේ තුන්වැනි සම්මේලනයේ යෝජනාවෙන් මෙම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්නේ කෙසේදැයි දැන් අපි සොයා බලමු. යෝජනාව සම්පූර්ණයෙන් පහත පළවේ:

"විප්ලවකාරී තාවකාලික ආණ්ඩුවක් පිළිබඳ යෝජනාව.

"(1) නිර්ධාන පංතියේ ක්ෂණික වුවමනාවන් හා සමාජවාදයේ අවසාන ඉලක්ක කොටගත් අරගලයේ යහපත සඳහාද, හැකි තරම් පුළුල් දේශපාලන නිදහසක් අවශ්‍ය වන අතර ඒ නිසා අත්තනෝමතික රාජාණ්ඩු ක්‍රමය වෙනුවට ප්‍රජාතන්ත්‍රවාදී සමූහාණ්ඩුවක් ඇති කළ යුතු හෙයින්ද;

"(2) රුසියාව තුළ ප්‍රජාතන්ත්‍රවාදී සමූහාණ්ඩුවක් පිහිටුවිය හැක්කේ විප්ලවකාරී තාවකාලික ආණ්ඩුවක් ආයුධ කොට ගත් ජයග්‍රාහී මහජන නැගිටීමක ප්‍රතිඵලයක් වශයෙන් පමණක් වන අතර, මැතිවරණ



ව්‍යාපාරයේදී උද්ඝෝෂණ ගෙන යාමේ පූර්ණ නිදහස සහතික කිරීමටත්, සර්වජන හා සමාන රහස් ඡන්දයෙන් හා කෙලින්ම මැතිවරණ පැවැත්වීමෙන් තෝරා පත් කරගත් මන්ත්‍රීවරුන්ගෙන් සමන්විත මහජනයාගේ සිතැඟි නියම වශයෙන්ම ප්‍රකාශ කරන නියෝජිත මන්ත්‍රී මණ්ඩලයක් පත් කිරීමටත් සමත් වන්නේ එයම පමණක් හෙයින්ද;

"(3) වර්තමාන සමාජ හා අර්ථ ක්‍රමය යටතේ රුසියාවේ මෙම ප්‍රජාතන්ත්‍රික විප්ලවය දුර්වල නොවන අතර, ඉන් ධනපති පාලනය ශක්තිමත් වී එය කිසියම් අවස්ථාවකදී අනිවාර්යයෙන්ම රුසියානු නිර්ධන පංතියට ලැබෙන ජයග්‍රහණ හැකි තරම් දුරට අහිමි කරනු පිණිස සෑම දෙයක්ම කරමින් නිසැකවම උත්සාහ ගනු ඇති හෙයින්ද, —

"රුසියානු සමාජ-ප්‍රජාතන්ත්‍රවාදී කම්කරු පක්ෂයේ තුන්වැනි සම්මේලනය, —

"(අ) අපේ වැඩ සටහන තුළ (අවම වැඩ සටහන) අඩංගු ක්ෂණික දේශපාලන හා ආර්ථික ඉල්ලීම් සියල්ල ක්‍රියාත්මක කරන සේ නිර්ධන පංතිය විසින් ඉල්ලා සිටිනු ලබන විප්ලවකාරී තාවකාලික ආණ්ඩුවක් බිහි කරනු සඳහා, විප්ලවයේ එක්තරා අවස්ථාවකදී එය ගමන් ගත හැකි මාර්ගය හා එහි අවශ්‍යතාවය පිළිබඳව නියම අවබෝධයක් කම්කරු පංතිය අතර පතුරුවා හැරීම අවශ්‍ය බවත්;

"(ආ) සියලුම ප්‍රතිවිප්ලවවාදී ප්‍රයත්නයන්ට විරුද්ධව නොනවතින සටනක් කරනු පිණිසත් කම්කරු පංතියේ ස්වාධීන අපේක්ෂාවන් ආරක්ෂා කරනු පිණිසත්, බලවේග අතර සබඳකම් හා කල්තබා නිශ්චය කළ නොහැකි වෙනත් හේතු කාරක අනුව තීරණය වන පරිද්දෙන්, අපේ පක්ෂ නියෝජිතයින්ට විප්ලවකාරී තාවකාලික ආණ්ඩුවට සහභාගි වීමට හැකි බවත්;

"(ඇ) සම්පූර්ණ සමාජවාදී විප්ලවයක් සඳහා උත්සාහ කරන්නාවූද, ඒ නිසාම සියලුම ධනපති පක්ෂවලට සදාකාලිකවම සතුරු වන්නාවූද, සමාජ-ප්‍රජාතන්ත්‍රවාදී පක්ෂයේ ස්වාධීනත්වය සම්පූර්ණයෙන්ම පවත්වා ගත යුතු අතර පක්ෂය විසින් ස්වකීය නියෝජිතයින් තදින්ම පාලනය කර ගැනීම ඉහත කී සහභාගිත්වය සඳහා නැතිවම බැරි කොන්දේසියක් බවත්;

"(ඇ) සමාජ-ප්‍රජාතන්ත්‍රවාදීන්ට විප්ලවකාරී තාවකාලික ආණ්ඩුවට සහභාගි වීමට පුළුවන්කම ලැබුනත් නැතත්, විප්ලවයේ ජයග්‍රහණ රැක ගැනීම, තහවුරු කිරීම හා පුළුල් කිරීම පිණිස, සමාජ-ප්‍රජාතන්ත්‍රවාදී පක්ෂයේ නායකත්වය ඇතිව අවිගත් නිර්ධන පංතිය විසින් තාවකාලික ආණ්ඩුව කෙරෙහි ස්ථාවර බලපෑම් ඇති කිරීමේ අවශ්‍යතාවය ගැන අප විසින් නිර්ධන පංතියට අයත් පුළුල්තම කොටස් අතර ප්‍රචාරය කළ යුතු බවත් යෝජනා කරයි."

## 2. රු.ස.ප්‍ර.ක. පක්ෂයේ තුන්වන සම්මේලනයේ විප්ලවකාරී තාවකාලික ආණ්ඩුවක් පිළිබඳ යෝජනාවෙන් අපට උගන්වන්නේ කුමක්ද?

මාතෘකාවෙන් පැහැදිලි කරන්නා සේම, රුසියානු සමාජ-ප්‍රජාතන්ත්‍රවාදී කම්කරු පක්ෂයේ තුන්වැනි සම්මේලනයේ යෝජනාව මුළුමනින්ම හා තනිකරම විප්ලවකාරී තාවකාලික ආණ්ඩුවක් පිළිබඳ ප්‍රශ්නය සම්බන්ධයෙන් කැප කර තිබේ. එහෙයින්, සමාජ-ප්‍රජාතන්ත්‍රවාදීන් විප්ලවකාරී තාවකාලික ආණ්ඩුවකට සහභාගි වීම එම ප්‍රශ්නයේ කොටසක් ලෙසින් එහි අඩංගු වී ඇත. අනික් අතින් විප්ලවකාරී තාවකාලික ආණ්ඩුව හැර අන් කිසිවක් ගැන එහි සඳහන් නොවේ. ඒ අනුව එයින් පොදුවේ, 'බලය අල්ලා ගැනීම' ආදිය ඉදිරිපත් වී නැත. මෙය හා වෙනත් සමාන ප්‍රශ්න අත්හැර දැමීමෙන් සම්මේලනය ගත් පියවර නිවැරැදිද? නිසැකවම එය නිවැරදිය. මන්ද යත්, රුසියාවේ දේශපාලන තත්වය අනුව එබඳු ප්‍රශ්න හදිසි දේ ලෙසින් පෙනී නොසිටී. හැරත්, වර්තමානයේදී සමස්ත ජනතාවම විසින් මතු කරනු ලැබූ ප්‍රශ්නය නම් අත්තනෝමතික රාජාණ්ඩුව පෙරළා දමා ව්‍යවස්ථාදයක මණ්ඩලයක් පිහිටු වීමයි. පක්ෂ සම්මේලන විසින් සලකා බලා තීරණය කළ යුත්තේ අර හෝ මේ ලේඛකයා විසින් අවස්ථාවෝචිතව හෝ අනුචිතව හෝ නගනු ලබන ප්‍රශ්න නොව උද්ගතව ඇති තත්ත්වයන් හා සමාජ සංවර්ධනයේ වාස්තවික ගමන් මග නිසා මහත් දේශපාලන වැදගත්කමක් ගන්නා ප්‍රශ්නය.

වර්තමාන විප්ලවයේදීත්, නිර්ධන පංතියේ පොදු සටනේදීත්, විප්ලවකාරී තාවකාලික ආණ්ඩුවක වැදගත්කම කුමක්ද? නිර්ධන පංතියේ නුදුරු අභිවෘද්ධිය හා 'සමාජවාදයේ අවසාන අරමුණු' යන උභයාර්ථයන් ගෙන්ම ගත් කළ 'දේශපාලන නිදහසේ ලබාගත හැකි වැඩිතම ප්‍රමාණයේ' වැදගත්කම ගැන මුලදීම සඳහන් කිරීමෙන් සම්මේලනයේ යෝජනාව විසින් ඊට හේතු පැහැදිලි කරනු ලබයි. අපේ පක්ෂ වැඩ සටහන විසින් දැනටමත් පිළිගනු ලැබූ පරිදි ඒවැනි පූර්ණ දේශපාලන නිදහසක් සඳහා අත්තනෝමතික රාජාණ්ඩුව වෙනුවට ප්‍රජාතන්ත්‍රවාදී සමූහාණ්ඩුවක් පිහිටුවීම අවශ්‍ය කෙරේ. ප්‍රජාතන්ත්‍රවාදී සමූහාණ්ඩුවක් පිළිබඳ සටන් පාඨය පිළිබඳව සම්මේලන යෝජනාව අවධාරනය කිරීම තර්කය වශයෙනුත් පිළිවෙත වශයෙනුත් යන දෙවිධියෙන්ම අවශ්‍ය වේ. මන්ද යත් ප්‍රජාතන්ත්‍රවාදයේ ප්‍රධාන තම නියමුවා ලෙස නිර්ධන පංතිය පූර්ණ නිදහසම ලබා ගැනීමට යත්න දරන බැවිනි. තවද දැන් රාජාණ්ඩුවාදීන්, එනම්, ඊනියා ව්‍යවස්ථානුකූල



'ප්‍රජාතන්ත්‍රවාදී' පක්ෂය හෙවත් 'අස්වබෂ්ජේනිය' පක්ෂය අප රට තුළ 'ප්‍රජාතන්ත්‍රවාදයේ' ධජය ඔසවා ගෙන සිටින බැවින් වර්තමානයේදී එය අවධාරනය කිරීම නුවණට හුරුය. සමූහාණ්ඩුවක් පිහිටුවනු සඳහා මහජන නියෝජිතයන්ගෙන් සමන්විත මන්ත්‍රී මණ්ඩලයක් පිහිටුවීම ප්‍රධාන කොටම අවශ්‍ය වේ. එසේම එය ජනතා (සර්වජන හා සමාන රහස් ඡන්දයන් කෙලින්ම මැතිවරණයක් තුළින් තෝරා පත් කරගත්) සහ ව්‍යවස්ථාදයක බලය සහිත එකක් ද විය යුතුය. සම්මේලන යෝජනාවෙන් තව දුරටත් පිළිගෙන ඇත්තේ මෙයයි. කෙසේවෙතත් යෝජනාව එතෙකින් නො නවතී. 'ජනතාවගේ සිතැඟි නියම වශයෙන්ම ප්‍රකාශ කරන' නව පාලනයක් පිහිටුවීම සඳහා නියෝජිත මන්ත්‍රී මණ්ඩලය ව්‍යවස්ථාදයක මණ්ඩලයක් ලෙස නම් කිරීම පමණක් ප්‍රමාණවත් නොවේ. මෙම මණ්ඩලයට 'ව්‍යවස්ථාදයක' අධිකාරය සහ බලතලද තිබිය යුතුය. මෙය සැලකිල්ලට ගත් සම්මේලන යෝජනාව 'ව්‍යවස්ථාදයක මණ්ඩලයක්' පිළිබඳ නිල සටන් පාඨයට සීමා නො වී එම සභාවට තම කාර්‍යයන් නියම වශයෙන්ම ඉටු කිරීමට අවශ්‍යයෙන්ම තිබිය යුතු භෞතික තත්ත්වයන්ද පෙන්වා දෙයි. නමින් මන්ත්‍රී මණ්ඩලයකට ක්‍රියාවෙන්ද එම බලතල ලැබිය හැකි වන තත්ත්වයන් වෙන්කර දැක්වීම අත්‍යාවශ්‍ය වෙයි. මන්ද යත් කිහිප වරක්ම අප විසින් පෙන්වාදී ඇති පරිදි, ව්‍යවස්ථාදයක රාජාණ්ඩු පක්ෂයෙන් නියෝජනය වන ලිබරල්වාදී ධනපති පංතිය මහජන මන්ත්‍රී මණ්ඩලයක් පිළිබඳ සටන් පාඨය ඕනෑකමින්ම විකෘත කරමින් එය හිස් පාඨයක් බවට පෙරලමින් සිටින හෙයිනි.

මැතිවරණ ව්‍යාපාරයේදී උද්ඝෝෂණ ගෙන යාමේ සම්පූර්ණ නිදහස ලබාදී මහජන මතය නියම වශයෙන්ම ප්‍රකාශ කෙරෙන, මන්ත්‍රී මණ්ඩල පිහිටු විය හැක්කේ, විශේෂයෙන්ම ජයග්‍රාහී මහජන නැගිටීමක් තුළින් බිහිවන තාවකාලික විප්ලවකාරී ආණ්ඩුවකට පමණකැයි සම්මේලන යෝජනාවේ සඳහන් වේ. මේ තීසිසය හරිද? එය වැරදි යැයි කීමට යමෙක් සිතන්නේ නම්, සාර් ආණ්ඩුව ප්‍රතිගාමිත්වයේ පැත්ත නොගැනීමට ඉඩ ඇති ලෙසත්, මැතිවරණ සමයේදී මධ්‍යස්ථව සිටීමට ඊට හැකිවා මෙන්ම මහජන මතය නියම අන්දමින් ප්‍රකාශ වීමට ඒ විසින්ම වග බලාගනු ලබන බවත්, තක්සේරු කිරීමට ඔහුට සිදුවේ. එබඳු පිළිගැනීම් කෙතරම් අර්ථ රහිත වේද යත්, එසේ එළිපිට කියා සිටීමට තරම් කිසිවෙකුත් එඩිතර නොවෙති. එහෙත් අපේ ''අස්වබෂ්ජේනිය'' ප්‍රභූන් විසින් ඒවා ලිබරල්වාදයේ වර්ණ අතර සඟවා වංචනික ලෙස හොරෙන් ඉදිරිපත් කරනු ලැබේ. යම්කිසිවකු විසින් ව්‍යවස්ථාදයක මණ්ඩලයක කැඳවිය යුතුය. මැතිවරණයේ නිදහස හා සාධාරණත්වය යම් කිසිවකු

විසින් සහතික කළ යුතුය. යම්කිසිවකු විසින් එබඳු මණ්ඩලයකට පූර්ණ බලය හා අධිකාරය පැවරිය යුතුය. පූර්ණ අවංකභාවයෙන් මෙය අපේක්ෂා කළ හැක්කේද, එය සාර්ථක කර ගැනීම සඳහා අවශ්‍ය සියල්ල සම්පූර්ණ කළ හැක්කේද, ජනතා නැගිටීමක් තුළින් බිහිවන විප්ලවීය ආණ්ඩුවකට පමණි. සාර් ආණ්ඩුව අනිවාර්යයෙන්ම මීට විරුද්ධ වනු ඇත. සාර් පාලනය හා එකඟත්වයකට පැමිණියා වූත්, මහජන පිබිදීම කෙරෙහි සම්පූර්ණ විශ්වාසය නොතබන්නා වූත්, ලිබරල් ආණ්ඩුවකට අවංකව එබඳු උනන්දුවක් ඇති විය නොහේ. ඕනෑකමක් තිබුනද, ඊට එය සාර්ථක කළ හැකි වන්නේද නොවේ. එහෙයින් සම්මේලන යෝජනාවෙන් මුළුමනින්ම නොසෙල්වෙන්නා වූත්, නිවැරදි වූත් එකම ප්‍රජාතන්ත්‍රවාදී සටන් පාඨය ඉදිරිපත් කරයි.

එහෙත් ප්‍රජාතන්ත්‍රික විප්ලවයේ පංති ස්වභාවය සැලකිල්ලට නොගන්නේ නම්, විප්ලවකාරී තාවකාලික ආණ්ඩුවක වැදගත්කම පිළිබඳ අගය මැනීම අසම්පූර්ණ හා වැරැදිසහගත වනු ඇත. එහෙයින් විප්ලවය නිසා ධනපති පංතියේ පාලනය ශක්තිමත් වනු ඇති බවද එම යෝජනාවේ තවදුරටත් සඳහන් වෙයි. වර්තමාන සමාජ ක්‍රමය යටතේ එනම් ධනවාදී සමාජ හා අර්ථ ක්‍රමයක් යටතේ මෙය වැලැක්විය නොහැකිය. කිසියම් ප්‍රමාණයක දේශපාලන නිදහසක් දිනාගෙන ඇති නිර්ධන පංතිය මතුයෙහි ධනපති පංතික පාලනය දැඩිවීම බලය සඳහා එම පංති දෙක අතර, උග්‍ර සටනට තුඩු දිය යුතුය. ''විප්ලවීය කාල පරිච්ඡේදයේදී නිර්ධන පංතිය ලැබූ ජයග්‍රහණ අහිමි කිරීමට'' ධනපති පංතිය ගන්නා දැඩි ප්‍රයත්නයන්ට හේතු විය යුතුය. එහෙයින් ප්‍රජාතන්ත්‍රවාදය සඳහාවූ සටනේ පෙරමුණේ සිටිමින් එයට නායකත්වය දෙන නිර්ධන පංතිය විසින් ධනපති ප්‍රජාතන්ත්‍රවාදය තුළ ආවේණිකව පවත්නා අලුත් ප්‍රතිවිරෝධතාවයන් ගැන හෝ අලුත් අරගලය ගැන හෝ මොහොතකට වත් අමතක කළ යුතු නොවේ.

මෙනයින් නිදහස හා සමූහාණ්ඩුවක් සඳහා කරන අරගලය සම්බන්ධයෙන්ද, ව්‍යවස්ථාදායක මණ්ඩලය සම්බන්ධයෙන්ද, අලුත් පංති අරගලයකට මග පාදන ප්‍රජාතන්ත්‍රික විප්ලවය සම්බන්ධයෙන්ද අතින් විප්ලවකාරී තාවකාලික ආණ්ඩුවක වැදගත්කම මෙම යෝජනාවේ අප දැන් විමසා බැලූ කොටසෙන් සම්පූර්ණයෙන් තක්සේරු කරයි.

මීළඟ ප්‍රශ්නය වන්නේ විප්ලවකාරී තාවකාලික ආණ්ඩුවක් කෙරෙහි පොදුවේ නිර්ධන පංතිය දක්වන ආකල්පයයි. සම්මේලන යෝජනාවෙන් පළමු කොටම මීට පිළිතුරු සපයන්නේ විප්ලවකාරී තාවකාලික ආණ්ඩුවක් අවශ්‍යය යන හැඟීම කම්කරු පංතිය අතර පතුරුවා හරින



ලෙස පක්ෂයට කෙලින්ම උපදෙස් දීමෙනි. මෙම අවශ්‍යතාවය පිළිබඳ අවබෝධයක් කම්කරු පංතියට ලබා දිය යුතුය. සාර් ආණ්ඩුව පෙරළා දැමීමේ ප්‍රශ්නය 'ප්‍රජාතන්ත්‍රික' ධනපති පංතිය විසින් පසුතලයට දමන අතර, අප විසින් එය පෙරට ගෙන විප්ලවකාරී තාවකාලික ආණ්ඩුවක අවශ්‍යකම අවධාරණයෙන් දැක්විය යුතුය. ඊටත් වඩා අප විසින් කළ යුතු වන්නේ එබඳු ආණ්ඩුවක් සඳහා අප දැන් ගෙවන කාල පරිච්ඡේදයේ වාස්තවික තත්ත්වයන් හා නිර්ධන පංතික ප්‍රජාතන්ත්‍රවාදයේ අරමුණු සමඟ ගැලපෙන වැඩ පිළිවෙළක් සකස් කිරීමයි. මෙම වැඩ සටහන අපේ පක්ෂයේ සමස්ත අවම වැඩ සටහන වන්නේය. එය එක් අතකින් පවත්නා සමාජ හා ආර්ථික සබඳකම් පදනම් කොටගෙන සම්පූර්ණයෙන් ක්‍රියාත්මක කල හැකි වූද අනික් අතින් සමාජවාදී ජයග්‍රහණය සඳහා ඊළඟ ඉදිරි පියවර තැබීමට අවශ්‍යවන්නා වූද, හදිසි දේශපාලන හා ආර්ථික ප්‍රතිසංස්කරන පිළිබඳ වැඩ සටහන වන්නේය.

මෙනයින් එම යෝජනාවෙන් විප්ලවකාරී තාවකාලික ආණ්ඩුවක ස්වභාවය හා අර්ථය පැහැදිලිව නිර්ණය කෙරේ. එහි මූලික ස්වභාවය හා ප්‍රභාවය අනුව එබඳු ආණ්ඩුවක් පොදු ජන නැගිටීමක ඉන්ද්‍රියය විය යුතුය. එහි මූලික අර්ථය විය යුත්තේ ජාතික ව්‍යවස්ථාදායක මණ්ඩලයක් කැඳවීමේ උපකරනයක් ලෙස ක්‍රියා කිරීමය. එහි ක්‍රියාකාරීත්වයේ අන්තර්ගතය විය යුත්තේ අත්තනෝමතික පාලනයට විරුද්ධව නැඟී සිටි ජනතාවගේ අභිප්‍රායන් ආරක්ෂ කිරීමට සමත් එකම වැඩ සටහන වූ නිර්ධන පංති ප්‍රජාතන්ත්‍රවාදයේ අවම වැඩ සටහන ක්‍රියාවට නැගීමය.

තාවකාලික ආණ්ඩුවක්, තාවකාලික පමණක් වන නිසාම තවමත් සමස්ත ජනතාවගේ අනුමැතිය ලැබී නැති නිර්මාණශීලී වැඩ සටහනක් ක්‍රියාත්මක කිරීමට ඊට පුළුවන් කමක් නැතැයි තර්ක කිරීමට ඉඩ තිබේ. එබඳු තර්කයක් ප්‍රතිගාමීන්ගේ හා අන්තවාදීන්ගෙන් කරුණු කනපිට පෙරලීමේ විතර්කයක් පමණි. නිර්මාණශීලී වැඩ සටහනක් ක්‍රියාත්මක කිරීම වනාහි ගරා වැටෙන අත්තනෝමතික පාලනයට අයත් රදළ කල්ලියේ පැවැත්ම ඉවසා සිටීමකි. එබඳු පාලනයක් ඉවසා සිටිය හැක්කේ විප්ලවයේ අභිප්‍රායන්ට ද්‍රෝහිවූවන්ගේ ආණ්ඩුවකට විනා පොදුජන නැගිටීමේ ඵලය වූ ආණ්ඩුවකට නොවේ. ව්‍යවස්ථාදායක මණ්ඩලය විසින් රැස්වීම් පැවැත්වීමේ නිදහස ස්ථිර නොකිරීමට ඉඩ ඇති හෙයින් එය ස්ථිර වන තෙක් රැස්වීම් පැවැත්වීමේ නිදහස පාවිච්චි කිරීමෙන් අප වැලකී සිටිය යුතු යැයි, යමකු විසින් යෝජනා කරනු ලැබීම විහිළුවක් වනු ඇත. විප්ලවකාරී තාවකාලික ආණ්ඩුවක් විසින් අවම වැඩ සටහන වහා ක්‍රියාත්මක කරනු ලැබීමට විරුද්ධ වීමද එබඳුම විහිළුවකි.

අවම වැඩ සටහන ක්‍රියාත්මක කිරීම විප්ලවකාරී තාවකාලික ආණ්ඩුවේ කාර්යභාරය බවට පත් කිරීමෙන් උපරිම වැඩ සටහන වහා ක්‍රියාත්මක කිරීම හා සමාජවාදී විප්ලවයක් සඳහා බලය අල්ලා ගැනීමත් සඳහාවූ විකාර සහ අර්ධ — ආරාජිකවාදී අදහස් මෙම යෝජනාව විසින් බැහැර කරනු ලැබූ බව අවසාන වශයෙන් අපි මතක තබා ගනිමු.රුසියාවේ ආර්ථික සංවර්ධනයේ මට්ටමත් (වාස්තවික තත්ත්වයකි) නිර්ධන පංතියට අයත් පුළුල් බහු ජනතාව අතර සංවිධානය හා පංති හැඟීමේ ඌනතාවයත් (වාස්තවික තත්ත්වය සමග වෙන් කළ නොහැකි සේ සම්බන්ධවූ මනෝමූල තත්ත්වයකි) නිසා කම්කරු පංතියේ සම්පූර්ණ විමුක්තිය වහා ලබා ගැනීම කළ නොහැක්කකි. දැනට සිදුවෙමින් තිබෙන ප්‍රජාතන්ත්‍රික විප්ලවයේ ධනපති පංතික ස්වභාවය අමතක කළ හැක්කේ අන්ත අඥාන මිනිසුන්ට පමණි. සමාජවාදයේ අරමුණු හා ඒවා දිනා ගන්නා ක්‍රම ගැන තවමත් කම්කරු බහු ජනතාවට ඇත්තේ කොතරම් සුළු අවබෝධයක්ද යන වග අමතක කළ හැක්කේ ඉතාමත්ම බොළඳ සර්ව ශුභ වාදීන්ට පමණි. එමෙන්ම වැඩකරන පංතීන්ගේ විමුක්තිය ළඟා කරගත හැක්කේ වැඩකරන පංතීන් විසින්ම පමණක් බව අප හැමටම ඒකාන්තය. බහු ජනතාව පංති හැඟීමෙන් යුතුව සංවිධානය වී සමස්ත ධනපති පංතියට විරුද්ධව විවෘත පංති සටනක් පිළිබඳ දැනුම හා පුහුණුව ලබන තෙක් සමාජවාදී විප්ලවයක් ගැන සිතිය නොහැකිය. අප සමාජවාදී විප්ලවය කල් තබන බවට කෙරෙන ආරාජිකවාදීන්ගේ චෝදනාවලට පිළිතුරු වශයෙන් අප කියන්නේ: අප කිසිවිටෙක වත් එය කල් නොදමනවා පමණක් නොව, ඉඩකඩ ඇති එකම නිවැරදි මාර්ගය ඔස්සේ, එනම් ප්‍රජාතන්ත්‍රවාදී සමූහාණ්ඩුවක් පිළිබඳ මාවත ඔස්සේ ප්‍රථම පියවර ඉදිරියට තබන බවය. දේශපාලන ප්‍රජාතන්ත්‍රවාදය හැරෙන විට වෙනස් මගකින් සමාජවාදය කරා එළඹීමට අදහස් කරන කවරෙක් වුවද, ආර්ථික මෙන්ම දේශපාලන අතින්ද, ප්‍රතිගාමීවූත් විකාරයක් වූත් නිගමනයන් කරා අනිවාර්යයෙන් එළඹෙනු ඇත. අප ඉදිරියට යමින් අපේ උපරිම වැඩ සටහන ක්‍රියාත්මක නොකරන්නේ මන්දැයි යම්කිසි අවස්ථාවක යම්කිසි කම්කරුවන් කොටසක් අපෙන් විමසුව හොත්, ප්‍රජාතන්ත්‍රවාදී අදහස් ඇති බහුතර ජනයා තවමත් සමාජවාදයෙන් ඈත්ව සිටින ප්‍රමාණයත්, තවමත් පංති ප්‍රතිවිරෝධතා වැඩී නැති ආකාරය හා තවමත් නිර්ධන පංතිය සංවිධානය අතින් කොපමණ දුර්වලද යන වගක් පෙන්වා දෙමින් අපි ඔවුනට පිළිතුරු සපයන්නෙමු. රුසියාව පුරා සිටින කෝටි සංඛ්‍යාත කම්කරුවන් සංවිධානය කරන්න. අපේ වැඩ සටහන කෙරෙහි ලක්ෂ ගණන් අවනත කරවා ගැනීමට උත්සාහ කරන්න. ඔබ හැම දෙනා පිටතින් ගාම්භීර



වූත්, එහෙත්, ඇතුළතින් හිස්වූත් ආරාජිකවාදී වාක්‍ය උච්චාරණයට සීමා නොවී මෙය ඉටු කිරීමට ඔබ උත්සාහ කරන විට කම්කරුවන් සංවිධානය කිරීමත්, සමාජවාදී අවබෝධය පැතිර වීමත් සඳහා අප විසින් හැකි තරම් ප්‍රජාතන්ත්‍රවාදී ප්‍රතිසංස්කරණ දිනාගත යුතු බව එක් වරම ඔබට පෙනෙනු ඇත.

අපි තවදුරටත් මේ ගැන සොයා බලමු. විප්ලවකාරී තාවකාලික ආණ්ඩුවක වැදගත්කම හා ඒ කෙරෙහි නිර්ධන පංතිය දක්වන ආකල්පය ගැන, අපට පැහැදිලි වැටහීමක් ලැබෙන විට පහත සඳහන් ප්‍රශ්නය මතුවේ. අපට එම ආණ්ඩුවට හවුල් වීමට (ඉහළින් ක්‍රියා කිරීම) අවසර තිබේද? එසේ නම් ඒ කවර තත්ත්වයන් යටතේද? පහළ මට්ටමෙන් අපගේ ක්‍රියාකාරිත්වය කුමක් විය යුතුද? මේ ප්‍රශ්න දෙකටම සම්මේලන යෝජනාවෙන් නියම පිළිතුරු සපයයි. (ප්‍රජාතන්ත්‍රික විප්ලව සමයේදී හා සමූහාණ්ඩුවක් සඳහා සටන් කරන අවධියේදී) විප්ලවකාරී තාවකාලික ආණ්ඩුවකට සහභාගි වීමට සමාජ-ප්‍රජාතන්ත්‍රිකයින්ට ප්‍රතිපත්තිමය වශයෙන් අවසර ඇති බව ඉන් අවධාරණයෙන් ප්‍රකාශ කෙරේ. මේ ප්‍රශ්නයට ප්‍රතිපත්ති වශයෙන් ''අවසර නැතැයි'' යනුවෙන් පිළිතුරු දෙන ආරාජිකවාදීන් ගෙන්ද, එමෙන්ම එබඳු ආණ්ඩුවකට සහභාගි වීමේ අවශ්‍යතාවය ඇති කරන තත්ත්වයක් උදා වනු ඇති බව කියමින් අප බිය ගැන්වීමට උත්සාහ කළ සමාජ-ප්‍රජාතන්ත්‍රිකයන් අතර සිටින (මර්තිනව් හා නව ඉස්ක්‍රාවාදීන් වැනි) වල්ගාවාදීන් ගෙන්ද, ඉහත කී ප්‍රකාශය අනුව අපි සම්පූර්ණයෙන්ම ඈත්වෙමු. විප්ලවකාරී තාවකාලික ආණ්ඩුවකට සමාජ-ප්‍රජාතන්ත්‍රිකයන් හවුල් වීම මිලෙරාන්වාදයේ[13] ස්වරූපයක් වනු ඇතැයිද,ධනපති ක්‍රමය අනුමත කිරීමක් මෙන් එයද ප්‍රතිපත්ති විසින් අවසර නොලද එකකැයි ආදී අලුත් ඉස්ක්‍රා කාරයන් ප්‍රකාශ කළ අදහස රුසියානු සමාජ ප්‍රජාතන්ත්‍රවාදී කම්කරු පක්ෂයේ තුන්වැනි සම්මේලනය විසින් මේ ප්‍රකාශය තුළින් සම්පූර්ණයෙන්ම ඉවත දමන ලදී.

එහෙත් ඇත්ත වශයෙන්ම ප්‍රතිපත්තිමය වශයෙන් ඇති අවසරය නිසා ප්‍රයෝගික වශයෙන් උචිත බව පිළිබඳ ප්‍රශ්නය නොවිසඳේ. මෙම අලුත් ක්‍රමයේ අරගලය, එනම් 'ඉහළ සිට කිරීම' පක්ෂ සම්මේලනය විසින් උචිත යැයි පිළිගන්නා ලද්දේ කුමන තත්ත්වයන් යටතේද? වර්තමානයෙහිදී බලවේග සබඳතාවය ආදී මූර්ත තත්ත්වයන් නිශ්චය කිරීම කළ නොහැකි බව අමුතුවෙන් කිව යුතු නැත. යෝජනාව ස්වාභාවිකවම එම තත්ත්වයන් පූර්වානුමානය කිරීමෙන් වලකියි. මෙම විෂය ගැන කිසිම අනාගත වාක්‍යයක් පැවසීමට කිසිම බුද්ධිමතෙක් වර්තමානයේදී එඩිතර නොවනු ඇත. අප විසින් කළ

යුතු වන්නේ, එසේම අපට කළ හැකි වන්නේත්, අපේ හවුල් වීමේ ස්වභාවයක් හා අරමුණු නිගමනය කිරීමයි. (1) ප්‍රතිවිප්ලවකාරී ප්‍රයත්නයන්ට විරුද්ධව අනුකම්පා රහිත සටනක් කිරීමත්; (2) කම්කරු පංතියේ ස්වාධීන වුවමනාවන් ආරක්ෂා කිරීමත් යන අපේ හවුල් වීමේ අර්ථ දෙක පෙන්වා දෙන එම යෝජනාවෙන් කර ඇත්තේද එයමයි. විප්ලවකාරී ජනයා බිය ගන්වා ඔවුන් අත්තනෝමතික රාජාණ්ඩුව කෙරෙහි අවනත කරවීමට උත්සාහ ගන්නා ධනපති ලිබරල්වාදීන් ප්‍රතිගාමීත්වයේ මානසික ස්වභාවය ගැන මෙතරම් උනන්දුවෙන් කතා කිරීම අරඹන විටදී (''අස්වබෝෂ්ජේනිය'' 71 කලාපයේ ස්ත්රූවේ මහතාගේ ඉතා උපදේශාත්මක ''විවෘත ලිපිය'' බලන්න) ප්‍රතිවිප්ලවයට විරුද්ධව නියම යුද්ධයක් ඇරඹීමේ කාර්‍ය්‍යය කෙරෙහි නිර්ධන පංතියේ පක්ෂය විසින් අවධානය යොමු කරවනු ලැබීම විශේෂයෙන්ම කාලෝචිතය. අවසාන වශයෙන් බලනවිට දේශපාලන නිදහස හා පංති සටන පිළිබඳ බරපතල ප්‍රශ්න විසඳන්නේ බලය යෙදීමෙන් පමණි. එහෙයින් ආත්ම ආරක්ෂාව සඳහා පමණක් නොව පහරදීම සඳහාද මේ බලය සූදානම් කර සංවිධානය කොට ක්‍රියාශීලීව කාර්‍ය්‍යයෙහි යෙදවීම අප සතු කාර්‍ය්‍යයයි. පැරිස් කොමියූනය[14] දවස්වල සිටම අඛණ්ඩව පැවතුන යුරෝපයේ දීර්ඝ කාලීන දේශපාලන ප්‍රතිගාමීත්වය විසින් සටන් කළ හැක්කේ 'පහළ සිට' පමණකැයි යන අදහසට අප බොහෝ සෙයින් පුරුදු කරනු ලැබීමෙන් ආත්මාරක්ෂාව සඳහා පමණක් කරන සටනට අප යොමුකොට ඇත. අපි නිසැකවම දැන්, දේශපාලන පෙරළි, හා විප්ලව ආරම්භ වී ඇති නව යුගයකට එළඹ සිටිමු. රුසියාව වර්තමානයේ පසු කරන අවදිය බඳු කාල පරිච්ඡේදවලදී පැරණි එකාකාර ක්‍රමවලටම පමණක් සීමා වී සිටීමට අපට හැකි නොවේ. ඉහළ සිට ක්‍රියාකිරීමේ අදහසට අප විසින් ප්‍රචාරය දිය යුතුයි. ඉතාමත් උද්‍යෝගිමත් ප්‍රහාරක කටයුතුවලට සූදානම් විය යුතුය. එබඳු සටන්වලදී අනුගමනය කළ යුතු ක්‍රම හා ඒ සඳහා අවශ්‍ය තත්ත්වයන් පරීක්ෂා කර බැලිය යුතුය. සම්මේලන යෝජනාවෙන් එම තත්ත්වයන්ගෙන් දෙකක් ඉදිරියට ගෙන එයි. විප්ලවකාරී තාවකාලික ආණ්ඩුවකට සමාජ-ප්‍රජාතන්ත්‍රවාදීන්ගේ හවුල් වීම පිළිබඳ මූලික අංශය ගැන (පක්ෂය විසින් තම නියෝජිතයන් තදින් පාලනය කිරීම) එකකින් සඳහන් වන අතර එබඳු හවුල් වීමක ස්වභාවය ගැන (සම්පූර්ණ සමාජවාදී විප්ලවයක් කිරීමේ අරමුණ කිසිවිටෙකත් මොහොතකටවත් අමතක නොකිරීම) අනෙකින් සඳහන් වේ.



මෙතෙක් නොසිතූ විරූ අලුත් සටන් ක්‍රමය වන, 'ඉහළ සිට' ක්‍රියා කිරීම සම්බන්ධයෙන් පක්ෂයේ ප්‍රතිපත්තිය මෙසේ සියලුම අංශවලින් පැහැදිලි කිරීමෙන් පසු ඉහළින් සිට ක්‍රියා කිරීමට අපට ඉඩ නොලැබෙන අවස්ථාව සඳහාත් එම යෝජනාවෙන් ඉඩ සලසා දෙයි. කුමන අවස්ථාවකදී වුවද විප්ලවකාරී තාවකාලික ආණ්ඩුව කෙරෙහි අපි පහළ සිට බලපෑම් කළ යුතු වෙමු. පහළ සිට බලපෑම් හැකියාව ලැබීම සඳහා නිර්ධන පංතිය සන්නද්ධව සිටිය යුතුය, — විප්ලවීය තත්ත්වයක් යටතේ විවෘත පුරවැසි යුද්ධ අවස්ථාව තෙක් ඉතා වේගයකින් කරුණු වර්ධනය වන හෙයිනි. සමාජ-ප්‍රජාතන්ත්‍රවාදී පක්ෂයේ නායකත්වය සහිතව සිටිය යුතුය. එසේ අවි යොදා කරන බලපෑමේ අරමුණ වනුයේ, විප්ලවයේ ජයග්‍රහණ එනම්,නිර්ධන පංතියේ අපේක්ෂාවන් අනුව බලන විට අපේ අවම වැඩ සටහන සම්පූර්ණයෙන් සාර්ථක කර ගැනීමට අදාල වන ජයග්‍රහණ ''ආරක්ෂා කිරීම, තහවුරු කිරීම හා පුළුල් කිරීමත්ය''.

විප්ලවකාරී තාවකාලික ආණ්ඩුවක් පිළිබඳ තුන්වැනි සම්මේලනයේ යෝජනාව සම්බන්ධයෙන් අපේ කෙටි විග්‍රහය මෙයින් අවසන් කරමු. පාඨකායට දැක ගත හැකි පරිදි, එම යෝජනාවෙන් මෙම අලුත් ප්‍රශ්නයේ වැදගත්කමත්, ඒ කෙරෙහි නිර්ධන පංති පක්ෂයේ ආකල්පයත් විප්ලවකාරී තාවකාලික ආණ්ඩුවක් තුළදී මෙන්ම ඉන් පිටතදීත් පක්ෂය විසින් අනුගමනය කළ යුතු පිළිවෙතත් පැහැදිලි කෙරේ.

අපි දැන් 'සාකච්ඡා සභාවේ' අනුරූපී යෝජනාව සලකා බලමු.

## 3. 'සාර්වාදය පරදවා විප්ලවය ලබන තීරණාත්මක ජයග්‍රහණය' යන්නෙහි අර්ථය කුමක්ද?

'සාකච්ඡා සභාවේ' යෝජනාව 'බලය අල්ලා ගැනීම හා තාවකාලික ආණ්ඩුවකට සහභාගි වීම'* පිළිබඳ ප්‍රශ්නය ගැන මිඩංගු කර ඇත. අප විසින් දැනටමත් පෙන්වා දී ඇති පරිදි ප්‍රශ්නය ඉදිරිපත් කර ඇති ආකාරයෙහිම ව්‍යාකූලත්වයක් තිබේ. එක් අතකින් ප්‍රශ්නය ඉදිරිපත්

* පොතෙහි තැනින් තැන දී ඇති උපුටා දැක්වීම්වලින් පූර්ණ යෝජනාව පාඨකයාට සකස් කරගත හැකිය. (ලෙනින් එකතු කළ කෘති, 9 වෙළුම, 32—33, 38—39, 44, 78, 82 පිටු බලන්න. — සංස්කාරක)

කර ඇත්තේ පටු ආකාරයකටයි. ඉන් විමසනු ලබන්නේ තාවකාලික ආණ්ඩුවකට අප සම්බන්ධවීම ගැන පමණි. පොදුවේ විප්ලවකාරී තාවකාලික ආණ්ඩුවක් පිළිබඳ පක්ෂයේ කාර්යභාරයන් ගැන එහි සඳහන් නොවේ. අනික් අතින් එකිනෙකට කිසිත් සම්බන්ධයක් නැති ප්‍රශ්න දෙකක්, එනම්, ප්‍රජාතන්ත්‍රික විප්ලවයේ යම්කිසි අවස්ථාවකදී අප ඊට සහභාගිවීමේ ප්‍රශ්නය හා සමාජවාදී විප්ලවයේ ප්‍රශ්නය ව්‍යාකූල කොට තිබේ. ඇත්තෙන්ම සමාජ-ප්‍රජාතන්ත්‍රවාදය මගින් 'බලය අල්ලා ගැනීම' නිශ්චිතවම සමාජවාදී විප්ලවයකි. මේ වචනවල ඍජු හා සාමාන්‍ය අර්ථය අනුව ගත්කල එය අන්කිසිවක් විය නොහේ. එහෙත් කෙසේ හෝ මෙම වචනවලින්, සමාජවාදී විප්ලවයක් සඳහා නොව ප්‍රජාතන්ත්‍රවාදී විප්ලවයක් සඳහා බලය අල්ලා ගැනීම අදහස් කළ යුතුවේ නම්, එහිදී විප්ලවකාරී තාවකාලික ආණ්ඩුවකට සහභාගි වීම ගැන පමණක් නොව පොදුවේ 'බලය අල්ලා ගැනීම' ගැනත් කථා කිරීමේ තේරුම කුමක්ද? පැහැදිලිවම පෙනෙන ලෙස, තමා කථා කළ යුතු කුමක් ගැනද, ප්‍රජාතන්ත්‍රික විප්ලවය ගැනද නැතහොත් සමාජවාදී විප්ලවය ගැනද යනු පිළිබඳව, අපේ 'සාකච්ඡා සහාකාරයින්ට' හරි වැටහීමක් තිබී නැත. සිය "ආඥදායකත්ව දෙකක්" නැමති සුප්‍රසිද්ධ කෘතියෙන් මේ අවුල් ආරම්භ කළ තැනැත්තා මර්තීනව් සහෝදරයා බව ප්‍රශ්නය පිළිබඳ ලිය කියවිලි කිය වූ අය දනිති. වල්ගවාදියෙකු ලෙස ලිවීමේ ආදර්ශයක් බඳු එයින් (ජනවාරි 9 දිනටත් කලින් පවා)[15] මෙම ප්‍රශ්නය ඉදිරිපත් කර ඇති ආකාරය මෙනෙහි කිරීමට නව ඉස්ක්‍රාවාදීහු මැලිවෙති. එසේ වුවද සාකච්ඡා සභාව කෙරෙහි එය දෘෂ්ඨිමය වශයෙන් බලපෑ බවට සැකයක් නැත.

එහෙත් යෝජනාවේ මාතෘකාව පිළිබඳ දූත් ප්‍රමාණවත්ය. එහි අන්තර්ගතයෙන් බරපතලකම අනුව සම කළ නොහැකි හා ගැඹුරු වැරදි හෙළි කෙරේ. පළමු කොටස මෙසේය:

"සාර්වාදය යටපත් කරන විප්ලවයේ තීරණාත්මක ජයග්‍රහණය ජයග්‍රාහී මහජන නැගිටීමකින් පිහිටුවන තාවකාලික ආණ්ඩුවකින් හෝ කෙලින්ම ඇති වන විප්ලවකාරී මහජන බලපෑම යටතේ මහජන ව්‍යවස්ථාදායක මණ්ඩලයක් පිහිටුවීමට තීරණය කරන, යම්කිසි ආකාරයක මහජන නියෝජිත ආයතනයක විප්ලවීය උද්යෝගයෙන් හෝ සලකනුවීමට ඉඩ තිබේ."

මේ අයුරින්, සාර්වාදය පරාජය කොට විප්ලවයේ තීරණාත්මක ජයග්‍රහණයක් සලකුනු විය හැක්කේ ජයග්‍රාහී ජනතා නැගිටීමකින් හෝ... නියෝජිත ආයතනයක් මගින් ව්‍යවස්ථාදායක මණ්ඩලයක් පිහිටුවීමට



තීරණය කිරීමෙන් යයි අපට, කියා තිබේ! එයින් අදහස් වන්නේ කුමක්ද? අප විසින් එය කෙසේ තේරුම් ගත යුතුද? ව්‍යවස්ථාදායක මණ්ඩලයක් පිහිටුවීමට කරන 'තීරණයකින්' තීරණාත්මක ජයග්‍රහණයක සලකුනු විය හැකි ය?? එසේම එබඳු 'ජයග්‍රහණයක්' 'ජයග්‍රාහී මහජන නැගිටීමකින් බිහිවනු' ඇති තාවකාලික ආණ්ඩුවක් පිහිටුවීම සමඟ සමතැනට දමා ඇත!! ජයග්‍රාහී මහජන නැගිටීමකින් හා තාවකාලික ආණ්ඩුවක් පිහිටුවීමෙන් විප්ලවයේ ජයග්‍රහණය ප්‍රත්‍යක්ෂයෙන් පෙන්වන අතර ව්‍යවස්ථාදායක මණ්ඩලයක් පිහිටුවීමේ 'තීරණයකින්' විප්ලවයේ ජයග්‍රහණය පෙන්වන්නේ වචනයෙන් පමණක් බව සටහන් කර ගැනුමට සාකච්ඡා සභාව අසමත් වී ඇත.

නිතරම ලිබරල්වාදීන් හා අස්වබෂ්ජේනියවාදීන් කරන වරදම නව ඉස්ක්‍රාවාදී මෙන්ෂෙවික්වරුන්ගේ සාකච්ඡා සභාව විසින්ද කර තිබේ. ශක්තිය හා අධිකාරය සාර් සන්තකව තිබීම ගැන ලැජ්ජාවෙන් ඇස්පියා ගනිමින් හා 'ව්‍යවස්ථා සම්පාදනය' පිණිස කෙනෙකුට එසේ කිරීමේ ශක්තිය තිබිය යුතු බව මතක නැති කරමින් අස්වබෂ්ජේනිය කල්ලිය 'ව්‍යවස්ථාදායක' මණ්ඩලයක් ගැන බොළඳ බස් දොඩති. නියෝජිතයන් කවුරුන් වුවද නියෝජිතයන් විසින් ඇති කර ගත් 'තීරණයක්' හා එම තීරණය ඉටු කිරීමත් අතර ලොකු පරතරයක් ඇති බවද සාකච්ඡා සභාව විසින් අමතක කොට ඇත. එමෙන්ම 1848 ජර්මන් විප්ලව ඉතිහාසයේ ප්‍රකට සිද්ධියක් වන ප්‍රැන්ක්පර්ට් පාර්ලිමේන්තුවේ[16] 'තීරණ' වලට අත්වූ ඉරණම පරිද්දෙන්ම, සාර් රජු අත බලය රඳන තාක් කල් නියෝජිතයන් විසින් සම්මත කරගනු ලබන කුමන තීරණයක් වුවද, නිස්සාර පල රහිත බොළඳ කතාවක් ලෙසින් පවත්නා බවද තවදුරටත් ඔවුන්ට අමතක වී ඇත. විප්ලවකාරී නිර්ධන පංතියේ නියෝජිතයාවූ මාක්ස් ඔහුගේ "නව රයින් පත්‍රය"[17] නමැති පුවත් පතෙන් 'අස්වබෂ්ජේනිය පන්නයේ' ලිබරල්වාදීන් නිර්දය අවඥවට හසු කරමින් පහර ගැසුවේය. ඔහු එසේ කළේ ඔවුන් විසිතුරු වචන උච්චාරණය කරමින් නොයෙකුත් ප්‍රජාතන්ත්‍රික 'තීරණ' ගනිමින් නොයෙකුත් වර්ගවල නිදහස "පැනැවූ" අතරම, නියම වශයෙන් බලය රජු අතම රැඳෙන්නට ඉඩහැර රජුගේ යුද හමුදාවනට විරුද්ධව අවිගත් සටනක් සංවිධානය කිරීමට අසමත් වූ හෙයිනි. එනිසා ප්‍රැන්ක්පර්ට් "අස්වබෂ්ජේනිය" පන්නයේ ලිබරල්වාදීන් බොළඳ කතාවල යෙදෙද්දී, රජු අවස්ථාව ප්‍රයෝජනයට ගෙන නියම බලය ගැන විශ්වාසය තබමින් තම හමුද හා ප්‍රතිවිප්ලවය ශක්තිමත් කොට ප්‍රජාතන්ත්‍රිකයන් ඔවුන්ගේ විසිතුරු 'තීරණ' සමගම අතුගා දැම්මේය.

සාකච්ඡා සභාව විසින් ජයග්‍රහණයට අත්‍යවශ්‍ය වන තත්ත්වය නොමැති දෙයම, තීරණාත්මක ජයග්‍රහණයක් හා සම කරනු ලබයි. අපේ පක්ෂයේ සමූහාණ්ඩු වැඩ සටහන පිළිගන්නා සමාජ-ප්‍රජාතන්ත්‍රවාදීන් එබඳු වරදක් කළ හැකි වූයේ කෙසේද? මෙම අද්භූත සිද්ධිය අවබෝධ කරගනු සඳහා පක්ෂයෙන් ඉවත්වූ කණ්ඩායම පිළිබඳව තුන්වැනි සම්මේලනයේ යෝජනාව* දෙස අපි හැරී බැලිය යුතු වෙමු. '''ආර්ථිකවාදයට' නැකම් ඇති'' විවිධ නැඹුරුවීම් අපේ පක්ෂය තුළ පැවති බවට එහි සඳහන් වෙයි. අපේ සාකච්ඡා සභාකාරයින් (ඔවුන් මර්තිනව්ගේ දෘෂ්ටිමය මග පෙන්වීම යටතේ

---

* අපි යෝජනාව සම්පූර්ණයෙන්ම උපුටා දක්වමු: '''ආර්ථිකවාදය'ට විරුද්ධව පක්ෂය සටන් කළ කාලයේ සිටම විවිධ ප්‍රමාණයන්ගෙන් හා අංශවලින් ආර්ථිකවාදයට නැකම් කියන්නාවූද, නිර්ධන පංති විප්ලවයේ පංති හැඟීමෙන් යුත් කොටස්වල වැදගත්කම ලඝු කොට එය නිසගත්වයේ අංගයකට අවනත කිරීමට පොදු නැඹුරුවක් පෙන්නුම් කරන්නාවූද, ඇතැම් ප්‍රවනතා රු. ස. ප්‍ර. ක. ප. තුළ ඉතිරිවූ බව සම්මේලනය වාර්තා ගත කරයි. සංවිධාන පිළිබඳ ප්‍රශ්නවලදී මෙම ප්‍රවනතාවන්හි නියෝජිතයෝ ක්‍රමානුකූලව ගෙන යන පක්ෂ කටයුතු සමග නොගැලපෙන ක්‍රියාදාමයක් මත සංවිධානයේ මූලධර්මය න්‍යායිකව ඉදිරිපත් කරති. ඔවුහු ව්‍යවහාරයේදී බොහෝ අවස්ථාවල ක්‍රමානුකූලව පක්ෂ විනයෙන් ඉවතට යති. වෙනත් අවස්ථාවන්හි රුසියානු ජීවිතයේ වාස්තවික තත්ත්වයන් නොසලකා ඡන්දයෙන් තේරීමේ මූලධර්මය පුළුල්ව යෙදීම පක්ෂයේ ඉතාමත්ම අඩු අවබෝධයක් සහිත කොටසට දේශනා කරති. ඒ නයින් වර්තමානයේ පැවැතිය හැකි පක්ෂ සබඳතාවල එකම පදනම දුර්වල කිරීමට උත්සාහ ගනිති. උපක්‍රමික ප්‍රශ්න වලදී පක්ෂ කටයුතු වල විෂය ක්ෂේත්‍රය පටු කිරීමට ලැදියාවක් පෙන්නුම් කරන ඔව්හු ලිබරල් ධනපති පක්ෂ සම්බන්ධයෙන් පක්ෂය අනුගමනය කරන සම්පූර්ණයෙන් ස්වාධීනවූ උපක්‍රමයන්ට ඔවුන්ගේ විරුද්ධත්වය ප්‍රකාශ කරති. ජනතා නැගිටීමෙහිදී සංවිධායකගේ කාර්ය භාරය අප පක්ෂයට ලබාගත නොහැකි යයිද එය ලබා ගැනීම උචිත නොවේ යැයිද, කියා සිටින ඔවුහු කුමන තත්ත්වයක් යටතේ වුව ප්‍රජාතන්ත්‍රික — විප්ලවකාරී තාවකාලික ආණ්ඩුවකට අප පක්ෂය සහභාගී වීමට විරුද්ධ වෙති.

''විප්ලවීය සමාජ-ප්‍රජාතන්ත්‍රවාදයේ මූලධර්ම වලින් එබඳු අර්ධ-පිටපැනීම් වලට විරුද්ධව දෘෂ්ටිමය අරගලයක් ගෙන යන ලෙස සම්මේලනය හැම තැනම සිටින සියළුම පාක්ෂිකයන්ට උපදෙස් දෙයි. කෙසේ වෙතත්, ඒ සමගම පක්ෂ සම්මේලනය හා පක්ෂ නීතිරීති පිළිපදිමින් පක්ෂ විනයට සහමුලින්ම අවනත වීමේ අනිවාර්ය කොන්දේසිය යටතේ කිනම් ප්‍රමාණයකට හෝ එබඳු අදහස් දරන්නවුන් හට පක්ෂ සංවිධානයන්හි සිටිය හැකි යයිද සම්මේලනයේ අදහසයි.'' (1907 මුද්‍රණයට කර්තෘගේ සටහන. — සංස්කාරක)



සිටින්නේ අහම්බෙන් නොවේ) විප්ලවය ගැන කථා කරන්නේ 'ආර්ථිකවාදීන්' දේශපාලන සටන හෝ පැය අටක දිනය හෝ ගැන කථා කළ ආකාරයට මදක්වත් නොවෙනස්වය. 'ආර්ථිකවාදීහු' එක්වරම 1) අයිතිවාසිකම් සඳහා සටන් කිරීම; 2) දේශපාලන උද්ඝෝෂණය; 3) දේශපාලන සටන, — හෝ 1) පැය 10 ක දිනයක්; 2) පැය 9 ක දිනයක්; 3) පැය 8 ක දිනයක් ආදී වශයෙන් 'අවස්ථා පිළිබඳ න්‍යායය' ඉදිරියට ගෙන ගියහ. මෙම 'ක්‍රියාදාමයක් ලෙස වූ උපක්‍රම' වල ප්‍රතිඵල සෑහෙන තරම්න් කා අතරත් ප්‍රකටය. මෙනයින් විප්ලවයද කල් තබාම පැහැදිලි අවස්ථාවලට බෙදීමට ඔව්හු අපට ආරාධනා කරති. ඒ අනුව 1) සාර් රජු විසින් නියෝජිත ආයතනයක් කැඳවීම; 2) මෙම ආයතනය විසින් 'ජනතාවගේ' බලපෑම යටතේ ව්‍යවස්ථාදායක මණ්ඩලයක් පිහිටුවීමට 'තීරණය කරනු ලැබීම'; 3) ... අවස්ථා වෙන්කර ඇති අතර තුන්වැනි අවස්ථාව පිළිබඳව මෙන්ෂෙවික්වරුන් තවමත් තමන් අතර එකඟත්වයකට පැමිණ නැත. මහජනයාගේ විප්ලවකාරී බලපෑමට විරුද්ධව සාර්වාදයේ ප්‍රතිවිප්ලවවාදී බලපෑම නැගෙනු ඇති බවත්, එහෙයින් 'තීරණය' ක්‍රියාවට නොනැගී තිබීම හෝ නැතහොත් මහජන නැගිටීමේ ජයග්‍රහණය හෝ පරාජය විසින් අවසානයේදී ප්‍රශ්නය විසඳන බවත් ඔවුන් විසින් අමතක කර තිබේ. සාකච්ඡා සභාවේ යෝජනාව 'අර්ථිකවාදීන්'ගේ මතු සඳහන් තර්කයම උපුටා දැක්වීමකි. එම තර්කය මෙයයි: විප්ලවකාරී මගකින් පැය 8 ක දිනයක් ලබා ගැනීමෙන් හෝ පැය 10 ක දිනයක් දීමෙන් හා පැය 9 ක දිනයකට මාරු වීමේ තීරණයක්' දීමෙන් කම්කරුවන්ගේ තීරණාත්මක ජයග්‍රහණයක් ලැබිය හැක. මේ හරියටම අනුපිටපත් තැබීමකි.

ජනතා නැගිටීමක ජයග්‍රහණය සාර් රජු විසින් කැඳවූ නියෝජිත ආයතනයක 'තීරණය' හා සමගම <u>සමතැන තැබීමට</u> යෝජනාව සකස් කළ වුන් අදහස් නොකළ බවත්, ඔවුනට ඕනෑ කළේ අවස්ථා දෙකෙහිදීම පක්ෂ උපක්‍රමවලට ඉඩ සැලසීම පමණක් බවත් කියා මෙහිදී විරෝධයක් පෑමට පුළුවන.ඊට අප දෙන පිළිතුරු මෙසේය:1) නියෝජිත ආයතනයක <u>තීරණය</u> 'සාර්වාදය පරදවා විප්ලවය ලබන තීරණාත්මක ජයග්‍රහණයක්' ලෙස යෝජනාවේ අඩංගු වචනවලින් පැහැදිලිව හා නිරවුල්ව විස්තර වෙයි. ඇතැම්විට එය නොසැලකිලිමත් ලෙස වචන යෙදීම නිසා ඇති වූවක් විය හැකිය. ඇතැම්විට එය වාර්තාව පරීක්ෂා කිරීමෙන් පසුව නිවැරදි කිරීමටද පුළුවන් වනු ඇත. එහෙත් එය නිවැරදි කරන තෙක් දැනට තිබෙන වචන අනුව ගත හැක්කේ එක් තේරුමක් පමණි. එම තේරුම <u>අස්වබෂ්ජේනියවාදීන්ගේ</u>

තර්කණයට සම්පූර්ණයෙන් අනුකූල වෙයි. 2) යෝජනාව සකස් කළවුන් තල්ලුවී ගොස් තිබෙන 'අස්වබෂ්ජේනිය' තර්කණය නව ඉස්ක්‍රා කල්ලියේ වෙනත් ලිපි ලේඛනවලින් වඩාත් පැහැදිලිව කැපී පෙනේ. නිදසුනක් දක්වතොත් තිප්ලිස් කමිටුවේ ප්‍රචාරක පත්‍රය වන (ජෝර්ජියානු භාෂාවෙන් මුද්‍රිත) ''සමාජ-ප්‍රජාතන්ත්‍රිකයා''[18] පත්‍රයේ ''සෙම්ස්කි සබෝර් (ජාතික මණ්ඩලය — සංස්කාරක) හා අපේ උපක්‍රම'' යන හිසින් පලවූ (''ඉස්ක්‍රා'' පත්‍රයේ 100 කලාපයෙන් ප්‍රශංසා කරන ලද) ලිපිය කෙතෙක් දුරට ගොස් තිබේද යත් ''සෙම්සකි සබෝර් (මෙය පිහිටුවීම ගැන තවමත් නිශ්චිත කිසිවක් දැනගන්න නැති බව අප කිව යුතුය!) අපේ ක්‍රියාකාරිත්වයේ කේන්ද්‍රය කරන'' 'උපක්‍රම' ජනතා නැගිටීමක් හා විප්ලවකාරී තාවකාලික ආණ්ඩුවක් පිහිටුවීමේ 'උපක්‍රම'වලට 'වඩා බොහෝ වාසිදයකය'යි ඉන් ප්‍රකාශ කරයි. අපි මතුවට මේ ලිපිය ගැන නැවතත් කරුණු දක්වන්නෙමු. 3) විප්ලවය ජයග්‍රහණය කළවිට හා එය පරාජය වූ විටත්, එසේම ජනතා නැගිටීම සාර්ථක වූ විට හා විශාල බලවේගයක් ලෙසින් වැඩී යාමට එය අසමත් වූ විටත්, පක්ෂය විසින් පිළිපැදිය යුතු උපක්‍රම පිළිබඳව මූලික සාකච්ඡාවකට විරෝධය පාන්නට නොහැකිය. ලිබරල්වාදී ධනපති පංතිය සමග එකඟත්වයකට පැමිණෙනු සඳහා නියෝජිත මණ්ඩලයක් ඇති කිරීමට සාර් ආණ්ඩුව සමත් වන්නට ඉඩ තිබේ. එම ඉඩකඩ පිළිබඳව සඳහන් කරන තුන්වැනි සම්මේලනයේ යෝජනාව 'කුහක ප්‍රතිපත්තිය', 'ව්‍යාජ ප්‍රජාතන්ත්‍රවාදය' හා 'රීගියා සෙම්ස්කි සබෝර් වැනි මහජන නියෝජිතත්වය පිළිබඳ රැවටිලි'. ගැන පැහැදිලිව කියයි.* එහෙත් කාරණය වනුයේ මෙය විප්ලවකාරී

* විප්ලවාසන්නයේ ආණ්ඩුවේ උපක්‍රම කෙරෙහි දක්වන ආකල්පය පිළිබඳ මෙම යෝජනාව මෙසේය:

''වර්තමාන විප්ලවීය කාලයෙහිදී ආණ්ඩුව ආත්මාරක්ෂක හේතු සඳහා ප්‍රධාන කොට නිර්ධන පංතියේ පංති හැඟීමෙන් යුත් කොටස්වලට විරුද්ධව එල්ලවූ සාමාන්‍ය මර්දන පියවර උත්සන්න කරන අතරම 1) සහන හා ප්‍රතිසංස්කරණ පිළිබඳ පොරොන්දු මගින් කම්කරු පංතිය දූෂ්‍ය කොට ඒ මගින් ඔවුන් විප්ලවීය අරගලයෙන් බැහැර කිරීමටද; 2) එම අරමුණ සහිතවම තමන්ගේ කුහක සහන ප්‍රතිපත්තිය තම නියෝජිතයන් කොමිෂන් වලට හා සාකච්ඡාවලට පත් කරන මෙන් කම්කරුවන්ට කරන ආයාචනා වල සිට රීණියා සෙම්ස්කි සබෝර් වැනි මහජන නියෝජනය පිළිබඳ රැවටිල්ලක් පිහිටුවීම දක්වාවූ ව්‍යාජ-ප්‍රජාතන්ත්‍රික කඩතුරා වලින් වසන බැවින්ද; 3) රීණියා කළු සියය[19] සංවිධානය කරමින් පොදුවේ ප්‍රතිගාමී නූගත් හෝ ගොත්‍රික හෝ



තාවකාලික ආණ්ඩුවක් පිළිබඳ යෝජනාවේ සඳහන් කර නොතිබීමයි. ඊට විප්ලවකාරී තාවකාලික ආණ්ඩුවක් සමග කිසිදු සම්බන්ධයක් නොතිබූ බැවිනි. මේ අවස්ථාව ජනතා නැගිටීමක් පිළිබඳ ප්‍රශ්නය හා විප්ලවකාරී තාවකාලික ආණ්ඩුවක් පිහිටුවීම පිළිබඳ ප්‍රශ්නය කල් දමන්නකි. වෙනස් කරන්නකි. දැනට ප්‍රශ්නයට මුල්වී ඇති කරුණ වනුයේ නොයෙකුත් සංයෝජනවලට ඉඩ ඇති බව වත්, ජය පරාජය දෙකටම ඉඩ තිබෙන බව වත්, ඍජු හෝ වක්‍ර මාර්ග තිබෙන බව වත් නොවේ. කාරණය නම්, නියම විප්ලවීය මාර්ගය සම්බන්ධයෙන් කම්කරුවන්ගේ සිත් තුළ අවුලක් ඇති කිරීමට සමාජ-ප්‍රජාතන්ත්‍රිකයෙකුට අවසර නැති බවය. එමෙන්ම අස්වබෂ්ජේනිය කරන්නාක් මෙන් ජයග්‍රහණයේ ප්‍රධාන අවශ්‍යතාවය හිඟවූ කිසිවක් ලෙස නිරූපනය කිරීමට අවසර නැති බවයි. අපට ලැබෙන්නට ඇති, පැය අටේ දිනය පවා එක්වරම නොව, දීර්ඝ වක්‍ර ක්‍රමයකින් පමණක් ලැබෙන්නට පුළුවන. එහෙත්, දිග් ගැස්සීමට, ප්‍රමාදයට, අතපසු කිරීමට, ද්‍රෝහි බවට, හා ප්‍රතිගාමීත්වයට විරුද්ධව කටයුතු කිරීමට නිර්ධන පංතිය අසමත් කරවන, එබඳු බෙලහීනයක්, එබඳු දුර්වල කමක්, යම්කිසිවකු විසින් කම්කරුවන්ගේ ජයග්‍රහණයක් ලෙසින් හඳුන්වනු

ආගමික වෛරයෙන් අණ්ඩවූ සකල ජන කොටස් විප්ලවයට විරුද්ධව උසිගන්වන හෙයින්ද, —

අ) ආණ්ඩුවේ සහනවල ප්‍රතිගාමී අර්ථය හෙළිදරව් කරන අතරම එක් අතකින් මෙම සහන බලයෙන් උදුරා ගත් බවත්, අනෙක් අතට නිර්ධන පංතියට තෘප්තිමත් විය හැකි සහන සැලසීමට ඒකාධිපත්‍යයට කිසිසේත්ම නොහැකි බවත්, තම ප්‍රචාරය හා උද්ඝෝෂණයෙහිදී අවධාරනය කරන මෙන්ද;

ආ) මැතිවරණ ව්‍යාපාරය වාසියට යොදු ගනිමින් ආණ්ඩුවේ මෙම පියවරයන්හි සැබෑ වැදගත්කමද, සර්වජන හා සමාන ඡන්දය ඍජු මැතිවරණ හා රහස් ඡන්දය පදනම්වූ ව්‍යවස්ථාදයක මණ්ඩලයක් විප්ලවකාරී මාර්ගයෙන් කැඳවීම නිර්ධන පංතියේ අවශ්‍යතාවයක් බව කම්කරුවන්ට පහදු දෙන මෙන්ද;

ඇ) පැය අට වැඩ දිනය හා කම්කරු පංතියේ සෙසු ක්ෂණික ඉල්ලීම් විප්ලවකාරී ආකාරයකින් වහාම දිනාගනු සඳහා කම්කරු පංතිය සංවිධානය කරන මෙන්ද;

ඇ) කළු සියයේ කටයුතුවලට විරුද්ධව හා පොදුවේ ආණ්ඩුවේ නායකත්වය යුත් සියලු ප්‍රතිගාමී කොටස් වලට විරුද්ධව සන්නද්ධ ප්‍රතිරෝධය සංවිධානය කරන මෙන්ද —

රු. ස. ප්‍ර. ක. පක්ෂයේ තුන්වන සම්මේලනය සියලු පක්ෂ සංවිධාන වලින් ඉල්ලා යැවීමට තීරණය කරයි.'' (1907 මුද්‍රණයට කර්තෘගේ සටහන. — සංස්කාරක)

ලබන්නේ නම්, ඔහු ගැන කිව යුත්තේ කුමක්ද? වරක් ''වපිරියොද්''* පත්‍රයේ සඳහන්වූ පරිදි රුසියානු විප්ලවය 'අසාර්ථක ආණ්ඩු ක්‍රමයකින්' අවසන් වන්නටද ඉඩ තිබේ. එහෙත් මේ නිසා තීරණාත්මක සටනක ආරම්භයේදී මේ අසාර්ථකත්වය, 'සාර්වාදය යටපත් කරන තීරණාත්මක ජයග්‍රහණයක්' ලෙසින් සමාජ-ප්‍රජාතන්ත්‍රවාදියෙකු විසින් හඳුන්වනු ලැබීම යුක්ති සහගත කළ හැකිද? තත්ත්වය වඩාත් නරක් වුවහොත්, අපට සමූහාණ්ඩුවක් ලබා ගැනීමට බැරිවනු පමණක් නොව අපට ලැබෙන ආණ්ඩු ක්‍රමය පවා 'ෂීපොව්[20] ක්‍රමයේ' ව්‍යාජ එකක් වන්නට ඉඩ ඇත. එහෙත් සමූහාණ්ඩුවක් සඳහා ඉදිරියට ගෙන යන අපේ සටන් පාඨය සමාජ-ප්‍රජාතන්ත්‍රිකයෙකු විසින් අවඥාවට ලක් කරනු ලැබීම සමාව දිය හැකි දෙයක්ද?

ඇත්තෙන්ම නව ඉස්ක්‍රාවාදීන් සැර බාල කිරීමට තරම් තවමත් දුරගොස් නැත. එහෙත් සියල්ලටම වඩා ඔවුන්ගේ යෝජනාවෙහි සමූහාණ්ඩුව පිළිබඳව වචනයක්වත් සඳහන් කිරීමට අමතක වී තිබීමෙන්, විප්ලවීය ජීවය ඔවුන්ගෙන් ඇත්වී ඇති තරම, අප්‍රාණික පුහු සෝෂා පටලය නිසා, අවස්ථාවේ සටන්කාමී කටයුතු ගැන ඔවුන්ගේ ඇස් වැසී ඇති තරම, ඉතා මැනවින් පෙන්නුම් කෙරේ. එය විශ්වාස කළ නොහැකි තරම්ය. එහෙත් ඒ සත්‍යයකි. සාකච්ඡා සභාවේ නොයෙකුත් යෝජනාවලින් සමාජ-ප්‍රජාතන්ත්‍රවාදී සියලු සටන් පාඨ යළි යළිත් සඳහන් කරමින්, පැහැදිලි කර දෙමින්, අනුමත කරමින් ඉදිරිපත් කර ඇත. කම්කරුවන් විසින් කර්මාන්ත ශාලා අංශ ප්‍රධානීන් හා මන්ත්‍රීවරුන් තෝරා පත්කර ගැනීම පවා අමතක කර නැත. එහෙත් විප්ලවකාරී තාවකාලික ආණ්ඩුවක් පිළිබඳ යෝජනාවක, සමූහාණ්ඩුව ගැන සඳහන් කිරීමට ඔවුනට නිකමටවත් ඉඩක් ලැබී නැත. මහජන නැගිටුමක 'ජයග්‍රහණය' හා තාවකාලික ආණ්ඩුවක් පිහිටුවීම ගැන කතාකරන නමුත්, මෙම 'පියවර' හා ක්‍රියාවන් සමූහාණ්ඩුවක් දිනාගැනීම සමග කෙසේ සම්බන්ධ වේද යි නොදැක්වීමෙන් —

---

* ජිනීවා හි පළ කරන ලද ''වපිරියොද්'' පුවත්පත පක්ෂයේ බොල්ෂෙවික් කණ්ඩායමේ නිල පුවත්පත ලෙස 1905 දී පළ වන්නට පටන් ගත්තාය. ජනවාරි සිට මැයි දක්වා කලාප 15 ක් පළවිය. රු.ස.ප්‍ර.ක. පක්ෂයේ තුන්වන සම්මේලනය විසින් ගත් තීරණයක් පරිදි මැයි මාසයේදී ''වපිරියොද්'' වෙනුවට රු.ස.ප්‍ර.ක. පක්ෂයේ නිල පුවත්පත ලෙස ''ප්‍රොලිතාරි'' පළවිය. (මෙම සම්මේලනය මැයි මස තුළ ලන්ඩන් නගරයේදී පැවතුනි. මෙන්ෂෙවික්වරු ඊට සහභාගි නොවූ අතර, ඔව්හු ජිනීවාහි තමන්ගේම 'සාකච්ඡා සභාවක්' පැවැත්වූහ), (1907 මුද්‍රණයට කර්තෘගේ සටහන. — සංසකාරක)



අදහස් වන්නේ නිර්ධන පංති සටනට මග පෙන්වීම සඳහා යෝජනාවක් සකස් කිරීම නොව, නිර්ධන පංති ව්‍යාපාරයේ වලිග කොනේ බඩගෑම සඳහා යෝජනාවක් සකස් කිරීමය.

සාරාංශ වශයෙන් මෙසේ දැක්විය හැකිය: යෝජනාවේ පළමුවෙනි කොටසෙන් — 1) සමූහාණ්ඩුවක් දිනා ගැනීම සඳහා සටන් කිරීමත් නියම වශයෙන්ම පොදු ජනවූත් නියම වශයෙන්ම ව්‍යවස්ථාදායක වූත් මණ්ඩලයක් පිහිටුවා ගැනීමත් සම්බන්ධයෙන් විප්ලවකාරී තාවකාලික ආණ්ඩුවක ඇති වැදගත්කම ගැන කිසිම කතු පැහැදිලි කිරීමක් කර නැත; 2) නියම ජයග්‍රහණයක ප්‍රධාන අත්‍යවශ්‍යතාවයක්ම නොමැතිවූ වැඩ පිළිවෙළක් සාර්වාදය පරදවා විප්ලවය ලබන තීරණාත්මක ජයග්‍රහණයක් හා සමග සමතැනලා දැක්වීමෙන් නිර්ධන පංතියේ ප්‍රජාතන්ත්‍රික විඥානය අවුල් කර තිබේ.

## 4. රාජාණ්ඩු ක්‍රමය අහෝසි කිරීම. සමූහාණ්ඩුව

අපි දැන් යෝජනාවේ මීළඟ කොටස ගෙන බලමු:

''... ඒ දෙආකාරයෙන්ම, එබඳු ජයග්‍රහණයකින්, විප්ලවීය යුගයේ අලුත් අවස්ථාවක් අරඹනු ඇත.

''මේ අලුත් අවස්ථාවේදී, සමාජ සංවර්ධනයේ වාස්තවික තත්ත්වයන් තුළින් නිසගයෙන් මතු කරන කටයුත්ත නම්, ස්වකීය සමාජමය අභිප්‍රායයන් මුදුන් පමුණුවා ගැනීම හා කෙලින්ම බලය ඇල්ලීම සඳහා, දේශපාලන විමුක්තිය ලැබූ ධනපති සමාජයේ කොටස් අතර කෙරෙන අන්‍යෝන්‍ය අරගල ක්‍රියාදාමයේදී රාජාණ්ඩුවේ හා ඉඩම්හිමි සමාජ පංතීන්ගේ සමස්ත පාලනයම, අවසන් වරට අහෝසි කිරීමයි.

''එහෙයින්, ඓතිහාසික ස්වභාවය විසින් ධනපති පංතික විප්ලවයක් වන මෙම විප්ලවයේ කටයුතු ඉටු කිරීම භාර ගන්නා තාවකාලික ආණ්ඩුවට විමුක්ති ක්‍රියාදාමයේ යෙදී සිටින ජාතියක් තුළ සිටින ප්‍රතිවිරුද්ධ පංතීන්ගේ අන්‍යෝන්‍ය අරගලය හැසිරවීමෙහිදී, විප්ලවීය සංවර්ධනය තව දුරටත් ඉදිරියට තල්ලු කිරීම පමණක් නොව, ධනපති ක්‍රමයේ පදනමට තර්ජනයක්ව එම වර්ධනය තුළ පවත්නා සාධකයන්ට විරුද්ධවද සටන් කිරීමට සිදුවනු ඇත''.

යෝජනාවේ ස්වාධීන කොටසක් වන මෙම ඡේදය අපි පරීක්ෂා කර බලමු. ඉහත පළවූ තර්කවල ගැබ්වූ ප්‍රධාන අදහස, සම්මේලන යෝජනාවේ තුන්වැනි ඡේදයේ සඳහන් කර ඇති අදහසට ගැලපේ. එහෙත් යෝජනා දෙකේ මෙම කොටස් එකිනෙකට සංසන්දනය කරන විට, පහත සඳහන් මූලික වෙනස එක්වරටම කැපී

පෙනේ. විප්ලවයේ සමාජ හා ආර්ථික පදනම සංක්ෂිප්තව විස්තර කරන සම්මේලන යෝජනාව නිශ්චිත වාසි සඳහා පංතීන් විසින් කරනු ලබන පැහැදිලි සටන් කෙරෙහි සම්පූර්ණයෙන්ම අවධානය යොමු කරමින්, නිර්ධන පංතියේ සටන්කාමී කටයුතු ඉදිරියෙන්ම තබයි. විප්ලවයේ සමාජ හා ආර්ථික පදනම පිළිබඳව දීර්ඝ, නොපැහැදිලි හා අවුල් සහිත විස්තරයක් ඉදිරිපත් කරන සාකච්ඡා සභාවේ යෝජනාව නිශ්චිත වාසි සඳහා කරන සටනක් ගැන කරුණු ඉතා නොපැහැදිලි ලෙස සඳහන් කරමින් නිර්ධන පංතියේ සටන්කාමී කටයුතු මුළුමනින්ම අඳුරේ තබයි. සමාජයේ විවිධ කොටස් අතර කෙරෙන අන්‍යොන්‍ය අරගල ක්‍රියාදාමයක යෙදී සිටින පැරණි සමාජ ක්‍රමය ගැන සාකච්ඡා සභා යෝජනාවෙන් කියවේ. නිර්ධන පංතියේ පක්ෂය වන අප විසින් එම අහෝසි කිරීම කළ යුතුය, පැරණි සමාජ ක්‍රමය නියත වශයෙන්ම අහෝසි වනුයේ ප්‍රජාතන්ත්‍රවාදී සමූහාණ්ඩුවක් පිහිටුවීමෙන් පමණය; එම සමූහාණ්ඩුව අප විසින් දිනාගත යුතුය; ඒ සඳහාත් සම්පූර්ණ විමුක්තිය ළඟා කරගනු සඳහාත් අත්තනෝමතික රාජාණ්ඩුවට පමණක් නොව, අපේ ජයග්‍රහණ උදුරා ගැනීමට තැත් කරන අවස්ථාවලදී (එසේ තැත් කරන බව සහතික බැවින්) ධනපති පංතියටද විරුද්ධව සටන් කළ යුතුය යනුවෙන් සම්මේලන යෝජනාව කියයි. නිශ්චිත ලෙස හඳුන්වනු ලබන ක්ෂණික අරමුණක් සඳහා සටනක් ගෙන යන ලෙස සම්මේලන යෝජනාව නිශ්චිත පංතියකට කියා සිටී සාකච්ඡා සභා යෝජනාව විවිධ බලවේගයන්ගේ අන්‍යොන්‍ය සටනක් ගැන දේශනා කරයි. එක් යෝජනාවක් ක්‍රියාශීලී සටනේ මනෝභාවය ප්‍රකාශ කරයි. අනික් යෝජනාව උදාසීනව බලාසිටින්නෙකුගේ මනෝභාවය ප්‍රකාශ කරයි. එක් යෝජනාවක් උද්‍යෝගී ප්‍රාණවත් සටනක් සඳහා නගන හඬින් පිරී ඇත. අනෙක අප්‍රාණික පුරසාරම්වලින් පිරී ඇත. වර්තමාන විප්ලවය අපේ පළමු පියවර පමණක් බවත්, ඉන්පසුව දෙවැනි පියවරක් ඇති බවත්, යෝජනා දෙකෙන්ම ප්‍රකාශ වේ. එහෙත් ඒ අනුව එක් යෝජනාවකින් කෙරෙන නිගමනය නම්, අප විසින් හැකි තරම් ඉක්මනින් පළමු පියවර තබා, හැකි තරම් ඉක්මනින් එය අවසන් කොට සමූහාණ්ඩුවක් දිනාගෙන, ප්‍රතිවිප්ලවය නිර්දය ලෙස මැඩ දෙවැනි පියවර සඳහා පසුබිම සකස් කිරීමය එහෙත් අනෙක් පළමු පියවර ගැන සාටෝප විස්තර දක්වන යෝජනාව (රළු යෙදුම ගැන කමන්න) පසුව එයම වමාරා කයි. සම්මේලන යෝජනාව (ප්‍රජාතන්ත්‍රවාදී විප්ලවයේ ධනපති පංතික ස්වභාවය ගැන) මාක්ස්වාදයේ පැරණි හා සද අලුත් වන අදහස් සිය පූර්විකාව හෙවත් පූර්වාවයවය කර ගනී. ප්‍රජාතන්ත්‍රවාදී විප්ලවය හා සමාජවාදී



විප්ලවය යන දෙකම සඳහා සටන් කරන ප්‍රගතිශීලී පංතියේ ප්‍රගතිශීලී කටයුතු පිළිබඳ නිගමනවලට ඒ අනුව එළඹෙයි. සාකච්ඡා සභාවේ යෝජනාව පූර්විකාවෙන් ඔබ්බට නොගොස් එය හප හපා හපන්කම පෙන්නීමට උත්සාහ දරයි.

නීත්‍යානුකූල මාක්ස්වාදය[21] පැවති අතීතයේ සටන්කාමී හා සදාචාර අංශ ලෙසින්ද, නැගී එන බහුජන ව්‍යාපාර සමයේ ආර්ථික හා දේශපාලන අංශ යනුවෙන්ද රුසියානු මාක්ස්වාදීන් දිගු කලක් තිස්සේ අංශ දෙකකට වෙන්කර තැබුයේ මෙම වෙනසම විසිනි. පොදු වශයෙන් පංති සටනේත්, විශේෂයෙන් ආර්ථික සටනේත් ගැඹුරට කා වැදී ගිය ආර්ථික මුල් සම්බන්ධ නිවැරදි මාක්ස්වාදී පූර්වාවයවයෙන් තනි නිගමනයකට එළඹී ආර්ථිකවාදීහු, දේශපාලන අරගලය අතහැර, එහි වැඩීමට බාධා කොට, එහි ඉඩකඩ පටු කරමින්, එහි අරමුණු අඩු කළ යුතු යයි කීහ. අනෙක් අතට දේශපාලන අංශය එම පූර්වාවයවය අනුවම වෙනස් නිගමනයකට පැමිණියහ. එනම්, වර්තමානයේ අපේ සටනේ මුල් වඩ වඩා ගැඹුරට කා වැදුනු තරමට, අප විසින් වඩාත් විශාල අධිෂ්ඨානයකින් හා උනන්දුවකින් යුතුව වඩ වඩා පුළුල් ලෙස හා නිර්භීත ලෙස මෙම සටන කළ යුතු යැයි ඔව්හු කීහ. අද අප ඉදිරියේද ඇත්තේ එම අර්බුදයමයි. එහෙත් එය මතුවී ඇත්තේ වෙනස් පරිසරයක් තුළ, වෙනස් ස්වරූපයකිනි. ප්‍රජාතන්ත්‍රික විප්ලවය, සමාජවාදී විප්ලවයකට බොහෝ වෙනස්ය; ඒ ගැන 'උනන්දුවන්නවුන්' වන්නේ දුප්පත් හා අගහිඟයෙන් පෙළෙන්නවුන් පමණක් නොවේය සහ එය සමස්ත ධනපති පංතියේ වෙනස් කළ නොහැකි අපේක්ෂාවන් හා ඕනෑ එපාකම් තුළ ගැඹුරට මුල් විහිදී ගොස් ඇත යන පූර්වාවයවයන්ගෙන් අප බැසගන්නා නිගමණය වන්නේ ඉදිරියෙන් සිටින පංතිය විසින් ස්වකීය ප්‍රජාතන්ත්‍රික අරමුණු වඩාත් නිර්භීතව සකස් කොට, ඒවා වඩාත් තියුණු ලෙස හා සම්පූර්ණ ලෙස ප්‍රකාශ කරමින්, සමූහාණ්ඩුවක් පිළිබඳ ක්ෂණික සටන් පාඨය පෙරට දමා විප්ලවකාරී තාවකාලික ආණ්ඩුවක අවශ්‍යතාවය හා ප්‍රතිවිප්ලවය නිර්දය ලෙස මැඩීමේ අවශ්‍යතාවය පිළිබඳ අදහස ජනප්‍රිය කරවිය යුතු බවය. කෙසේවෙතත්, අපේ විරුද්ධවාදීන් වූ නව ඉස්ක්‍රාවාදීන් ඒම පූර්වාවයවයන්ගෙන්ම බැසගන්නා නිගමනය වන්නේ ප්‍රජාතන්ත්‍රික තීරණ සම්පූර්ණයෙන්ම ප්‍රකට නොකළ යුතුය, සමූහාණ්ඩුවක් පිළිබඳ සටන් පාඨය, ව්‍යවහාරික සටන් පාඨ කෙරෙන් බැහැර කළ හැකිය, අපට විප්ලවකාරී තාවකාලික ආණ්ඩුවක් අවශ්‍යය යන අදහස ජනප්‍රිය කිරීමෙන් වැළකී සිටිය හැකිය, ව්‍යවස්ථාදායක මණ්ඩලයක් කැඳවීමට ගන්නා හුදු තීරණයම තීරණාත්මක ජයග්‍රහණයක් වශයෙන්

නම් කළ හැකිය, ප්‍රතිවිප්ලවයට විරුද්ධව සටන් කිරීමේ කටයුත්ත අපේ ක්‍රියාශීලී අරමුණ ලෙසින් ඉදිරියට ගෙනයාම අනවශ්‍ය වන අතර එය 'අන්‍යොන්‍ය සටන් ක්‍රියාදමයක්' ගැන කෙරෙන නො පැහැදිලි හැඳින්වීමක් තුළ සඟවා තැබිය හැකිය (දැනට අපට පෙනෙන අයුරු, එය වැරැදි ලෙස ඉදිරිපත් කර ඇත) යන්නය. මේ දේශපාලන නායකයන්ගේ භාෂාවක් නොව නිදිබර මහල්ලන්ගේ ලේඛනාගාර භාෂාවකි.

නව ඉස්ක්‍රාවාදීන්ගේ යෝජනාවේ අඩංගු විවිධ සූත්‍ර වඩාත් ලංව පරීක්ෂා කරන තරමට ඉහත සඳහන් මූලික ලක්ෂණ වඩාත් පැහැදිලිව පෙනේ. නිදසුනක් දක්වතොත්, 'දේශපාලන වශයෙන් විමුක්තිය ලැබූ ධනපති සමාජයේ කොටස් අතර අන්‍යොන්‍ය සටන් ක්‍රියාදමයක්' ගැන ඉන් අපට කියයි. මෙම යෝජනාවේ මාතෘකාව (විප්ලවකාරී තාවකාලික ආණ්ඩුවක්) සිතට ගන්නා කෙනෙකු විමතියෙන් මෙසේ අසනු ඇත: අන්‍යොන්‍ය සටන් ක්‍රියාදාමය ගැන ඔබ සඳහන් කරන්නේ නම්, ධනපති සමාජය දේශපාලන වශයෙන් වහල් බවට පමුණුවන කොටස් ගැන ඔබ නිහඬව සිටින්නේ කෙසේද? විප්ලවය ජයග්‍රාහී වනු ඇතැයි සාකච්ඡා සභා කාරයින් පිළිගෙන ඇති බැවින් ඉහත කී කොටස් දැනටමත් අතුරුදහන්ව ඇතැයි ඇත්ත වශයෙන්ම ඔවුන් කල්පනා කරන්නේද?'' එබඳු අදහසක් දැරීම පොදුවේ විකාරයක් වන අතර විශේෂයෙන් දැඩි දේශපාලන බොළඳකම හා දේශපාලන අදූරදර්ශී බව හොඳින් ප්‍රකාශ කිරීමක් වනු ඇත. ප්‍රතිවිප්ලවය අභිබවා විප්ලවය ජයග්‍රහණය කළ පමණින්ම ප්‍රතිවිප්ලවය අතුරුදහන් නොවේ. එසේ නොවනු පමණක් නොව ඒ විසින් වඩාත් උග්‍ර අලුත් සටනක් නිසැකයෙන්ම ආරම්භ කරනු ඇත. විප්ලවය ජයග්‍රහණය කළ විට අප හමුවට පැමිණෙන කටයුතු විග්‍රහ කිරීම අපේ යෝජනාවේ අරමුණ වන බැවින් අපේ යුතුකම වන්නේ (සම්මේලන යෝජනාව මගින් කළ පරිදි) ප්‍රතිවිප්ලවීය ප්‍රහාර වැළැක්වීමේ කටයුතුවලට දැඩි අවධානය යොමු කිරීම මිස සටන්කාමී පක්ෂයක ක්ෂණික, හදිසි හා පරම දේශපාලන කටයුතු වර්තමාන විප්ලවීය සමයෙන් පසුව කුමක් සිදුවේද හෝ ''දේශපාලන වශයෙන් විමුක්තිය ලැබූ සමාජයක්'' පවතින විට සිදු වන්නේ කුමක්ද? ආදී සාමාන්‍ය සාකච්ඡාවලින් යටපත් කිරීම නොවේ. 'ආර්ථිකවාදීන්' විසින් දේශපාලනය ආර්ථික ක්‍රමයට අවනත වන්නේය යන සරල සත්‍යය පුනපුනා දක්වමින් හදිසි දේශපාලන කටයුතු තේරුම් ගැනීමේ ස්වකීය අසමත්කම සඟවා ගනු ලැබූවාක් මෙන්ම, දේශපාලන වශයෙන් විමුක්තිය ලැබූ සමාජයක ගැටුම් පවතිනු ඇතැයි යන සරල සත්‍යය පුනපුනා දක්වන නව ''ඉස්ක්‍රා'' කණ්ඩායමද



ඒ මගින් මේ සමාජයේ දේශපාලන විමුක්තිය පිළිබඳ හදිසි විප්ලවීය කටයුතු අවබෝධ කර ගැනීමේ ස්වකීය අසමත්කම සඟවා ගනිති.

'රාජාණ්ඩුවේ හා ඉඩම් හිමි සමාජ පංතීන්ගේ සමස්ත පාලනයම අවසාන වරට අහෝසි කිරීම' යන ප්‍රකාශය ගනිමු. පැහැදිලි බසින් කියන්නේ නම් රාජාණ්ඩු ක්‍රමය අවසන් වරට අහෝසි කිරීම යනුවෙන් අදහස් කරන්නේ ප්‍රජාතන්ත්‍රවාදී සමූහාණ්ඩුවක් පිහිටුවීමයි. මේ ප්‍රකාශය පමණට වඩා සරළ හා පැහැදිලි එකකැයි අපේ හොඳ මර්තිනව් හා ඔහුගේ අනුගාමිකයෝ කල්පනා කරති. එය 'වඩා ගැඹුරු ලෙසින්' දක්වීමට හා වඩාත් 'දක්ෂ ලෙසින්' පැවසීමට උත්සුක වෙති. එහි ඵලයක් වශයෙන් එක් අතකින් ගාම්භීර ලෙසින් පෙනී සිටීමේ නිශ්ප්‍රභ හාස්‍යජනක ප්‍රයත්නයක් දක්නට ලැබේ. අනික් අතින් සටන් පාඨයක් වෙනුවට විස්තර ප්‍රකාශයක්ද, පෙරටයාම සඳහා කරන ප්‍රබෝධජනක ආයාචනයක් වෙනුවට උදාසීන දුක්මුසු පසුබැස්මක්ද දක්නට ලැබේ. අපට එහිදී ඇති වන්නේ, සමූහාණ්ඩුවක් සඳහා මෙහිදී දැන් සටන් කිරීමට උනන්දුවන පණ ඇති මිනිසුන් පිළිබඳ හැඟීමක් නොව, plusquamperfectum* අනුව sub specie aeternitatis** ප්‍රශ්නය දෙස බලන වැහැරුනු මලම්නී රැසක් පිළිබඳ හැඟීමකි.

අපි තවදුරටත් බලමු:

''...තාවකාලික ආණ්ඩුව ... මේ ... ධනපති පංති විප්ලවයේ ... කටයුතු ඉටු කිරීමට භාරගනු ඇත ...''. නිර්ධන පංතියේ දේශපාලන නායකයන් මුහුණ දෙන නිශ්චිත ප්‍රශ්නයක් අපේ සාකච්ඡා සම්මේලන කාරයින් විසින් අමතක කර තිබීමේ විපාකය මින් අපට එකවරම පෙනී යයි. ධනපති පංති විප්ලවයේ අරමුණු පොදුවේ ඉටු කරනු ලබන අනාගත ආණ්ඩු ගණනාවක ප්‍රශ්නය විසින්, විප්ලවකාරී තාවකාලික ආණ්ඩුවක් පිළිබඳ නිශ්චිත ප්‍රශ්නය ඔවුන්ගේ දර්ශන පථයෙන් ඈත් කොට තිබේ. ප්‍රශ්නය 'ඓතිහාසික' වශයෙන් සලකා බැලීම ඔබට අවශ්‍ය වේ නම් ධනපති පංති විප්ලවයේ ඓතිහාසික අරමුණු ඉටු කරන ලද්දේ කිසිසේත්ම 'තාවකාලික' නොවූ ආණ්ඩු ගණනාවක් විසින් බවත්, විප්ලවය පරාජය කළ ආණ්ඩුවලට පවා පරාජිත විප්ලවයේ ඓතිහාසික අරමුණු ඉටු කිරීමට සිදුවූ බවත් ඕනෑම යුරෝපීය රටක නිදර්ශණයෙන් පෙනී යනු ඇත. එහෙත් 'විප්ලවකාරී තාවකාලික ආණ්ඩුවක්' යනුවෙන් හැඳින්වෙන දේ ඔබ සඳහන් කරන දෙයට වඩා හාත්පසින්ම වෙනස් වූවකි. එය, පෙරළා දැමූ ආණ්ඩුව

* පසුගිය අතීතයේ. — සංස්කාරක
** සදාකාලිකත්වයේ පැත්තෙන්. — සංස්කාරක

වෙනුවට කෙළින්ම එතැනට පත්වන්නාවූද, මහජනයා අතරින් යම් කිසි වර්ගයක නියෝජිත ආයතනයක් මත නොව, ජනතා නැගිටීම මත රඳා පවතින්නාවූද, විප්ලවීය යුගයක ආණ්ඩුවකට දෙන ලද නමයි. විප්ලවකාරී තාවකාලික ආණ්ඩුවක් විප්ලවය වහා ජයග්‍රහණය කරවනු සඳහාත් ප්‍රතිවිප්ලවකාරී ප්‍රයත්න වහා පලවා හරිනු සඳහාත් ගෙනයන සටනේ සංවිධානය වන්නේය. එසේ නැතිව එය කිසිසේත්ම ධනපති පංති විප්ලවයේ ඓතිහාසික ඉලක්ක පොදුවේ ක්‍රියාත්මක කරන සංවිධානයක් නොවේ. අප හෝ නැතහොත් යම් කිසි ආණ්ඩුවක් විසින් හෝ ධනපති පංති විප්ලවයේ කුමන ඉලක්කයන් සාර්ථක කර ගෙන ඇත්දැයි හරියටම නිගමනය කිරීම අපි අනාගත ''රූස්කය ස්තරිනා''[22] සඟරාවක අනාගත ඉතිහාසඥයින්ට බාර කරමු. අවුරුදු තිහකට පසු ඒ සඳහා අවශ්‍ය තරම් කාලය ලැබෙනු ඇත. දැන් අප විසින් සමූහාණ්ඩුවක් සඳහා සටන් කිරීමත් එම සටනට නිර්ධන පංතිය ඉතාමත් ක්‍රියාශීලීව සහභාගි කරවීමත් පිළිබඳ සටන් පාඨ හා සටන ගැන ප්‍රයෝගික නිර්දේශ ඉදිරිපත් කළ යුතුය.

යෝජනාවේ අප විසින් ඉහතින් උපුටා දක්වන ලද කොටසේ ඇතුලත් අවසන් ප්‍රස්තුතයන්ද සඳහන් හේතූන් නිසා අසතුටුදයක වෙයි. සතුරු පංති අතර අන්‍යොන්‍ය ගැටුම 'හැසිරවීමට' තාවකාලික ආණ්ඩුවට සිදුවෙතැයි යන ප්‍රකාශය, බොහෝ සෙයින්ම අනුචිතය නැතහොත් සහමුලින් නුහුරු ලෙස ඉදිරිපත් කොට ඇත. පංති සටනේ සංවිධානයන් ලෙසින් නොව එහි 'හසුරුවන්නන්' ලෙසින් කටයුතු කරන ආණ්ඩු තිබිය හැකි යයි කෙනෙකු විසින් සිතනු ලැබීමට තුඩුදෙන එබඳු ලිබරල්වාදී අස්වබෂ්ජේනිය පන්නයේ සූත්‍ර මාක්ස්වාදීන් විසින් ප්‍රයෝජනයට ගත යුතු නොවේ. ''විප්ලවීය සංවර්ධනය තවදුරටත් ඉදිරියට යොමු කිරීමට පමණක් නොව ධනපති ක්‍රමයේ පදනමට තර්ජනයක්ව එම වර්ධනය තුළ පවත්නා සාධකයන්ට විරුද්ධවද සටන් කිරීමට'' ආණ්ඩුවට සිදුවේ. එහෙත් මේ 'සාධකය' සමන්විත වන්නේ නිර්ධන පංතියෙනි. මේ යෝජනාව සකස් වී ඇත්තේද ඔවුන්ගේ නාමයෙනි! වර්තමානයේදී නිර්ධන පංතිය විසින් ''විප්ලවීය සංවර්ධනය තවදුරටත් ඉදිරියට (ව්‍යවස්ථාවාදී ධනපති පංතිය ගමන් ගන්නා සීමාවෙන් ඔබ්බට ගෙනයාමට) යොමු කළ යුත්තේ කෙසේද යන වග පෙන්වා දෙනු වෙනුවට, ධනපති පංතිය විප්ලවයේ ජයග්‍රහණයන්ට විරුද්ධව නැගී සිටින අවස්ථාවකදී ඔවුන්ට එරෙහිව සටන් කිරීමේ නිශ්චිත සූදානම් කිරීම සඳහා උපදෙස් දෙනු වෙනුවට, අපේ කටයුතුවල නිශ්චිත අරමුණු ගැන වචනයක්වත් සඳහන් නොවන ක්‍රියාදාමයක් පිළිබඳ සාමාන්‍ය විස්තරයක් අපට ඉදිරිපත් කර තිබේ.



'දයලක්තික' අදහස්වලට පටහැනිවූ පැරණි භෞතිකවාදය සම්බන්ධයෙන් මාක්ස් (ෆූයෙර්බාහ් පිළිබඳ සුප්‍රසිද්ධ 'තීසිසයන්හි') දැක්වූ අදහසක් මෙහිදී ස්වකීය අදහස් ප්‍රකාශ කිරීමේ නව ඉස්ක්‍රාවාදී ක්‍රමය නිසා අපට සිහියට නැගේ. දර්ශනවාදීන් විසින් විවිධ ආකාරයෙන් ලෝකය නිරූපනය කිරීම පමණක් කර ඇති නමුත් ප්‍රශ්නය වනුයේ ලෝකය වෙනස් කිරීම යය[23] මාක්ස් කීය. එපරිද්දෙන්ම තම ඇස් හමුවේ සිදුවෙන සටන් ක්‍රියාවලිය පිළිබඳ සෑහෙන විස්තරයක් කිරීමට නව ඉස්ක්‍රාවාදීන්ට හැකිවී තිබෙන නමුත්, මෙම සටනට නිවැරදි සටන් පාඨයක් දීමට ඔවුන් සම්පූර්ණයෙන් අසමත් වී ඇත. හොඳට ගමනේ යන්නන් නමුත් නරක නායකයන් වන මොවුන් විසින් විප්ලවයක ද්‍රව්‍යමය පූර්ව අවශ්‍යතා අවබෝධ කොට ගත්තාවූත්, ප්‍රගතිශීලී පංතීන්ගේ නායකත්වයට පැමිණියාවූත් පක්ෂ විසින් ඉටු කළ හැකි හා ඉටු කළ යුතු, ඉතිහාසයේ ක්‍රියාශීලී මාර්ගෝපදේශක ප්‍රධාන වැඩ කොටස අමතක කර දැමීමෙන් ඉතිහාසය පිළිබඳ භෞතිකවාදී සංකල්පයට නිගරු කොට තිබේ.

## 5. 'විප්ලවය ඉදිරියට ගෙන යා යුත්තේ' කෙසේද?

යෝජනාවේ ඊළඟ කොටස අපි උපුටා දක්වමු:

''එබඳු තත්වයන් යටතේ විප්ලවය මුළුල්ලේම විප්ලවය ඉදිරියට ගෙන යාමේ හැකියාව ඉහළින්ම තමාට ලබා දෙන්නාවූද, ධනපති පක්ෂවල අස්ථිර, ආත්මාර්ථකාමී ප්‍රතිපත්තියට විරුද්ධව කරන සටනේදී ස්වකීය අත් පා බැඳ නොදමන්නාවූද, ධනපති ප්‍රජාතන්ත්‍රවාදය තුළ ගැලී යාමෙන් රැක දෙන්නාවූද තත්වයක් හොඳින් සහතික කර ගැනීම සඳහා සමාජ-ප්‍රජාතන්ත්‍රවාදය විසින් උත්සාහ ගත යුතු වේ.

''එහෙයින් සමාජ-ප්‍රජාතන්ත්‍රවාදය තාවකාලික ආණ්ඩුවේ බලය අල්ලා ගැනීම හෝ එහි කොටස් කරුවෙකු වීම තම අරමුණ කර නො ගෙන අන්ත විප්ලවකාරී විරුද්ධ-පාර්ශ්වීය පක්ෂය ලෙසින් පැවතිය යුතුය''.

විප්ලවය ඉදිරියට ගෙන යාමේ ඉඩකඩ වඩාත්ම හොඳින් ලබා දෙන්නාවූ තත්වයක් සහතික කර ගැනීමේ උපදේශය ඇත්තෙන්ම අපට ඉතා විශාල සතුටකි. වර්තමාන දේශපාලන තත්වය යටතේ; ජනතා නියෝජිත මණ්ඩලයක් පිහිටුවීමේ යෝජනාක්‍රම, කට කතා, අනුමාන කිරීම්, කතන්දර ආදිය පවත්නා මේ අවධියේදී, මේ හොඳ

උපදේශයට අතිරේක වශයෙන්, සමාජ-ප්‍රජාතන්ත්‍රවාදය විසින් විප්ලවය දුන් තව දුරටත් ඉදිරියට ගෙන යා යුතු ආකාරය ගැන කෙළින්ම පෙන්වා දුන්නේ නම්, මැනවයි අපි සිතමු. ජනතාව හා සාර් රජු අතර 'සම්මුතියක්' පිළිබඳ අස්වබෂ්ජේනිය න්‍යායයේ අන්තරාය හඳුනා ගැනීමට නොහැකි වූද, ව්‍යවස්ථාදායක මණ්ඩලයක් පිහිටුවීම පිළිබඳ හුදු 'තීරණයක්' පමණක් ජයග්‍රහණයක් ලෙසින් හඳුන්වන්නාවූද, විප්ලවකාරී තාවකාලික ආණ්ඩුවක අවශ්‍යතාවය පිළිබඳ අදහස ක්‍රියාශීලීව ප්‍රචාරය කිරීමේ කටයුත්ත තමන් පිට පවරා නොගන්නා හෝ ප්‍රජාතන්ත්‍රවාදී සමූහාණ්ඩුවක් පිළිබඳ සටන් පාඨය පසු බිම තබන්නාවූද උදවියට විප්ලවය දුන් තව දුරටත් ඉදිරියට ගෙන යා හැකිද? එබඳු පුද්ගලයෝ ඇත්ත වශයෙන්ම විප්ලවය පස්සට අදිති. මන්ද යත්, ප්‍රායෝගික දේශපාලනයේදී ඔවුන් අස්වබෂ්ජේනිය මට්ටමේම නතරව සිටින බැවිනි. විප්ලව කාල පරිච්ඡේදයේදී පක්ෂයේ වර්තමාන හා තක්ෂණික කටයුතු හඳුන්වන උපක්‍රම පිළිබඳ යෝජනාවකින් සමූහාණ්ඩුවක් සඳහා සටන් කිරීමේ සටන් පාඨය අමතක කරන්නේ නම්, අත්තනෝමතික පාලනය වෙනුවට සමූහාණ්ඩුවක් පිහිටුවන සේ ඉල්ලා සිටින වැඩ සටහනක් ඔවුන් විසින් පිළිගනු ලැබීමේ ප්‍රයෝජනය කුමක්ද? විප්ලවකාරී තාවකාලික ආණ්ඩුවක් හා සමූහාණ්ඩුවක් පිහිටුවීම ගැන ඕනෑකමින් නිහඬ වන අතරම, මහජන නියෝජිත මන්ත්‍රණ සභාවක් පිහිටුවීමේ තීරණය, තීරණාත්මක ජයග්‍රහණයක් ලෙසින් සලකනු ලැබීමෙන් දුන් නියම වශයෙන්ම ප්‍රකට වන්නේ අස්වබෂ්ජේනිය තත්වයයි! ව්‍යවස්ථාවාදී ධනපති පංතියේ තත්වයයි! විප්ලවය ඉදිරියට ගෙන යාම සඳහා, රාජාණ්ඩුවාදී ධනපති පංතිය විසින් එය ගෙනයනු ලබන සීමාවෙන් ඔබ්බට ගෙන යනු සඳහා, ධනපති ප්‍රජාතන්ත්‍රවාදයේ 'අස්ථිරභාවය' බැහැර කරන සටන් පාඨ නිපදවා, අවධාරයට ලක් කොට ක්‍රියාශීලීව ඉදිරියටම ගෙන ඒම අවශ්‍යය. විප්ලවය අප්‍රාණික කිරීමේ පරමාර්ථය නිසාම, එහි සම්පූර්ණ ජයග්‍රහණය වළක්වා, ධනපති පංතියට සාර්වාදය සමග කූට වාණිජ ගනුදෙනුවකට පැමිණීමට ඉඩ සැලසීමේ අභිප්‍රායයෙන්ම රාජාණ්ඩුවාදී ධනපති පංතිය විසින් ව්‍යවස්ථාදායක මණ්ඩලයක් පිළිබඳ සටන් පාඨය පිළිගෙන ඇති බැවින් (''විමුක්තියේ සංගමයේ''[24] වැඩ පිළිවෙළ බලන්න) දැනට ඇත්තේ — 1) විප්ලවකාරී තාවකාලික ආණ්ඩුවක් හා 2) සමූහාණ්ඩුවක් යන සටන් පාඨ දෙකක් පමණි. එහෙත් විප්ලවය ඉදිරියට ගෙන යාමේ ඇති සටන් පාඨ දෙක අතුරෙන් සමූහාණ්ඩුවක් පිළිබඳ සටන් පාඨය සම්පූර්ණයෙන් අමතක කළ සාකච්ඡා සභාව, විප්ලවකාරී තාවකාලික ආණ්ඩුවක් පිළිබඳ



සටන් පාඨය ව්‍යවස්ථාදායක මණ්ඩලයක් පිළිබඳ අස්වබෂ්ජේනිය සටන් පාඨයත් සමග සමතැන තබමින් ඒ දෙකම එකක් ලෙසත්, එය 'විප්ලවයේ තීරණාත්මක ජයග්‍රහණයක්'!! ලෙසත් හඳුන්වන බව දුන් අපට පෙනේ.

මේ නිසැක සත්‍යයකි. එය රුසියානු සමාජ-ප්‍රජාතන්ත්‍රවාදී ව්‍යාපාරය පිළිබඳ අනාගත ඉතිහාසඥයාට එක් මග සලකුනක් වනු ඇති බව අපට සත්තකින්ම විශ්වාසය. 1905 මැයි මාසයේදී පැවැත්වුණු සමාජ-ප්‍රජාතන්ත්‍රවාදීන්ගේ සාකච්ඡා සභාව විසින් ප්‍රජාතන්ත්‍රික විප්ලවය ඉදිරියට ගෙන යාමේ අවශ්‍යතාවය ගැන විසිතුරු වදන් අඩංගු යෝජනාවක් සම්මත කළ මුත්, ඇත්ත වශයෙන්ම ඉන් එම විප්ලවය පසු පස්සට අදී ඇත්ත වශයෙන්ම එය රාජාණ්ඩුවාදී ධනපති පංතියේ ප්‍රජාතන්ත්‍රික සටන් පාඨවලින් ඔබ්බට නොයයි.

නිර්ධන පංතිය ධනේශ්වර ප්‍රජාතන්ත්‍රය තුළ දියවී යාමේ අන්තරාය නොසලකා හරින බවත් කියමින් නව ''ඉස්ක්‍රා'' කණ්ඩායම අපට චෝදනා නැගීමට රුචියක් දක්වති. රුසියානු සමාජ-ප්‍රජාතන්ත්‍රවාදී කම්කරු පක්ෂයේ තුන්වැනි සම්මේලනය මගින් සම්මත කරගනු ලැබූ යෝජනාවේ අඩංගු කරුණු පදනම් කොට එම චෝදනාව ඔප්පු කිරීම භාරගන්නා කෙනෙකු දැකීමට අපි කැමති වෙමු. විරුද්ධවාදීන්ට අප දෙන පිළිතුරු මෙයයි: ධනපති සමාජයක් තුළ කටයුතු කරන සමාජ-ප්‍රජාතන්ත්‍රික පක්ෂයකට ඇතැම් අවස්ථාවන්හිදී ධනේශ්වර ප්‍රජාතන්ත්‍රය සමග එකට ගමන් නොකොට දේශපාලන කටයුතුවලට හවුල් විය නොහැකිය. මෙහි අප අතර ඇති වෙනස නම් අපි විප්ලවකාරී හා සමූහාණ්ඩුවාදී ධනපති පංතිය හා ඒකාබද්ධ නොවී ඔවුන් සමග එකට ගමන් කරන අතර ඔබ ලිබරල් සහ රාජාණ්ඩුවාදී ධනපති පංතිය හා ඒකාබද්ධ නොවී ඔවුන් සමග එකට ගමන් කිරීමයි. කරුණු පවතින්නේ එලෙසය.

සාකච්ඡා සභාවේ නාමයෙන් ඔබ විසින් සකස් කරන ලද උපක්‍රමීය සටන් පාඨ 'ව්‍යවස්ථාවාදී ප්‍රජාතන්ත්‍රික' පක්ෂයේ එනම්, රාජාණ්ඩුවාදී ධනපති පංතික පක්ෂයේ සටන් පාඨ සම්පාත වේ. හැරත්, ඔබ විසින් මේ සම්පාත වීම දැක හෝ අවබෝධ කර හෝ නැත. එහෙත් ඇත්ත වශයෙන් ඔබ අස්වබෂ්ජේනිය සහෝදරත්වයේ පසුපස ගමන් කර තිබේ.

රුසියන් සමාජ-ප්‍රජාතන්ත්‍රවාදී කම්කරු පක්ෂයේ තුන්වැනි සම්මේලනයේ නාමයෙන් අප විසින් සකස් කරනු ලැබ ඇති උපක්‍රමීය සටන් පාඨ ප්‍රජාතන්ත්‍රික විප්ලවකාරී හා සමූහාණ්ඩුවාදී ධනපති පංතියේ සටන් පාඨ හා සමග සම්පාත වේ. රුසියාවේ මේ ධනපති පංතිය හා

සුළු ධනපති පංතිය තවමත් විශාල මහජන පක්ෂයක් ලෙස සකස් වී නැත.* එහෙත් එබඳු පක්ෂයක මූලිකාංග බිහිව තිබීම ගැන සැක පහළ කළ හැක්කේ දැන් රුසියාවේ සිදුවන දේ යම්තමින් වත් වටහා නොගත් කෙනෙකුට පමණි. (රුසියන් මහ විප්ලවය ඉදිරියට යන්නේ නම්) සමාජ-ප්‍රජාතන්ත්‍රික පක්ෂය විසින් සංවිධානය කරනු ලැබූ නිර්ධන පංතිය පමණක් නොව, අප හා සමග එකට ගමන් කළ හැකි මේ සුළු ධනපති පංතියද මෙහෙයවීමට අපි අදහස් කරමු.

සාකච්ඡා සභාව ස්වකීය යෝජනාවේදී නොදැනුවත්වම ලිබරල්වාදී හා රාජාණ්ඩුවාදී ධනපති පංතියේ මට්ටමට ඇද වැටේ. එහෙත්, පක්ෂ සම්මේලනය ස්වකීය යෝජනාවේදී තැරැව් කාරයන් ලෙස ක්‍රියා කිරීමට නොව, සටන් කිරීමට සමත් විප්ලවකාරී ප්‍රජාතන්ත්‍රවාදයේ කොටස් හැඟීමෙන් යුතුව තම මට්ටමට ඔසවා තබයි.

එබඳු කොටස් වැඩි වශයෙන් සිටින්නේ ගොවි ජනතාව අතරය. සමාජ-ප්‍රජාතන්ත්‍රවාදය තුළින් කම්කරු පංතිය අපට හඳුනා ගත හැකි වන්නා සේම, එම දැනුම, විශේෂතා හා සිතාගත් තත්වයන් පරිදි ඇත්තෙන්ම, දේශපාලන නැඹුරුවීම් අනුව විශාල සමාජ කොටස් වර්ග කිරීමේදී බරපතල වැරදීම් පිළිබඳ අන්තරායයෙන් තොරව, බහුතර ගොවි ජනතාව තුළින් විප්ලවකාරී හා සමූහාණ්ඩුවාදී ප්‍රජාතන්ත්‍රවාදය හඳුනා ගැනීමට අපට පුළුවන. වෙනත් වචනවලින් කියතොත් අපේ නිගමන පහත සඳහන් ආකාරයෙන්ද දැක්විය හැක: සාකච්ඡා සභාව විප්ලවීය කාල පරිච්ඡේදයකදී ස්වකීය දේශ-ව්‍යාප්ත** දේශපාලන සටන් පාඨවලදී නොදැනුවත්ම ඉඩම් හිමියන්ගේ මට්ටමට ඇද වැටෙයි. පක්ෂ සම්මේලනය ස්වකීය දේශ-ව්‍යාප්ත දේශපාලන සටන් පාඨවලදී ගොවි බහු ජනතාව විප්ලවකාරී මට්ටමකට ඔසවා තබයි. මේ නිගමනය නිසා අප උභතෝකෝටිකයන්ට ඇලුම් කරතැයි චෝදනා කරන ඕනෑම කෙනෙකුට අපි මෙසේ අභියෝග කරමු: විප්ලවය සාර්ථක අවසානයක් දක්වා ගෙන යාමට තරම් අපට ශක්තිය නැති නම්, අස්වබෂ්ජේනිය අර්ථය අනුව විප්ලවය 'තීරණාත්මක ජයග්‍රහණයකින්' අවසන් වේ නම්, එනම්, සාර් රජු විසින් කැඳවනු

---

* 'සමාජවාදී විප්ලවවාදීහු' එබඳු පක්ෂයක කලල රූපයට වඩා බුද්ධිමතුන්ගේ ත්‍රස්තවාදී කණ්ඩායමකි. එනමුත් මෙම කණ්ඩායමේ කටයුතුවල වාස්තවික වැදගත්කම විප්ලවීය හා සමූහාණ්ඩුවාදී ධනපති පංතියේ අරමුණු ළඟා කර ගැනීමේ කටයුත්තම ලෙසින් දැක්විය හැකිය.

** වෙනම යෝජනා මගින් සලකා බලන ලද විශේෂ ගොවි ජන සටන් පාඨ ගැන අපි මෙහිදී සඳහන් නොකරමු.



ලබන ව්‍යවස්ථාදායක මණ්ඩලයක් යයි විහිළුවට පමණක් හැඳින්විය හැකි නියෝජිත මණ්ඩලයක් ස්වරූපයෙන් ඔබ්බට නොගොස් අවසන් වේ නම්, එය ඉඩම් හිමි හා ලොකු ධනපති පංතික කොටස් ප්‍රධානත්වය ගන්නා විප්ලවයක් වනු ඇතැයි යන ප්‍රස්තුතය බොරු කරන්න. අනික් අතින් නියම වශයෙන්ම ශ්‍රේෂ්ඨ විප්ලවයක් පසු කිරීමට අප ඉරණම ලබා ඇත්නම්, ඉතිහාසය විසින් මෙවර 'ගබ්සාවක්' වළක්වනු ලැබේ නම්, අස්වබෂ්ජේනිය හෝ නව ඉස්ක්‍රා හෝ අරුත අනුව නොව නියම තීරණාත්මක ජයග්‍රහණයක් කරා — සාර්ථක අවසානයක් කරා — විප්ලවය ඉදිරියට ගෙන යාමට තරම් අප ශක්තිමත් වේ නම්, එවිට එය ගොවි හා නිර්ධන පංතික කොටස් ප්‍රධානත්වය ගන්නා විප්ලවයක් වනු ඇත.

එබඳු ප්‍රධානත්වයක් සඳහා ඉඩකඩ ඇති බවට අප කරන පිළිගැනීම ළඟ එන විප්ලවය ධනපති ස්වභාවයෙන් යුක්ත වනු ඇතැයි යන අදහස ඉවත ලෑමක් ලෙසින් යමෙකු විසින් පෙන්වා දීමට පුළුවන. මෙම සංකල්පය ''ඉස්ක්‍රා'' පත්‍රය විසින් වැරදි ලෙස ප්‍රයෝජනයට ගන්නා ලද ආකාරය ගැන බලන විට ඊට හොඳටම ඉඩ තිබේ. මේ හේතුව නිසා මෙම ප්‍රශ්නය ගැන සලකා බැලීම කිසිසේත්ම අනවශ්‍ය දෙයක් නොවනු ඇත.

## 6. අස්ථිර ධනපති පංතියට විරුද්ධව කරන සටනේදී නිර්ධන පංතිය කෙරෙහි තම අත් පා බැඳ දැමීමේ තර්ජනය එල්ල වන්නේ කවර දිසාවකින්ද?

රුසියානු විප්ලවයේ ධනපති පංතික ස්වභාවය මාක්ස්වාදීන්ට සම්පූර්ණයෙන්ම ඒත්තු ගොස් ඇත. මින් අදහස් කෙරෙන්නේ කුමක්ද? ඉන් අදහස් කරන්නේ, රුසියාවට අත්‍යවශ්‍ය දෙයක් බවට පත්ව ඇති, දේශපාලන ක්‍රමයේ ප්‍රජාතන්ත්‍රික වෙනස්කම් හා සමාජ, ආර්ථික වෙනස්කම්වලින්ම ධනවාදය දුර්වල වීමක් හා ධනපති පංතික පාලනය දුර්වල වීමක් සිදු නොවන බවයි. ඒ වෙනුවට එම වෙනස්කම් නිසා පළමු වරට ආසියාතික නොවන යුරෝපීය ධනවාදයක් පුළුල් ලෙස වේගයෙන් වැඩී යාම සඳහා නියම වශයෙන් ඉඩකඩ සලස්වයි. එමගින් පළමු වරට පංතියක් වශයෙන් පාලනය ගෙන යාමට ධනපති පංතියට හැකිවනු ඇත. සමාජවාදී විප්ලවකාරීන්ට මෙම අදහස තේරුම් ගැනීමට

නුපුළුවන. මන්ද යත් හුවමාරු ද්‍රව්‍ය හා ධනපති නිෂ්පාදනයේ සංවර්ධනය පිළිබඳ මූලික නියාමයන්ගේ අ-ආ පවා ඔවුන් නොදන්නා බැවිනි. ගොවි ජන නැගිටීමක් සම්පූර්ණයෙන් සාර්ථක වීමෙන් පවා, ගොවි ජනයාගේ කැමැත්ත පරිදි ඔවුන්ගේ යහපත පිණිස සියළුම ඉඩ කඩම් යළි බෙදා දීමෙන් පවා ('පොදුවේ යළි බෙද දීම' නැතහොත් එවැනි දෙයක්) ධනපති ක්‍රමය අහෝසි නොවනු පමණක් නොව එහි දියුණුව වඩාත් වේගවත් කර ගොවිජනයාගේ පංතිමය බිඳී යෑම ඉක්මන් කරවන බවද දැකීමට ඔව්හු අපොහොසත් වෙති. මෙම සත්‍යය වටහා ගැනීමට අසමත් වීමෙන් සමාජවාදී විප්ලවකාරීහු තමන් නොදැනම සුළු ධනපති පංතික දෘෂ්ටිවාදීන් බවට පත් වෙති. මෙම සත්‍යය අවබෝධ කර ගැනීම න්‍යාය අතින් පමණක් නොව ව්‍යවහාර දේශපාලනය අතින්ද සමාජ-ප්‍රජාතන්ත්‍රිකයන්ට මහත් සේ වැදගත් වෙයි. මන්ද යත්, වර්තමාන 'පොදු ප්‍රජාතන්ත්‍රවාදී' ව්‍යාපාරයේදී නිර්ධන පංති පක්ෂයේ සම්පූර්ණ පංති ස්වාධීනත්වය අවශ්‍යයෙන්ම තිබිය යුත්තක් බව ඉන් පැහැදිලි වන හෙයිනි.

එහෙත් (සමාජ හා ආර්ථික හරය විසින් ධනපති පංතික වූ) ප්‍රජාතන්ත්‍රික විප්ලවයක් නිර්ධන පංතියට මහත් සේ වැදගත් නොවන බවක් මින් කිසිසේත් අදහස් නොවේ. එසේම ප්‍රධාන වශයෙන් ලොකු ධනපතියන්ට, මුදල් හිමියන්ට හා 'අවබෝධය ලැබූ' ඉඩම් හිමියන්ටත් වාසිදායක ක්‍රමයකට මෙන්ම ගොවීන්ට හා කම්කරුවන්ට වාසිදායක වන ක්‍රමයකටද ප්‍රජාතන්ත්‍රික විප්ලවය සිදු විය නොහැකි බවක් කිසිසේත්ම අදහස් නොවේ.

ප්‍රභේදයක් ලෙස ධනපති පංති විප්ලවය යන්නෙහි තේරුම හා වැදගත්කම නව ඉස්ක්‍රාවාදීහු සහමුලින්ම වැරදි ලෙසට වටහා ගනිති. ඔවුන්ගේ තර්කවල නිරන්තරයෙන්ම ගැබ් වූ අදහස ධනපති පංති විප්ලවය, ධනපති පංතියට පමණක් වාසිදායක බවය. ඒ අදහස තරම් වැරදිවූ අන් කිසිවක් නැත. ධනපති පංති විප්ලවය වනාහි ධනපති සීමාවන්ගෙන්, එනම්, ධනපති සමාජ-ආර්ථික ක්‍රමයෙන් ඔබ්බට නොයන විප්ලවයකි. ධනපති පංති විප්ලවය ධනවාදය සංවර්ධනය කිරීමේ අවශ්‍යතාවය ප්‍රකට කරන්නකි. එය ධනවාදයේ පදනම් විනාශ කිරීම කෙසේ වෙතත්, ඊට පටහැනිව, ඒවා වඩාත් පුළුල් කරයි. ගැඹුරු කරයි. එහෙයින් මෙම විප්ලවයෙන් කම්කරු පංතියේ පමණක් නොව සමස්ත ධනපති පංතියේද අපේක්ෂාවන් ප්‍රකට කෙරේ. ධනවාදය යටතේ කම්කරු පංතිය මත ධනපති පංතික පාලනය අනිවාර්‍ය දෙයක් වන බැවින් ධනපති පංති විප්ලවයකින් ධනපති පංතියේ අපේක්ෂාවන් තරමට නිර්ධන පංතියේ අපේක්ෂාවන් ප්‍රකට නොවන බව කිව හැකිය.



එහෙත් ධනපති පංති විප්ලවයකින් නිර්ධන පංතියේ අපේක්ෂාවන් කොහෙත්ම ප්‍රකට නොවෙතැයි සිතීම විකාරයකි. මෙම විකාර අදහස අවසානයේදී එක්කෝ, ධනපති පංති විප්ලවය නිර්ධන පංතියේ අපේක්ෂාවන්ට පටහැනි වෙතැයි ද, එහෙයින් ධනපති දේශපාලන නිදහස අපට අවශ්‍ය නැතැයිද යන අබලන් නරෝද්නික් න්‍යායට වැටේ. නැතහොත් ධනපති දේශපාලනයට, ධනපති විප්ලවයට හා ධනපති පාර්ලිමේන්තු කටයුතුවලට නිර්ධන පංතිය කුමන අයුරකින් හෝ සහභාගි වීම සම්පූර්ණයෙන් ඉවත ලන අරාජිකවාදයට වැටේ. න්‍යායය අනුව බලන විට මෙම අදහස හුවමාරු භාණ්ඩ නිෂ්පාදනය පවත්නා තැන ධනවාදය වැඩී යාමේ අනිවාර්‍යභාවය පිළිබඳ මූලික මාක්ස්වාදී ප්‍රස්තුතයන්ට පටහැනි වෙයි. ශිෂ්ටාචාර ධනපති රටවල් සමග වාණිජ සම්බන්ධතා පවත්වන්නාවූද, හුවමාරු භාණ්ඩ නිෂ්පාදනය මත පදනම්වූද සමාජයක් වේ නම්, එය ස්වකීය සංවර්ධනයේ එක්තරා අවස්ථාවකදී අනිවාර්‍යයෙන්ම ධනපති මාවත ඔස්සේ ගමන් ගන්නා බව මාක්ස්වාදය අපට උගන්වයි. නිදසුනක් වශයෙන් රුසියාවට ධනවාදයේ පදනම හා රාමුව තුළම වූ පංති සටනෙන් බැහැර වූ වෙනත් මාවතක් ඔස්සේ ධනවාදී සංවර්ධනය මග හැර, ධනවාදයෙන් ගැලවී හෝ ඊට උඩින් පැන යා හැකිය යන නරෝද්නික් හා අරාජිකවාදී පුහු කතාවලින් මාක්ස්වාදය ආලෝප්‍ය ලෙස වෙන්වී ඇත.

මාක්ස්වාදයේ මේ සියලු මූලධර්ම, පොදු වශයෙන්ද, රුසියාව සම්බන්ධයෙන් විශේෂ වශයෙන්ද, නැවත නැවතත් සවිස්තරව පැහැදිලි කොට ඔප්පු කර තිබේ. ධනවාදයේ වැඩිදුර සංවර්ධනය හැර වෙනත් යමක් තුළින් කම්කරු පංතියේ විමුක්තිය සෙවීමේ අදහස ප්‍රතිගාමී බව මේ මූලධර්ම අනුව හෙළිවේ. රුසියාව වැනි රටවල කම්කරු පංතිය ධනවාදයෙන් විඳින පීඩාවලට වඩා ධනවාදය සෑහෙන පමණට දියුණු නොවීමෙන් පීඩා විඳී. එහෙයින් කම්කරු පංතිය ධනවාදය ඉතාමත්ම පුළුල්, ඉතාමත්ම නිදහස් එමෙන්ම ඉතාමත්ම වේගවත් අයුරින් වැඩී යාමක් ගැන ඉතාමත්ම නිසැක උනන්දුවක් දක්වයි. ධනවාදය පුළුල් ලෙස, නිදහසේ හා වේගයෙන් සංවර්ධනය වීමට බාධා පමුණුවන පැරණි සමාජ ක්‍රමයේ සියලු නටබුන් ඉවත් කිරීම කම්කරු පංතියට පරම වාසියකි. ධනපති පංති විප්ලවය අතීතයේ ශේෂ, දස-හිමි ක්‍රමයේ ශේෂ (අත්තනෝමතික පාලන ක්‍රමය පමණක් නොව රාජාණ්ඩුද ඇතුළුව), දැඩිව අතුගා දමන්නාවූද, ධනවාදයේ ඉතාමත්ම පුළුල්, නිදහස් හා වේගවත් සංවර්ධනය සම්පූර්ණයෙන්ම සහතික කරන්නාවූද පෙරළියක්මය.

ධනපති පංතික විප්ලවයක්, ඉතාමත් ඉහළ මට්ටමින්ම නිර්ධන

පංතියට වාසිදයක වන්නේ එහෙයිනි. නිර්ධන පංතියේ යහපත තකා ධනපති පංතික විප්ලවයක් නිරපේක්ෂයෙන්ම අවශ්‍යය. ධනපති පංතික විප්ලවය වඩාත් සම්පූර්ණවූ හා අධිශ්ඨාන සහගත වූ තරමටම, වඩාත් ස්ථිරසාර වූ තරමටම, සමාජවාදය සඳහා නිර්ධන පංතිය ධනපති පංතියට විරුද්ධව කරන සටන ද තව තවත් සහතික වන්නේය. මෙම නිගමනය අලුත්, අද්භූත හෝ උභතෝකෝටිකයක් හෝ ලෙසින් සැලකිය හැක්කේ විද්‍යාත්මක සමාජවාදයේ අ-ආ ගැන පවා නොදත් අය විසින් පමණකි. මෙම නිගමනය තුළින් මතුවන අනෙකුත් දෑ අතර එක් අතකින් ධනපති පංතික විප්ලවයක් ධනපති පංතියට වඩා නිර්ධන පංතියට වැඩි වාසි ගෙන දෙන්නක් වේය යන තීසිසයද වෙයි. පහත සඳහන් අර්ථයෙන් මෙම තීසිසය අවිවාදයෙන්ම නිවැරදිය: නිර්ධන පංතියට මෙන් නොව ධනපති පංතියට අතීතයෙන් ඉතිරිවූ ඇතැම් දේ, නිදසුන් වශයෙන් රාජාණ්ඩුව හා ස්ථිර හමුදාව ආදි දේ කෙරෙහි බලාපොරොත්තු තැබීම සිය වාසියට හේතු වෙයි. ධනපති පංතික විප්ලවය විසින් අතීතයෙන් ඉතිරිවූ සියල්ල දැඩි ලෙස අතුගා නොදමා ඉන් කිහිපයක් එලෙසින්ම තබාගනු ලබන්නේ නම්, වෙනත් අයුරකින් කියතොත්, මෙම විප්ලවය මුළුමනින්ම ස්ථිරසාර නොවේ නම්, අංග සම්පූර්ණ නොවේ නම් එසේම එය අධිෂ්ඨාන සම්පන්න හා නිර්දය නොවේ නම්, එය ධනපති පංතියේ වාසිය සඳහා වෙයි. සමාජ-ප්‍රජාතන්ත්‍රවාදීහු තරමක් වෙනස් ආකාරයකින් නිතරම මේ අදහස ප්‍රකාශ කරති. එනම්, ධනපති පංතිය විසින් තමන්ම පාවා දෙනු ලබන බවත්, ධනපති පංතිය විසින් නිදහසේ ඉදිරි ගමන පාවාදෙනු ලබන බවත් එසේම ස්ථිරසාරව ප්‍රජාතන්ත්‍රවාදී වීමට ධනපති පංතිය අසමත් බවත්, සඳහන් කිරීමෙනි. ධනපති ප්‍රජාතන්ත්‍රවාදය දෙසට යොමුවූ අවශ්‍ය වෙනස්කම්, විප්ලවය මගින් නොව, ප්‍රතිසංස්කරන මගින් වඩාත් හෙමින්, වඩාත් අනුක්‍රමිකව හා වඩාත් ප්‍රවේසමෙන්, අඩු අධිෂ්ඨානයකින් සිදු වන්නේ නම්, මේ වෙනස්කම්වලින්, (රාජාණ්ඩුව වැනි) දස-හිමි ක්‍රමයේ 'ගෞරවනීය' ආයතන හැකි තරම් වැඩියෙන් ඉතිරි කර තබන්නේ නම්, මේ වෙනස්කම්වලින් ගොවීන් හා විශේෂයෙන් කම්කරුවන් ආදී පොදු ජනයාගේ විප්ලවීය කටයුතු උද්යෝගය හා ශක්තිය හැකි තරම් සුළුවෙන් වැඩි දියුණු කරන්නේ නම් එහි වැඩි වාසිය ලැබෙන්නේ ධනපති පංතියටය. මන්ද යත් එසේ නොවී නම්, ප්‍රංශ ජාතිකයන් කියන පරිදි ''තුවක්කුව එක් උරයකින් අනික් උරයට මාරු කිරීම'' සඳහා කම්කරුවන්ට වඩා පහසුකම් ලැබෙනු ඇත. එනම් ධනපති පංති විප්ලවය විසින් අත තැබූ තුවක්කුව, විප්ලවය විසින් ලබා දෙන නිදහස සහ දස ක්‍රමය අතු ගා දැමූ භූමියෙහි



පහළ වන ප්‍රජාතන්ත්‍රික ආයතන ධනපති පංතියටම විරුද්ධව එල්ල කිරීමට ඔවුන්ට ඉඩ ලැබෙනු ඇත.

අනෙක් අතින්, ධනපති ප්‍රජාතන්ත්‍රවාදය දෙසට යොමු වූ අවශ්‍ය වෙනස්කම්, ප්‍රතිසංස්කරණ මගින් නොව විප්ලවය මගින් සිදුවන්නේ නම් එය කම්කරු පංතියට වඩා වාසිදයක වෙයි. මන්ද යත්, ප්‍රතිසංස්කරණ මාවත ජාතික ඉන්ද්‍රියයේ කුණුවූ කොටස් වේදනා සහගතව හෙමින් දිරාපත්වන්නාක් වැනි ප්‍රමාද හා දිග්ගැස්සීම් සහිත මගක් වන හෙයිනි. මේ කුණු වීමෙන් පළමුවෙන්ම හා වැඩි වශයෙන්ම පීඩා විඳින්නේ ගොවි ජනතාව හා නිර්ධන පංතියයි. විප්ලවීය මාර්ගය ඒ කුණුවූ කොටස් වහා කපා වෙන් කරන ඉක්මන් මාර්ගයකි. එය නිර්ධන පංතියට හැකි තරම් වේදනා අඩු මාර්ගයයි. දිරාපත්වන කොටස් ක්ෂණිකවම කපා ඉවත් කරන්නාවූත් රාජාණ්ඩුව හා ඊට සම්බන්ධ අප්‍රියජනක හා දූෂ්ට, දුගඳ හමන හා අපිරිසිදු ආයතන කෙරෙහි අඩුම සහනයක් හා අඩුම සැලකිල්ලක් දක්වන්නාවූත් මාර්ගයයි.

එහෙයින් අපේ ධනපති ලිබරල්වාදී පුවත්පත් විප්ලවීය මාර්ගයකට ඇති ඉඩකඩ ගැන අඳෝනා නගන්නේත්, විප්ලවයට බිය වන්නේත්, විප්ලවයේ බිල්ලා දක්වමින් සාර් රජු බිය ගැන්වීමට උත්සාහ දරන්නේත්, විප්ලවය මග හැරීමට උත්සුක වන්නේත් එසේම, ප්‍රතිසංස්කරණවාදී මාවතක් සඳහා පදනම් සකස් කිරීමක් වශයෙන් නිවට ප්‍රතිසංස්කරණ ඇති කිරීම පිණිස මැසිවිලි කියන්නේත් පුවත් පාලනය නිසා පමණක් නොවේ. 'යුදෙව්වන් ගැන බිය වන නිසා' පමණක් නොවේ. ''රුස්කිය වියදමස්ති''[25], ''සින් අතියවෙස්ත්ව''[26], ''නාෂ ෂිස්න්''[27] හා ''නාෂි ද්නි''[28] යන පුවත්පත් පමණක් නොව පුවත් පාලනයට යට නොවූ නීතිවිරෝධී ''අස්වබෂ්ජේනිය'' පත්‍රය පවා එම පිළිවෙත අනුගමනය කරයි. ධනපති සමාජය තුළදී පංතියක් වශයෙන් ධනපති පංතියට හිමි තත්වය නිසාම, එය ප්‍රජාතන්ත්‍රික විප්ලවයකදී අනිවාර්යයෙන්ම චපල ස්වභාවයක් ගනී. එසේම පංතියක් වශයෙන් ඒ සමාජය තුළ නිර්ධන පංතියට හිමි තත්වය නිසාම ස්ථිරසාරව ප්‍රජාතන්ත්‍රවාදී වීමට එය පෙළඹේ. නිර්ධන පංතිය ශක්තිමත් කිරීමට තර්ජනය කරන ප්‍රජාතන්ත්‍රික ඉදිරි ගමනට බියවන ධනපති පංතිය ආපස්සට හැරේ. නිර්ධන පංතියට සිය යදම් විනා අහිමි වීමට වෙන යමක් නැත නමුත් ප්‍රජාතන්ත්‍රවාදයේ ආධාර ඇතිව දිනා ගැනීමට මුළු ලෝකයක්ම ඇත.[29] ධනපති පංති විප්ලවය ප්‍රජාතන්ත්‍රික වෙනස්කම් සම්බන්ධයෙන් ස්ථිර බව දක්වූ තරමටම තනිකරම ධනපති පංතියට වාසිදයක වන දේ සීමා වනුයේද එහෙයිනි. ධනපති විප්ලවයේ

ස්ථිර භාවය වැඩිවූ තරමටම, නිර්ධන පංතියට හා ගොවීන්ට ප්‍රජාතන්ත්‍රික විප්ලවයේ ප්‍රයෝජනය සහතික වීමද ස්ථිර වෙයි.

ධනපති පංති විප්ලවයෙන් ඇත්වී නොසිටින ලෙස එය නොසලකා නොහරින ලෙස හා විප්ලවයේ නායකත්වය ගැනීමට ධනපති පංතියට ඉඩ නොදෙන ලෙස පමණක් නොව, විප්ලවයට ඉතාමත් උද්‍යෝගීව හවුල් වෙමින්, අවපල නිර්ධන පංතියක ප්‍රජාතන්ත්‍රවාදයක් සඳහාත් විප්ලවය එහි අවසානය දක්වා ගෙන යාම සඳහාත් දැඩි අධිෂ්ඨානයෙන් සටන් කරන ලෙස මාක්ස්වාදය විසින් නිර්ධන පංතියට උගන්වනු ලැබේ රුසියානු විප්ලවයේ ධනපති ප්‍රජාතන්ත්‍රික රාමුවෙන් පිට පැනීමට අපට නුපුළුවන. එහෙත් ඒ රාමුව බොහෝ සෙයින් පුළුල් කිරීමට අපට පුළුවන. එසේම, නිර්ධන පංතියේ අපේක්ෂාවන් මෙන්ම හදිසි අවශ්‍යකම් සඳහාත්, අනාගතයේදී සම්පූර්ණ ජයග්‍රහණය ලබනු පිණිස තම බලවේගයන් සූදනම් කිරීමට නිර්ධන පංතියට ඉඩ ලබා දෙන තත්වයන් ඇති කරනු සඳහාත් අර රාමුව තුළ සිට සටන් කිරීමට අපට පුළුවන් වන්නා සේම එය කළ යුත්තක්ද වෙයි. විවිධ ආකාරයේ ධනපති ප්‍රජාතන්ත්‍රවාද ඇත. කප්පාදු කළ ආණ්ඩු ක්‍රමයක් සඳහා සාර්වාදය සමග රහසින් කපටි ලෙස ජාවාරමක යෙදෙන අතර ඉහළ පෙළේ සභාවකට කැමති වෙමින් සර්වජන ඡන්දය 'ඉල්ලන' රාජාණ්ඩුවාදී සෙම්ස්ත්වොවාදියාද[30] ධනපති ප්‍රජාතන්ත්‍රිකයෙකි. එසේම ඉඩම් හිමියන්ට හා ආණ්ඩුවේ නිලධාරියන්ට විරුද්ධව අවිගෙන සටන් කරමින් 'බොළඳ සමූහාණ්ඩුවාදයකින්' යුතුව 'සාර් රජු පං පහර දී පන්නා දැමීමට'* යෝජනා කරන ගොවියාද ධනපති ප්‍රජාතන්ත්‍රිකයෙකි. ජර්මනියේ බඳු එංගලන්තයේ බඳු, අවුස්ත්‍රියාවේ බඳු, ඇමෙරිකාවේ බඳු හෝ ස්විට්සර්ලන්තයේ බඳු ධනපති-ප්‍රජාතන්ත්‍රවාදී පාලන තිබේ. ප්‍රජාතන්ත්‍රික විප්ලව සමයේදී ප්‍රජාතන්ත්‍රවාදයේ ඒ ඒ මට්ටම් අතර ඇති වෙනසත්, විවිධ ප්‍රජාතන්ත්‍රික ආකෘති අතර ඇති වෙනසත් හඳුනා ගැනීමට අසමත්ව මේනම් 'ධනපති විප්ලවයකි', 'ධනපති විප්ලවයක' ඵලයකි ආදී 'දක්ෂ' ප්‍රකාශ කරන්නා ඇත්තෙන්ම අපූරු මාක්ස්වාදියෙකි.

අපේ නව ඉස්ක්‍රාවාදීහූ තම අදූර දර්ශී බව ප්‍රදර්ශනය කිරීම අතින් ඉතා දක්ෂ පිරිසක් වෙති. අස්ථිර ධනපති ප්‍රජාතන්ත්‍රවාදය හා ස්ථිර නිර්ධන පංති ප්‍රජාතන්ත්‍රවාදය අතර වෙනස ගැන කෙසේ වෙතත් විප්ලවකාරී සමූහාණ්ඩුවාදී ප්‍රජාතන්ත්‍රවාදයත් රාජාණ්ඩුවාදී ලිබරල් ධනපති පංතික ප්‍රජාතන්ත්‍රවාදයත් අතර වෙනස දැක්වීමට හැකි විය

---

* ''අස්වබෝෂ්ජේනිය'', අංක 71, 337 පිටුව, 2 වැනි සටහන



යුතු අවස්ථාවේදී ඔව්හු විප්ලවයේ ධනපති පංතික ස්වභාවය ගැන තර්ක විතර්ක කිරීමට පමණක් සීමා වෙති. වර්තමාන විප්ලවයට ප්‍රජාතන්ත්‍රික නායකත්වයක් දීමත්, සත්රුවේ මහතාගේ හා ඔහුගේ අනුගාමිකයින්ගේ ද්‍රෝහී සටන් පාඨවලට පැහැදිලිව වෙනස්වූ ප්‍රගතිශීලී ප්‍රජාතන්ත්‍රික සටන් පාඨ හුවා දැක්වීමත් ඉඩම් හිමියන්ගේ හා කර්මාන්ත ශාලා හිමියන්ගේ ලිබරල්වාදී හිස් කතාවලට වෙනස්ව කැපී පෙනෙන සේ නිර්ධන පංතියේ හා ගොවීන්ගේ නියම විප්ලවීය සටනේ නුදුරු ඉලක්ක කෙලින්ම, එක්වරම කියා පෑමත් යන මේ කරුණු මූලික ප්‍රශ්නය වී තිබියදී සෑම අලුත් දෙයකටම බිය වන ගතානුගතිකයන් බවට පත්වූවන් සේ ඔව්හු, 'හතුරු පන්තීන් අතර අන්‍යෝන්‍ය සටන් මගක්' ගැන අදෝනා කියමින් ඇත්ත වශයෙන්ම ''කරපටියේ මිනිසා''[31] බවට පත්ව තෘප්තිමත් වෙති. මහත්වරුනි, ඔබට හසු නොවූ ප්‍රශ්නවල හරය මෙයයි: අපේ විප්ලවය නියම මහා ජයග්‍රහණයකින් කෙළවර වේද, නැතහොත් ජුගුප්සාජනක ගනුදෙනුවකින් කෙළවර වේද එය නිර්ධන පංතියේ හා ගොවීන්ගේ විප්ලවීය ප්‍රජාතන්ත්‍රික ආඥාදායකත්වය තරම් දුරට යනු ඇත්ද? නො එසේම ලිබරල්වාදී ෂිපොව් ආණ්ඩු ක්‍රමයකින් නතර වේද?

මේ ප්‍රශ්නය නැගීමෙන් අප මාතෘකාවෙන් සම්පූර්ණයෙන් පිට පනින බව බැලූ බැල්මට පෙනී යාමට පුළුවන. එහෙත්, එසේ වනු ඇත්තේ බැලූ බැල්මට පමණකි. ඇත්ත වශයෙන්ම රුසියානු සමාජ-ප්‍රජාතන්ත්‍රවාදී කම්කරු පක්ෂයේ තුන්වැනි සම්මේලනයේ සමාජ-ප්‍රජාතන්ත්‍රික උපාය මාර්ගය හා නව ඉස්ක්‍රාවාදීන්ගේ සාකච්ඡා සභාවේ උපාය මාර්ග අතර දැන් පැහැදිලි වී ඇති ප්‍රතිපත්ති පිළිබඳ වෙනසට මුල්වී ඇත්තේ මේ ප්‍රශ්නයමය. ඉහත කී සාකච්ඡා සභාව, කම්කරුවන්ගේ පක්ෂයට අතිශයින් වැදගත්වූ, අත්‍යවශ්‍යවූද, එමෙන්ම අසමාන ලෙස වඩාත් සංකීර්ණවූද ප්‍රශ්න විසඳීමේදී නම් වශයෙන් දක්වතොත් විප්ලව සමයේදී එම පක්ෂයේ උපාය මාර්ග පිළිබඳ ප්‍රශ්න නිරාකරණය කිරීමේදී 'ආර්ථිකවාදයේ' වැරදි යළි යළිත් කරමින්, දැනටමත් පියවර දෙකක් නොව තුනක්ම ආපස්සට තබා ඇත. අප මතු කළ ප්‍රශ්නය අප විසින් නියම අවධානයෙන් යුතුව විභාග කර බැලිය යුත්තේ ඒ නිසාය.

ධනපති පංතියේ චපල ප්‍රතිපත්තියට විරුද්ධව කරන සටනේදී සමාජ-ප්‍රජාතන්ත්‍රවාදය විසින් ස්වකීය අත් පා බැඳ ගැනීමේ අන්තරායක් එසේම ධනපති ප්‍රජාතන්ත්‍රවාදය තුළ ඔවුන් කිඳා බැස යාමේ අන්තරායත්, නව ඉස්ක්‍රාවාදීන්ගේ යෝජනාවේ අප විසින් ඉහතින් උපුටා දක්වන ලද කොටසින් පෙන්නුම් කරයි. මෙම අන්තරාය පිළිබඳ

අදහස නව ඉස්ක්‍රාවාදීන්ගේ සියලුම ලිපි ලේඛන අතුරින් නූලක් මෙන් ඇදී යයි. අපේ පක්ෂය බෙදී යාමට සම්බන්ධ ප්‍රතිපත්තිය නියම වශයෙන්ම රැඳී ඇත්තේ ඒ වටාය (එතැන් පටන් මෙම බෙදීම ගැන සෝෂා කළ කොටස් 'ආර්ථිකවාදය' දෙසට නැඹුරුවූ කොටස් විසින් සහමුලින් යටපත් කරනු ලැබේ). එම අන්තරාය නියම වශයෙන්ම පවත්නා බව අපි පැහැදිලිව පිළිගනිමු. හරියටම වර්තමානයේදී, රුසියානු විප්ලවය උච්චයට පත්ව ඇති මෙම අවස්ථාවේදී එම අන්තරාය විශේෂයෙන්ම බරපතලය. න්‍යායාචාර්යවරුන් වන අප සියලු දෙනා කෙරෙහි, මා ගැන හඳුන්වා ගනු ලැබීමම වඩාත් කැමති පරිදි — සමාජ-ප්‍රජාතන්ත්‍රවාදයේ ප්‍රචාරකවාදීන් වන අප කෙරෙහි පැවරෙන හදිසි හා ඉතාමත් වගකීම් සහිත යුතුකම නම් එම අන්තරායේ තර්ජනය නියම වශයෙන්ම එල්ල වන්නේ කුමන දිසාවකින්ද යනු සොයා ගැනීමයි. මන්ද යත් අපේ මතභේදයට මුල්ව ඇත්තේ එබඳු අන්තරායක් තිබේද යන ප්‍රශ්නය නොව, එම අන්තරාය ඇති කරන්නේ 'සුළු පිරිසගේ' ඊනියා වල්ගවාදය විසින්ද නැතහොත් 'බහුතරයේ' ඊනියා විප්ලවවාදය විසින්ද යන ප්‍රශ්නය බැවිනි.

සියලුම වැරදි අර්ථ–නිරූපන හා වැරදි අවබෝධ දුරලනු පිණිස අප පළමුවෙන්ම සඳහන් කරන අන්තරාය, කාරණයේ මනෝමූල අංශයෙහි නොව වාස්තවික අංශයෙහි රැඳෙන්නක් බවත්, එසේම එය සටනේදී සමාජ-ප්‍රජාතන්ත්‍රවාදය විසින් ගනු ලබන නිල තත්වයෙහි රැඳෙන්නක් නොව මුළුමහත් වර්තමාන විප්ලවීය සටනේ ද්‍රව්‍යමය ප්‍රතිඵලය කෙරෙහි රැඳෙන්නක් බවත් සඳහන් කළ යුතු වෙමු. ප්‍රශ්නය වී ඇත්තේ අර හෝ මේ සමාජ-ප්‍රජාතන්ත්‍රික කණ්ඩායමට ධනේශ්වර ප්‍රජාතන්ත්‍රවාදයේ දියවී සිටිමට වුවමනාද යනු හෝ තමන් එසේ කරන බව ඔවුන් අවබෝධ කර ගන්නේද යනු නොවේ. කිසිවකු එය යෝජනා නොකරයි. කිසිම සමාජ-ප්‍රජාතන්ත්‍රිකයෙක් තුළ එබඳු ආශාවක් ඇතැයි අපි සැක නොකරමු. මෙය කිසි සේත්ම ආශාව පිළිබඳ ප්‍රශ්නයක් නොවේ. එමෙන්ම එය මුළු විප්ලව කාලය තුළදීම, යම්කිසි සමාජ-ප්‍රජාතන්ත්‍රික කණ්ඩායමක් විසින් මූලික වශයෙන් ධනේශ්වර ප්‍රජාතන්ත්‍රවාදයෙන් ස්වකීය අන්‍යොන්‍යභාවය, පුද්ගලිකත්වය හා ස්වාධීනත්වය පවත්වා ගනීද යන්න පිළිබඳ ප්‍රශ්නයක්ද නොවේ. ඔවුන් විසින් එබඳු 'ස්වාධීනත්වයක්' ප්‍රකාශ කරනු ඇතිවා පමණක් නොව, නිල වශයෙන් එය පවත්වා ගැනීමද කරනු ඇත. එහෙත් ධනපති පංතියේ චපලභාවයට විරුද්ධව කරන සටනේදී ඔවුන්ගේ අත් පා බැඳෙනු ඇති බව පෙනී යනු ඇත. සමාජ-ප්‍රජාතන්ත්‍රවාදයේ මූලික 'ස්වාධීනත්වය' රැකුනද වෙනම පක්ෂයක් වශයෙන් සම්පූර්ණයෙන්



එහි සංවිධානමය පුද්ගලික භාවය රැකුනද, විප්ලවයේ අවසන් දේශපාලන ප්‍රතිඵලය අනුව ඇත්ත වශයෙන්ම එම පක්ෂය ස්වාධීන නොවනු ඇති අතර, සිදුවීම් හමුවේ ස්වකීය නිර්ධන පංතික ස්වාධීනත්වයේ සලකුණු තැබීමට ඊට හැකි නොවනු ඇත. එහිදී එම පක්ෂය කොතරම් දුර්වල තැනට වැටෙන්නේද යත්, අවසානයේදී සම්පූර්ණයෙන් එය ධනපති පංතික ප්‍රජාතන්ත්‍රවාදය 'දියවීයාම' ඉතිහාසගත සත්‍යයක් වනු ඇත.

නියම අන්තරාය වන්නේ එයයි. දැන් මෙම අන්තරාය එල්ල වන්නේ, අප විශ්වාස කරන පරිදි නව ඉස්ක්‍රාවාදීන් කරන්නාක් මෙන් සමාජ-ප්‍රජාතන්ත්‍රවාදය දකුණට ගමන් කිරීමෙන්ද, නැතහොත් ඔවුන් විශ්වාස කරන පරිදි ''වපිරියොද්'' (ඉදිරිමග) 'වැඩිදෙනා' ආදීන් කරන්නාක් මෙන් සමාජ-ප්‍රජාතන්ත්‍රවාදය වමට බර වීමෙන්ද යනු විමසා බලමු.

අප විසින් පෙන්වා දී ඇති පරිදි, මෙම ප්‍රශ්නයට පිළිතුර රඳා ඇත්තේ විවිධ සමාජ බලවේග ක්‍රියාත්මක වීමෙහිදී වාස්තවිකව සංයෝග වීම මතය. රුසියානු ජීවිතය පිළිබඳ මාක්ස්වාදී විශ්ලේෂණය විසින් මෙම බලවේගයන්ගේ ස්වභාවය න්‍යායිකව නිර්ණය කර ඇත. වර්තමානයේ එය, විප්ලවයේදී පංතීන්ගේ හා සමාජ කොටස්වල විවෘත ක්‍රියා අනුව ව්‍යවහාරික වශයෙන් නිර්ණය කෙරේ. දැන් අප ගෙවන කාල පරිච්ඡේදය ආරම්භ වීමට බොහෝ කලින්ම මාක්ස්වාදීන් විසින් කරන ලද මුළු න්‍යායික විශ්ලේෂණය මගින්ද, එසේම විප්ලවීය සිදුවීම් වැඩී යාම පිළිබඳ සියලු ව්‍යවහාරික නිරීක්ෂණයන්ගෙන්ද පෙන්වන අයුරු, වාස්තවික තත්වයන් අනුව රුසියානු විප්ලවයට ගතහැකි මාර්ග දෙකක් හා විය හැකි ප්‍රතිඵල දෙකක් තිබේ. රුසියාවේ දේශපාලන හා ආර්ථික ක්‍රමය ධනපති ප්‍රජාතන්ත්‍රික මාර්ගයේ වෙනස් වීම අනිවාර්යයෙන්ම වැළැක්විය නොහැක්කේද වෙයි. එබඳු වෙනසක් සිදුවනු වැලැක්වීමට ලෝකයේ කිසිම බලයකට නුපුළුවන. එහෙත්, එය සිදු කරන පවත්නා බලවේගයන්ගේ ඒකාබද්ධ ක්‍රියාකාරිත්වය තුළින් දෙකින් එකක් ඇති කිරීමට පුළුවන. එම වෙනස පිළිබඳ ක්‍රම දෙකෙන් එකක් ගෙන ඒමට පුළුවන. එක්කෝ (1) 'සාර්වාදය යටපත් කෙරෙන විප්ලවයේ තීරණාත්මක ජයග්‍රහණයකින්' කරුණු අවසන් වනු ඇත. නැතහොත් (2) තීරණාත්මක ජයග්‍රහණයක් සඳහා බලවේග ප්‍රමාණවත් නොවන අතර ඉතාමත් 'චපල' හා ඉතාමත් 'ආත්මාර්ථකාමී' ධනපති පංතික කොටස් සහ සාර්වාදය අතර ගනුදෙනුවකින් කරුණු අවසන් වීමක් වනු ඇත. කල් තබා කිසිවෙකුට දැකිය නොහැකි අනන්ත ප්‍රමාණ සවිස්තර හා සංයෝග තුළින් පොදුවේ

හා සමස්තයක් වශයෙන් මේ ප්‍රතිඵල දෙකෙන් එකක් බිහි වනු ඇත.

ප්‍රථමයෙන්, ඒවායේ සමාජමය වැදගත්කම අතිනුත්, දෙවනුව, දෙතැන්හිදීම ('දියවීයාමේදී' හෝ 'අත් පා බැඳෙන විටදී') සමාජ-ප්‍රජාතන්ත්‍රවාදයට හිමිවන තත්වය අතිනුත් මෙම ප්‍රතිඵල අපි දැන් විමසා බලමු.

'සාර්වාදය යටපත් කළ විප්ලවයේ තීරණාත්මක ජයග්‍රහණය' යනු කුමක්ද? මේ ප්‍රකාශණය ප්‍රයෝජනයට ගැනීමේදී එහි නුදුරු දේශපාලන වැදගත්කම පවා අවබෝධ කර ගැනීමට නව ඉස්ක්‍රාවාදීන් අපොහොසත් වූ බව අපි දැනටමත් දැක ඇත්තෙමු. ඔවුන් මෙම සංකල්පයේ පංතිමය හරය අවබෝධ කරගෙන ඇත්තේ ඊටත් අඩුවෙන් බැව් පෙනේ. ඇත්ත වශයෙන්ම මාක්ස්වාදීන් වන අප කිසි විටෙකත් කුමන හේතුවක් නිසා හෝ, බොහෝ (ගපොන් පන්නයේ) විප්ලවීය ප්‍රජාතන්ත්‍රිකයන් මෙන් 'විප්ලවය' හෝ 'ශ්‍රෙෂ්ඨ රුසියන් විප්ලවය' බඳු වදන්වලින් රවටනු ලැබීමට ඉඩ දිය යුතු නොවේ. (හැමටම හොඳින් වැටහෙන යථා බලවේගයක් වූ) 'සාර්වාදයට' විරුද්ධ වන්නාවූත්, එය යටපත් කොට 'තීරණාත්මක ජයග්‍රහණයක්' ලැබීමට හැකිකම තිබෙන්නාවූත් නියම සමාජ බලවේග කවරේද යන වග ගැන අපට හොඳින් පැහැදිලි වූ දැනුමක් තිබිය යුතුය. ලොකු ධනපති පංතියට, ඉඩම් හිමියන්ට, කම්හල් හිමියන්ට, අස්වබ්ෂ්ජේනියවාදීන්ගේ නායකත්වය අනුව යන 'සමාජයට' එබඳු බලවේගයක් විය නොහැකිය. ඔවුන්ට තීරණාත්මක ජයග්‍රහණයක් වුවමනා නැති බව අපට පෙනේ. ස්වකීය පංති තත්වය නිසා සාර්වාදයට විරුද්ධව තීරණාත්මක අරගලයක යෙදීමට ඔවුන් අසමත් වන බව අපි දනිමු. පුද්ගලික දේපළ අයිතිය, ඉඩම් හා ප්‍රාග්ධන අයිතිය ආදිය නිසා, තීරණාත්මක සටනකට එළඹීමට ඔවුනට දැඩි බාධා ඇතිවේ. ගොවීන්ට හා නිර්ධන පංතියට විරුද්ධව යෙදවීම සඳහාත්, එම කොටස් විනාශ කර දැමීමට උත්සාහ කරනු සඳහාත් නිලධාරි බලය, යුද හමුදාව හා පොලීසිය ආදියෙන් සමන්විත වූ සාර්වාදය ඔවුන්ට බොහෝ සෙයින්ම උවමනා ය. නැත, 'සාර්වාදය යටපත් කළ තීරණාත්මක ජයග්‍රහණයක්' ලැබීමට සමත් එකම බලවේගය ජනතාවයි. එනම්, ප්‍රධාන පෙළේ ලොකු බලවේග ගණන් ගන්නේ නම්, නිර්ධන පංතිය හා පොදු ජනතාවත්, ඒ දෙක අතරට වැටෙන ('ජනතාව'ගේම කොටසක් වන) නාගරික හා ගම්බද සුළු ධනපති පංතියත්ය. 'සාර්වාදය යටපත් කිරීමෙන් ලබන විප්ලවයේ තීරණාත්මක ජයග්‍රහණය' නම් නිර්ධන පංතියේ හා ගොවි ජනයාගේ විප්ලවීය ප්‍රජාතන්ත්‍රික ආඥාදායකත්වය පිහිටුවීමයි. "එපිරියොද්"



පුවත් පත විසින් බොහෝ ඉහතදීම පෙන්වා දෙන ලද නිගමනයෙන් පලා යාමට අපේ නව ඉස්ක්‍රා කණ්ඩායමට නුපුළුවන. සාර්වාදය යටපත්කොට තීරණාත්මක ජයග්‍රහණයක් ලැබීමට අන් කිසිවෙකුත් සමත් නොවේ.

එබඳු ජයග්‍රහණයක් නියත වශයෙන්ම ආඥාදායකත්වයක් වනු ඇත. එනම්, එය 'නීත්‍යානුකූල' හෝ 'සාමකාමී' මාර්ගයකින් පිහිටුවන ලද කිසියම් ආයතන කෙරෙහි නොව හමුද බලය කෙරෙහි, බහුජනතාව සන්නද්ධ කිරීම කෙරෙහි විශ්වාසය තැබීමට සිදුවේ. නිර්ධන පංතියට හා ගොවි ජනතාව කිසිසේත් නැතිවම බැරි හදිසි වෙනස්කම් ඇති කිරීමේදී ඉඩම් හිමියන්ගේත්, ලොකු ධනපති පංතියේ හා සාර්වාදයේත් මාරාන්තික විරෝධය මතුවන බැවින් එය ආඥාදායකත්වයක් මගින්ම පමණක් යුතුය. ආඥාදායකත්වයක් නොමැතිව එම විරෝධය මැඩ පවත්වා ප්‍රතිවිප්ලවකාරී උත්සාහයන් පළවා හැරිය දැමිය නොහැකිය. එහෙත් එය නිසැකයෙන්ම සමාජවාදී ආඥාදායකත්වයක් නොව ප්‍රජාතන්ත්‍රවාදී ආඥාදායකත්වයක් වනු ඇත. (විප්ලවයේ වැඩී යාම පිළිබඳ අතුරු අවස්ථා පෙළක් නොමැතිව) ධනවාදයේ පදනම් සෙලවීමට ඊට නුපුළුවන. එබඳු ආඥාදායකත්වයකින් උඩත් පිරි සෙයින්ම කළ හැකි වන්නේ ගොවි ජනයාට වැඩදායක වන අන්දමින් මූලික වශයෙන් ඉඩකඩම් යළි බෙදදීම, සමූහාණ්ඩුවක් පිහිටුවීම ඇතුළු සම්පූර්ණ හා ස්ථිරසාර ප්‍රජාතන්ත්‍රවාදයක් ඇති කිරීම, ගම්බද පමණක් නොව නාගරික ජීවිතයේත් පවත්නා ආසියාතික වහල් ලක්ෂණ හා සියලු බැඳීම් ඉවත් කිරීම, කම්කරුවන්ගේ තත්වයේ හොඳ දියුණුවක් ඇති කිරීමට හා ඔවුන්ගේ ජීවන තත්වය ඉහළ දැමීමට පදනමක් දැමීම සහ අවසාන වශයෙන්, last but not least* — විප්ලවීය ගැටුම යුරෝපයට ගෙන යාමත්ය. එහෙත් එබඳු ජයග්‍රහණයකින් අපේ ධනපති පංතික විප්ලවය සමාජවාදී විප්ලවයක් බවට පරිවර්තනය නොකෙරේ. ප්‍රජාතන්ත්‍රික විප්ලවය ක්ෂණිකවම ධනපති සමාජ හා ආර්ථික ක්‍රමයේ සීමාවන්ගෙන් ඔබ්බට නොයයි. එහෙත් රුසියාවේ හා සමස්ත ලෝකයේත් අනාගත සංවර්ධනය සඳහා එබඳු ජයග්‍රහණයක වැදගත්කම දැවැන්ත වනු ඇත. රුසියාවේ දැන් ආරම්භවී ඇති විප්ලවයේ මේ තීරණාත්මක ජයග්‍රහණය තරම් වෙන කිසිවකිනුත් ලෝක නිර්ධන පංතියේ විප්ලවීය උද්යෝගය ඒ සා ඉහළ නොයනු ඇත. එහි සම්පූර්ණ ජයග්‍රහණය කරා දිවෙන මාවත ඒ සා ප්‍රමාණයකින් කෙටි නොවනු ඇත.

---

* අවසාන මුත් වැදගත්කමින් යුත්

එබඳු ජයග්‍රහණයකට කොතෙක් දුරට ඉඩකඩ ඇත්ද යනු වෙනත් ප්‍රශ්නයකි. ඒ සම්බන්ධයෙන් අහේතුක ලෙස සර්වශුභවාදී හැඟීම් ඇතිකර ගැනීමට අපි කිසිසේත්ම රිසි නොවෙමු. මෙම කාර්ය භාරයේ ඇති දුෂ්කරතා අපි මොහොතකටවත් අමතක නොකරමු. එහෙත් සටන් කිරීමට අප අධිෂ්ඨාන සහගතව බැස සිටින හෙයින් අපි ජයග්‍රහණය බලාපොරොත්තු විය යුතු වෙමු. ඊට පිවිසෙන නිවැරදි මාර්ගය දක්විය යුත්තෙමු. එබඳු ජයග්‍රහණයකට තුඩුදෙන නැඹුරුවීම් නිසැකයෙන්ම පවතී. තවමත් නිර්ධන පංතියේ බහුතර ජන කොටස් කෙරේ අපේ, සමාජ-ප්‍රජාතන්ත්‍රික බලපෑම බොහෝ සෙයින් ප්‍රමාණවත් නොවන බවත්, බහුතර ගොවි ජනතාව කෙරෙහි විප්ලවීය බලපෑම සහමුලින්ම සුළු එකක් බවත්, නිර්ධන පංතිය හා විශේෂයෙන් ගොවි ජනතාව තවමත් භයානක ලෙස අසමගිව නොදියුණු කමින් හා නූගත් කමින් පසුවන බවත් ඇත්තකි. එහෙත් විප්ලවය විසින් ශීඝ්‍රයෙන් එක්සත් කරනු ලබයි. ශීඝ්‍රයෙන් අවබෝධය දෙනු ලබයි. එහි වැඩී යාමේ සෑම පියවරක් විසින්ම බහු ජනතාව ප්‍රබෝධමත් කොට තමන්ගේ නියම හා පරම අපේක්ෂාවන් සම්පූර්ණයෙන් හා ස්ථිරසාරව ප්‍රකට කරන එකම වැඩ සටහන වන විප්ලවීය වැඩ සටහන කෙරෙහි අචල භක්තියකින් ඔවුන් බැඳ තබයි.

යාන්ත්‍රික විද්‍යාවේ නියාමයක් අනුව ක්‍රියාව හා ප්‍රතික්‍රියාව හැම විටම සමානය. ඉතිහාසයේදීද, විප්ලවයක විනාශකාරී බලය නිදහස සඳහා ගන්නා උත්සාහය වර්ධනය කිරීමේ ශක්තිය හා' කාලසීමාවේ ප්‍රමණය මත සහ යල්පිණු 'උපරි-ව්‍යුහය' හා අපේ කාලයේ ජීවමාන බලවේග අතර ප්‍රතිවිරෝධතාවයේ ගැඹුර මත සැහෙන තරමින් රඳා පවතී. ජාත්‍යන්තර දේශපාලන තත්වයද බොහෝ අංශවලින් රුසියන් විප්ලවයට ඉතා වාසිදයක අන්දමින් හැඩ ගැසේ. කම්කරුවන්ගේ හා ගොවින්ගේ නැගිටීම දැනටමත් ආරම්භ වී ඇත. එය තැනින් තැන ඉබේ හටගත් දුර්වල එකකි. එහෙත් තීරණාත්මක අරගලයක් කිරීමට සමත් වූද තීරණාත්මක ජයග්‍රහණයක් කරා ඉදිරියට යන්නාවූද බලවේගවල පැවැත්ම ඉන් ප්‍රශ්න කළ නොහැකි පරිදි හා නිසැකවම ඔප්පු කරයි.

එම බලවේග ප්‍රමාණවත් නොවුනි නම් බුලීගින් කල්ලිය එක අතකිනුත් ස්ත්‍රුවේ කල්ලිය අනෙක් අතිනුත් අන්ත දෙකකින් දැනටමත් සූදනම් කරමින් තිබෙන ගනුදෙනුව සම්පූර්ණ කිරීමට සාර්වාදයට කාලය ලැබේ. එවිට කප්පාදු කළ ආණ්ඩු ක්‍රමයකින් සියල්ල හමාර වනු ඇත. නැතහොත් තත්වය නරකටම ගියහොත් ආණ්ඩු ක්‍රමයක් පිළිබඳ රැවටිල්ලකින් වුවද අවසන් විය හැක. මෙයද



'ධනපති පංතික විප්ලවයක්' වෙයි. එහෙත් එය මළ දරු උපතක්, අකාල උපතක්, ගබ්සාවක් වනු ඇත. මේ සම්බන්ධයෙන් සමාජ-ප්‍රජාතන්ත්‍රිකයෝ වැරදි වැටහීම් නොදරති. ධනපති පංතියේ ද්‍රෝහී ස්වභාවය ඔව්හු දනිති. ධනපති ආණ්ඩුක්‍රමවාදී මීපොව් ප්‍රමෝදය පවතින ඉතාමත් අඳුරු මලානික කාලයේදී පවා නිර්ධන පංතියට පංති පුහුණුවක් ගෙනදීමේ දැඩි, ඉවසිලිවන්ත හා කල් පවත්නා ස්වකීය කටයුතු සමාජ-ප්‍රජාතන්ත්‍රවාදය විසින් අතහැර දැමීම හෝ ඒ ගැන මන්දෝත්සාහී වීම නොකරනු ඇත. එබඳු ප්‍රතිඵලයක් 19 වෙනි සියවසේ යුරෝපයේ ප්‍රජාතන්ත්‍රික විප්ලව සියල්ලෙහිම පාහේ ප්‍රතිඵලවලට බොහෝ සෙයින් සමාන වනු ඇත. එතැනදී අපේ පක්ෂයේ වැඩීයාම අසීරු වුවත් දුෂ්කරවූත්, දීඝවූත් එහෙත් හුරු පුරුදු හා සොයාගත් මග ඔස්සේ ඉදිරියට ගමන් කරනු ඇත.

දැන් උද්ගතවන ප්‍රශ්නය මෙයයි. චපල හා ආත්මාර්තකාමී ධනපති පංතියට විරුද්ධව කරන සටනේදී සමාජ-ප්‍රජාතන්ත්‍රවාදයේ අත්පා හිරකරනු ඇත්තේ ඉහත දැක්වූ ප්‍රතිඵල දෙකෙන් කුමන ප්‍රතිඵල විසින්ද? එසේම සමාජ-ප්‍රජාතන්ත්‍රවාදය නියම වශයෙන් ධනපති ප්‍රජාතන්ත්‍රවාදයේ 'දියවීයාමට' හෝ එසේ වීමට ආසන්නවීමට තුඩු දෙන්නේ කුමන ප්‍රතිඵලයකින්ද?

මොහොතකවත් දුෂ්කරතාවයෙන් තොරව පිළිතුරු දීම සඳහා මෙම ප්‍රශ්නය පැහැදිලිව ඉදිරිපත් කිරීමම ප්‍රමාණවත් වේ.

සාර්වාදය හා එකඟත්වයකට පැමිණ රුසියන් විප්ලවය භංග කිරීමට ධනපති පංතිය සමත් වන්නේ නම් එවිට චපල ධනපති පංතියට විරුද්ධව කරන සටනේදී සමාජ-ප්‍රජාතන්ත්‍රවාදයේ අත් පා නියම වශයෙන් හිරවනු ඇත. විප්ලවය මත තම පැහැදිලි සලකුනු තැබීමට නිර්ධන පංතිය සමත් නොවනු ඇත. නිර්ධන පංතික ආකාරයෙන් හෝ මාක්ස් වරක් කී පරිදි 'ප්ලේබියන් ආකාරයෙන්' සාර්වාදය සමග ගනුදෙනු බේරීමට නිර්ධන පංතියට ඉඩ නොලැබෙනු ඇත යන අර්ථයෙන් තමන් ධනපති ප්‍රජාතන්ත්‍රවාදය තුළ 'දියවී' ඇති බව සමාජ-ප්‍රජාතන්ත්‍රවාදයට දැනෙනු ඇත.

විප්ලවය තීරණාත්මක ජයග්‍රහණයක් ලබයි නම්, එවිට අපි ජැකොබින්[33] ක්‍රමයට හෝ ඔබ කැමති නම් 'ප්ලේබියන්' ක්‍රමයට සාර්වාදය සමග ගනුදෙනු බේරා ගන්නෙමු. ''මුළු ප්‍රංශ භීෂණයම වෙන කිසිවක් නොව ධනපති පංතියේ හතුරන් සමග, ඒකාන්තවාදය, වැඩවසම්වාදය හා පිංගුත්තරවාදය සමග ගනුදෙනු බේරීමේ ප්ලේබියන් ක්‍රමයකැ''යි මාක්ස් 1848 දී සුප්‍රසිද්ධ ''නව රයින් පත්‍රය'' නමැති පුවත්පතෙහි ලිවේය. (Marx' Nachlaß, මේරින්ග් ගේ සංස්කරණය,

3 වෙළුම,211 පිටුව බලන්න)[32] ප්‍රජාතන්ත්‍රික විප්ලව කාල පරිච්ඡේදයක දී ජැකොබින්වාදයේ බිල්ලා පෙන්වමින් රුසියාවේ සමාජ-ප්‍රජාතන්ත්‍රික කම්කරුවන් බිය වැද්දීමට උත්සාහ කරන මිනිස්සු මාක්ස්ගේ මේ වදන්වල වැදගත්කම ගැන මොහොතකට වත් කල්පනා කළේද?

වර්තමාන රුසියන් සමාජ-ප්‍රජාතන්ත්‍රවාදයේ ජිරොන්ඩවාදීන්[33] වූ නව ඉස්ක්‍රා කණ්ඩායම අස්වබ්ෂ්ජේනිය කණ්ඩායම සමග බද්ධ නොවේ. එහෙත් ඇත්ත වශයෙන්ම ඔවුන්ගේ සටන් පාඨවල ස්වාභාවය නිසාම ඔව්හු අස්වබ්ෂ්ජේනියවාදීන් පසුපස ගමන් කරති. ඒ අතර අස්වබ්ෂ්ජේනිය කණ්ඩායම, එනම්, ලිබරල්වාදී ධනපති පංතියේ නියෝජිතයෝ, ඒකාධිපත්‍යය සමග ගනුදෙනු බේරීමට කැමති වන්නේ රදළයින්, වංශවතුන් හා රාජසභාව අමනාප නොවන අන්දමින් ඉතා මෘදු ලෙස, කීකරු ලෙස හා ප්‍රතිසංස්කරණවාදී මාර්ගයකිනි. සුදු අත් මේස් (රුධිරු නිකොලායි විසින් පවත්වන ලද 'ජනතා නියෝජිතයන්ගේ' සම්භාෂණයකදී[34] බෂ්බුසුක්[35] අතින් පෙත්රුන්කේවිච් මහතා පැළඳි ඒවාට සමාන — ''ප්‍රොලිතාරි'' අංක 5* බලන්න) පළඳින නම්බුකාර මහතුන්ට ගැලපෙන සේ කාරුණික හා සැරපරුෂ නොවන තාලයකිනි.

වර්තමාන සමාජ-ප්‍රජාතන්ත්‍රවාදයේ ජැකොබින්වරු වන බොල්ෂෙවික්වරු, එනම්, වපිරියොද්වරු, සම්මේලන කණ්ඩායම, ප්‍රොලිතාරිවරු[36] ආදී වශයෙන් අප විසින් හඳුන්වනු ලබන්නෝ විප්ලවකාරී හා සමූහාණ්ඩුවාදී සුළුධනපති පංතියත්, විශේෂයෙන්ම ගොවි ජනතාවත්, පංතියක් වශයෙන් තම පුද්ගලභාවය රැක ගන්න නිර්ධන පංතියේ ස්ථිරසාර ප්‍රජාතන්ත්‍රවාදයේ මට්ටමට ඔසවා තැබීමට කැමති වෙති. විමුක්තියට සතුරු වන්නන් නිර්දය ලෙස විනාශ කරමින්, ඔවුන්ගේ ප්‍රතිරෝධය බලය යොදා පොඩිපට්ටම් කරමින්, දස ක්‍රමයේත්, ආසියාතික මිලේච්ඡත්වයේ හා මිනිසා පහත් කොට සැලකීමේත්, නින්දජනක නටබුන්වලට කිසිම සහනයක් නොදක්වා ජනතාව විසින්, එනම් නිර්ධන පංතිය හා ගොවිජනයා විසින් රාජාණ්ඩුව හා රදළ පංතිය සමග ප්ලේබියන් ක්‍රමයට ගනුදෙනු බේරීම දැකීමට ඔව්හු කැමති වෙති.

1793 ජැකොබින්වරුන් එලෙසින්ම අනුකරනය කරන ලෙසත් ඔවුන්ගේ අදහස්, වැඩ සටහන්, සටන් පාඨ හා සටන් ක්‍රම එලෙසින්ම

* ළමා අත් මෙස් පළඳින 'විප්ලවවාදීහු'. 1905. ලෙනින් එකතු කළ කෘති, 8 වෙළුම, 526—530 පිටු. — සංස්කාරක.



පිළිගන්නා ලෙසත් අප අවශ්‍යයෙන්ම යෝජනා කරන බවක් ඇත්තෙන්ම මින් අදහස් නොකෙරේ. එබඳු කිසිවක්ම නැත. අපේ වැඩ සටහන පැරණි එකක් නොව නව එකකි. එය රුසියානු සමාජ-ප්‍රජාතන්ත්‍රවාදී කම්කරු පක්ෂයේ අවම වැඩ සටහනය. අපට අලුත් සටන් පාඨයක් තිබේ. එනම් නිර්ධන පංතියේ හා ගොවි ජනයාගේ විප්ලවීය ප්‍රජාතන්ත්‍රික ආඥාදායකත්වයයි. විප්ලවයේ නියම ජයග්‍රහණයක් දැකීමට අප ජීවත් වුවහොත් පූර්ණ සමාජවාදී විප්ලවයක් සඳහා වෙහෙසන කම්කරු පංති පක්ෂයේ සම්භවයට හා අරමුණුවලට හොඳින් ගැලපෙන අලුත් සටන් ක්‍රමද ඇති කරන්නෙමු. මෙසේ කරුණු සසැඳීමෙන් අපට හුදෙක්ම උවමනා කරන්නේ 18 වන සියවසේ ප්‍රගතිශීලී පංතිය වූ ධනපති පංතියේ නියෝජිතයින් ජිරොන්ඩවාදීන් හා ජැකොබින්වරුන් යනුවෙන් අංශ දෙකකට බෙදී සිටියාක් මෙන්20 වන ශතවර්ෂයේ ප්‍රගතිශීලී පංතිය වූ නිර්ධන පංතියේ නියෝජිතයින්ද, එනම් සමාජ-ප්‍රජාතන්ත්‍රවාදීන්ද, අංශ දෙකකට (අවස්ථාවාදීන් හා විප්ලවකාරීන්) බෙදී සිටින බව පැහැදිලි කිරීම පමණි.

චපල ධනපති පංතියට විරුද්ධව කරන සටනේදී නිර්ධන පංතියේ අත් පා නිදහසේ හැසිරවීමට පුළුවන් වන්නේ, ප්‍රජාතන්ත්‍රික විප්ලවය සම්පූර්ණයෙන් ජයග්‍රහණය කළ විටදී පමණි. ධනපති ප්‍රජාතන්ත්‍රවාදය තුළ 'දිය නොවී' ඊට සමස්ත විප්ලවය මත නිර්ධන පංතික සළකුණු නැතහොත් ගොවි හා නිර්ධන පංතික සළකුණු සටහන් කළ හැකි වන්නේ එවිට පමණි.

කොටින් කියතොත්, චපල ධනපති ප්‍රජාතන්ත්‍රිකයින්ට විරුද්ධව කරන සටනේදී ස්වකීය අත් පා හිර නොවනු පිණිස නිර්ධන පංතිය පන්ති හැඟීමෙන් යුතුව හා ගොවීන්ගේ විප්ලවීය හැඟීම් පුබුදුවා ඔවුන්ගේ ප්‍රහාරය මෙහෙයවා ඒ මගින් ස්වයීනව ස්ථිරසාර නිර්ධන පංති ප්‍රජාතන්ත්‍රවාදී මාර්ගය අනුගමනය කිරීමට තරම් ශක්තිමත් විය යුතුය.

චපල ධනපති පංතියට විරුද්ධව කරන සටනේදී අපේ අත් පා බැඳීයාමේ තර්ජනය පිළිබඳව නව ඉස්ක්‍රාවාදීන් විසින් අදක්ෂ ලෙස පිළිතුරු සපයා ඇති ප්‍රශ්නය සම්බන්ධ නියම කරුණු එසේය. ධනපති පංතිය සැමවිටම චපල වනු ඇත. සාර්ථක වුනිනම්, ධනපති ප්‍රජාතන්ත්‍රිකයා ජනතාවගේ අවංක මිතුරෙකු ලෙසින් සලකනු ලැබීමට තුඩුදෙන කරුණු හා කොන්දේසි* පැනවීම සඳහා ප්‍රයත්න දැරීම තරම්

* ස්තරවේර් මේ සඳහා උත්සාහයක්[37] ගත්තද තුන්වන සම්මේලනය මගින් එය නිෂ්ප්‍රභා කරන ලදී. සාකච්ඡා සභාවද, ඒ හා සමානව දුර්වල යෝජනාවන් ඒ සඳහා උත්සාහයක් දරයි.

බොලඳවූත් නිෂ්ඵලවූත් අන්කිසිවක් නැත. ප්‍රජාතන්ත්‍රවාදය සඳහා ස්ථිරසාර සටන් කරන්නෙකු විය හැක්කේ නිර්ධන පංතියට පමණි. ඊට ප්‍රජාතන්ත්‍රවාදය සඳහා ජයග්‍රාහී සටන්කරුවෙකු විය හැක්කේ ස්වකීය විප්ලවකාරී සටනට ගොවි බහු ජනතාව සම්බන්ධ වන්නේ නම් පමණි. නිර්ධන පංතිය මේ සඳහා ශක්තිමත් නොවේ නම්, ධනපති පංතිය ප්‍රජාතන්ත්‍රික විප්ලවයේ මුල්තැනට පැමිණ ඊට වපල ආත්මාර්ථකාමී ස්වභාවයක් ගෙනදෙනු ඇත. ගොවීන්ගේ හා නිර්ධන පංතියේ විප්ලවීය ප්‍රජාතන්ත්‍රික ආඥාදායකත්වයක් හැර වෙන කිසිවකට මෙය වළක්වනු හැකි නොවේ.

නව ඉස්ක්‍රා උපක්‍රම ඒවායේ වාස්තවික වැදගත්කම නිසාම ධනපති ප්‍රජාතන්ත්‍රිකයන්ගේ වාසියට හේතුවන බවට මෙසේ අපි නිසැක නිගමනයකට එළඹෙමු. ජනවරම් පවත්වන තරම් දිව යන සංවිධානමය දියාරුව දේශනා කිරීම, පාවාදෙන මූලධර්මය, පක්ෂ සාහිත්‍යය පක්ෂයෙන් වෙන් කිරීම, ජනතා නැගිටීමක අරමුණු සුළුකොට දැක්වීම, විප්ලවකාරී නිර්ධන පංතියේ සටන් පාඨ රාජාණ්ඩුවාදී ධනපති පංතියේ සටන් පාඨ සමග පටලැවීම, 'සාර්වාදය යටපත් කළ විප්ලවයේ තීරණාත්මක ජයග්‍රහණයක්' පිළිබඳ අවශ්‍යකම් විකෘති කිරීම ආදී — මේ සියල්ල එකට ගත්කළ එය විප්ලවකාරී කාල පරිච්ඡේදයක වල්ගවාදී ප්‍රතිපත්තියම වන්නේය. ජයග්‍රහණයට එකම මග පෙන්වා දෙමින්, නිර්ධන පංතියේ සටන් පාඨය වටා විප්ලවකාරී හා සමූහාණ්ඩුවාදී සියලුම ජන කොටස් ඒකරාශී කරනු වෙනුවට එයින් නිර්ධන පංතිය මුලාකොට, අසංවිධානාත්මක කොට ඔවුන්ගේ අවබෝධය අවුල් කොට සමාජ-ප්‍රජාතන්ත්‍රවාදී උපක්‍රම සුළුකොට දක්වේ.

---

යෝජනාව විශ්ලේෂණය කිරීම පදනම් කොට ගෙන අප විසින් එළඹෙන ලද මේ නිගමනය තහවුරු කරනු සඳහා මේ ප්‍රශ්නය වෙතට අපි වෙනත් අංශවලින් පිවිසෙමු. පළමුවෙන්ම ජෝර්ජියානු ''සමාජ-ප්‍රජාතන්ත්‍රිකයා'' පත්‍රයෙන් ප්‍රධාන පෙළේ මෙන්ෂෙවික්වාදියෙකු නව ඉස්ක්‍රා උපක්‍රම පහදා දෙන ආකාරයත්, දෙවැනිව, වර්තමාන දේශපාලන තත්වය යටතේ නියම වශයෙන් නව ඉස්ක්‍රා සටන් පාඨ ප්‍රයෝජනයට ගත්තේ කවුරුත් විසින් ද යන වගක් විමසා බලමු.



# 7. 'ආණ්ඩුවෙන් ගතානුගතිකවාදීන් තුරන් කිරීමේ' උපක්‍රම

තිප්ලිස් මෙන්ෂෙවික් 'කමිටුවේ' නිල පුවත්පතේ (''සමාජ-ප්‍රජාතන්ත්‍රිකයා'' අංක 1) පළවූ අප ඉහතින් සඳහන් කළ ලිපියෙහි මාතෘකාව ''සෙම්ස්කි සබෝර් හා අපේ උපක්‍රම'' යනුයි. එම ලේඛකයා අපේ වැඩ සටහන තවමත් සම්පූර්ණයෙන් අමතක කර නැත. ඔහු සමූහාණ්ඩුවක් පිළිබඳ සටන් පාඨය ඉදිරිපත් කරයි. එහෙත් ඔහු උපක්‍රම සාකච්ඡා කරන්නේ මෙසේය:

''මෙම ඉලක්කය (සමූහාණ්ඩුවක්) දිනා ගැනීමේ මාර්ග දෙකක් දැක්විය හැකිය: එක්කෝ ආණ්ඩුව විසින් කැඳවනු ලබන සෙම්ස්කි සබෝර් සභාව සම්පූර්ණයෙන්ම නොසලකා හැර අවි බලයෙන් ආණ්ඩුව පරදවා, විප්ලවකාරී ආණ්ඩුවක් පිහිටුවා ව්‍යවස්ථාදායක මණ්ඩලයක් කැඳවිය යුතුය; නැතහොත්, සෙම්ස්කි සබෝර් සභාව අපේ කටයුතුවල කේන්ද්‍රස්ථානය බවට ප්‍රකාශ කොට, එහි සංයුතියට හා ක්‍රියාවන්ට අවිබලයෙන් බලපෑම් කොට, ව්‍යවස්ථාදායක මණ්ඩලයක් බවට ප්‍රකාශ කරන සේ ඊට බලහත්කාරයෙන් බලකිරීම හෝ ඒ මගින් ව්‍යවස්ථාදායක මණ්ඩලයක් පිහිටුවීමය. මෙයින් කුමන මාර්ගයක් අපට වඩා වාසිදායක වේදැයි සොයා බලමු.''

අප විසින් විශ්ලේෂණය ලැබූ යෝජනාවට පසුව ඇතුළු කරනු ලැබූ අදහස් රුසියානු නව ඉස්ක්‍රාවාදීන් විසින් ඉදිරිපත් කරනු ලබන්නේ එසේය. බුලීගින් 'වැඩ පිළිවෙළ' එළිනොබට කාලයේ ත්සුෂිමා සටනට[38] පෙර මෙය ලියැවුණු බව මතක තබා ගත යුතුය. ලිබරල්වාදීහු පවා නොඉවසිලිමත් වෙමින් නීත්‍යානුකූල පුවත්පත් මගින් තම අවිශ්වාසය පළ කළහ. කෙසේවෙතත්, නව ඉස්ක්‍රා වර්ගයේ සමාජ-ප්‍රජාතන්ත්‍රිකයෙකු ලිබරල්වාදීන්ටත් වඩා ඒවා ගැන විශ්වාසය තබන බව ඔප්පු වී ඇත. සෙම්ස්කි සබෝර් දැන් 'කැඳවා ගෙන යන' බව ප්‍රකාශ කරන ඔහු, සාර් රජු කෙරෙහි කොතරම් විශ්වාසයක් ඇති කරගෙන තිබේද යත්, තවමත් එළිනොබට මේ සෙම්ස්කි සබෝර් (නැතහොත් විය හැකි පරිදි 'රාජ්‍ය ඩූමා' සභාව හෝ 'උපදේශක ව්‍යවස්ථාදායක' සභාව?) අපේ ක්‍රියා කාරීත්වයේ කේන්ද්‍රස්ථානය කර ගැනීමට යෝජනා කරයි. සාකච්ඡා සභාවේදී අනුමත කරගත් යෝජනාවේ කර්තෘන්ට වඩා කෙළින් කතා කරන, ඍජු පුද්ගලයෙකු වන අපේ තිප්ලිස් වැසියා (තමන් විසින් දැඩි බොළඳබවෙන් යුතුව දක්වන) 'උපක්‍රම' දෙක සමාන මට්ටමක

නොතබා, ඉන් දෙවැන්න වඩාත් 'වාසිදායක' බැව් ප්‍රකාශ කරයි. මදක් ඇහුම්කන් දෙන්න:

''පළමු උපක්‍රමය. ඔබ දන්නා පරිදි මතු එන විප්ලවය ධනපති පංතික විප්ලවයකි. එනම්, එහි අර්ථය වනුයේ නිර්ධන පංතියට පමණක් නොව සමස්ත ධනපති සමාජයටම ප්‍රයෝජනවත් වන ආකාරයේ වෙනස්කම් වර්තමාන සමාජක්‍රමයේ ඇති කිරීමය. ආණ්ඩුවට සියලුම පංතීහු විරුද්ධ වෙති. ධනපතීහු පවා විරුද්ධ වෙති. එක් අතකින්, සටන්කාමී නිර්ධන පංතිය හා සටන්කාමී ධනපති පංතිය එක්ව ඉදිරියට යමින් විවිධ දිසාවල සිට ඒකාධිපත්‍යයට හවුලේ පහර දෙති. ආණ්ඩුව සම්පූර්ණයෙන් කොන්වී සිටින අතර ඊට මහජන අනුකම්පාවක් නැත. මේ හේතුව නිසා එය විනාශ කර දැමීම ඉතා පහසුය. සමස්තයක් වශයෙන් ගත්කළ තනිවම විප්ලවය ගෙනයාමට තරම් රුසියානු නිර්ධන පංතිය තවමත් සෑහෙන පමණ පංති හැඟුමෙන් යුක්තව හා සංවිධානව නැත. ඊට එසේ කළහැකි වුවද එයින් කරනු ඇත්තේ ධනපති පංතික විප්ලවයක් නොව නිර්ධන පංතික (සමාජවාදී) විප්ලවයකි. මේ නිසා, ආණ්ඩුව මිතුරන් නැතිව සිටීම, විරුද්ධ පාර්ශ්වය භේද කිරීමට නොහැකිව සිටීම, ධනපති පංතිය සමග අත්වැල් බැඳගැනීමෙන් නිර්ධන පංතිය කොන් කිරීමට අසමත් වීම අපට වාසිදායකය...''

එහෙනම්, ධනපති පංතිය හා නිර්ධන පංතිය වෙන් කිරීමට සාර් ආණ්ඩුවට නොහැකි විය යුත්තේ නිර්ධන පංතියේ යහපත පිණිසය! ''අස්වබෂ්ජේනිය'' යන නම වෙනුවට මෙම ජෝර්ජියන් නිල පත්‍රය ''සමාජ-ප්‍රජාතන්ත්‍රිකයා'' නමින් හැඳින්වෙන්නේ වැරදීමකින් නොවෙයි ද? ප්‍රජාතන්ත්‍රික විප්ලවය පිළිබඳව එහි එන අසමසම දර්ශනය බැලුව මැනවි! මේ අසරණ තිප්ලිස් වැසියා 'ධනපති පංති විප්ලවය' පිළිබඳ සංකල්පය ගැන වල්ගාවාදී පූරසාරම් අර්ථනිරූපනයෙන් හිස අවුල් කරගත් බව නොපෙනේද? ප්‍රජාතන්ත්‍රික විප්ලවයකදී නිර්ධන පංතිය කොන්වීමට ඉඩ තිබීමේ ප්‍රශ්නය ගැන සාකච්ඡා කරන ඔහුට යමක් අමතක වෙයි... සුළු දෙයක්, එනම්, ගොවිජනයා අමතක වෙයි! නිර්ධන පංතියේ මිතුරන් විය හැකි අය අතුරෙන් ඔහු සෙම්ස්ත්වොවාදී ඉඩම් හිමියන් අඳුනනු මෙන්ම ඔවුන්ට පක්ෂ වන අතරම ගොවීන් ගැන කිසිවක් නොදනී. එහෙත් මෙය සිදුවන්නේ කොකේශියාවේදීය! හොඳයි, සිය තර්කනය අනුව නව ඉස්ක්‍රාවාදීන්, විප්ලවකාරී ගොවිජනතාව තම මිත්‍රයකුගේ තත්වයට ඔසවා තබනු වෙනුවට රාජාණ්ඩුවාදී ධනපති පංතියේ මට්ටමට තමන් ඇද වැටෙන බව අප විසින් පවසනු ලැබීම නිවැරදි නේද?



''...නැතහොත් නිර්ධන පංතියේ පරාජය හා ආණ්ඩුවේ ජයග්‍රහණය වැළැක්විය නොහැකිය. ඒකාධිපත්‍යය වෙහෙසෙන්නේම මේ සඳහාමය. සෙම්ස්කි සබෝර් සභාවේදී ඒකාධිපත්‍යය විසින් නිසැක වශයෙන්ම සෙම්ස්ත්වො හා නගරවල නියෝජිතයින්, වංශවතුන්ගේ නියෝජිතයින්, විශ්වවිද්‍යාල හා ඒ සමාන වෙනත් ධනපති ආයතනවල නියෝජිතයින් ආදීන් තම පැත්තට ඇද ගන්නවා ඇත. සුළු සහන ලබාදීමෙන් මොවුන් සතුටු කොට තමන්ට අවනත කර ගැනීමට එය උත්සාහ ගනු ඇත. මෙනයින් ශක්තිය ලබන එය එහි දී තනිව සිටින කම්කරු ජනතාවට ස්වකීය ප්‍රහාර සියල්ල එල්ල කරනු ඇත. එහෙයින් එබඳු අවාසනාවන්න විපාකයක් වැලැක්වීම අපේ යුතුකම වන්නේ ය. එහෙත් පළමු ක්‍රමය අනුව එය කළ හැකිද? සෙම්ස්කි සබෝර් කෙරේ කිසි සැලකිල්ලක් නොදක්වා, ජනතා නැගිටීමක් සඳහා කටයුතු සූදනම් කොට එක් දිනක අවි ගෙන සටන් පිණිස වීදියට බැස්සා යයි අපි මොහොතකට සිතමු. එහි ප්‍රතිඵලය වනු ඇත්තේ අපට එක සතුරෙකුට පමණක් නොව සතුරන් දෙදෙනකුටම මුහුණදීමට සිදුවීමය: එනම්, ආණ්ඩුව හා සෙම්ස්කි සබෝර් යන දෙකටම මුහුණදීමට සිදුවීමය. අප කටයුතු සූදනම් කරන අතරවාරයේ තමන්ට වාසි ගෙනදෙන ආණ්ඩු ක්‍රමයක් සකස් කොට එකිනෙකා සමඟ එකඟ බවට පැමිණ බලය බෙද ගැනීමට ඔවුන්ට හැකිවනු ඇත. මෙම උපක්‍රමය ආණ්ඩුව කෙලින්ම වාසි ලබා දෙන්නක් බැවින් අප විසින් එය ඉතාමත්ම විස්තරාත්මකව ප්‍රතික්ෂේප කළ යුතුය''.

දැන් මේ අවංක කතාවකි! ජනතා නැගිටීමක් සූදනම් කිරීමේ 'උපක්‍රමය' අප විසින් අධිෂ්ඨාන සහගතව ප්‍රතික්ෂේප කළ යුතුය. මන්ද? අප ඒ සඳහා සූදනම් වන 'අතරතුර' ආණ්ඩුව ධනපති පංතිය හා එකඟත්වයකට පැමිණීමට ඉඩ ඇති බැවිනි! අති උන්මත්ත 'ආර්ථිකවාදයේ' පැරණි සාහිත්‍යයෙන් පවා විප්ලවීය සමාජ-ප්‍රජාතන්ත්‍රවාදයට මෙතරම් නින්දවක් ගෙන දෙන කිසිවක් සොයා ගත හැකිද? පළමුව එක් තැනෙකත් පසුව තවත් තැනෙකත් කම්කරු හා ගොවිජන නැගිටීම් හා කැරැලි සිදුවන බව ප්‍රත්‍යක්ෂ සත්‍යයකි. එහෙත් සෙම්ස්කි සබෝර් තවමත් බුලීගින් පොරොන්දුවක් පමණි. එසේ තිබියදීත්, ජනතා නැගිටීමක් සූදනම් කිරීමේ උපක්‍රමය ප්‍රතික්ෂේප කොට සෙම්ස්කි සබෝර් 'බල කේන්ද්‍රය' වෙනුවෙන් බලා සිටීමට තිප්ලිස් නගරයේ ''සමාජ-ප්‍රජාතන්ත්‍රිකයා'' පත්‍රය තීරණය කරයි...

''...අනෙක් අතට, දෙවැනි උපක්‍රමය, තමන්ගේ කැමැත්ත අනුව ක්‍රියා කිරීමට හා එමගින් ආණ්ඩුව සමඟ ගිවිසුමකට එළඹීමට සෙම්ස්කි

සබෝර් සභාවට ඉඩ නොතබා, එය අපේ පාලනය යටතට ගැනීමයි.

''සෙම්ස්කි සබෝර් ඒකාධිපත්‍යයට විරුද්ධව සටන් කරන තරමට අපි ඊට සහාය දෙමු. එය ඒකාධිපත්‍යය හා එක්වන තැනදී අපි ඊට විරුද්ධව සටන් කරමු. උද්‍යෝගීව මැදිහත්වීමෙන් හා බලය පෙන්වීමෙන් මන්ත්‍රීන් භේදකොට** රැඩිකල්වාදීන් අපේ පැත්තට රොක් කොට, ආණ්ඩුව තුළින් ගතානුගතිකවාදීන් නෙරපා දමා එනයින් මුළු සෙම්ස්කි සබෝර් සභාවම විප්ලව මාවතට යොමු කළ යුතු වන්නෙමු. එබඳු උපක්‍රමයන්ට ස්තුති වන්නට ආණ්ඩුව නිතරම තනි වී විරුද්ධ පාර්ශ්වය ශක්තිමත් වනු ඇත. ඒ මගින් ප්‍රජාතන්ත්‍රික ක්‍රමයක් ගොඩනැගීම පහසු කෙරෙනු ඇත.''

හොඳයි, හොඳයි! නව ඉස්ක්‍රාවාදීන් ඉතාමත් සෞම්‍ය ස්වරූපයේ 'ආර්ථිකවාදය' දෙසට හැරීම අප විසින් අතිශයෝක්තියෙන් දක්වනු ලැබේ යයි කීමට දැන් ඕනෑම කෙනෙකුට ඉඩ දෙමු. මෙය හරියටම මැස්සන් විනාශ කිරීමේ සුප්‍රකට බෙහෙත් කුඩ වැනිය: පළමුව මැස්සා අල්ලා ගෙන ඒ බෙහෙත් කුඩු ඌගේ ඇඟේ තවරන්න. එවිට මැස්සා මිය යනු ඇත. සෙම්ස්කි සබෝර් මන්ත්‍රීවරුන් අතර බලයෙන් භේදයක් කර, 'ගතානුගතිකවාදීන් ආණ්ඩුවෙන් තුරන් කරන්න' එවිට මුළු සෙම්ස්කි සබෝර් සභාවම විප්ලව මාවතට පිවිසෙනු ඇත... 'ජැකොබින්' ක්‍රමයේ කුමන හෝ සන්නද්ධ ජනතා නැගිටීමක් නොවේ. පාර්ලිමේන්තු මෝස්තරය අනුව ආචාර සම්ප්‍රදනුකූලව සෙම්ස්කි සබෝර් සභාවේ සාමාජිකයින් කෙරෙහි 'බලපෑම' පමණි.

දූප්පත් රුසියාව! ඇය නිතර යුරෝපය විසින් ඉවත ලන පැරණි පන්නයේ අබලන් හිස් වැසුම් පළඳින බවට කතාවක් ඇත. අපට තවමත් පාර්ලිමේන්තුවක් නැත. බුලීගින් පවා එබන්දක් දීමට තවමත් පොරොන්දු වී නැත. එහෙත් පාර්ලිමේන්තු ක්‍රෙටිනිසම[39] අප අතර කොතෙකුත් තිබේ.

''... මේ මැදිහත් වීම කළ යුත්තේ කෙසේද? සර්වජන හා සමාන ඡන්දය අනුව කෙලින්ම පැවැත්වෙන රහස් ඡන්ද විමසීමෙන් සෙම්ස්කි සබෝර් සභාව පිහිට විය යුතු යයි අප විසින්ම මුලින්ම ඉල්ලා සිටිය

---

* සෙම්ස්ත්වෝ මිනිසුන්ට ඔවුන්ගේම කැමැත්ත නැති කළ හැක්කේ කුමන මාධ්‍යයෙන්ද? ඇතැම් විශේෂ වර්ගයේ ලිට්මස් කොළයක් පාවිච්චි කිරීමෙන්ද?

** දෙවියනි! මෙය නම් සත්තකින්ම උපක්‍රම 'ගැඹුරු කිරීමකි'! වීථිවල සටන් කිරීමට බලවේග නැත. එහෙත් 'බලයෙන්' 'මන්ත්‍රීන් භේද කිරීමට' පුළුවන. තිප්ලිසයේ සහෝදරය, මේ අහන්න. ඔබට බොරු කිව යුතු නම් ඊටත් සීමාවක් තිබේ.



යුතුය. මේ මැතිවරණ ක්‍රියා පටිපාටිය ප්‍රකාශයට පත් කිරීමත්* සමගම ඡන්ද ව්‍යාපාරය ගෙන යාමේ සම්පූර්ණ නිදහසත්, එනම් රැස්වීම් පැවැත්වීමේ, කථා කිරීමේ හා පුවත්පත් පළකිරීමේ නිදහසත්, ඡන්දදායකයන් හා අපේක්ෂකයන්ගේ අලංඝනීයත්වයත්, සියලුම දේශපාලන හිර කරුවන් නිදහස් කිරීමත් නීති ගත කළ යුතුය** මහජනයාට අවබෝධය දී ඔවුන් සූදානම් කිරීම සඳහා අපට සෑහෙන තරම් කාලය ලැබෙන සේ මැතිවරණයද හැකි තරම් ප්‍රමාද කොට පැවැත්වීමට දින නියම කළ යුතුය. සබෝර් සභාව කැඳවීම පාලනය කෙරෙන ව්‍යවස්ථා කෙටුම් පත් කිරීම අභ්‍යන්තර කටයුතු පිළිබඳ ඇමති බුලීගින් ප්‍රධාන කොමිසමකට භාර දී ඇති බැවින්, අප මේ කොමිසම හා එහි සාමාජිකයන් කෙරෙහිද බලපෑම් ඇති කළ යුතුය***. අපේ ඉල්ලීම් තෘප්තිමත් කිරීම බුලීගින් කොමිසම විසින් ප්‍රතික්ෂේප කරනු ලැබ****, ඡන්ද බලය දෙපළ හිමියන්ට පමණක් ලබා දෙයි නම්, එතැනදී අප මැතිවරණ කටයුතුවලට අත පොවා ප්‍රගතිශීලී මන්ත්‍රීවරුන් තෝරා පත් කර ගන්නා සේ ඡන්දදායකයන්ට විප්ලවීය මාර්ග වලින් බල කොට සෙම්ස්කි සබෝර් සභාව තුළදී ව්‍යවස්ථාදායක මණ්ඩලයක් ඉල්ලා සිටිය යුතුය. අවසාන වශයෙන් අප විසින් හැකි සියලුම ක්‍රියා මාර්ග වලින්, පෙළපාලි, වැඩ වර්ජන හා අවශ්‍ය වෙතොත් ජනතා නැගිටීම තුළින්ද ව්‍යවස්ථාදායක මණ්ඩලයක් පිහිටුවීමට හෝ එබන්දක් බව ප්‍රකාශ කිරීමට හෝ සෙම්ස්කි සබෝර් සභාව පොළඹවා ගත යුතුයි. ආයුධ සන්නද්ධ නිර්ධන පංතිය ව්‍යවස්ථාදායක මණ්ඩලයේ ආරක්ෂකයා බවට පත්ව දෙකොටසම එක්ව***** ප්‍රජාතන්ත්‍රික සමූහාණ්ඩුවක් සඳහා ඉදිරියට යා යුතුයි.

''සමාජ-ප්‍රජාතන්ත්‍රික පිළිවෙත එයයි. අපට ජයග්‍රහණය ලැබෙන්නේ එමගින් පමණි''.

ඇදහිය නොහැකි මේ විකාර දෙඩුම්, නව ඉස්ක්‍රා අදහස් අනුව යන කිසිදු බලයක් හෝ සහායක් නැති කෙනෙකුගේ කුලුඳුල් ප්‍රයත්නයක් පමණක් යයි පාඨකයා කල්පනා කළ යුතු නොවේ. මේ වනාහි නව ඉස්ක්‍රාවාදීන්ගේ සම්පූර්ණ කමිටුවක් වන තිප්ලිස් කමිටුවේ නිල පත්‍රයේ සඳහන් වී ඇති දේයි. ඊටත් වඩා මේ විකාර දෙඩුම්

---

* ''ඉස්ක්‍රා'' හි?

** නිකොලායි විසින්ද?

*** එහෙනම් 'ආණ්ඩුවෙන් ගතානුගතිකවාදීන් ඉවත් කිරීමේ' උපක්‍රමය යනුවෙන් අදහස් කරන්නේ මෙයයි!

**** අප මේ නිවැරදි හා ගැඹුරු උපක්‍රමය පිළිපදින්නේ නම් සත්තකින්ම එබඳු දෙයක් සිදුවිය නොහැකිය!

***** සන්නද්ධ නිර්ධන පංතිය හා 'ආණ්ඩුවෙන් ඉවත්කරන ලද' ගතානුගතිකවාදීන් යන දෙගොල්ලම?

''ඉස්ක්‍රා'' පත්‍රයේ සියවැනි කලාපය විසින් එළිපිටම අනුමත කොට තිබේ. එම අදහස් දක්වුණු ''සමාජ-ප්‍රජාතන්ත්‍රිකයා'' පත්‍රය ගැන ''ඉස්ක්‍රා'' පත්‍රයේ සඳහන් වූයේ මෙසේය:

''ප්‍රථම කලාපය ප්‍රාණවත් ලෙස හා බුද්ධිමත් ලෙස සංස්කරණය කොට තිබේ. දක්ෂ කර්තෘවරයෙකුගේ හා ලේඛකයකුගේ කෘතහස්ත හස්තයක් ඉන් විද්‍යාමාන වේ... මේ පුවත්පත විසින් තමන් වෙත පවරාගත් වගකීම විශිෂ්ට ලෙස සම්පූර්ණ කරනු ඇතැයි කීමට පුළුවන''.

ඔව්!] නව ඉස්ක්‍රාවාදයේ] සම්පූර්ණ දෘෂ්ටිමය පිරිහීම මුළුමනින් පෙන්වාදීම එසේ පවරාගත් වගකීම වේ නම්, එය 'විශිෂ්ට' ලෙස ඉටු කොට තිබේ. නව ඉස්ක්‍රාවාදීන් ලිබරල් ධනපති අවස්ථාවාදය තෙක් පහතට ඇද වැටීම මීට වඩා 'ප්‍රාණවත්ව, බුද්ධිමත්ව හා දක්ෂ ලෙස' ප්‍රකාශ කිරීමට වෙන කිසිවෙකුටත් හැකි නොවෙනු ඇත.

## 8. ''අස්වබඕෂ්ජේනිය'' හා නව ''ඉස්ක්‍රා'' ප්‍රවනතා

නව ඉස්ක්‍රා ප්‍රවනතාවයේ දේශපාලන වැදගත්කම කැපීපෙනෙන තහවුරු කරන තවත් නිදර්ශනයක් අපි දැන් ගෙන බලමු.

''තමා ගැන දන ගන්නේ කෙසේද?'' යන මාතෘකාව යටතේ (''අස්වබඕෂ්ජේනිය'' පත්‍රයේ 71 කලාපයේ) පළ කරන ලද විශිෂ්ට, කදිම මෙන්ම උපදේශාත්මක ලිපියකින් ස්ත්‍රූවේ මහතා අපේ අන්තවාදී පක්ෂවල 'වැඩ සටහන්වාදී විප්ලවවාදයට' විරුද්ධව සටනක් අරඹයි. ස්ත්‍රූවේ මහතා විශේෂයෙන්ම පුද්ගලිකව මා සමඟ නොමනාප වී ඇත*.මා ගැන සඳහන් කරන්නේ නම් ස්ත්‍රූවේ මහතාට

* ''ලෙනින් මහතා හා ඔහුගේ සගයන්ගේ විප්ලවීයත්වය සමග සසඳන කල්හි බේබෙල්ගේ හා කෞට්ස්කිගේ පවා බටහිර යුරෝපීය සමාජ-ප්‍රජාතන්ත්‍රවාදය අවස්ථාවාදයකි. එහෙත් දැනටමත් සැර බාල කොට ඇති මෙම විප්ලවීයත්වයෙහි පවා පදනම් ඉතිහාසය විසින් යටින් බිඳ හැර සෝදා දමා තිබේ.'' ඉතා කෝපාවිෂ්ට ප්‍රහාරයකි. එකක් තිබේ. එනම්, මළ විරුද්ධවාදියෙකු පිට පටවන්නාක් මෙන් සියලුම වරද මා පිට පැටවීමට ස්ත්‍රූවේ මහතා කල්පනා කළ යුතු නැත. මා කළ යුත්තේ පහත සඳහන් ප්‍රශ්නවලට පිළිතුරු සපයන ලෙස ස්ත්‍රූවේ මහතාට අභියෝග කිරීමකි. එබඳු අභියෝගයක් කිසි විටෙක පිළිනොගන්නා බව මට සහතිකය. 'බේබෙල්ගේ හා කෞට්ස්කිගේ විප්ලවීයත්වය' අවස්ථාවාදය යැයි මා කීවේ කවදද? කොතැනකද?



මීට වඩා මා සතුටු කළ නොහැකිය. නව ඉස්ක්‍රා කණ්ඩායම යළි පන ගන්වන ආර්ථිකවාදයට විරුද්ධව හා ''සමාජවාදී විප්ලවකාරීන්'' විසින් ප්‍රදර්ශනය කරනු ලැබූ අන්ත ප්‍රතිපත්ති රහිත භාවයට විරුද්ධවත් ගෙනයන සටනේදී මට ඊට වඩා හොඳ සගයකු ගැන සිතිය නො හැක. සමාජවාදී විප්ලවකාරීන්ගේ කෙටුම්පත් වැඩ සටහනෙන් මාක්ස්වාදයට දී ඇති 'සංශෝධන' කෙතරම් ප්‍රතිගාමී ඒවාද යන වග ස්ත්‍රූවේ මහතා හා ''අස්වබඕෂ්ජේනිය'' පත්‍රය විසින් ක්‍රියාවෙන් ඔප්පු කර ඇති ආකාරය වෙනත් අවස්ථාවකදී අපි සඳහන් කරන්නෙමු. ස්ත්‍රූව් මහතා ප්‍රතිපත්ති වශයෙන් නව ඉස්ක්‍රා ප්‍රවනතාවයේ අදහස් අනුමත කළ සෑම විටකම*

බේබෙල්ගේ හා කෞට්ස්කිගේ ප්‍රවනතාවයට සමාන නොවන ජාත්‍යන්තර සමාජ-ප්‍රජාතන්ත්‍රවාදයේ එක්තරා විශේෂ ප්‍රවනතාවයක් නිර්මාණය කළ බවට මා කියා ඇත්තේ කවදද? කොතැනකද? එක් පැත්තකින් මාද, අනෙක් පැත්තෙන් බේබෙල් හා කෞට්ස්කි ද අතර වෙනස්කම් පිළිබඳව නිදසුනක් වශයෙන් බරපතලකම අනුව බ්‍රෙස්ලෝහි[40] ගොවි ජන ප්‍රශ්නය ගැන බේබෙල් හා කෞට්ස්කි අතරවූ වෙනස්කම් පමණට වත් සමාන වන කරුණු එළිදරව් වී ඇත්තේ කවදද? කොතැනකද? මෙම ප්‍රශ්න තුනට පිළිතුරු දීමට ස්ත්‍රූවේ මහතාට ඉඩ දෙන්න.

''අපේ පාඨකයන්ට අපි මෙසේ කියමු. තම රටේ සමාජ-ප්‍රජාතන්ත්‍රවාදීන් ඉතාමත්ම අසාධාරණ වන අතර අසල්වැසි රටක ඔවුන්ගේ සහෝදරයන් 'හොඳ ළමයින්' බවත් තම අනුගාමිකයින්ට සහතික කිරීමේ උපක්‍රමය ලිබරල් ධනේශ්වර පංතිය හැමතැනම හා හැමවිටම අනුගමනය කරයි.ජර්මන් ධනේශ්වර පංතිය බේබෙල්ලාට හා කෞට්ස්කිලාට ආදර්ශ වශයෙන් 'හොඳ ළමයින්' ලෙස ප්‍රංශ සමාජවාදීන් වාර සිය ගණනක් පෙන්වාදී ඇත. මෑතදී ප්‍රංශ ධනේශ්වර පංතිය ප්‍රංශ සමාජවාදීන්ට ආදර්ශයක් වශයෙන් බේබෙල්'හොඳ ළමයා' පෙන්විය. ස්ත්‍රූවේ මහතාණෙනි, මේ පරණ උගුලකි. මෙබඳු ඇම ගිලිනු ඇත්තේ ළදරුවන් හා අඥනයන් පමණි.වැඩ සටහන හා උපක්‍රම පිළිබඳ සියලුම ප්‍රශ්න අරබයා ජාත්‍යන්තර විප්ලවීය සමාජ-ප්‍රජාතන්ත්‍රවාදයේ පූර්ණ ඒකමතිකත්වය විවාද රහිත කාරණයකි.

* ''නොකළ යුත්තේ කුමක්ද?'' (''ඉස්ක්‍රා'' අංක 52) යන ලිපිය අවස්ථාවාදීන් හට සහන සැලසීම කරා යොමුවූ 'වැදගත් නැඹුරුවක්' ලෙස ''අස්වබඕෂ්ජේනිය'' විසින් ඉතා සෝෂා කාරීව ප්‍රශංසාවට ලක්කොට තිබීන. රුසියානු සමාජ-ප්‍රජාතන්ත්‍රිකයන් අතර භේදය ගැන සඳහන් කිරීමකදී ''අස්වබඕෂ්ජේනිය'' විසින් නව ''ඉස්ක්‍රා'' අදහස් පිටුපස වූ මූලධර්ම විශේෂයෙන්ම ප්‍රශංසාවට ලක්කරනු ලැබීන. ''අපේ දේශපාලන කටයුතු'' නමැති ට්‍රොට්ස්කිගේ පොත් පිංච ගැන විවේචනය කළ ''අස්වබඕෂ්ජේනිය'' එම කර්තෘගේ අදහස් හා ''රබෝචිය දියල''[41] ලේඛකයන්වූ ක්‍රිචෙව්ස්කි, මර්තිනව්, අකීමව් විසින් කියන හා ලියන ලද දේ අතරවූ සමානත්වය සටහන් කළාය.

ඔහුගෙන් මට ලැබුණු අවංක, භක්තිමත් හා නියම සේවය ගැන අපි දැනටමත් කිහිප විටකදීම කියා ඇත්තෙමු. එසේම යළිදු අපි ඒ ගැන කතා කරමු.

ස්ත්රූවේ මහතාගේ ලිපියෙහි රසවත් ප්‍රකාශ රාශියක් අඩංගු වේ. ඒවා මෙහි සඳහන් කළ හැක්කේ යන්තමිනි. 'පංති අරගලය නොව පංති සහයෝගතාවය මත විශ්වාසය තබා රුසියානු ප්‍රජාතන්ත්‍රවාදය බිහි කිරීමට' ඔහු බලාපොරොත්තු වේ. එහිදී 'සමාජමය වශයෙන් වරප්‍රසාද ලත් බුද්ධිමතුන්' ('ශිෂ්ඨාචාර සම්පන්න වංශවතුන්' වැනි ස්වභාවයක් ගන්නා මේ පිරිසට ස්ත්රූවේ මහතා ඉහළ සමාජයේ නියම හෙංචයියකු ලෙසින් හිස නමයි). 'ස්වකීය සමාජ තත්වයේ බලපුළුවන්කම' (ඔවුන්ගේ මුදල් මලුවල බර) මේ 'පංතිමය නොවන' පක්ෂයට යොදවනු ඇත. 'ධනපති පංතිය බියට පත්ව, නිර්ධන පංතිය හා ඔවුන්ගේ විමුක්තිය පාවාදී ඇතැයි යන පට්ටා ගැසුණු රැඩිකල්වාදී මතයේ' නිෂ්පලභාවය තරුණ පිරිසට පෙන්වා දීමට ස්ත්රූවේ මහතා ආශාවක් පළ කරයි. (අපි මේ අදහස හදපත්ලෙන්ම පිළිගනිමු. මෙම 'පට්ටා ගැසුනු' මාක්ස්වාදී අදහසට විරුද්ධව ස්ත්රූවේ මහතා විසින් සටනක් අරඹනු ලැබීම තරම් එහි නිවැරදි බව වෙන කිසිවෙකිනුත් ඔප්පු නොවේ. අනේ ස්ත්රූවේ මහතානනි, ඔබේ මේ අනගි සැලැස්ම කල් නොදමන්න!)

කාලගුණයේ සුළු වෙනසක් ගැන වුව ඉතා සැලකිලිමත් වන, දේශපාලන වශයෙන් තියුණු හැඟීම් ඇති රුසියානු ධනපති පංතියේ මේ නියෝජිතයා විසින් මෙ කල විරුද්ධව සටන් කරනු ලබන ව්‍යාවහාරික සටන් පාඨ සැලකිල්ලට ගැනීම අපේ මාතෘකාව සඳහා ඉතා වැදගත් වෙයි. පළමුවෙන්ම, ඔහු සමූහාණ්ඩුවාදයේ සටන් පාඨයට විරුද්ධව සටන් කරයි. මේ සටන් පාඨය 'බහුතර ජනතාවට නොතේරෙන නුහුරු' එකක් බව ඔහුගේ අචල විශ්වාසයයි. (එය ධනපති පංතියට තේරෙන නමුත් වාසිදායක නොවේ යයිද සඳහන් කිරීමට ඔහුට අමතක වී තිබේ!) අපේ අධ්‍යයන කවයන්හිදී හා අපේ මහජන රැස්වීම්වලදී කම්කරුවන්ගෙන් ස්ත්රූවේ මහතාට ලැබෙන

("එපිරියොද්" පත්‍රයේ පළවූ "කියන දේ කරන ලිබරල්වාදියෙක්" නමැති පත්‍රිකාව බලන්න.) ආඥාදායකත්ව දෙකක් පිළිබඳ මර්තිනව්ගේ පොත් පිංච ගැන "අස්වබඡ්ජේනිය" සතුට පළ කළාය. අවසාන වශයෙන් 'පළමුව බෙදුම් රේඛාඇඳ පසුව සමග එවන්න' යන පැරණි "ඉස්ක්‍රා" වේ[42] පැරණි සටන් පාඨය පිළිබඳ ස්තරවේර්ගේ ප්‍රමාද වූ විවේචන "අස්වබඡ්ජේනිය" විශේෂයෙන්ම සානුකම්පිකව සලකා බලනු ලැබීය.



පිළිතුර කුමක්දැ යි දැක ගැනීමට අප කැමතිය. නැතහොත් කම්කරුවන් මහජනයා නො වන්නේද? ගොවීන් ගැන කියන්නේ කුමක්ද? ස්ත්රූවේ මහතා කියන අන්දමට ඔවුන් ඇතැම්විට ('සාර්ට පා පහර දී පැන්නීමේ') 'බොළඳ සමූහාණ්ඩුවාදයට' යට වී ඇත. එහෙත් බොළඳ සමූහාණ්ඩුවාදය වෙනුවට ප්‍රබුද්ධ සමූහාණ්ඩුවාදය නොව ප්‍රබුද්ධ රාජාණ්ඩුවාදය ආදේශ කළ යුතු යයි ලිබරල් ධනපති පංතිය විශ්වාස කරයි! Ça dépend, ස්ත්රූවේ මහතානනි, එය සිද්ධීන් මත රඳා පවතිනු ඇත. විශාල ඉඩම් අයිතියට හානි වන පරිදි ගොවිජනතාවගේ තත්වයේ රැඩිකල් දියුණුවක් ඇති කිරීම සඳහා විරුද්ධ නොවී සිටීමට සාර්වාදයට හෝ ධනපති පංතියට නො හැකි අතර ඊට ආධාර නොදී සිටීමට කම්කරු පංතියට නොහැකිය.

දෙවැනිව, 'පුරවැසි යුද්ධයකදී පහර දෙන පක්ෂය සෑම විටම වැරදිය' ස්ත්රූවේ මහතා කියා සිටී. මේ අදහස ඉහත දැක්වූ නව ඉස්ක්‍රා නැඹුරුවීම්වලට ඉතා ළංවේ. පුරවැසි යුද්ධයකදී පහර දීම සෑමවිටම වාසිදායක යැයි ඇත්තෙන්ම අපි නොකියමු. ඇතැම්විට පහර වළක්වා ආරක්ෂා වීමේ උපක්‍රම තාවකාලිකව අනිවාර්ය විය හැකියි. එහෙත්, ස්ත්රූවේ මහතාගේ යෝජනාව වැනි යෝජනාවක් 1905 දී රුසියාවට ගැලපීම නියම වශයෙන්ම 'පට්ටා ගැසුණු රැඩිකල් මතය' ('ධනපති පංතිය බියපත්ව විමුක්තිය පාවා දීම') තරමක් විදහා දැක්වීමකි. දැන් ඒකාධිපත්‍යයට හා ප්‍රතිගාමීත්වයට පහරදීම ප්‍රතික්ෂේප කරන, එබඳු ප්‍රහාරයකට සූදානම් නොවන, එය දේශනා නො කරන කවරෙකුට වුවද විප්ලවවාදියෙකැයි කියා ගැනීමේ අයිතියක් නැත.

ස්ත්රූවේ මහතා 'රහස්‍යභාවය' හා 'කැරළි ගැසීම' පිළිබඳ සටන් පාඨ (කැරලි ගැසීම 'කුඩා පරිමාණයේ ජනතා නැගිටීමක්') හෙළා දකියි. ස්ත්රූවේ මහතා ඒ දෙකටම නිග්‍රහ කරනමුත් එසේ කරන්නේ 'පොදු ජනතාව වෙතට පිවිසීම' මත පිහිටා සිටය. නිදසුනක් වශයෙන් ඔහුගේ අදහස අනුව අන්ත විප්ලවවාදියකුගේ කෘතියක් වන "කළ යුත්තේ කුමක්ද?" නැමති පොතෙන් කැරලි ගැසීම අනු දක්නා එක් ඡේදයක්වත් ගෙනහැර දැක්විය හැකිදැයි සත්රූවේ මහතාගෙන් ප්‍රශ්න කිරීමට අපි කැමැත්තෙමු. 'රහස්‍යභාවය' ගැන බලන විට, නිදසුනක් ගතහොත් ස්ත්රූවේ මහතා සහ අප අතර ඇත්තෙන්ම ලොකු වෙනසක් තිබේද? අපි දෙදෙනාම, රුසියාවට 'හොරෙන්' ගෙන එනු ලබන, එසේම අස්වබඡ්ජේනිය පෙරමුණේ හෝ රුසියානු සමාජ-ප්‍රජාතන්ත්‍රවාදී කම්කරු පක්ෂයේ 'රහස්' කණ්ඩායම්වලට උදව් දෙන 'නීති විරෝධී' පුවත්පත්වල වැඩ නොකරමුද? අපේ කම්කරුවන්ගේ බහුජන රැස්වීම් බොහෝවිට පැවැත්වෙන්නේ

'රහසේ'ය. අපි ඒ පාපය කරමු. එහෙත් අස්වබෂ්ජේනිය පෙරමුණේ මහත්වරුන්ගේ රැස්වීම් ගැන කියන්නේ කුමක්ද? ස්ත්රූවේ මහතානනි, පුරසාරම් දෙඩීමට සහ පිළිකුල් සහගත රහස්‍යභාවයේ පිළිකුල් සහගත හවුල්කරුවන් හෙළාදැකීමට ඔබට පදනමක් තිබේද?

කම්කරුවන්ට ආයුධ සැපයීමේදී දැඩි රහස්‍යභාවය අවශ්‍ය බව ඇත්තකි.මේ සම්බන්ධයෙන් ස්ත්රූවේ මහතා වඩා විවෘතව කතා කරයි. මේ අහන්න: ''ජනතා නැගිටීමක් නැතහොත් තාක්ෂණික අර්ථය අනුව විප්ලවයක් සම්බන්ධයෙන් බලනවිට පොදු සන්නද්ධ ජනතා නැගිටීමක් සඳහා අවශ්‍ය සමාජ-මානසික තත්වයන් නිර්මාණය කළ හැක්කේ ප්‍රජාතන්ත්‍රික වැඩ සටහනකට සහාය දෙන බහුජන ප්‍රචාර මගින් පමණි. මෙනයින් විමුක්තිය සඳහා දුනට ගෙනයන වර්තමාන සටනේ අනිවාර්ය පරිසමාප්තිය ජනතා නැගිටීමක් වේනම්, (මෙය මා පිළි නොගන්නා මතයකි) ඒ අනුව බැලුවත් ප්‍රජාතන්ත්‍රික ප්‍රතිසංස්කරණ පිළිබඳ අදහස් පොදු ජනතාවට කා වැද්දීම ඉතාමත් මූලික හා ඉතාමත් අවශ්‍ය කටයුත්තකි.''

ස්ත්රූවේ මහතා ප්‍රශ්නය මග හැරීමට උත්සාහ දරයි. විප්ලවයේ ජයග්‍රහණය පිනිස ජනතා නැගිටීමක් අත්‍යවශ්‍ය බව සඳහන් කරනු වෙනුවට එය වැළැක්විය නො හැකි බව ඔහු කියයි. කිසිදු සූදානමක් නැතිව, ඉබේම තැනින් තැන මතුවන ජනතා නැගිටීමක් දනටමත් පටන් ගෙන තිබේ. එය පරිපූර්ණ ඒකීය ඒකාබද්ධ ජනතා නැගිටීමක් බවට වැඩී යනු ඇතැයි කිසිවෙකුට ස්ථිරවම දිවුරා කිව නොහැකිය. මන්දයත් (සටනේදී පමණක් සම්පූර්ණ තත්ත්වය මැනිය හැකි) විප්ලවීය බලවේගවල තත්වය, ආණ්ඩුවේ හා ධනපති පංතියේ හැසිරීම, හා හරියටම තක්සේරු කළ නොහැකි වෙනත් දූ රාශියකුත් මත එය රඳා පවත්නා බැවිනි. ස්ත්රූවේ මහතා කරන්නාක් මෙන් යම්කිසි නිශ්චිත සිදුවීමක සම්පූර්ණ නියත භාවය පිළිබඳ අර්ථයෙන් වැළැක්විය නොහැකි බව ගැන කීමේ තේරුමක් නැත. ඔබ විප්ලවයේ කොටස් කරුවෙකු වන්නේ නම් ඔබ විසින් කතා කළ යුතු වන්නේ විප්ලවයේ ජයග්‍රහණය සඳහා ජනතා නැගිටීම අවශ්‍ය වේද, එය දැඩිව ප්‍රකාශ කිරීම, දේශනා කිරීම හා ඒ සඳහා වහා උද්‍යෝගීමත් කටයුතු සූදානම් කිරීම අවශ්‍ය වේද යනුයි. මේ වෙනස අවබෝධ කිරීම සඳහා ස්ත්රූවේ මහතා අපොහොසත් විය නොහැකිය: නිදසුනක් දක්වතොත්, ප්‍රජාතන්ත්‍රිකයෙකු විසින් අවිවාදයෙන් පිළිගත යුතු සර්වජන ඡන්දයෙහි අවශ්‍යතාවය පිළිබඳ ප්‍රශ්නය දේශපාලන කටයුතුවල නියැලී පුද්ගලයන්ට හදිසියක් නොවන එමෙන්ම විවාදයට තුඩු දෙන ප්‍රශ්නයක් සර්වජන ඡන්දය ලැබීම වර්තමාන විප්ලවයේදී අනිවාර්ය වේද යන්න



ප්‍රශ්නය මතු කිරීමෙන් ඔහු අඳුරු කරන්නේ නැත. ජනතා නැගිටීමක අවශ්‍යතාවය පිළිබඳ ප්‍රශ්නය මඟ හැරීමෙන් ස්ත්රූවේ මහතා ලිබරල්වාදී ධනපති පංතියේ දේශපාලන තත්වයේ අභ්‍යන්තර හරය ප්‍රකට කරයි. පුදුමයෙන්ම, ධනපති පංතිය ඒකාධිපත්‍යය බිඳ දමනු වෙනුවට ඒ හා සමග එකඟත්වයකට පැමිණීමට වඩාත් කැමති වේ. දෙවැනිව, ධනපති පංතිය අවිගත් සටනේ බර හැමවිටම කම්කරුවන්ගේ කර පිට පටවයි. ස්ත්රූවේ මහතාගේ මඟ ඇරීමේ නියම තේරුම එයයි. ජනතා නැගිටීමක අවශ්‍යකම පිළිබඳ ප්‍රශ්නයෙන් එහි 'සමාජ මනෝභාවයන්' හා මූලික 'ප්‍රචාරය' පිළිබඳ ප්‍රශ්නය වෙතට ඔහු පැන යන්නේ ඒ නිසාය. ආණ්ඩුවේ යුධ හමුදා පළවා හැරීමත් ව්‍යාපාරය සන්නද්ධ අරගලයක් 'අවශ්‍යතාවයට මුහුණ දීමත්' අවශ්‍ය වූ අවධියකදී, වචනයෙන් කරන පෙළඹීම් පමණක් (කටයුතු සූදාන කරන මුල් අවධියේදී එය සිය ගුණයෙන් අවශ්‍ය වුවද) අල්පතර, ධනපති පංතික බියසුලු බව හා උදාසීනත්වය බවට පත්වූ අවධියේදී, 1848 ප්‍රැන්ක්පර්ට් පාර්ලිමේන්තුවේ ධනපති පුරාජේරු කාරයින් යෝජනා සකස් කරමින් 'බහුජන ප්‍රචාර' පිළිබඳ තීරණ හා නිවේදන සකස් කරමින් හා 'සමාජ මනෝභාවයන්' සූදානම් කරමින් සිටියාක් මෙන්ම, ස්ත්රූවේ මහතාද ජනතා නැගිටීම පිළිබඳ ප්‍රශ්නය මඟ අරිමින් වගන්ති වලට මුවා වෙයි. බොහෝ සමාජ-ප්‍රජාතන්ත්‍රිකයන් නොසලකා හරින්නේ කුමක්දැයි ස්ත්රූවේ මහතා අපට හොඳින් පෙන්වා දෙයි. එනම්, විප්ලවීය කාල පරිච්ඡේදයක්, ඉතිහාසයේ සාමාන්‍ය එදිනෙදා කටයුතු සූදානම් කෙරෙන කාල පරිච්ඡේදවලට වඩා වෙනස් වන්නේ බහු ජනයාගේ මානසික තත්වය කැලඹීම හා විශ්වාස චකිත බව හා ක්‍රියාවෙන් ප්‍රකට වන හා ප්‍රකට විය යුතු වීමෙනි.

වචනද ක්‍රියාවක් බව දක ගැනීමට ග්‍රාම්‍ය විප්ලවවාදය අසමත් වෙයි. පොදුවේ ඉතිහාසය සම්බන්ධයෙන් හෝ නැතහොත් විවෘත බහුජන දේශපාලන සටන් සිදු නොවන ඉතිහාස කාල පරිච්ඡේද සම්බන්ධයෙන් හෝ යෙදූ විට මෙම ප්‍රස්තුතය විවාද කළ නොහැකිය. කවර වර්ගයේ හෝ කුමන්ත්‍රණකාරී පෙරළි මගින් එම ක්‍රියා ආදේශ කිරීම හෝ කෘතිම වශයෙන් කිරීම හෝ කළ නො හැකිය. විප්ලවීය කාල පරිච්ඡේදයක් ආරම්භ වී ඇති විට, පැරණි උපරි-ව්‍යුහය මුදුනේ සිට පත්ල දක්වා දෙදරා ගිය විට, තමන් සඳහා අලුත් උපරි-ව්‍යුහයක් නිර්මාණය කරන පංතීන්ගේ හා බහු ජනතාවගේ විවෘත දේශපාලන සටන් ප්‍රත්‍යක්ෂයක් බවට පත්වූ විට සහ පුරවැසි යුද්ධය ආරම්භ වූ විට, පැරණි කාලයට 'වචනවලට' සීමාවී සිටීම, 'ක්‍රියාවට' පරිවර්තනය වීමේ අවශ්‍යතාවය පිළිබඳ ඍජු සටන් පාඨය ඉදිරිපත් කිරීමට අසමත්

වීම පොදුවේ 'මානසික තත්වයන්' හා 'ප්‍රචාරය' අවශ්‍ය බව කියමින් ක්‍රියාවෙන් වැළකී සිටීමට උත්සාහ දැරීම උදාසීනත්වයක් අප්‍රාණික බවක් හා පන්ඩිතකම් පෙන්නීමක් හෝ විප්ලවීය පාවාදීම හා ද්‍රෝහිකමකි. ප්‍රජාතන්ත්‍රික ධනපති පංතියට අයත් ප්‍රැන්ක්පර්ට් පූරාජේරු කාරයින්, එබඳු ද්‍රෝහි බවට හෝ අතිපණ්ඩිත මුග්ධභාවයට කදිම ඉතිහාසගත නිදර්ශනයකි.

ග්‍රාම්‍ය විප්ලවවාදය හා විප්ලවවාදීන්ගේ වල්ගාවාදය අතර මෙම වෙනස, රුසියාවේ සමාජ-ප්‍රජාතන්ත්‍රික ව්‍යාපාරයේ ඉතිහාසයෙන් ගත් නිදශීනයකින් පැහැදිලි කර ගැනීමට ඔබ කැමතිද? අපි ඔබට එබඳු තතු පැහැදිලි කිරීමක් ඉදිරිපත් කරමු. ඉතා මෑත කාලයක් වන නමුත් අද අපට ඈත ඉතිහාසයක් මෙන් පෙනෙන 1901 හා 1902 වර්ෂ ගැන සිහිපත් කරන්න. පෙළපාලි ආරම්භ වී තිබුණි.ග්‍රාම්‍ය විප්ලවවාදය විසින් 'පහරදීමේ උපක්‍රම' ගැන අඳෝනාවක් නගා (''රබෝචිය දියල'') තිබුනි. (මගේ මතකය නිවැරැදි නම් බර්ලිනයේ මුද්‍රණය කරන ලද) 'ලේ පිපාසිත පත්‍රිකා' විසුරුවා හරිනු ලැබිනි. පුවත්පතක් මගින් (නදියෂ්දින්)[43] රට පුරා උද්ඝෝෂණ ගෙනයාමේ අදහසේ 'සාහිත්‍යමය උඩඟුකමට' හා හාන්සිපුටු සමභවයට පහර ගසන ලදී. අනික් අතින්, 'ආර්ථික සටන දේශපාලන උද්ඝෝෂණයේ හොඳම මාර්ගය'යි දේශනා කරනු ලැබීමෙන් විප්ලවකාරීන්ගේ වල්ගාවාදය අනාවරණය විය. විප්ලවකාරී සමාජ-ප්‍රජාතන්ත්‍රිකයන් හැසිරුනේ කෙසේද? ඔව්හු මේ නැඹුරුවීම් දෙකටම පහර ගැසූහ. ඔව්හු ගිණිකෙළි ක්‍රම හා පහර දීමේ උපක්‍රම පිළිබඳ කෑගෑම් හෙළා දුටහ. මන්දයත් විවෘත පොදු ජන සටන අනාගත කටයුත්තක් වූ බව සියල්ලන්ට පෙනී ගිය හෝ පෙනී යා යුතුව තිබූ හෙයිනි. වල්ගාවාදය හෙළා දුටු ඔව්හු ජනතා නැගිටීමක් පිළිබඳ සටන්පාඨය පවා ඉදිරිපත් කළහ. එසේ කරන ලද්දේ කෙලින්ම කරන ආයාචනයක් ලෙස නොව (එම වකවානුවේ අපේ කිසිම කතාවකින් 'කැරලිගැසීම්' පිළිබඳ කිසිම ආයාචනයක් සොයා ගැනීමට ස්ත්‍රූවේ මහතාට හැකි නොවනු ඇත) අවශ්‍ය නිගමනයක් අර්ථයෙනි. 'ප්‍රචාරය' (ඒ ගැන ස්ත්‍රූවේ මහතාට කල්පනාවී ඇත්තේ දැනුයි — අපේ ගරු ස්ත්‍රූවේ මහතා සැමවිටම කාලයට වඩා අවුරුදු කීපයක් පිටුපසින් සිටී) යන අර්ථයෙනි. මංමුලාවූ වංචනික ධනපති නියෝජිතයින් දැන් 'අනුචිත ලෙස හා ශෝකයෙන් යුතුව' අල්ලා ගෙන සිටින 'සමාජ මනෝභාවයන්'ම සූදානම් කිරීමේ අර්ථයෙනි. එම වකවානුවේදී, ප්‍රචාරය හා උද්ඝෝෂණය, උද්ඝෝෂණය හා ප්‍රචාරය සිදුවීම් පිළිබඳ පවත්නා වාස්තවික තත්වය විසින් නියම වශයෙන්ම ඉදිරියට ගෙනෙන ලදී. එම වකවානුවේදී සතිපතා නිකුත්



කිරීම පරමාදර්ශයක් ලෙස පිළිගනු ලැබූ සමස්ත රුසියානු දේශපාලන පුවත්පතක් පළ කිරීමේ කටයුතු ජනතා නැගිටීමක් සඳහා කටයුතු සූදානම් කිරීමේ ආරම්භය ලෙසින් යෝජනා කළ හැකි විය (''කළ යුත්තේ කුමක්ද?'' නමැති කෘතියෙන් යෝජනා කර ඇත). එම වකවානුවේදී, කෙලින්ම අවිගත් සටන්වල යෙදෙනු වෙනුවට බහු ජන උද්ඝෝෂණ අනුදන්නා වූත් ගිණිකෙළි ක්‍රම වෙනුවට ජනතා නැගිටීමක් සඳහා සමාජ මනෝභාවයන් සූදානම් කරන්නා වූත් සටන් පාඨ, විප්ලවීය සමාජ-ප්‍රජාතන්ත්‍රික ව්‍යාපාරයේ එකම නිවැරැදි සටන් පාඨ වූයේය. වර්තමානයේදී මෙම සටන් පාඨ පසුබස්වා සිදුවීම් ඉදිරියට ගොස් තිබේ. ව්‍යාපාරය ඒවා පසු කර ගොස් තිබේ. එහෙයින් එම සටන් පාඨ දැන්, අස්වබෂ්ජේනිය කුහක කම හා නව ඉස්ක්‍රා වල්ගාවාදය සඟවා තැබීමට පමණක් සුදුසු වූ, ඉරුනු කඩමාලු බවට පත් වී ඇත!

නැතහොත් ඇතැම්විට මට වැරදී තිබේද? සමහර විට විප්ලවය තවමත් ආරම්භ වී නැතුවා වත්ද? පංතීන්ගේ විවෘත දේශපාලන ක්‍රියා සඳහා සුදුසු කාලය තවමත් එළඹ නැතිවද? නැතහොත් තවමත් පුරවැසි යුද්ධය ඇරඹී නැති අතර, ආයුධ පිළිබඳ විවේචනය, විවේචන ආයුධයේ එකම හා අවශ්‍යයෙන්ම සිටිය යුතු හිමිකරුවා, උරුමක්කාරයා, බාරකරුවා හා එය ක්‍රියාකරවන්නා බවට පත්විය යුතු නැතුවා වත්ද?

ඔබේ කන්තෝරු කාමරයෙන් එළියට බැස වටපිට බලා වීථියෙහිදී පිළිතුර සොයාගන්න. සැම තැනකම නිරායුධ සාමකාමී පුරවැසි සමූහයන් සිය ගණනින් වෙඩි තැබීමෙන් ආණ්ඩුව විසින්ම පුරවැසි යුද්ධය අරඹා නැත්ද? අවිගත් කළු සියය කණ්ඩායම් ඒකාධිපත්‍යයේ 'තර්කයක්' ලෙස ක්‍රියා නොකරත්ද? ධනපති පංතිය — ධනපති පංතිය පවා — පුරවැසි හමුදාවක අවශ්‍යකම පිළිගෙන නැද්ද? අදහස් අතින් ආදර්ශමත් ලෙස මධ්‍යස්ථ සුළුදේ ගැන පවා බොහෝ සිතන ස්ත්‍රූවේ මහතාම දැන් (අඳෝමැයි ඔහු මෙසේ කියන්නේ ප්‍රශ්නය මඟ හැරීමට පමණයි!) 'විප්ලවීය ක්‍රියාකාරිත්වයේ විවෘත ස්වභාවය' (අද අපේ හැටි එසේය!) 'දැන් බහු ජනතාව මත අධ්‍යාපනික බලපෑමක් ඇති කිරීමේ ඉතා වැදගත් අවශ්‍යතාවයක් වී ඇතැ' යි නො කියන්නේද?

දැකීමට ඇස් ඇත්තවුන්ට නම් විප්ලවයේ භටයන් විසින් ජනතා නැගිටීමක් පිළිබඳ ප්‍රශ්නය දැන් ඉදිරිපත් කළ යුතු ආකාරය ගැන සැකයක් තිබිය නොහැකිය. හැම අතින්ම බහු ජනතාව කෙරෙහි බලපෑමට හැකියාව තිබෙන නිදහස් පුවත්පත්වලින් මෙම ප්‍රශ්නය ඉදිරිපත් කර ඇති තුන් ආකාරය දෙස මඳක් බලන්න.

පළමු ඉදිරිපත් කිරීම. රුසියානු සමාජ-ප්‍රජාතන්ත්‍රික කම්කරු පක්ෂයේ තුන්වැනි සම්මේලනයේ යෝජනාව*. පොදු ප්‍රජාතන්ත්‍රික විප්ලවීය ව්‍යාපාරය දැනටමත් ජනතා නැගිටීමක අත්‍යවශ්‍ය බව, දැනටමත් ඉස්මතු කර ඇති බව, ප්‍රසිද්ධියේ පිළිගෙන ප්‍රකාශයට පත්

* එම යෝජනාව සම්පූර්ණයෙන් මෙසේය:

1. තම තත්වය නිසා නිර්ධන පංතිය පෙරමුණේම පටන් ගන්නා හා එකම ස්ථිරසාර විප්ලවීය පංතිය වන බැවින් ඊට රුසියාවේ පොදු ප්‍රජාතන්ත්‍රික විප්ලවීය ව්‍යාපාරයෙහි නායක කාර්යභාරය ගැනීමට සිදුව ඇති හෙයින්ද;

2. මෙම ව්‍යාපාරය වර්තමානයේ සන්නද්ධ ජනතා නැගිටීමක අවශ්‍යතාවයකට යොමුව ඇති හෙයින්ද;

3. මෙම නැගිටීමෙහිදී නිර්ධන පංතිය ඉතාමත්ම උද්යෝගිමත්ව සහභාගි වනු ඇති හෙයින් හා එම සහභාගිත්වය රුසියාවේ විප්ලවයේ ඉරණම තීරණය කරන හෙයින්ද;

4. නිර්ධන පංතියට මෙම විප්ලවයේ කාර්යභාරය ඉටු කළ හැකි වන්නේ එහි අරගලයට දෘෂ්ටිමය හා ප්‍රායෝගික මග පෙන්වීම කරනු ලබන සමාජ-ප්‍රජාතන්ත්‍රවාදී කම්කරු පක්ෂයේ ධජය වටා ඒකීය හා ස්වාධීන දේශපාලන බලවේගයක් තුළ එය සමගි වන්නේ නම් පමණක් හෙයින්ද;

5. සමාජවාදය සඳහා වූ අරගලයට, ධනේශ්වර-ප්‍රජාතන්ත්‍රවාදී දේශපාලන පක්ෂයට විරුද්ධ අරගලයට ඉතාමත් වාසිදායක තත්වයන් නිර්ධන පංතියට සහතික කරගත හැකි වන්නේ යථෝක්ත කාර්යභාරය ඉටු කිරීමට පමණක් වන හෙයින්ද, සන්නද්ධ නැගිටීමක මාර්ගයෙන් ඒකාධිපත්‍යයට විරුද්ධ සෘජු අරගලයට නිර්ධන පංතිය සූදානම් කිරීමේ කටයුත්ත වර්තමාන විප්ලවීය කණ්ඩායම් එක් ප්‍රධානතම හා හදිසිම පක්ෂ කටයුත්තක් බව රු. ස. ප්‍ර. ක. පක්ෂයේ තුන්වන සම්මේලනය අදහස් කරයි.

ඒ අනුව —

අ) — ප්‍රචාරය හා උද්ඝෝෂණය මාර්ගයෙන් ඉදිරියේ එන සන්නද්ධ නැගිටීමේ දේශපාලන වැදගත්කම පමණක් නොව එහි ප්‍රායෝගික සංවිධායක අංශයද නිර්ධන පංතියට පැහැදිලි කරන මෙන්ද;

ආ) — නැගිටීම ආරම්භයේදී හා නැගිටීම සිදුවන අතර විශාල වැදගත්කමින් යුත් දේශපාලන බහුජන වැඩ වර්ජනයන්හි කාර්යභාරය එම ප්‍රචාරයේදී හා උද්ඝෝෂණයෙහිදී පැහැදිලි කරන මෙන්ද;

ඇ) — නිර්ධන පංතිය සන්නද්ධ කිරීමට මෙන්ම සන්නද්ධ අරගලය සඳහා, එහි සෘජු නායකත්වය සඳහා සැලසුමක් සකස් කිරීමට ඉතාමත් උද්යෝගිමත් පියවර ගන්නා මෙන්ද, ඒ සඳහාම අවශ්‍ය වූ විට පාක්ෂික කම්කරුවන්ගේ විශේෂ කණ්ඩායම් පිහිටුවන මෙන්ද සම්මේලනය සියලුම පක්ෂ කණ්ඩායම්වලට උපදෙස් දෙයි.
(1907 සංස්කරණය. කර්තෘගේ පෙරවදන. — සංස්කාරක)



කොට තිබේ. ජනතා නැගිටීමක් සඳහා නිර්ධන පංතිය සංවිධානය කිරීම, පක්ෂයේ අවශ්‍යකම, මූලික හා නැතිවම බැරි කටයුත්තක් ලෙසින් වර්තමානයේ න්‍යාය පත්‍රයට ඇතුළත් කර තිබේ. නිර්ධන පංතිය සන්නද්ධ කිරීමටත්, කෙලින්ම ජනතා නැගිටීමක නායකත්වය ගැනීමට ඇති ඉඩකඩ සහතික කිරීමටත් ඉතාමත් උද්‍යෝගි පියවර ගන්නා සේ උපදෙස් දී ඇත.

දෙවැනි ඉදිරිපත් කිරීම. 'රුසියානු ආණ්ඩු ක්‍රම ව්‍යවස්ථාවාදීන්ගේ නායකයා' (යුරෝපීය ධනපති පංතියේ බලගතු ප්‍රචාරක පත්‍රයක් වන ''ෆ්‍රැන්ක්ෆර්ට් පත්‍රය''[44] මගින් ස්ත්‍රූවේ මහතා හඳුන්වා දී ඇත්තේ එසේය), හෙවත් රුසියානු ප්‍රගතිශීලී ධනපති පංතියේ නායකයා විසින් ප්‍රතිපත්ති පිළිබඳ නිවේදනයක් ඇතුළත් ''අස්වබෝෂ්ජේනිය'' පත්‍රයේ පළ කරන ලද ලිපියක්. ජනතා නැගිටීමක් වැළැක්විය නොහැකිය යන අදහස ඔහු පිළි නොගනී. රහස් කටයුතු හා කැරළි ගැසීම් අසාධාරන විප්ලවවාදයේ විශේෂ ක්‍රම වෙයි. සමූහාණ්ඩුවාදය විශාල ඝෝෂාවකින් විශ්මය දනවන ක්‍රමයයි. බහුජන ප්‍රචාර ගෙන යමින් සමාජ මානසික තත්වයන් සූදානම් කිරීම 'මූලික හා ඉතාමත් අවශ්‍ය කටයුත්ත' වන හෙයින් ජනතා නැගිටීම හුදු තාක්ෂණික ප්‍රශ්නයක් පමණි.

තුන්වැනි ඉදිරිපත් කිරීම. නව ඉස්ක්‍රා සාකච්ඡා සභාවේ යෝජනාව. අපේ කාර්යය ජනතා නැගිටීමක් පිළියෙළ කිරීමයි. සැලසුමක් අනුව පිළියෙළ කරන ජනතා නැගිටීමක් ගැන කතාවෙන් ඵලක් නැත. කැරැල්ලකට වාසිදායක තත්වයන් නිර්මාණය කෙරෙන්නේ ආණ්ඩුව අවුල්වී යාමෙන්, අපේ උද්ඝෝෂණයෙන් හා අපේ සංවිධානය විසිනි. 'තාක්ෂණික සටන් සූදානම යම්කිසි තරමකින් බරපතල වැදගත්කමක් ගත හැක්කේ' එවිට පමණි.

එපමණද? ඔව්. එපමණයි. ජනතා නැගිටීම අත්‍යවශ්‍ය දෙයක් බවට පත්වී ඇත්ද යනු නිර්ධන පංතියේ නව ඉස්ක්‍රා නායකයෝ තවමත් නොදනිති. ක්ෂණිකවම සටන් කිරීම සඳහා නිර්ධන පංතිය සංවිධානය කිරීම, හදිසි කාර්යභාරයක් වී ඇත්ද යන වග ගැන ඔවුන්ට තවමත් පැහැදිලි අවබෝධයක් නැත. ඉතාමත් උද්‍යෝගි පියවර ගැනීමට ඉල්ලා සිටීම අවශ්‍ය නොවේ. මෙම පියවර 'යම්කිසි තරමකින් වැදගත් විය හැක්කේ' කවර තත්වයන් යටතේදැයි සාමාන්‍ය වශයෙන් පැහැදිලි කිරීම (1902 දී නොව 1905 දී) වඩා වැදගත් වේ.

නව ඉස්ක්‍රා සහෝදර වරුනි, මර්තිනව් අනුගාමිකත්වයට නැඹුරුවීමෙන් ඔබ කොතැනට පැමිණ ඇත්ද යන වග දැන් වත් පෙනේද? ඔබේ දේශපාලන දර්ශනය අස්වබෝෂ්ජේනිය දර්ශනයේ

අනුවාදයක් බවත්, (ඔබේ කැමැත්තට පටහැනිව, ඔබේ දැනීමෙන් තොරව) ඔබ රාජාණ්ඩුවාදී ධනපති පංතියේ වලිගයේ එල්ලී සිටින බවත් ඔබට අවබෝධ වේද? යල් පැනගිය පරණ සත්‍යයන් පුන පුනා කියමින් අලංකාර පුරසාරම්වලින් පූර්ණ බවට පැමිණෙන අතරම, ජ්යොතර් ස්ත්රුවේගේ මාහැඟි ලිපියේ අඩංගු මාහැඟි වදන් පවසන කරුණ එනම්, ''විප්ලවීය සටන්වල විවෘත ස්වභාවය දැන් බහුතර බහු ජනතාව මත අධ්‍යාපනික බලපෑමක් ඇති කිරීම සඳහා ඉතා වැදගත් අවශ්‍යතාවයකැ'' යි යන සත්‍යය ඔබට නොපෙනී ගොස් ඇති බව දැන්වත් ඔබට පැහැදිලි වේද?

## 9. විප්ලව සමයේදී අන්ත විරුද්ධවාදී පක්ෂයක් වීම යනුවෙන් කුමක් අදහස් වේද?

තාවකාලික ආණ්ඩුවක් පිළිබඳ යෝජනාව අපි යළි සලකා බලමු. නව ඉස්ක්‍රාවාදීන්ගේ උපක්‍රම විප්ලවය ඉදිරියට තල්ලු කරන්නක් (මෙහි හැකියාව යෝජනාව මගින් තහවුරු කිරීමට ඔවුහු කැමතියහ) නොව ආපස්සට අදින්නක් බැව් අප විසින් පෙන්වා දී ඇත. චපල ධනපති පංතියට විරුද්ධව කරන සටනේදී සමාජ-ප්‍රජාතන්ත්‍රවාදය ධනපති ප්‍රජාතන්ත්‍රවාදය තුළ දියවී යාමෙන් ආරක්ෂා නොකොට, එහි අත් පා බැඳ දමන්නේ මෙම උපක්‍රමයෙන්ම බව අපි පෙන්වා දී ඇත්තෙමු. ඇත්තෙන්ම එම යෝජනාවේ වැරදි පිළිගැනීම් පහත සඳහන් වැරදි නිගමනයට තුඩුදේ: ''එහෙයින් සමාජ-ප්‍රජාතන්ත්‍රවාදය විසින් තාවකාලික ආණ්ඩුවේ බලය අල්ලා ගැනීම හෝ එහි කොටස්කරුවෙකු වීම තම අරමුණ කරගත යුතු නැති අතර එය අන්ත විප්ලවකාරී විරුද්ධ පක්ෂය ලෙසින් සිටිය යුතුය.'' අරමුණු පිළිබඳ ප්‍රකාශයක් අඩංගු වන මේ නිගමනයේ මුල් කොටස සලකා බලන්න සමාජ-ප්‍රජාතන්ත්‍රවාදී කටයුතුවල අරමුණ සාර්වාදය පරාජය කරන විප්ලවයේ තීරණාත්මක ජයග්‍රහණයක් විය යුතු බව නව ඉස්ක්‍රාවාදීහු ප්‍රකාශ කරත්ද? ඔව්හු එසේ කරති. තීරණාත්මක ජයග්‍රහණයකට අවශ්‍ය දේ නිවැරදිව සනිටුහන් කර ගැනීමට අපොහොසත් වන ඔව්හු අස්වබෂ්ජේනිය නිගමනයට වැටෙති. එහෙත් ඔවුහු එම අරමුණ ඇති කර ගනිති. අමතරව, ඔව්හු තාවකාලික ආණ්ඩුවක් ජනතා නැගිටීම සමග සම්බන්ධ කරත්ද? තාවකාලික ආණ්ඩුවක් 'ජයග්‍රාහී මහජන නැගිටීමක් තුළින් බිහිවනු ඇතැයි' සඳහන් කිරීමෙන් ඔව්හු කෙලින්ම එසේ කරති. අවසාන වශයෙන් මහජන නැගිටීමකට මග පෙන්වීමේ



අරමුණ ඔවුහු තමන් වෙත පවරා ගනිත්ද? ඔව්, එසේ කරති. ස්ත්රුවේ මහතා මෙන් ඔව්හු ජනතා නැගිටීම හදිසි අවශ්‍යතාවයක් ලෙස පිළිගැනීම මග හරිති. එහෙත් ඒ අතරම ඔව්හු ස්ත්රුවේ මහතා මෙන් නොව ''සමාජ-ප්‍රජාතන්ත්‍රවාදය එය (ජනතා නැගිටීම) තම බලපෑමට හා නායකත්වයට නතුකර ගැනීමටත්, එය කම්කරු පංතියේ යහපත පිණිස යෙදවීමටත් උත්සාහ ගන්නේය'' යි පවසති.

මෙය කොතරම් කදිම ලෙස එකට ගැලපේද? එය එසේ නොවන්නේද? නිර්ධන පංතියට අයත් වන හා නිර්ධන පන්තියට අයත් නොවන ජන කොටස් දෙකේම නැගිටීම අපේ බලපෑමට හා අපේ නායකත්වයට නතුකර ගැනීමේත් එය අපේ අපේක්ෂාවන් පිණිස යොදා ගැනීමේත් අරමුණ අපි ඇති කර ගන්නෙමු. එහෙයින් ජනතා නැගිටීමේදී නිර්ධන පංතිය සහ (''නිර්ධන පංතියට අයත් නොවන කණ්ඩායම්'') විප්ලවකාරී ධනපති පන්තිය හා සුළු ධනපති පන්තියද මෙහෙයවීමේ අරමුණ එනම්, ජනතා නැගිටීමේ නායකත්වය සමාජ-ප්‍රජාතන්ත්‍රවාදීන් හා විප්ලවකාරී ධනපති පංතිය අතර 'බෙදාගැනීමේ' අරමුණ අපි ඇති කර ගනිමු. තාවකාලික ආණ්ඩුවක් ('ජයග්‍රාහී මහජන නැගිටීමක් තුළින් බිහිවන' ආණ්ඩුවක්) පිහිටුවීමට තුඩුදෙන පරිදි ජනතා නැගිටීමක ජයග්‍රහණය සහතික කිරීමේ අරමුණද අපි ඇතිකර ගනිමු. එහෙයින්... අප විප්ලවකාරී තාවකාලික ආණ්ඩුවකට හවුල්වීමේ හෝ එහි බලය අල්ලා ගැනීමේ අරමුණ තබාගත යුතු නොවේ!!

තමන්ගේ තර්ක එකිනෙක ගලපා ගැනීමට අපේ මිත්‍රයින්ට බැරිය. ඔව්හු ජනතා නැගිටීම පිළිබඳ ප්‍රශ්නය මග හරින ස්ත්රුවේ මහතාගේ පිළිවෙතත්, මෙම හදිසි කටයුත්ත පවරා ගැනීමට අපෙන් ඉල්ලා සිටින සමාජ-ප්‍රජාතන්ත්‍රිකයන්ගේ පිළිවෙතත් යන දෙක අතර මැදිවී දෙගිඩියාවෙන් සිටිති. ඔව්හු ප්‍රතිපත්ති වශයෙන් විප්ලවකාරී තාවකාලික ආණ්ඩුවකට කොයි ලෙසකින් නමුත් හවුල්වීම නිර්ධන පංතියට ද්‍රෝහිවීමකැයි කියන ආරාජිකවාදයත්, අනික් අතින් ජනතා නැගිටීමේදී මෙහෙයුම්කාර බලපෑම පවතී නම් එසේ හවුල් විය යුතු යැයි කියන මාක්ස්වාදයත් යන දෙක අතර දෙගිඩියාවෙන් පසුවෙති.* ඔවුනට කිසිම ස්වාධීන පිළිවෙතක් නැත. සාර්වාදය හා එකහත්වයකට පැමිණීමට ඇති උවමනාව නිසා ජනතා නැගිටීම පිළිබඳ ප්‍රශ්නය මග

* ''ප්‍රොලිතාරී'' අංක 3 හි ''විප්ලවීය තාවකාලික ආණ්ඩුව ගැන'' දෙවන ලිපිය 1906 බලන්න. (ලෙනින් එකතු කළ කෘති, 8 වෙළුම 474—81 පිටු.)

හැර බේරී යාමට පෙළඹී සිටින ස්ත්‍රෑවේ මහතාගේ පිළිවෙතවත්, ධනපති පංති විප්ලවයකට කොයි ලෙසකින් නමුත් හවුල් වීමත්, 'ඉහළින්' කෙරෙන සියළුම සටනුත් හෙලා දකින අරාජිකවාදීන්ගේ පිළිවෙතවත් ඔවුනට නැත. නව ඉස්ක්‍රා කණ්ඩායම සාර්වාදය සමග එක්ව කරන ගනුදෙනුවක්, සාර්වාදය පරදවා ලබන ජයග්‍රහණයක් හා සමග එකට පටලවති. ධනපති පංතික විප්ලවයකට කොටස්කරුවන් වීමට ඔවුන්ට උවමනා වී ඇත. ඔවුන් මර්තිනව්ගේ ''ආඥදායකත්ව දෙකෙන්'' තරමක් ඔබ්බට ගොස් තිබේ. ජයග්‍රහණය ලද වහාම (නැතහොත් ජයග්‍රහණයට මදකට පෙර?) නායකත්වය අතහැර දැමීම සඳහා එනම්, ජයග්‍රහණයේ ඵල භුක්ති විඳීමට නොව ඒවා මුළුමනින්ම ධනපති පංතියට භාර දීම සඳහා — ජනතා නැගිටීම මෙහෙයවීමට පවා ඔව්හු කැමැත්ත පළ කරති. 'ජනතා නැගිටීම කම්කරු පංතියේ යහපත පිණිස ප්‍රයෝජනයට ගැනීම' යයි ඔවුන් විසින් හඳුන්වනු ලබන්නේ මෙයයි...

මෙම අවුල ගැන තවදුරටත් වෙහෙසීම අවශ්‍ය නොවේ. 'අන්ත විප්ලවීය විරුද්ධ පක්ෂය ලෙසින් සිටීම' යනුවෙන් කියැවෙන කියමන තුළින් මෙම හවුල හටගත් ආකාරය පරීක්ෂා කිරීම වඩා ප්‍රයෝජනවත් වෙයි.

මෙය ජාත්‍යන්තර විප්ලවකාරී සමාජ-ප්‍රජාතන්ත්‍රවාදයේ එක් සුපුරුදු ප්‍රස්තුතයකි. එය සම්පූර්ණයෙන්ම නිවැරැදි ප්‍රස්තුතයකි. පාර්ලිමේන්තු ඇති රටවල සංශෝධනවාදයට හෝ අවස්ථාවාදයට විරුද්ධ වන සියල්ලන්ම එය පොදු බිමක් වී ඇත. 'පාර්ලිමේන්තුව සුරුවමක් කරගැනීම', මිලෙරාන්වාදය, බර්න්ෂ්ටයින්වාදය[45] හා ටුරාටි ගණයේ ඉතාලි සංශෝධනවාදයත් ප්‍රතික්ෂේප කරන අවශ්‍යකම නිත්‍යානුකූල දෙයක් හැටියට එය පොදුවේ පිළිගැනී තිබේ. මෙම අනගි ප්‍රස්තුතය කටපාඩම් කරගත් අපේ නව ඉස්ක්‍රාවාදීහු එය ඉතා උනන්දුවෙන් එහෙත් සම්පූර්ණයෙන්ම නුසුදුසු ලෙස ව්‍යවහාරයට ගනිති. පාර්ලිමේන්තු සටනේ ප්‍රභේද පාර්ලිමේන්තු නොපවත්නා තත්වයන් සඳහා ලියන ලද යෝජනාවලට ඇතුලත් කර තිබේ. කිසිවකුත් ජනතා නැගිටීමක් ගැන බලතල ලෙස කථා නොකරන දේශපාලන තත්වයක් පිළිබිඹු කරන්නක් හා ප්‍රකට කරවන්නක් බවට පත්ව ඇති 'විරුද්ධ පක්ෂය' යන සංකල්පය, ජනතා නැගිටීමක් ආරම්භ වී ඇත්තා වූද විප්ලවයට සහයෝගය දක්වන සියළු දෙනා එය මෙහෙයවීම ගැන සිතන හා කතාකරන්නා වූද පරිසරයකට තේරුමක් නැතිව යොදාගෙන තිබේ. පැරණි ක්‍රමවල 'එළඹ සිටීමට', එනම්, 'පහළින්' පමණක් කටයුතු කිරීමට දක්වන ඇල්ම මහා සෝෂාවක් සහිතව හා පුරසාරම් සහිතව ප්‍රකාශ කරනු ලැබෙන්නේ ජනතා නැගිටීම ජයග්‍රාහී වන විටෙක ඉහළින් ක්‍රියාකිරීම විප්ලවය විසින් අප හමුවේ තබා ඇති අවධියකදීමය.

නැත. අපේ නව ඉස්ක්‍රා කණ්ඩායම ඇත්තෙන්ම අවාසනාවන්තයෝය! ඔව්හු නිවැරදි සමාජ-ප්‍රජාතන්ත්‍රික නිගමනයක් සකස් කරනු ලැබූ විටක පවා හරියාකාර එය යෙදවීමට නොදන්නෝය. විප්ලවය ආරම්භ වී ඇති කාල පරිච්ඡේදයකදී, පාර්ලිමේන්තුවක් තවමත් නැති පුරවැසි යුද්ධයක් ඇරඹී ඇති, කැරැලිකාර පිබිදීම් සිදුවන විට පාර්ලිමේන්තු සටනේ සංකල්ප හා කොන්දේසි සම්පූර්ණ ප්‍රතිවිරුද්ධ අර්ථයට වෙනස්වී පරිවර්තනය වන බව අවබෝධ කර ගැනීමට ඔවුහු අපොහොසත් වූහ. විමර්ශනයට ලක්වූ තත්ත්වයන් යටතේ සංශෝධන වීදි පෙළපාලි විසින් ඉදිරිපත් කෙරෙන බවත්, අතරමැද මැදිහත්වීම් අවිගත් රටවැසියන්ගේ ප්‍රහාරක කටයුතු මගින් ඇති කරන බව හා බලයෙන් ආණ්ඩුව පෙරළා දැමීමෙන් ආණ්ඩුවට විරුද්ධත්වය ප්‍රකාශ කෙරෙන බවත්, කල්පනා කිරීමට ඔව්හු අවබෝධ කොට නොගනිති.

අපේ ජනකතාවල ප්‍රකට වීරයා කොහෙත්ම නුසුදුසු අවස්ථාවේදී නැවත නැවත යහපත් අවවාද දුන්නාක් මෙන්, මර්තිනව් අනුගාමිකයෝද ඔවුන් විසින්ම හඳුන්වා දෙනු ලබන පරිදි නියම වශයෙන් සටන් ඇරඹී ඇති අවස්ථාවේද සාමකාමී පාර්ලිමේන්තු ක්‍රමයේ පාඩම පුනපුනා කියවති. 'විප්ලවයේ තීරණාත්මක ජයග්‍රහණය' හා 'මහජන නැගිටීම' ගැන සඳහන් කරමින් පටන් ගන්නා යෝජනාවක 'අන්ත විරුද්ධත්වය' පිළිබඳ සටන් පාඨය මෙසේ අහංකාරයෙන් හුවා දැක්වීම තරම් අනෙක් විහිළුවක් නැත! මහත්වරුනි, ජනතා නැගිටීම හටගත් අවධියකදී 'අන්ත විරුදධවාදී වීම' යනුවෙන් අදහස් කරන්නේ කුමක්දැයි සිතා ගැනීමට උත්සාහ කරන්න. ඉන් අදහස් කෙරෙන්නේ ආණ්ඩුව හෙළිදරවු කිරීමද නැතහොත් එය පෙරළා දැමීමද? ඉන් අදහස් කෙරෙන්නේ ආණ්ඩුවට විරුද්ධව ඡන්දය දීමද නැතහොත් විවෘත සටනකින් ආණ්ඩුවේ හමුදා පැරදවීමද? ඉන් අදහස් කෙරෙන්නේ ආණ්ඩුවේ භාණ්ඩාගාරයට මුදල් එක් කරනු ප්‍රතික්ෂේප කිරීමද නැතහොත් ජනතා නැගිටීමේ අවශ්‍යකම් සපුරාලීමත්, ගොවීන් හා කම්කරුවන් සන්නද්ධ කිරීම හා ව්‍යවස්ථාදායක මණ්ඩලයක් පිහිටුවීමත් සඳහා එම භාණ්ඩාගාරය විප්ලවකාරී ලෙස අල්ලා ගැනීමද? මහත්වරුනි, 'අන්ත විරුද්ධවාදී' යන පදයෙන්, විවේචනය, විරුද්ධව ඡන්දය දීම හා ප්‍රතික්ෂේප කිරීම ආදී ප්‍රතිපක්ෂ කටයුතු පමණක් අදහස් වන බව ඔබට තේරුම් නොයන්නේද? එය එසේ

වනුයේ මන්ද? ඊට හේතුව නම් මෙම පදය පාර්ලිමේන්තු සටන්වලට පමණක් අදාලවීමය. ඊටත් වඩා, 'තීරණාත්මක ජයග්‍රහණය' කිසිවෙකු විසිනුත් තම සටනේ නුදුරු ඉලක්කය කරගනු නොලබන කාල පරිච්ඡේදයකට පමණක් අදාලමය. දේශපාලන වශයෙන් පීඩනයට පත් ජනතාව ජයග්‍රහණය පතා මාරාන්තික සටනක් කරමින් මූළු පෙරමුණටම අධිෂ්ඨාන ගත ප්‍රහාරයක් එල්ල කරන මොහොතේ සිටම මේ අතින් සියල්ල මූලික වෙනස්කමකට භාජන වන බව ඔබට තේරුම් නොයන්නේද?

කම්කරුවෝ අපෙන් මෙසේ අසති: ජනතා නැගිටීමක් පිළිබඳ හදිසි කටයුත්ත උද්යෝගයෙන් පටන් ගත යුතුද? නැගී එන ජනතා නැගිටීම ජයග්‍රාහී කිරීම සඳහා කුමක් කළ යුතුද? ජයග්‍රහණය කෙසේ පාවිච්චි කළ යුතුද? එවිට ක්‍රියාවේ යෙදවිය හැකි හා යෙදවිය යුතු වැඩ සටහන කුමක්ද? මාක්ස්වාදය වඩාත් ගැඹුරු කරන නව ඉස්ක්‍රාවාදීහු මෙසේ පිළිතුරු දෙති: අපි අන්ත විප්ලවකාරී විරුද්ධ පක්ෂය ලෙසින් සිටිය යුත්තෙමු. ඉතින්, මේ වීරයන් පිංගුත්තරවාදයේ අතීත උරුමක්කාරයන් ලෙසින් අප විසින් හඳුන්වනු ලැබීමේ වරදක් ඇත්ද?

## 10. 'විප්ලවකාරී කොමියුන' හා නිර්ධන පංතියේ සහ ගොවීන්ගේ විප්ලවකාරී ප්‍රජාතන්ත්‍රික ආඥාදායකත්වය

නව ඉස්ක්‍රා කණ්ඩායාමේ සාකච්ඡා සභාව නව ''ඉස්ක්‍රා'' පුවත්පත විසින් දක්වන ලද අරාජිකවාදී තත්වය ('පහළින් හා ඉහළින්' නොව 'පහළින්' පමණක්) නොරැක්කේය. ජනතා නැගිටීමකට ඇති ඉඩකඩ පිළිගන්නා නමුත්, එය ජය ගැනීමේ හා විප්ලවකාරී තාවකාලික ආණ්ඩුවකට හවුල්වීමේ ඉඩකඩ පිළි නොගැනීමේ විකාරය හොඳින් කැපී පෙනුණි. එහෙයින් මර්තිනව් හා මාර්තව් විසින් ඉදිරිපත් කරනු ලැබූ විසඳුමට සාකච්ඡා සභා යෝජනාවෙන් ඇතැම් එකඟ නොවීම් හා සීමා කිරීම් ඇතුළු කරන ලදී. යෝජනාවේ පහත උපුටා දැක්වෙන කොටසේ සඳහන් කර ඇති ලෙස අපි දැන් එම එකඟ නොවීම් ගැන සොයා බලමු:

''හුදෙක් ජනතා නැගිටීම ව්‍යාප්ත කිරීම හා ආණ්ඩුව අවුල් කිරීම සඳහාම, යම්කිසි මහා නගරයක හෝ දිස්ත්‍රික්කයක බලය අර්ධ



වශයෙන් හා සිද්ධියානුබද්ධව අල්වා ගෙන විප්ලවකාරී කොමියුන පිහිටුවීමේ යෝග්‍යතාව, මෙම උපක්‍රමය විසින් ('අන්ත විප්ලවකාරී විරුද්ධ පක්ෂය ලෙස සිටීම') ඇත්තෙන්ම කිසි ලෙසකිනුත් බැහැර නොකෙරේ''.

එය එසේ නම් ඉන් අදහස් කෙරෙන්නේ, පහළින් පමණක් නොව ඉහළින්ද සටන් කිරීමේ ඉඩකඩ ප්‍රතිපත්ති වශයෙන් ඔවුන් විසින් පිළිගනු ලබන බවය. ඉන් අදහස් කරන්නේ, ''ඉස්ක්‍රා'' පත්‍රයේ (93 කලාපය) පලවූ මාර්තව්ගේ සුප්‍රකට ලිපියෙන් ඉදිරිපත් කර ඇති අදහස ඉවත දමා ''වපිරියොද්'' පත්‍රයෙන් ඉදිරිපත් කළ උපක්‍රමය, එනම් 'පහළින්' පමණක් නොව 'ඉහළින්' ද සටන් කිරීමේ උපක්‍රමය නිවැරදි සේ පිළිගෙන ඇති බවය.

තවද, බලය අල්වා ගැනීම (අර්ධ වශයෙන් හා සිද්ධියානුබද්ධව වුවද) සඳහා අවශ්‍ය වන්නේ, සමාජ-ප්‍රජාතන්ත්‍රිකයන් හා නිර්ධන පංතිය පමණක් නොවන බව පැහැදිලිය. ඊට හේතු වන්නේ ප්‍රජාතන්ත්‍රික විප්ලවයකදී, ඒ ගැන උනන්දු වෙමින් ඊට හවුල් වන පිරිස නිර්ධන පංතියට පමණක් සීමා නොවීමය. එසේ වනුයේ අප සාකච්ඡාවට භාජන කරන යෝජනාවේ මුලින්ම සඳහන් කර ඇති පරිදිම, නැගිටීම 'මහජන' එකක් වීමත්, (නැගිටීම පිළිබඳ සාකච්ඡා සභා යෝජනාවේ යොදා ඇති පදය අනුව) 'නිර්ධන පංතික නොවන කණ්ඩායම්' එනම්, ධනපති පංතියද ඊට හවුල් වීමත් නිසාය. එහෙයින් සුළු ධනපති පංතිය සමග එක්වී සමාජවාදීන් විප්ලවකාරී තාවකාලික ආණ්ඩුවකට කොයි ලෙසකින් නමුත් හවුල්වීම කම්කරු පංතියට කරන ද්‍රෝහිකමක්ය යන මූලධර්මය සාකච්ඡා සභාව විසින් සහමුලින්ම ඉවත දමා තිබේ. ''වපිරියොද්'' පත්‍රය තහවුරු කරන්නට තැත් කළේද එයමය. අර්ධ වශයෙන්, සිද්ධියානුබද්ධව හා ප්‍රාදේශිකව කළත් 'ද්‍රෝහිකමක්' වන ක්‍රියාව ද්‍රෝහිකමක්ම වෙයි. එහෙයින් විප්ලවකාරී තාවකාලික ආණ්ඩුවකට හවුල්වීම හා විකෘත ජොරේස්වාදය[46] එකට සම කිරීමට දැරූ උත්සාහය සාකච්ඡා සභාව විසින් ඉවත දමා ඇත. 'වපිරියොද්' පත්‍රය බලාපොරොත්තු වූයේද එයමය.[47] ආණ්ඩු බලය වෙනත් නගරවලට පැතිර නොගොස් එක් මහා නගරයකට සීමා වුවද, බොහෝ දිස්ත්‍රික්කවලට පැතිර නොගොස් එක් දිස්ත්‍රික්කයකට සීමා වුවද, එසේම එය හඳුන්වනු ලබන නම කුමක් වුවද, ආණ්ඩුව ආණ්ඩුවක්ම විනා වෙනකක් නොවේ. මෙනයින් නව ''ඉස්ක්‍රා'' විසින් පිළිගැන්වීමට උත්සාහ කරනු ලැබූ, මේ ප්‍රශ්නයේ න්‍යායික ඉදිරිපත් කිරීම සාකච්ඡා සභාව විසින් ඉවත දමා තිබේ.

විප්ලවකාරී ආණ්ඩු පිහිටුවීම හා ඊට හවුල්වීම සම්බන්ධයෙන් සාකච්ඡා සභාව විසින් පනවනු ලැබූ දූනට ප්‍රතිපත්ති වශයෙන් පිළිගනු ලැබූ, සීමාකිරීම් සාධාරණ දූයි දූන් අපි සොයා බලමු. 'සිද්ධියානුබද්ධ' හා 'තාවකාලික' යන සංකල්ප අතර වෙනස කුමක්දූයි අපි නොදනිමු.* පැහැදිලි චින්තනයක් නොමැතිකම සඟවා තැබීම සඳහා මේ 'අලුත්' නුහුරු වචන යොදගෙන ඇති බවට අපි සැක කරමු. ''වඩා ගම්භීර බවක් පිටතින් පෙන්වන නමුදු, ඇත්ත වශයෙන්ම එය වඩාත් අවුල් සහිතය, නොපැහැදිලිය. මහ නගරයක හෝ දිස්ත්‍රික්කයක අර්ධ වශයෙන් 'බලය අල්ලා ගැනීමේ' 'ඉඩකඩ' හා මුළු රටේම පැතුරුණු විප්ලවකාරී තාවකාලික ආණ්ඩුවකට හවුල් වීමත් අතර ඇති වෙනස කුමක්ද? ජනවාරි 9 දින සිදුවීම්වලට පසුබිම වූ සාන්ත පීටර්ස්බර්ග් වැනි නගර මහ නගර ගණයට ඇතුළත් නොවන්නේද? දිස්ත්‍රික්කවලට බොහෝ රාජ්‍යයන්ට වඩා විශාල වූ කොකේසස් අයත් නොවන්නේද? දිස්ත්‍රික්ක පසෙක තබා තනි මහ නගරයක් ගැන සිතා බැලුවද, එහි 'බලය' 'අල්ලා' ගත් වහාම බන්ධනාගාර, පොලීසිය, මහජන අරමුදල් ආදිය සම්බන්ධයෙන් කළ යුතු දේ ගැන (වරක් නව ''ඉස්ක්‍රා'' පත්‍රයට හිසරදයක්වූ) ප්‍රශ්න අප හමුවට නොපැමිණේද? අපට ප්‍රමාණවත් තරම් බලවේග නොමැති නම්, කැරැල්ල සම්පූර්ණයෙන් සාර්ථක නොවුනි නම්, හෝ ජයග්‍රහණය තීරණාත්මක නොවේ නම්, එවිට වෙන් වෙන් වශයෙන් ප්‍රදේශ මහ නගර හා එබඳු වෙනත් තැන්වල විප්ලවකාරී තාවකාලික ආණ්ඩු පිහිටුවීමට ඉඩ ඇති බව ඇත්තෙන්ම කිසිවකු විසිනුත් ප්‍රතික්ෂේප නොකරනු ඇත. එහෙත් මහත්වරුනි, මේ සියල්ලම කාරණාවට අදාළ වන්නේ කෙසේද? යෝජනාව ආරම්භයේදීම ''විප්ලවයේ තීරණාත්මක ජයග්‍රහණයක්'' ගැන ''ජයග්‍රාහී මහජන නැගිටීමක්'' ගැන ඔබ විසින්ම සඳහන් කරනු ලැබුවා නොවේද? පොදුවේ, ඒකීයව, අඛණ්ඩව හා සම්පූර්ණව වෙනුවට නිර්ධන පංතියේ අවධානය හා අරමුණු දෙකඩ කිරීම, එහි අවධානය අර්ධයන්ට යොමු කිරීම යන අරාජිකවාදීන්ගේ කටයුතු සමාජ-ප්‍රජාතන්ත්‍රිකයන් විසින් තමන් වෙත පවරා ගනු ලැබුවේ කවද සිටද? එක් මහ නගරයක 'බලය අල්ලා ගැනීම' යෝජනා කරන අතරම 'කැරැල්ල ව්‍යාප්ත කිරීමටද' ඔබම කතා කරයි. සියලු නගරවලට ව්‍යාප්ත කිරීම අප කල්පනා කළ යුතුද? අප බලාපොරොත්තු විය යුතුද? මහත්වරුනි, ඔබේ නිගමන ඔබේ පූර්වාවයව මෙන්ම පදනම් විරහිත ඒවාය.

* පළමුවන වචනය එවකට උගතුන්ගේ බසෙහි ව්‍යවහාරවූ අතර දෙවැන්න තවමත් රුසියානු ගැමි වහරෙහි පවතී. — පරිවර්තක



පරස්පර විරෝධී හා පැටලිලි සහිත ඒවාය. පොදු වශයෙන් විප්ලවකාරී තාවකාලික ආණ්ඩුවක් පිළිබඳ ප්‍රශ්නයට රු.ස.ප්‍ර.ක. පක්ෂයේ තුන්වැනි සම්මේලනය විසින් සම්පූර්ණ හා පැහැදිලි පිළිතුරක් සපයා ඇත. එම පිළිතුර තාවකාලික ප්‍රාදේශික ආණ්ඩු සියල්ලක් සම්බන්ධයෙන්ද සාධාරණ වූ එකකි. එහෙත් හිතුවක්කාර හා කෘත්‍රිම අන්දමින් ප්‍රශ්නයේ එක් කොටසක් පමණක් තෝරා ගනිමින් සාකච්ඡා සභාව විසින් සපයා ඇති පිළිතුරෙන් කෙරෙන්නේ හුදෙක් (අසාර්ථක ලෙස) සමස්තයක් වශයෙන් ප්‍රශ්නය මග හැර අවුල් ඇති කිරීමය.

'විප්ලවකාරී කොමියුන' යනුවෙන් අදහස් කෙරෙන්නේ කුමක්ද? මෙම සංකල්පය 'විප්ලවකාරී තාවකාලික ආණ්ඩුව' ට වෙනස් වූවක්ද? එසේ නම් ඒ කුමන අංශයෙන්ද? සාකච්ඡා සභාවේ මහතුන්මද දන්නේ නැත. බොහෝ විට සිදුවන පරිදි, විප්ලවීය චින්තනය අවුල් කර ගැනීම නිසා ඔවුන් විප්ලවීය වදන් හරඹයට යොමුවී ඇත. ඇත්තකි. සමාජ-ප්‍රජාතන්ත්‍රික නියෝජිතයන් විසින් අනුමත කරගනු ලැබූ යෝජනාවක 'විප්ලවකාරී කොමියුන' යන වචන යෙදීම විප්ලවීය වදන් හරඹයක් මිස අනිකක් නොවේ. ඇත අතීතයේ අනාගත කාර්යභාරයන් සඟවා තැබීම සඳහා වැහැරුනු අතීතයෙන් 'චමත්කාර' වචන ප්‍රයෝජනයට ගත් බොහෝ අවස්ථාවලදී මාක්ස් එබඳු වදන් හරඹ හෙලා දුටුවේය. එබඳු තත්හිදී ඉතිහාසයේදී වරක් වැදගත් තැනක් ගත් පදයක චමත්කාරය හුදු නිෂ්ඵල අනර්ථදායි දිලිසෙන තහඩුවක්, ළමයකුගේ පුහුසෝෂාවක් වෙයි. අපට විප්ලවකාරී තාවකාලික ආණ්ඩුවක් පිහිටුවීමට උවමනා වන්නේ ඇයිද යන වගත්, දූනටමත් ආරම්භවී ඇති මහජන නැගිටීම ජයගත් හැටියේම, අප විසින් ආණ්ඩුව කෙරෙහි තීරණාත්මක බලපෑමක් ඇති කිරීමෙන් දිනාගත හැකි වෙනස්කම් හරියටම මොනවාදූයි යන වගත් ගැන අපි කම්කරුවන්ට හා සමස්ත ජනතාවට පැහැදිලි නිරවුල් පිළිතුරක් දිය යුත්තෝ වෙමු. මේවා දේශපාලන නායකයන් හමුවේ ඇති ප්‍රශ්නය.

රු. ස. ප්‍ර. ක. පක්ෂයේ තුන්වැනි සම්මේලනය මෙම ප්‍රශ්නවලට ඉතා පැහැදිලි පිළිතුරු සපයමින් අප පක්ෂයේ මෙම වැඩ සටහන හැටියට, මෙම වෙනස්කම් පිළිබඳ සම්පූර්ණ වැඩ සටහනක් සකස් කළේය. 'කොමියුන' යන පදය කිසිසේත්ම පිළිතුරක් නොවේ. ඈතින් ඇසෙන මළ බෙර හඬක් හෝ පුහුසොෂාවක් බඳු එයින් කෙරෙන්නේ ජනතාවගේ මනස අවුල් කිරීම පමණකි. නිදසුනක් දක්වතොත් 1871 පැරිස් කොමියුනය පිළිබඳ මතකයට අප අපේ ගරුකිරීම වැඩිවූ තරමටම, එහි වැරදි හා ඊට සම්බන්ධ තත්ත්වයන් විභාග කර බැලීමෙන් තොරව, ඒ ගැන ආවාට ගියාට කල්පනා කිරීමට අවසරයක්

නැත. එසේ කරන්නේ නම්, එය එංගල්ස් විසින් සිනහවට ලක් කරනු ලැබුවා වූද, කොමියුනයේ සෑම ක්‍රියාවක්ම (1874 තම ''ප්‍රකාශනය''[48] මගින්) හිස් මුදුනින් පිළිගත්තා වූද බ්ලන්කිවාදීන්ගේ විකාර ආදර්ශය අනුගමනය කිරීමක් වනු ඇත. යෝජනාවේ සඳහන් කර ඇති මෙම 'විප්ලවකාරී කොමියුනය' ගැන තමන්ගෙන් ප්‍රශ්න කරන කම්කරුවෙකුට සාකච්ඡා සභා කාරයෙකු දෙන පිළිතුර කුමක්ද? එහිදී ඔහුට කීමට හැකි වන්නේ, එය වනාහී එම වකවානුවේදී ප්‍රජාතන්ත්‍රික විප්ලවයක මූලිකාංග හා සමාජවාදී විප්ලවයක මූලිකාංග අතර වෙනස හඳුනා ගැනීමට අසමත් වූද, සමූහාණ්ඩුවක් සඳහා සටන් කිරීමේ කටයුතු සමාජවාදය සඳහා සටන් කිරීමේ කටයුතු සමග පටලවා ගත්තා වූද, වර්සේල්ස් පාලනයට විරුද්ධව උද්යෝගිමත් හමුදා ප්‍රහාරයක් එල්ල කිරීමට අසමත් වූවා මෙන්ම ප්‍රංශ බැංකුව අල්ලා නොගැනීමේ වරද සිදු කලාවූද, එක්තරා කම්කරු ආණ්ඩුවක් හැඳින්වීමට ඉතිහාසයේ සඳහන් වන නමක් පමණක් බවය. කොටින් කියතොත්, ඔබේ පිළිතුරෙන් ඔබ පැරිස් කොමියුනය හෝ වෙන යම් කොමියුනයක් ගැන සඳහන් කළද, ඔබේ පිළිතුර වනු ඇත්තේ ''එය අපේ ආණ්ඩුව නොවිය යුතු ආණ්ඩුවකි'' යනුය. ඇත්තෙන්ම කදිම පිළිතුරකි! පක්ෂයේ ව්‍යවහාරික වැඩ සටහන ගැන කිසිත් නොකියා යෝජනාවක් තුළින් ඉතිහාස පාඩම් උගැන්වීමට අනුචිත ලෙස පටන් ගන්නා විට විප්ලවවාදියකුගේ පූරසාරම් දෙඩුම හා අකර්මන්‍යභාවය ඉන් පෙන්නුම් නොකෙරේද? අප විසින් වරදක් කර ඇතැයි, එනම් ප්‍රජාතන්ත්‍රික විප්ලවයත් සමාජවාදී විප්ලවයත් සමග එකට පටලවා ඇතැයි අසාර්ථක ලෙස අපට චෝදනා කරන්නන්ම එම වරද කර ඇති බව මින් පැහැදිලි නොවේද?

(කොමියූනය යි ඉතා අනුචිත ලෙස නම්කරන ලද) තාවකාලික ආණ්ඩුවක අරමුණ 'තනිකරම'ජනතා නැගිටීම ව්‍යාප්ත කොට ආණ්ඩුව අවුල් කිරීම යයි ප්‍රකාශයට පත්කර ඇත. වචනයේ වහරන අරුත අනුව බලන විටම 'තනිකරම' යන පදයෙන් අන් සියලු ඉලක්ක බැහැර වෙයි. ඒ වනාහි 'පහළින් පමණක්' යන විකාර න්‍යායයේ ද්‍රෝංකාරයකි. සෙසු අරමුණු එසේ බැහැර කිරීම ඔවුන්ගේ අදූරදර්ශි බව හා කල්පනා ශක්තියේ ඌනතාවය දක්වන තවත් අවස්ථාවකි. 'විප්ලවකාරී කොමියුනයක්' එනම් විප්ලවකාරී ආණ්ඩුවක් තනි මහ නගරයක පමණක් පිහිටුවනු ලැබුවද, ඊට රාජ්‍යයේ සියලු කටයුතු (තාවකාලිකව, අර්ධ වශයෙන්, සිද්ධියානුබද්ධව වුව) පරිපාලනය කිරීමට අනිවාර්යයෙන්ම සිදුවෙයි. තම පිහාටු යටම ඔළුව හංගා ගෙන මෙය දැකීමට ප්‍රතික්ෂේප කිරීම අනුවන කමේ ඉහළම තත්ත්වය පෙන්වන්නකි. පැය අටක වැඩ දිනයක් නියම කිරීම, කර්මාන්තශාලා කම්කරුවන්ගේ පරීක්ෂාවට නතු කිරීම, සැමටම නිදහස් අධ්‍යාපනයක් ලබා දීම, විනිශ්චය කරුවන් ඡන්දයෙන් තෝරා පත් කර ගැනීමේ ක්‍රමයක් ඇති කිරීම, ගොවිජන සභා පිහිටුවීම ආදී කටයුතු ඉටු කිරීමට මෙම ආණ්ඩුවට සිදුවේ. කොටින් කියතොත් සහතික වශයෙන්ම මේ ආණ්ඩුවට ප්‍රතිසංස්කරණ රාශියක් ඇති කිරීමට සිදුවේ මෙම ප්‍රතිසංස්කරණ ජනතා නැගිටීම ව්‍යාප්ත කිරීමට ආධාර දීම යනුවෙන් හැඳින්වීම, සම්පූර්ණ පැහැදිලි තත්ත්වයක් අවශ්‍ය වන දෙයක් ඕනෑකමින්ම මහ අවුල්ජාලයක් බවට පත් කරමින් වචන හා සමග සෙල්ලම් කිරීමක් වෙයි.

---

නව ''ඉස්ක්‍රා'' යෝජනාවේ අවසාන කොටසින් අපේ පක්ෂය තුළ යළි පණගැන්වී ඇති 'ආර්ථිකවාදයේ' ප්‍රතිපත්ති පිළිබඳ නැඹුරුවීම් විවේචනය කරනු සඳහා අලුත් කිසිවක් නොලැබෙන අතර එයින් ඉහතින් කියා ඇති දේ තරමක් වෙනස් කෝණයකින් පැහැදිලි කර දෙයි.

ඒ අවසාන කොටස මෙසේය:

''බලය අල්ලාගෙන හැකි තරම් කල් එය රඳවා ගැනීම සඳහා සමාජ–ප්‍රජාතන්ත්‍රවාදීන් තමන්ගේම උනන්දුව උඩ ස්වකීය ප්‍රයත්න යෙදවිය යුත්තේ එක් අවස්ථාවකදී පමණි. එනම්, සමාජවාදය ළඟා කර ගැනීමට අවශ්‍ය තත්ත්වයන් දැනටමත් කිසියම්(?) මුහුකුරා ගිය ප්‍රමාණයකට පත්ව ඇති බටහිර යුරෝපයේ දියුණු රටවල් කරා විප්ලවය පැතිර යන විට පමණි.එම අවස්ථාවේදී රුසියානු විප්ලවයේ සීමිත ඉතිහාසමය ඉඩ ප්‍රස්ථා සැහෙන පමණින් පුළුල් කිරීමට ඉඩ ලැබෙන අතර, සමාජවාදී ප්‍රතිසංස්කරණ පිළිබඳ මාවතට පිවිසීමේ ඉඩකඩද පහළ වනු ඇත.

''සම්පූර්ණ විප්ලව කාල පරිච්ඡේදය තුළදීම, විටින් විට අනු පිළිවෙළින්, බලයට පත්විය හැකි සියලුම ආණ්ඩුවලට විරුද්ධ වූ අන්ත විප්ලවකාරී පක්ෂය ලෙසින් ස්වකීය තත්වය පවත්වා ගැනීමේ අදහස ඇතිව ඒ අනුව තම උපක්‍රම සකස්කර ගැනීමෙන්, ආණ්ඩු බලය තමන් අතට වැටෙනු (??) එය පාවිච්චි කිරීමට සමාජ-ප්‍රජාතන්ත්‍රවාදයට ඉතා හොඳින්ම සූදානම් විය හැකි වෙයි.''

මෙහි ඇති මූලික අදහස නම් ප්‍රජාතන්ත්‍රික විප්ලවයකදි සමාජ-ප්‍රජාතන්ත්‍රවාදයේ සම්පූර්ණ ජයග්‍රහණය ගැන එනම් නිර්ධන පංතියේ හා ගොවීන්ගේ විප්ලවකාරී ප්‍රජාතන්ත්‍රික ආඥාදායකත්වය ගැන (මර්තිනව් මෙන්) අප බියවිය යුතු නැති බව කියමින් ''චපිරියොද්''

පත්‍රය පුන පුනා දක්වන ලද අදහසයි. මන්දයත්, එබඳු ජයග්‍රහණයකින් යුරෝපය අවදි කිරීමට අපට හැකිවන අතර ධනපති පංතියේ වියගස එහිදී ඉවත ලෑමෙන් පසුව යුරෝපයේ සමාජවාදී නිර්ධන පංතියද අනික් අතින් සමාජවාදී විප්ලවය සාර්ථක කර ගැනීමට අපට ආධාර දෙනු ඇති බැවිනැයි ද එම පත්‍රය සඳහන් කළේය. එහෙත් මේ අදහස නව ''ඉස්ක්‍රා'' විසින් ඉදිරිපත් කර ඇති ආකාරයෙන් කොතරම් දුරට ඊට හාණි පමුණුවා ඇති දැයි බලන්න. සවිස්තරයන් ගැන, බලය අල්ලාගැනීම හානිකර උපක්‍රමයක් යයි සළකන පංති හැඟීමෙන් යුතු පක්ෂයක් අතට බලය 'වැටෙනු' ඇතැයි යන විකාර පිළිගැනීම ගැන, යුරෝපය තුළ සමාජවාදය සඳහා අවශ්‍ය තත්ත්වයන් එක්තරා පමණකට නොව පොදුවේ මුහුකුරා තිබීම ගැන, අපේ පක්ෂයේ වැඩ සටහන සමාජවාදී විප්ලවය මිස සමාජවාදී ප්‍රතිසංස්කරණ නොහැඳිනීම ගැන කිසිවක් නොකියමු. ''වපිරියොද්'' පත්‍රය විසින් ඉදිරිපත් කරන ලද අදහස හා යෝජනාවෙන් දක්වන ලද අදහසක් අතර ඇති ප්‍රධාන හා මූලික වෙනස ගනිමු. ''වපිරියොද්'' පත්‍රය රුසියාවේ නිර්ධන පංතියට ක්‍රියාශීලී කටයුත්තක් පවරයි. එනම්, ප්‍රජාතන්ත්‍රවාදය සඳහා කරන සටන ජයග්‍රහණය කිරීමත්, එම ජයග්‍රහණය, යුරෝපයට විප්ලවය පැතිරවීම සඳහා ප්‍රයෝජනයට ගැනීමත්ය. අපේ 'තීරණාත්මක ජයග්‍රහණය' (නව ඉස්ක්‍රා අර්ථය අනුව නොවේ) හා යුරෝපයේ විප්ලවය අතර පවත්නා මේ සම්බන්ධය හඳුනා ගැනීමට යෝජනාව අසමත් වෙයි. එහෙයින් එය නිර්ධන පංතියේ කටයුතු ගැන හෝ එහි ජයග්‍රහණයේ ඉඩකඩ ගැන හෝ නොව පොදුවේ එක් ඉඩ ප්‍රස්ථාවක් ගැන සඳහන් කරයි: එනම්, 'විප්ලවය පැතිරයන විට' පමණි. සමාජ සංවර්ධනයේ නිශ්චිත අවස්ථාවකදී වහා දිනාගත හැකි දේ කුමක්ද යන වගත්,සමාජවාදය සඳහා කරන සටනේ ප්‍රජාතන්ත්‍රික පෙර ඇවැසිකමක් ලෙසින් පළමුවෙන්ම දිනාගත යුත්තේ කුමක්ද යන වගත් සිත තබාගෙන 'ආණ්ඩු බලය ප්‍රයෝජනයට' ගත හැකි හා, ගත යුතු ආකාරය ''වපිරියොද්'' පත්‍රය විසින් නිශ්චිත ලෙසින් කෙලින්ම දක්වා ඇත. එය රුසියානු සමාජ-ප්‍රජාතන්ත්‍රවාදී කම්කරු පක්ෂයේ තුන්වැනි සම්මේලනයේ යෝජනාවටද ඇතුලු කර තිබේ. මෙහිදීද සාකච්ඡා සභා යෝජනාව ''ප්‍රයෝජනය ගැනීමට තමන්ටම සූදනම් විය හැකිය'' යයි සඳහන් කරමින් වලිගයේ එල්ලී සිටී. එහෙත් එසේ හැකි වන්නේ කෙසේද, තමන්ම සූදනම් වන්නේ කෙසේද එය ප්‍රයෝජනයට ගන්නේ කුමක් සඳහාද යන වග දැක්වීමට අසමත් වෙයි. සාමාන්‍යයෙන් නව ඉස්ක්‍රාවාදීන්ම පක්ෂය තුළ තමන්ට හිමි ප්‍රධාන තැන ''ප්‍රයෝජනයට ගැනීම සඳහා තමන් විසින්ම සූදනම්



විය හැකි බවට'' අපට සැකයක් නැත. එහෙත් කාරණය නම් ඔවුන් විසින් එය ප්‍රයෝජනයට ගෙන ඇති ආකාරයත් මෙතෙක් ඔවුන්ගේ සූදනමත් ගැන බලන විට ඉඩකඩ ප්‍රත්‍යක්ෂයක් බවට පෙරලීම ගැන වැඩි බලාපොරොත්තුවක් තැබිය නොහැකි වීමය. ''බලය රඳවා ගැනීමේ ඉඩකඩ'' නියම වශයෙන්ම රැඳෙන්නේ කොතැනද යන බව, එ නම් නිර්ධන පංතියේ හා ගොවින්ගේ විප්ලවකාරී ප්‍රජාතන්ත්‍රික ආඥාදායකත්වය තුළ බව, ප්‍රතිවිප්ලවකාරී සියලු බලවේග අභිභවා යාමට සමත් ඔවුන්ගේ ඒකාබද්ධ සමූහ ශක්තිය තුළ බව, ප්‍රජාතන්ත්‍රික වෙනස්කම්වලදී ඔවුන්ගේ අපේක්ෂාවන්ගේ අනිවාර්ය සම්පාත වීම තුළ බව ''වපිරියොද්'' පත්‍රය ඉතා නිශ්චිත ලෙස සඳහන් කළේය. මෙහිදීද සාකච්ඡා සභාවේ යෝජනාව අපට සක්‍රීය කිසිවක් නොකියයි. එය හුදෙක් ප්‍රශ්නය මග හරී. සත්තකින්ම රුසියාවේ බලය රඳවා ගැනීමේ ඉඩකඩ රුසියාව තුළම වූ සමාජ බලවේගවල සංයුතිය මත හා දැන් අප රටේ සිදුවන ප්‍රජාතන්ත්‍රික විප්ලවයේ තත්ත්වයනුත් විසින් නිගමනය විය යුතුය. සත්තකින්ම යුරෝපයේ නිර්ධන පංතියේ ජයග්‍රහණයකින්, (යුරෝපයට විප්ලවය ගෙන යෑම හා නිර්ධන පංතියේ ජයග්‍රහණයත් අතර තවමත් බොහෝ දුරක් තිබේ). රුසියානු ධනපති පංතියේ උග්‍ර ප්‍රතිවිප්ලවකාරී අරගලයක් හටගනු ඇත. එහෙත් රු. ස. ප්‍ර. ක. පක්ෂයේ තුන්වැනි සම්මේලනයේ යෝජනාවෙන් වැදගත්කම තක්සේරු කරනු ලැබූ මේ ප්‍රතිවිප්ලවකාරී බලවේග ගැන නව ඉස්ක්‍රාවාදීන්ගේ යෝජනාව කිසිවක් නොකියයි. සමූහාණ්ඩුවක් හා ප්‍රජාතන්ත්‍රවාදය සඳහා අප ගෙනයන සටනේදී නිර්ධන පංතිය හා ගොවිජනයා කෙරෙහි විශ්වාසය තැබීමට අපට නොහැකි නම් අප විසින් 'බලය රඳවා ගැනීමේ' ඉඩකඩ නිෂ්ඵල වනු ඇත. එය නිෂ්ඵල නොවේ නම් ''සාර්වාදය යටපත් කළ විප්ලවයේ තීරණාත්මක ජයග්‍රහණයකින්'' එබඳු ඉඩප්‍රස්ථාවක් උදාවන්නේ නම් එතැනදී අපි එය පෙන්වා දිය යුත්තෙමු. එය යථාර්ථයක් බවට පෙරලීම සඳහා උද්‍යෝගිව හඬ නැගිය යුත්තේමු. යුරෝපයට විප්ලවය ගෙනයාමේ හදිසි අවශ්‍යතාවය සඳහා පමණක් නොව එය එහි ගෙන යාමේ අරමුණ සඳහාද ව්‍යවහාරික සටන් පාඨ නිකුත් කළ යුතු වෙමු.'' රුසියානු විප්ලවයේ සීමිත ඉතිහාසමය ඉඩකඩ'' පිළිබඳ වල්ගාවාදී සමාජ-ප්‍රජාතන්ත්‍රිකයන් විසින් කර ඇති සඳහන හුදෙක් මේ ප්‍රජාතන්ත්‍රික විප්ලවයේ අරමුණු හා මේ විප්ලවයේදී නිර්ධන පංතිය සතු නායක කාර්යභාරය පිළිබඳ ඔවුන්ගේ සීමිත දැනුම සැඟවීමට ආධාර වේ!

''නිර්ධන පංතියේ හා ගොවි ජනතාවගේ විප්ලවීය ප්‍රජාතන්ත්‍රික ආඥාදායකත්වයකින් ''ඒකීය අභිමතය'' මුලින්ම බලාපොරොත්තු

වන අතර නිර්ධන පංතියේ හා සුළු ධනේශ්වර පංතියේ ඒකීය අභිමතයක් පැවතිය නොහැකි වීමයි. (''ඉස්ක්‍රා'' අංක 95) මෙම විරෝධය පදනම් විරහිතය. මන්දයත් එය ''ඒකීය අභිමතය'' යන පදයේ අමූර්ත, ''පාර ලෞකික'' අර්ථ විග්‍රහයක් මත පදනම් වූවක් හෙයිනි. එක් අංශයකින් ඒකීය අභිමතයක් පැවතීමටත් වෙනත් අංශයකින් නොපැවතීමටත් පුළුවන. සමාජවාදය පිළිබඳ ප්‍රශ්නවලදී හා සමාජවාදය සඳහා වූ සටනේදී ඒකීය අභිමතයක් දැරීම ප්‍රතික්ෂේප නොකරයි. මෙය අමතක කිරීම ප්‍රජාතන්ත්‍රික විප්ලවයක් හා සමාජවාදී විප්ලවයක් අතර වූ තර්කානුකූල හා ඉතිහාසගත වෙනස අමතක කිරීමක් වනු ඇත. මෙය අමතක කිරීම මුළු මහත් ජනතාවගේම විප්ලවයක් ලෙස ප්‍රජාතන්ත්‍රික විප්ලවයේ සමභාවය අමතක කිරීමකි. ''මුළු මහත් ජනතාවගේම'' නම් එහි තේරුම ''ඒකීය අභිමතය'' පවතින්නේ මෙම විප්ලවය මුළු ජනතාවගේ අවශ්‍යතා හා වුවමනා ඉටුකරන්නේ නම් පමණි. ප්‍රජාතන්ත්‍රවාදයේ සීමාවලින් ඔබ්බට නිර්ධන පංතියට හා ගොවි ජන ධනේශ්වර පංතියට ඒකීය අභිමතයක් තිබීමේ ප්‍රශ්නයක් නැත. ඔවුන් අතර පංති අරගලය අනිවාර්‍ය්‍යය. ඒහෙත් සමාජවාදය සඳහා ජනතාවගේ ඉතාමත්ම උග්‍ර අරගලය ඇතිවෙන්නේ ප්‍රජාතන්ත්‍රික ආණ්ඩුවක් තුළ පමණි. ලෝකයේ පවත්නා අන් හැම දෙයක් මෙන්ම නිර්ධන පංතියේ හා ගොවි ජනතාවගේ විප්ලවීය ප්‍රජාතන්ත්‍රික ආඥාදායකත්වයට අතීතයක් හා අනාගතයක් තිබේ. එහි අතීතය ඒකාධිපත්‍යය, වැඩවසම් ක්‍රමය, රාජාණ්ඩුව හා වරප්‍රසාද වේ. මෙම අතීතයට. විරුද්ධ අරගලයේ, ප්‍රතිවිප්ලවයට විරුද්ධ අරගලයේ නිර්ධන පංතියේ හා ගොවි ජනතාවගේ ''ඒකීය අභිමතයක්'' තිබිය හැකිය. මන්ද මෙහිදී වුවමනාවන්ගේ සමගියක් පවත්නා බැවිනි.

එහි අනාගතය පෞද්ගලික දේපලවලට විරුද්ධ අරගලයයි. වැටුප් සේවකයා ස්වාමියාට විරුද්ධව කරන අරගලයයි. සමාජවාදය සඳහා කරන අරගලයයි. මෙහිදී ඒකීය අභිමතයක් ඇතිවිය නොහැකිය* මෙහිදී අප ඉදිරියේ ඇති මාවත වැටෙන්නේ ඒකාධිපත්‍යයේ සිට සමූහාණ්ඩුවක් කරා නොව සුළු ධනේශ්වර ප්‍රජාතන්ත්‍රික සමූහාණ්ඩුවක සිට සමාජවාදය කරාය.

යථා ඉතිහාසමය තත්වයන්හිදී අතීතයේ අංග අනාගතයේ අංග හා වෙලී පැවතීම, මාවත් දෙක මුණගැසීම සත්‍යයකි. පෞද්ගලික

---

* නිදහස් තත්වයන් යටතේ වඩා ව්‍යාප්තව හා ශීඝ්‍රව ඇතිවන ධනවාදයේ සංවර්ධනය මගින් ඒකීය අභිමතය අනිවාර්යයෙන්ම අහෝසි කරනු ඇත. ප්‍රතිවිප්ලවය හා ප්‍රතිවිරෝධනය ඉක්මනින් මැඩ පැවැත්වුවහොත් එයද ඉක්මන් වනු ඇත.



දේපලවලට විරුද්ධව සටන් කරන වැටුප් ශ්‍රමය ඒකාධිපත්‍යය යටතේ පවතී. එය වැඩවසම් ක්‍රමය යටතේද උපදී. එහෙත් මේ නිසා සංවර්ධනයේ ප්‍රධාන අවදි ඉතිහාසමය වශයෙන් වෙන් කිරීමට අපට බාදා පැමිනෙන්නේ නැත. අප හැම දෙනම ධනේශ්වර විප්ලවය හා සමාජවාදී විප්ලවය එකිනෙක ප්‍රතිවිරුද්ධ ලෙස දක්වති. ඒවා අතර වෙනස දැඩි ලෙස හඳුනා ගැනීමේ පරම අවශ්‍යතාවය ගැන තරයේ කියා සිටිති. කෙසේ වෙතත් ඉතිහාසයෙහි ගමනේදී මෙම විප්ලව දෙකක පුද්ගල, සුවිශේෂ අංග එකිනෙක වෙළෙන බව ප්‍රතික්ෂේප කළ හැකිද? යුරෝපයේ ප්‍රජාතන්ත්‍රික විප්ලව සමයෙහි ඒ ආශ්‍රිතව සමාජවාදී ව්‍යාපාර කිහිපයක් හා සමාජවාදය පිහිටුවීමට උත්සාහ දැරීම් නොපැවැතියේද? යුරෝපයේ අනාගත සමාජවාදී විප්ලවයට ප්‍රජාතන්ත්‍රවාදයේ ක්ෂේත්‍රයේ ඉතිරිව ඇති බොහෝ දෑ සම්පූර්ණ කිරීමට තිබෙනවා නොවේද?

ඉතාමත්ම ප්‍රජාතන්ත්‍රික හා සමූහාණ්ඩුවාදී ධනේශ්වර පංතියට හා සුළු ධනේශ්වර පංතියට විරුද්ධව වුවද සමාජවාදය සඳහා පංති අරගලයක් කිරීමට නිර්ධන පංතියට අනිවාර්යයෙන් සිදුවන බව සමාජ-ප්‍රජාතන්ත්‍රිකයෙකු විසින් කිසි විටෙක අමතක නොකළ යුතුය. මෙය සැකයෙන් තොරය. එහෙයින්, සමාජ-ප්‍රජාතන්ත්‍රවාදයේ වෙනම, ස්වාධීන දැඩි පංතිමය පක්ෂයක් පරම අවශ්‍යතාවයකි. එහෙයින්, ධනපති පංතිය සමග එක්ව ඒකාබද්ධ ප්‍රහාරයක් දීමේ අපේ උපක්‍රමවල තාවකාලික ස්වභාවයද, ''හතුරකු කෙරෙහි මෙන් අපේ සගයා කෙරෙහිද'' දැඩි සුපරීක්ෂාවක් තබා ගැනීමේ යුතුකම ආදියද පවතී. මේ සියල්ලම සැකයට ඉඩක් නොතබයි. කෙසේ වෙතත් සංක්‍රමණික හා තාවකාලික වන වර්තමාන කාලයේදී පරම වන්නාවූ කටයුතු අප විසින් අමතක කළ යුතුය, ගණන්නොගත යුතුය හෝ නොසලකා හැරිය යුතුය යනුවෙන් නිගමනය කිරීම හාස්‍යජනක හා ප්‍රතිගාමී වනු ඇත. ඒකාධිපත්‍යයට විරුද්ධ අරගලය සමාජවාදීන් හට තාවකාලික හා සංක්‍රමනීය වන මුත් මෙම කටයුත්ත කිසි ලෙසකින් වත් ගණන් නොගැනීම හෝ නොසලකා හැරීම සමාජවාදය පාවාදීමක් හා ප්‍රතිගාමීත්වයට සේවය කිරීමකි. නිර්ධන පංතියේ හා ගොවි ජනතාවගේ විප්ලවීය ප්‍රජාතන්ත්‍රික ආඥාදායකත්වය අවිවාදයෙන්ම සංක්‍රමනික, තාවකාලික සමාජවාදී අරමුණකි. එහෙත් ප්‍රජාතන්ත්‍රික විප්ලව සමයකදී මෙම අරමුණ නොසලකා හැරීම අන්ත ප්‍රතිගාමී දෙයක් වනු ඇත.

මූර්ත තත්වයන්හිදී මූර්ත දේශපාලන අරමුණු ඉදිරිපත් කළ යුතුය. සියල්ල සාපේක්ෂය. සියල්ල ගලා යයි. සියල්ල වෙනස්වෙයි.

සමූහාණ්ඩුවක් ඉල්ලීම ජර්මන් සමාජ-ප්‍රජාතන්ත්‍රවාදයේ සිය වැඩ සටහනට ඇතුළත් නොකරයි. ජර්මනියේ තත්වය කෙසේද යත් මෙම ප්‍රශ්නය ප්‍රායෝගිකව සමාජවාදී ප්‍රශ්නයෙන් වෙන් කළ නොහැකිය. (කෙසේ වෙතත්, ජර්මනිය සම්බන්ධයෙන්ද 1891 දී ඒර්ෆුර්ට් වැඩ සටහනේ[49] කෙටුම්පත පිළිබඳ විවේචනයෙහිදී සමූහාණ්ඩුවක හා සමූහාණ්ඩුවක් සඳහා වූ අරගලයේ වැදගත්කම අඩුවෙන් තක්සේරු කිරීමට විරුද්ධව එංගල්ස් අනතුර හැඟවීය!) තම වැඩ සටහනෙන් හා උද්ඝෝෂනයෙන් සමූහාණ්ඩුවක් පිළිබඳ ඉල්ලීම ඉවත් කිරීමේ ප්‍රශ්නය රුසියානු සමාජ-ප්‍රජාතන්ත්‍රවාදයට කිසි දිනක මතු වී නැත. මන්දයත් අප රටේ සමූහාණ්ඩුවක් පිළිබඳ ප්‍රශ්නයේ හා සමාජවාදය අතර වෙන්කළ නොහැකි සම්බන්ධයක් ගැන කථාවක් නැති හෙයිනි. 1898 දී ජර්මන් සමාජ-ප්‍රජාතන්ත්‍රවාදය විසින් සමූහාණ්ඩුවක් පිළිබඳ ප්‍රශ්නයට විශේෂ අවධාරණයක් නොදීම ඉතා ස්වභාවිකය. එය පුදුමයට හෝ හෙළා දැකීමට හෝ කරුණක් නොවේ. එහෙත් 1848 දී සමූහාණ්ඩුවක් පිළිබඳ ප්‍රශ්නය පසුවීමට තල්ලු කළ සමාජ-ප්‍රජාතන්ත්‍රිකයෙකු විප්ලවයේ අන්තද්‍රෝහියකු විය හැකිව තිබුණි. අමූර්ත සත්‍ය කියා දෙයක් නැත. සත්‍ය හැමවිටම මූර්තය.

රුසියානු ඒකාධිපත්‍යයට විරුද්ධ අරගලය අවසාන වන හා රුසියාවේ ප්‍රජාතන්ත්‍රික විප්ලව සමයේ ගෙවුන කාලයක් එළඹෙනු ඇත. එවිට නිර්ධන පංතියේ හා ගොවි ජනතාවගේ ''ඒකීය අභිමතයක්'' ගැන, ප්‍රජාතන්ත්‍රික ආඥාදායකත්වයක් ගැන කථා කිරීම පවා විහිළුවක් වනු ඇත. එම අවධිය එළඹුණු විට අපි කෙලින්ම නිර්ධන පංතියේ සමාජවාදී ආඥාදයකත්වය පිළිබඳ ප්‍රශ්නය වෙතට පිවිස ඒ ගැන වඩා සවිස්තරව කතා කළ යුතු වෙමු. එහෙත් වර්තමානයේදී, ඉදිරියට ගිය පංතියේ පක්ෂයට සාර්වාදය යටපත් කළ ප්‍රජාතන්ත්‍රික විප්ලවයේ තීරණාත්මක ජයග්‍රහණයක් සඳහා ඉතාමත් උද්‍යෝගයෙන් ක්‍රියා නො කොට සිටිය නොහැකිය. එමෙන්ම තීරණාත්මක ජයග්‍රහණය යනු ගොවීන්ගේ හා නිර්ධන පංතියේ විප්ලවකාරී ප්‍රජාතන්ත්‍රික ආඥාදයකත්වය විනා අනෙකක් නොවේ.

සටහන

1) ''ඉස්ක්‍රා'' හා ''ව්පිරියොද්'' පත්‍ර අතර කෙරුනු විවාදයේදී මුලින් සඳහන් කළ පත්‍රය ඉදිරිපත් කළ වෙනත් කරුණු අතර, ප්‍රජාතන්ත්‍රික විප්ලවය සමාජවාදී විප්ලවය සමග එකට පටලැවීම ගැන ඉතාලි ප්‍රතිසංස්කරණවාදීන්ගේ (ආනගත) නායකයාට අනතුරු හැඟවීමක් ලෙස එංගල්ස් විසින් ටුරාටි වෙත යවන ලද ලිපිය ගැන



මතක් කර දීමක්ද විය. 1894 දී ඉතාලියේ දේශපාලන තත්වය ගැන ලියූ එංගල්ස් ඉතාලියේ ලඟ එන විප්ලවය සමාජවාදී විප්ලවයක් නොව සුළුධනපන්තික ප්‍රජාතන්ත්‍රික විප්ලවයක් වනු ඇතැයි සඳහන් කළේය. එංගල්ස් විසින් පනවන ලද ප්‍රතිපත්තිවලින් ඈත්වීම ගැන ''ඉස්ක්‍රා'' පත්‍රය ''ව්පිරියොද්'' පත්‍රයට චෝදනා කළේය. එහෙත් මේ චෝදනාව යුක්ති සහගත නොවේ. මන්දයත් 19 වැනි ශතවර්ෂයේ විප්ලවවල ප්‍රධාන බලවේග තුන අතර වෙනස පිළිබඳ මාක්ස්ගේ න්‍යායයේ නිවැරදි බව ''ව්පිරියොද්'' පත්‍රය (14 කලාපය) විසින් සම්පූර්ණයෙන් පිළිගෙන ඇති බැවිනි*. මේ න්‍යාය අනුව පැරණි සමාජ ක්‍රමයට විරුද්ධව, ඒකාධිපත්‍යයට, වැඩවසම් ක්‍රමයට හා දස-හිමි ක්‍රමයට විරුද්ධව (1) ලිබරල්වාදී ලොකු ධනපති පංතිය; (2) රැඩිකල් සුළු ධනපති පංතිය හා (3) නිර්ධන පංතියද සටන් කරති. පළමුවැන්නා ආණ්ඩු ක්‍රමයක් සහිත රාජාණ්ඩුවකට වඩා වැඩි යමක් සඳහා සටන් නො කරයි. දෙවැන්නා ප්‍රජාතන්ත්‍රික සමූහාණ්ඩුවක් සඳහා සටන් කරන අතර තුන්වැන්නා සමාජවාදී විප්ලවයක් සඳහා සටන් කරයි. සම්පූර්ණ ප්‍රජාතන්ත්‍රික විප්ලවයක් සඳහා කරන සුළු ධනපති පංතික සටන සාමාජවාදි විප්ලවයක් සඳහා කරන නිර්ධන පංතික සටන සමඟ එකට පටලැවීමෙන් සාමාජවාදියෙකුට දේශපාලන බංකොලොත් භාවයට පත් වීමේ තර්ජනය එල්ලවේ. මේ සම්බන්ධයෙන් මාක්ස්ගේ අනතුරු ඇඟවීම සම්පූර්ණයෙන්ම යුක්ති යුක්ත වෙයි. එහෙත් ''විප්ලවකාරී කොමියුන'' පිළිබඳ සටන් පාඨය සාවද්‍ය වන්නේද මේ නිසාය. මන්ද යත් ඉතිහාසයේ සඳහන් වන කොමියුන විසින් කර ඇති වරද වන්නේද ප්‍රජාතන්ත්‍රික විප්ලවය සමාජවාදී විප්ලවය හා එකට පටලැවීමය. අනික් අතින් ගොවීන් ගේ හා නිර්ධන පංතියේ විප්ලවකාරී ප්‍රජාතන්ත්‍රික ආඥාදයකත්වක් පිළිබඳ අපේ සටන් පාඨය අප සම්පූර්ණයෙන්ම මෙම වරදෙන් ආරක්ෂා කරයි. හුදෙක් ප්‍රජාතන්ත්‍රික විප්ලවයක සීමාවන් කෙළින්ම පැනයාමට නො හැකි වන විප්ලවයේ නිසැක ධනපති පංතික ස්වභාවය පිළිගන්නා අතර ම අපේ සටන් පාඨය විසින් එම විප්ලවය ම ඉදිරියට තල්ලු කරමින් එය නිර්ධන පංතියට ඉතාමත් වාසිදයක වන ස්වරූප වලට සකස් කිරීමට උත්සාහ දරයි. ඒ අනුව සමාජවාදය සඳහා නිර්ධන

---

* ''සමාජ-ප්‍රජාතන්ත්‍රවාදය හා විප්ලවීය තාවකාලික ආණ්ඩුව'' 1905 (ලෙනින් එකතු කළ කෘති, 8 වෙළුම, 279—292 පිටු. — සංස්කාරක.)

පංතිය වැඩි දුරටත් ගෙන යන සටනේ වැඩීම සාර්ථකත්වය ලබනු පිණිස ප්‍රජාතන්ත්‍රික විප්ලවයෙන් හැකි තරම් ප්‍රයෝජන ගැනීමට එය උත්සාහ දරයි.

## 11. රු.ස.ප්‍ර.ක. පක්ෂයේ තුන්වන සම්මේලනයේ හා 'සාකච්ඡා සභාවේ' ඇතැම් යෝජනා පිළිබඳ කඩිනම් සැසඳීමක්

විප්ලවකාරී තාවකාලික ආණ්ඩුවක් පිළිබඳ ප්‍රශ්නය වාර්තමාන සමාජ–ප්‍රජාතන්ත්‍රික ව්‍යාපාරයේ කේන්ද්‍රීය උපක්‍රමික ප්‍රශ්නය වී ඇත. සාකච්ඡා සභාවේ වෙනත් යෝජනා ගැන එතරම් විශාල වශයෙන් සැලකිල්ලක් දක්වීමට ඉඩ නැතිවා මෙන් ම එහි අවශ්‍යතාවක් ද නොවේ. රු. ස. ප්‍ර. ක. පක්ෂයේ තුන්වැනි සම්මේලනයේ හා සාකච්ඡා සභාවේ යෝජනාවල උපක්‍රමීය නැඹුරුවීම අතර ඉහත දී විභාග කොට දක්වන ලද ප්‍රතිපත්ති පිළිබඳ වෙනස තහවුරු කරන කරුණු කිහිපයක් පමණක් කෙටියෙන් දක්වීමට අපි මෙහි දී සීමාවෙමු.

විප්ලවාසන්න ආණ්ඩුවේ උපක්‍රම සම්බන්ධයෙන් දක්වන ලද ආකල්පය පිළිබඳ ප්‍රශ්නය ගෙන බලමු. නැවතත් මෙම ප්‍රශ්නයට පූර්ණ පිළිතුරක් රු. ස. ප්‍ර. ක. පක්ෂයේ තුන්වැනි සම්මේලනයේ යෝජනා තුළ ඔබට හමුවනු ඇත. මෙම යෝජනාව මෙම විශේෂ අවස්ථාවේ සියලු විවිධාංශික තත්වයන් හා කටයුතු සැලකිල්ලට ගනී. එනම්, ආණ්ඩුවෙන් ප්‍රදනය කෙරෙන සහනවල පවත්නා කුහකකම හෙළි කිරීම, 'මහජන නියෝජිතත්වය පිළිබඳ රැවටිල්ල' ප්‍රයෝජනයට ගැනීම, කම්කරු පංතියේ හදිසි ඉල්ලීම් (ප්‍රධාන වශයෙන් පැය අටක වැඩ දිනයක් ඇතුළුව) විප්ලවකාරී මාර්ග වලින් දිනා ගැනීම හා අවසාන වශයෙන් කළු සියය කටයුතුවලට විරෝධය පෑම ආදියයි. සාකච්ඡා සභා යෝජනාවල මෙම ප්‍රශ්නය ඡෙද රාශියක් පුරා කඩින්කඩ විසිර ගොස් ඇත. 'ප්‍රතිගාමීත්වයේ අඳුරු බලවේග වලට විරුද්ධත්වය පෑම' සඳහන් කර ඇත්තේ, වෙනත් පක්ෂ කෙරෙහි දක්වන ආකල්පය පිළිබඳ යෝජනාවේ පූර්විකාවෙහි පමණි. නියෝජිත මණ්ඩලවල මැතිවරණ වලට සහභාගිවීම සලකා බලනුයේ ධනපති පංතිය හා සාර්වාදය අතර 'බේරුම්කාර සම්මුති' පිළිබඳ ප්‍රශ්නයෙන් වෙන්කොට බැහැරට ගෙනයි. විප්ලවීය මාර්ග වලින් පැය අටක වැඩ දිනයක් දිනා ගත්තා සේ හඬ නඟනු වෙනුවට 'ආර්ථික සටන පිළිබඳව' යන ගම්භීර සේ පෙනෙන සිරස්තලය යටතේ වූ විශේෂ යෝජනාවෙන්



කෙරෙන්නේ ('රුසියානු ජන ජීවිතයේදී කම්කරු ප්‍රශ්නයට හිමිවන කේන්ද්‍රීය ස්ථානය' පිළිබඳව කපටි පුරසාරම් ඇද බෑමෙන් පසු) 'පැය අටක වැඩ දිනයක් නීතියෙන් සම්මත කිරීම' සඳහා උද්ඝෝෂණ කිරීමේ පැරණි සටන් පාඨය යළි උච්චාරණය කිරීම පමණකි. දැනට මේ සටන් පාඨය ප්‍රමාණවත් නොවීම හා එහි යල්පැනපු ස්වභාවය පෙන්වීමට අමුතුවෙන් සාක්ෂ්‍ය උවමනා නැත.

විවෘත දේශපාලන සටන් පිළිබඳ ප්‍රශ්නය. තුන්වැනි සම්මේලනය අපේ ක්‍රියාකාරිත්වයේ අනාගත රැඩිකල් වෙනස්කම සැලකිල්ලට ගනී. රහස්‍ය කටයුතු හා රහස් සංවිධානයක් ඇති කිරීම කිසිසේත්ම අත්හැරිය යුතු නොවේ. එසේ කළහොත් පොලිසියේ අතට පහසුවෙන් හසුවන අතර ආණ්ඩුවට ද විශාල වාසියක් අත්වේ. එහෙත් ඒ අතර ම විවෘත ක්‍රියා ගැනද අප කල්පනා කළ යුතුය. උචිත එබඳු සටන් ස්වරූපත්, ඒ අනුව ඒ සඳහාම රහස්‍ය භාවයෙන් අඩු විශේෂ සංවිධානයකුත් වහා සූදනම් කළ යුතු වෙයි. රුසියාවේ අනාගත විවෘත සමාජ ප්‍රජාතන්ත්‍රික කම්කරු පක්ෂයේ කඳවුරු බවට පරිවර්තනය කිරීමේ අරමුණ ඇතිව නිත්‍යානුකූල හා අර්ධ නිත්‍යානුකූල සමිති ප්‍රයෝජනයට ගතයුතුය.

මෙහිදී ද ප්‍රශ්නය කොටස් වලට කඩන සාකච්ඡා සභාව කිසිම පූර්ණ සටන් පාඨයක් ඉදිරිපත් කිරීමට අසමත් වෙයි. නීත්‍යානුකූලව කටයුතු කරන ස්වකීය ප්‍රචාරකයින් 'තබාගැනීමට' වග බලා ගන්නා සේ සංවිධාන කමිටුවට දෙන හාස්‍යජනක උපදේශය එහි දී සෙසු දෙයින් වෙන් වූ තනි කරුණක් ලෙසින් ඉස්මතු වේ. ඊලඟට 'කම්කරු පංති ව්‍යාපාරයට ආධාර දීමේ අරමුණ තමන් වෙත පවරා ගන්නා ප්‍රජාතන්ත්‍රවාදී පුවත් පත් තම බලපෑමට නතු කර ගැනීමේ' සම්පූර්ණයෙන් විකාරයක් වූ තීරණය දෙස බලමු. මෙය අපේ නිත්‍යානුකූල ලිබරල්වාදී සියලු පුවත්පත් වල ප්‍රකාශිත ඉලක්කය වෙයි. ඒ සියල්ල ම වාගේ ''අස්වබඡ්ජේනිය'' නැඹුරුවීමට අයත්ය. ඉස්ක්‍රා පත්‍රයේ කතුවරුන්, තම උපදේශය තමන් විසින්ම ක්‍රියාවලට නැඟීම අරඹා ඒ මගින් ''අස්වබඡ්ජේනිය'' සමාජ–ප්‍රජාතන්ත්‍රික බලපෑම යටතට ගන්නා ආකාරය ගැන අපට ආදර්ශයක් නො දෙන්නේ ඇයි? පක්ෂය සඳහා කඳවුරු පිහිටුවීම පිණිස නීත්‍යානුකූලව පවතින සමිති ප්‍රයෝජනයට ගැනීම පිළිබඳ සටන් පාඨය වෙනුවට වෘත්තීය සංගම් පමණක් ප්‍රයෝජනයට ගතයුතු යයි (පක්ෂ සාමාජිකයන් ඒවායේ ක්‍රියාකාරී විය යුතුය) අපට විශේෂ උපදෙසක් පළමුවෙන් ම ලැබී ඇත. දෙවනුව 'කම්කරුවන්ගේ විප්ලවකාරී සංවිධාන' — 'නිල වශයෙන් පිහිටුවනු නො ලැබූ සංවිධාන' — 'විප්ලවකාරී කම්කරු

සමාජ'' මෙහෙයවන සේ තවත් උපදෙසක් ලැබී ඇත. මේ 'සමාජ' නිල වශයෙන් පිහිටුවනු නො ලැබූ සංවිධාන ලෙස වර්ගකරන ලද්දේ කෙසේද යන වගත් ඇත්ත වශයෙන් ම ''මේ සමාජ'' මොනවාද යන වගත් කිසිවෙකු නොදනී. පක්ෂයේ උත්තරීතර මණ්ඩලයක නිශ්චිත හා පැහැදිලි උපදෙස් වෙනුවට අපට ලැබී ඇත්තේ ලේඛකයන්ගේ කටු සටහන් හා එහෙන් මෙහෙන් උපුටාගත් අදහස් කැබලි රැසකි. පක්ෂය තම සියලු කටයුතු වලදී සම්පූර්ණයෙන්ම අලුත් පදනමකට පරිවර්තනය වීමේ ආරම්භය ගැන සම්පූර්ණ චිත්‍රයක් නො ලැබේ.

පක්ෂ සම්මේලනය හා සාකච්ඡා සභාව විසින් 'ගොවිජන ප්‍රශ්නය' ඉදිරිපත් කර ඇත්තේ සම්පූර්ණයෙන්ම එකිනෙකට වෙනස් ආකාර වලිනි. ''ගොවිජන ව්‍යාපාරය කෙරෙහි දක්වන ආකල්පය'' සම්බන්ධයෙන් පක්ෂ සම්මේලනය යෝජනාවක් සකස් කළ අතර සාකච්ඡා සභාව ''ගොවින් අතර කටයුතු'' පිළිබඳ යෝජනාවක් සකස් කළේය. එක් යෝජනාවකින් ප්‍රධානයෙන් වැදගත් කොට සලකන ලද්දේ සාර්වාදයට විරුද්ධ සටනේ පොදු ජාතික යහපත සැලසෙන පරිදි, පුලුල් විප්ලවකාරී ප්‍රජාතන්ත්‍රික ව්‍යාපාරය මෙහෙයවීමේ කාර්යභාරයයි. අනෙක් යෝජනාවෙන් සමාජයේ එක්තරා කොටසක් අතර හුදෙක් 'වැඩකිරීමට' ප්‍රශ්නය සීමා කෙරේ. එක් යෝජනාවකින් සියලු ප්‍රජාතන්ත්‍රික වෙනස්කම් ඇති කරනු පිණිස විප්ලවකාරී ගොවි ජන කමිටු වහා සංවිධානය කරනසේ ඉල්ලමින් අපේ උද්ඝෝෂණය සඳහා මධ්‍ය ව්‍යවහාරික සටන් පාඨයක් ඉදිරිපත් කෙරේ. අනෙත් යෝජනාවෙන් 'කමිටු සංවිධානය කිරීමේ ඉල්ලීමක්' ව්‍යවස්ථාදායක මණ්ඩලයකට ඉදිරිපත් කිරීමට බලාපොරොත්තු වේ. අප මේ ව්‍යවස්ථාදායක මණ්ඩලය එන තෙක් බලා සිටිය යුත්තේ ඇයි? එය නියම වශයෙන් ම ව්‍යවස්ථාදායක වනු ඇත් ද? මූලික වශයෙන් හා එක විටම විප්ලවකාරී ගොවිජන කමිටු පිහිටු වීමෙන් තොර ව එය ස්ථාවර වෙයිද? මේ සියලුම ප්‍රශ්න සාකච්ඡා සභාව විසින් අමතක කර දමා ඇත. එහි සියලුම තීරණ වලින් අප විසින් දකින ලද සාමාන්‍ය අදහස, එනම්, ධනපති පංතික විප්ලවයේ දී සම්පූර්ණ ප්‍රජාතන්ත්‍රික ව්‍යාපාරය මෙහෙය වීමේ හා එම ව්‍යාපාරය ස්වාධීන ව ගෙනයෑමේ අරමුණ තබා ගන්නේ නැතිව, අපේ විශේෂ වැඩ කටයුතු පමණක් අප විසින් ඉටු කළ යුතුය යන අදහස පිළිබිඹු වේ. දේශපාලන සටන ගෙනයෑම ලිබරල්වාදීන්ට පවරා සමාජ–ප්‍රජාතන්ත්‍රවාදීන් ආර්ථික සටන ගැන පමණක් උනන්දු විය යුතු වැරැදි අදහස 'ආර්ථිකවාදීන්' විසින් නිරන්තරයෙන් ඉස්මතු කරනු ලැබුවා සේම, නව



ඉස්ක්‍රාවාදීහු ද ඔවුන්ගේ සෑම තර්කනයකදීම ධනපති පංතික විප්ලවයේදී අප නිහඬව මුල්ලකට වී, විප්ලවය ගෙන යාමේ ක්‍රියාශීලි කටයුතු ධනපති පංතියට ම බාරදිය යුතුය යන අදහසටම වැටෙති.

අවසාන වශයෙන් වෙනත් පක්ෂ කෙරෙහි දක්වන ආකල්පය පිළිබඳ යෝජනාව ගැන ද සඳහන් කළ යුතුය. රු. ස. ප්‍ර. ක. පක්ෂයේ තුන්වැනි සම්මේලනයේ යෝජනාව විමුක්තිය සඳහා ගෙන යනු ලබන ධනපති පංතික ව්‍යාපාරයේ සියලු ම අප්‍රමාණ වත්කම් හා සීමාවීම් හෙළිදරව් කිරීම ගැන කතා කරයි. එබඳු සීමාවීම් පිළිබඳ හැකි සියලුම උදාහරණ සම්මේලනයෙන් සම්මේලනයට ගණන් ගැනීම හෝ නරක ධනපති පන්තිය හා හොඳ ධනපති පංතිය අතර මායිම් රේඛාවක් සටහන් කිරීම හෝ පිළිබඳ බොලඳ අදහස් අත් හරී. ස්තාරවේර් විසින් කරනු ලැබූ වරද නැවතත් කළ සාකච්ඡා සභාව එබඳු රේඛාවක් ගැන දැඩිව සොයා බලමින් සුප්‍රකට 'ලිට්මස් පත්‍රිකා' න්‍යාය සම්පාදනය කළේය. ස්තරවේර් එය ආරම්භ කළේ ධනපති පංතියට හැකි තරම් තද කොන්දේසි පැනවීමේ කදිම අදහස් ඇතිවය. එහෙත් පිළිගැනීමට හා ගිවිසුම් වලට සුදුසු ධනපති ප්‍රජාතන්ත්‍රිකයන් නුසුදුසු අය ගෙන් කල් තබාම වෙන් කිරීමට ගන්නා කුමන ප්‍රයත්නයක් වුවද සමාජයේ සිදුවීම් අනුව වහා ඉවත විසිවන්නා වූ 'සූත්‍රයකට' තුඩු දෙන බවත් එයින් නිර්ධන පංතිකයන්ගේ පංති හැඟීම් අවුල් කරනබවත් පමණක් ඔහුට අමතක විය. සටනේදීවූ නියම සමගියට දියයුතු අවධාරනය ප්‍රකාශ, පොරොන්දු හා සටන් පාඨ වලට දෙනු ලැබිනි. ''සර්වජන හා සමාන ඡන්දය, මහජනයා විසින් කෙළින්ම මන්ත්‍රීවරුන් තෝරා ගැනීම හා රහස් ඡන්දය'' එබඳු රැඩිකල් සටන් පාඨයකැයි ස්තරවේර් කල්පනා කළේය. එහෙත් අවුරුදු දෙකක් ගත වන්නටත් පෙර 'ලිට්මස් පත්‍රිකාවේ' නිෂ්ඵල භාවය ප්‍රත්‍යක්ෂ විය. සර්වජන ඡන්දය පිළිබඳ සටන් පාඨය අස්වබෂ්ජේනිය කණ්ඩායම විසින් ගන්නා ලදී. මෙහි ඵලයක් වශයෙන් ඔවුන් සමාජ ප්‍රජාතන්ත්‍රවාදයට ළං නො වූවා පමණක් නොව ඊට පටහැනිව ගිය එම සටන්පාඨය ම උපයෝගී කර ගෙන කම්කරුවන් නොමග යවා සමාජවාදයෙන් ඈත් කිරීමට ද උත්සාහ කළහ.

දැන් නව ඉස්ක්‍රාවාදීහු 'වඩාත්' තද 'කොන්දේසි' ඉදිරිපත් කරති. ''ජනතාව ස්වයං සන්නද්ධ කිරීමට ක්‍රියාශීලීව සහභාගිවීම'' ඇතුලුව ''නිර්ධන පංතියේ අධිෂ්ඨාන ගත සෑම සටනකට ම උද්‍යෝගයෙන් හා ස්ථිර ව සහයෝගය දෙන'' සේ ඔව්හු සාර්වාදයේ සතුරන්ට 'බලකර' සිටිති. අර රේඛාවට තවත් බොහෝ දුරට සළකුනු කර තිබේ. එසේ වුවද මෙම රේඛාව නැවතත් වරක් දැනටමත් යල්

පැනගිය එකකි. එහි නො වැදගත්කම එක් වරම ප්‍රකාශ වී ඇත. නිදසුණක් ලෙස සමූහාණ්ඩුවක් පිළිබඳ සටන් පාඨයක් නැත්තේ මන්ද? සමාජ-ප්‍රජාතන්ත්‍රවාදීන් ''ඉඩම්හිමි සමාජ පංතීන්ගේ හා රාජාණ්ඩු ක්‍රමයේ සකල පදනම්වලට විරුද්ධ ව ගෙන යන නිර්දය විප්ලවකාරී යුද්ධයේ'' යහපත පිණිස සමූහාණ්ඩුවක් සඳහා සටන් කිරීම හැර වෙන ඕනෑම දෙයක් ධනපති ප්‍රජාතන්ත්‍රිකයන්ගෙන් 'ඉල්ලා සිටින්නේ' කෙසේද?

මෙම ප්‍රශ්නය හුදෙක් වැරදි පෙන්වීමක් නොවන බවත් නව ඉස්ක්‍රාවාදීන්ගේ වරද දේශපාලන වශයෙන් ඉතාමත් කැපී පෙනෙන්නක් බවත් ''රුසියානු විමුක්ති සංගමය'' (''ප්‍රොලිතාරී'' 4 කලාපය බලන්න)* විසින් පෙන්වා දී තිබේ. 'සාර්වාදයේ සතුරන්' නව ඉස්ක්‍රාවාදීන් සියලුම 'අවශ්‍ය කම්' සම්පූර්ණයෙන්ම සපුරා ලනු ඇත. එසේ නමුත්, මෙම ''රුසියානු විමුක්ති සංගමයේ'' (වැඩ සටහනක් නොමැතිකම තුළ හෝ) වැඩ සටහන තුළ අස්වබෂ්පේනිය ජීවය ඉස්මතු ව ඇති බවත් අස්වබෂ්පේනිය කණ්ඩායමට එය පහසුවෙන් එක් කර ගත හැකි බවත් අපි විසින් පෙන්වා දී ඇත්තෙමු. එහෙත් ''ලිබරල්වාදී හා ප්‍රජාතන්ත්‍රික ධජයක් ප්‍රදර්ශනය කරන නමුත් නිර්ධන පංතියේ විප්ලවීය සටනට අවංක සහයෝගයක් දීම ප්‍රතික්ෂේප කරන සියලුම දේශපාලන පක්ෂවලට ජනතාවගේ කුහක මිතුරන් සේ සලකා සමාජ–ප්‍රජාතන්ත්‍රවාදය තවදුරටත් විරුද්ධ වන බව සාකච්ඡා සභාව, තම යෝජනාවේ අවසාන කොටසෙන් පළ කරයි. ''රුසියානු විමුක්කි සංගමය'' මෙම සහයෝගය ප්‍රතික්ෂේප නොකරනු පමණක් නොව එය උනන්දුවෙන් පිළිගැන්වීම ද කරයි. මෙම සංගමයේ නායකයන් විමුක්තිදයකයන් වුවද ඔවුන් 'ජනතාවගේ කුහක මිතුරන්' නොවන බවට එය සහතිකයක් වෙයිද?

* 1905 ජූනි 4 පළවූ ''ප්‍රොලිතාරී'' අංක 4 හි ''නව විප්ලවීය කම්කරු සංගමයක්'' 1905 (ලෙනින් එකතු කළ කෘති 8 වෙළුම 499—510 පිටු.) යන හිසින් දීර්ඝ ලිපියක් පළවිය. ''රුසියානු විමුක්ති සංගමය'' යන නම යොදගත් හා ජනතා නැගිටීමක මාර්ගයෙන් ව්‍යවස්ථාදයක මණ්ඩලයක් පිහිටුවීම අරමුණු කොටගත් සංගමයේ ආයාචනයෙහි අඩංගු කරුණු එම ලිපියෙහි සඳහන් විණි. තවද, එබඳු පාක්ෂික නොවන සංගම් කෙරෙහි සමාජ-ප්‍රජාතන්ත්‍රවාදීන්ගේ ආකල්පය ලිපියෙහි හඳුන්වා තිබුණි. මෙම සංගම් කොතරම් දුරට ඇත්තෙන්ම පැවතියද හා විප්ලවයේදී එහි ඉරණම කුමක්විද යනු අපට කිසිසේත්ම වැටහීමක් නැත. (1907 සංස්කරණයට කර්තෘගේ සටහන. — සංස්කාරක)



බලන්න: කල්තබා ම කොන්දේසි ඇති කිරීමෙන් හා දැඩි අකර්මන්‍ය බව නිසාම හාස්‍ය ජනක වූ ''ඉල්ලීම්'' ඉදිරිපත් කිරීමෙන් ද, නව ඉස්ක්‍රාවාදීන් විසින් තමන්ම සිනහ උපදවන තත්වයකට පත් කර ගෙන ඇත. ජීවමාන යථාර්ථයන් අනුව මැන බලන විට ඔවුන්ගේ කොන්දේසි හා ඉල්ලීම් ප්‍රමාණවත් නොවන බව එක් වර ම ඔප්පු වේ. ඔවුන් සූත්‍ර පසුපස ලුහුබැඳ යැම නිෂ්ඵලය. මන්ද යත්, ධනපති ප්‍රජාතන්ත්‍රිකයන්ගේ කුහකකම්, චපලකම් හා පටුමානසිකත්වය පිළිබඳ සියලු විවිධ ප්‍රකටවීම් සැලකිල්ලකට ගැනීමට කිසිම සූත්‍රයකට නොහැකි වන හෙයිනි. එය නොයෙකුත් ක්‍රම, 'ලිට්මස් පත්‍රිකා' හො ලිඛිත හා මුද්‍රණ ඉල්ලීම් පිළිබඳ කරුණක් වත්, කල්තබා කුහක හා අවංක 'ජනතා මිත්‍රයන්' බෙදා වෙන් කරන රේඛාවක් සලකුණු කිරීම පිළිබඳව කරුණක් වත් නොවේ. එය සටනේ දී නියම සමගියත්, ධනපති ප්‍රජාතන්ත්‍රිකයන් ගන්නා සෑම 'අස්ථිර' පියවරක්ම සමාජ–ප්‍රජාතන්ත්‍රිකයන් විසින් නො නවතා විවේචනය කරනු ලැබීමත් පිළිබඳ කාරණයකි. 'ප්‍රජාතන්ත්‍රික වෙනස්කම් සම්බන්ධයෙන් උනන්දුවන සියලු සමාජ බලවේග අව්‍යාජ ලෙසින් තහවුරු කිරීම' සඳහා අවශ්‍ය වී ඇත්තේ සාකච්ඡා සභාව එතරම් මහන්සියෙන් හා නිෂ්ඵල අයුරින් වෙහෙසවුණු 'කරුණු' නොව නියම විප්ලවකාරී සටන් පාඨ ඉදිරියට දැමීමේ හැකියාවයි. මන්ද යත්, නිර්ධන පංතියේ අරමුණු රාජාණ්ඩුවාදී ධනපති පංතියේ අරමුණුවල මට්ටමට පහත දමන සටන් පාඨ නොව විප්ලවකාරී හා සමූහාණ්ඩුවාදී ධනපති පංතිය නිර්ධන පංතියේ මට්ටමකට ඔසවා තබන සටන් පාඨය අවශ්‍ය වන හෙයිනි. ඒ සඳහා අවශ්‍යවන්නේ සන්නද්ධ නැගිටීමක් සංවිධානය කිරීමේ හදිසි කටයුත්තෙන් පූරසාරම් දෙඩමින් පැනයාම නොව ඊට ඉතා උද්‍යෝගීව සහභාගිවීමය.

## 12. ධනපති පංතිය ආපසු හැරී ගියොත් ප්‍රජාතන්ත්‍රික විප්ලවයේ ගමන් වේගය හීනවේද?

නව ඉස්ක්‍රාවාදීන්ගේ කොකේසියානු සාකච්ඡා සභාව විසින් අනුමත කරන ලදුව, ''ඉස්ක්‍රා'' පත්‍රයේ පළවූ යෝජනා අප වෙතට ලැබෙන විටත් මතු සඳහන් වාක්‍යය කිහිපය ලියා අවසන් වී තිබුණි. Pour la bonne bouche (හොඳ අවසානයක් සඳහා) උත්සාහයක් දැරුවද මීට වඩා හොඳ කිසිවක් අපට නිපදවීමට පුළුවන්කමක් නො තිබුණි.

''ඉස්ක්‍රා'' පත්‍රයේ කතුවරු ඉතා යුක්ති සහගතව මෙසේ සඳහන් කරති: උපක්‍රම පිළිබඳ මූලික ප්‍රශ්න සම්බන්ධයෙන් කොකේසියානු සාකච්ඡා සභාව සමස්ත රුසියන් සාකච්ඡා සභාවේ (එනම් නව ඉස්ක්‍රා කණ්ඩායමේ) තීරණයට සමාන වූ (ඇත්තෙන්ම!) තීරණයකට එළඹියා ය. ''විප්ලවකාරී තාවකාලික ආණ්ඩුවක් කෙරෙහි සමාජ-ප්‍රජාතන්ත්‍රවාදයේ ආකල්පය පිළිබඳ ප්‍රශ්නය කොකේසියානු සහෝදරයින් විසින් විපිරියොද් කාණ්ඩායම හා ඔහුන්ට එක් වූ ඊනියා සම්මේලනය නියෝජිතයින් අනුගමනය කරන අලුත් ක්‍රමයට දැඩි විරුද්ධත්වය දක්වෙන අන්දමින් විසඳන ලදී''. ''ධනපති පංතික විප්ලවයක දී නිර්ධන පංති පක්ෂයේ උපක්‍රම සකච්ඡා සභාව විසින් සකස් කර ඇති ආකාරය ඉතා උචිත බව පිළිගත යුතු ය.''

ඇත්ත ඇත්තක්ම ය. නව ඉස්ක්‍රා කණ්ඩායමේ මූලික වරද සම්බන්ධයෙන් වඩාත් 'උචිත' යෙදුමක් වෙන කිසිවෙකුටත් සකස් කළ නොහැකි වනු ඇත. පළමුවෙන් මල්ද අවසානයේ එල ද අනාවරණය කෙරෙන වැකි ගෙන හැර පාමින් අපි එම යෙදුම සම්පූර්ණයෙන් දක්වමු.

තාවකාලික ආණ්ඩුවක් පිළිබඳව නව ඉස්ක්‍රා අනුගාමිකයන්ගේ කොකේසියානු සාකච්ඡා සභාවේ යෝජනාව මෙසේය:

''නිර්ධන පංතියේ සමාජ-ප්‍රජාතන්ත්‍රික විඥනය'' (විඥනය වඩා ගැඹුරු කරනු පිණිස මිස සමූහාණ්ඩුවක් දිනා ගැනීම පිණිස නොවේ ද? විප්ලවය පිළිබඳව කොතරම් 'ගැඹුරු' සංකල්පයක්ද!) ''වඩාත් ගැඹුරු කරනු''(සත්තකින්ම! මර්තිනව් ශෛලියට යයි ඔවුන්ට එකතුකරන්නට තිබින!) ''සඳහාත්, නැගී එන ධනපති පංති රාජ්‍ය ක්‍රමය විවේචනය කරනු පිණිස පක්ෂයට සම්පූර්ණ නිදහස ලබා ගනු සඳහාත්'' (සමූහාණ්ඩුවක් ලබාගැන්ම අප සතු කාර්යයක් නොවේ! අපේ කාර්යය වනුයේ විවේචනය කිරීමේ නිදහස දිනාගැනීම පමණි. ආරාජිකවාදී අදහස්වලින් ආරාජිකවාදී භාෂාව බිහිවෙයි: 'ධනපති පංති රාජ්‍යක්‍රමය'!) ''විප්ලවකාරී තත්වයෙන් ප්‍රයෝජන ගැනීම අප සතු කටයුත්ත සේ අප විසින් සළකනු ලබන හෙයින්, සමාජ-ප්‍රජාතන්ත්‍රික තාවකාලික ආණ්ඩුවක් පිහිටුවීමට හා එබඳු ආණ්ඩුවකට හවුල් වීමට සාකච්ඡා සභාව විරුද්ධත්වය පළ කරන'' (ස්පාඤ්ඤ විප්ලවයට දස මසකට පෙර බකුනින්වාදීන්[50] විසින් සම්මත කරගනු ලැබූ හා එංගල්ස් විසින් සඳහන් කරනු ලැබූ යෝජනාව ගැන මෙනෙහි කරන්න. ''ප්‍රොලිතාරි'' අංක 3 බලන්න[51]) ''අතර රාජ්‍ය ක්‍රමයේ ක්‍රියාත්මක කළ හැකි පරිමාණයේ(!?) ප්‍රජාතන්ත්‍රකරණයක් සහතික කරනු පිණිස ධනපති තාවකාලික ආණ්ඩුවට බැහැරින් බලපෑම ඇති කිරීම'' (ඉහළින්



නොව පහළින්) ''ඉතාම උචිත ක්‍රියා මාර්ගය බව සාකච්ඡා සභාව කල්පනා කරයි. සමාජ–ප්‍රජාතන්ත්‍රිකයන් විසින් තාවකාලික ආණ්ඩුවක් පිහිටුවනු ලැබීම හෝ එබඳු ආණ්ඩුවකට ඔවුන් සහභාගී වීම හෝ එක් අතකින්, මහජනයා සමාජ–ප්‍රජාතන්ත්‍රවාදී පක්ෂය කෙරෙහි කලකිරී එය අතහැර යාමට තුඩුදෙන බව සාකච්ඡා සභාව කල්පනා කරයි. මන්ද යත්, සමාජ-ප්‍රජාතනත්‍රවාදීන් බලය අල්ලා ගත්ත ද සමාජවාදය පිහිටුවීම ඇතුළු කම්කරු පංතියේ දැවෙන අවශ්‍යතා'' (සමූහාණ්ඩුවක් දැවෙන අවශ්‍යතාවයක් නොවේ! ධනේශ්වර විප්ලවවලට සහභාගි වීම ඔවුන් ප්‍රතික්ෂේප කරන්නාක් සේ කර්තෘහු ඔවුන්ගේ නො දැනුවත්කම නිසා තමන් අරාජිකවාදී භාෂාව කතා කරන බව නොහඳුනති!) ''සපුරාලීමට අසමත් වන බැවිනි. අනික් අතින් එසේ ආණ්ඩුවකට හවුල් වීමෙන් ධනපති පංති විප්ලවයෙන් ආපසු හැරී ගොස් එහි වේගය හීන වීමට හේතුවනු අත.''

ප්‍රශ්නයේ ගැටළුව එ තැනයි. අරාජිකවාදී අදහස් නග්න අවස්ථාවාදය සමග එකට වෙළී (බටහිර යුරෝපිය, බර්න්ෂ්ටයින්වාදීන් අතර ද නිතර ම සිදුවන පරිදි) ඇත්තේ එ තැනයි. හිතන්න: මේ මිනිසුන් තාවකාලික ආණ්ඩුවකට හවුල් නොවන්නේ එයින් ධනපති පංතිය විප්ලවයේ වේගය හීන කරමින් ආපසු හැරී යන හෙයිනි! සමස්තයක් ලෙස පිරිසිදුව හා ස්ථිරසාරව නව ඉස්ක්‍රා දර්ශණය ඇතතෙන්ම මෙසේය: විප්ලවය ධනපති පංති විප්ලවයක් හෙයින් අප ධනපති පිංගුත්තරවාදයට හිස නමා ඊට ඉඩදිය යුතුය. අපේ හවුල්වීමෙන් ධනපති පංතිය ආපසු හැරී යාමට සිදු වෙතැයි යන හැඟීමෙන් යුතුව මඳ වශයෙන් හෝ මොහොතකටවත් කටයුතු කරන්නේ නම් ඉන් අප කරන්නේ නිකම්ම විප්ලවයේ නායකත්වය සහමුලින්ම ධනපති පංතීන්ට පාවාදීමය. එනයින් අප කරන්නේ ධනපති පංතියට ආපසු හැරී යාමට සිදු නොවන අයුරින් යටහත් පහත්ව සිටීමට නිර්ධන පංතියට බල කරමින් ('විවේචන කිරීමේ නිදහස සම්පූර්ණයෙන් භුක්ති විඳින අතර'!!) ඔවුන් ධනපති පංතියේ සරණ යටතට පත්කිරීමය. ධනපති පංතියට ආපසු හැරී යාමට සිදු නො වන අයුරින් කිසි දිනෙකත් ආර්ථිකවාදීන් හා ඔවුන්ගේ අනුගාමීන් විසින් හරියාකාර අවබෝධ කර ගනු නො ලැබූ නිර්ධන පංතියේ ඉතාමත්ම පරම අවශ්‍යතා, එනම් එහි දේශපාලන අවශ්‍යතා කර ඇරීමයි. නිර්ධන පංතියට උවමනා කරන තරම් ප්‍රජාතන්ත්‍රවාදය දිනා ගැනීමේ විප්ලවකාරී සටනේ වේදිකාවේ සිට අපි ධනපති පංතිය සමග කේවල් කිරීමේ, ධනපති පංතියේ ස්වේච්ඡක කැමැත්ත අපේ ප්‍රතිපත්තිවලින් ගෙවා, විප්ලවය පාවාදී මිළට ගැනීමේ ('එය ආපසු හැරී නොයනු පිණිස')

වේදිකාවකට සහමුලින්ම මාරුවෙමු. විප්ලවය පාවාදී නිර්ධන පංතිය ධනපති පංතීන්ගේ කණගාටුදායක උපාංගයක් බවට පත් කිරීමේ උපක්‍රමයේ හරය කෙටි වාසගම් දෙකකින් ප්‍රකාශ කිරීමට කොකේසියානු නව ඉස්ක්‍රාවාදීන් සමත් වී ඇත. නව ඉස්ක්‍රා නැඹුරුවීමේ වැරදිවලින් අප විසින් ඉහත නිගමණය කරන ලද දේ දැන් පැහැදිලි හා නිශ්චිත ප්‍රතිපත්තියක් ලෙසින්, එනම් රාජාණ්ඩුවාදී ධනපති පංතිය පසුපස එල්ලී යාමේ ප්‍රතිපත්තිය ලෙසින් නංවා තිබෙනු අපි දැන් දකිමු. සමූහාණ්ඩුවක් පිහිටුවීමෙන් ධනපති පංතිය ආපසු හැරී යාමට ඉඩ ඇති හෙයින් (දැනුදු එය සිදුවේ.නිදසුනක් ලෙස ස්ත්‍රැවේ මහතා පෙන්වා දිය හැකිය) සමූහාණ්ඩුවක් සඳහා වූ සටන හංගවේවා. ලෝකයේ සෑම තැනක ම සෑමවිට ම නිර්ධන පංතියේ සියලු උද්යෝගිමත් ස්ථිරසාර ප්‍රජාතන්ත්‍රික ඉල්ලීම් හේතු කොට ගෙන ධනපති පංතියට ආපසු හැරීමට සිදුවන හෙයින් වැඩකරන ජනයිනි, මුලුගැන්නෙව්. පිටතින් සිට ගෙන පමණක් ක්‍රියා කරව් ''ධනපති රාජ්‍ය' ක්‍රමයේ උපකරණ හා ආයුධ විප්ලවයේ ඉදිරි ගමන සඳහා යොදු ගැනීමට නො සිතව්. 'විවේචනය කිරීමේ නිදහස' තමන් සතුව තබා ගනිව්!

'ධනපති පංති විප්ලවය' යන පදය පිළිබඳ ඔවුන් දරන සංකල්පයේම මූලික වරද මෙහි දී මතුපිටට විත් ඇත. මේ පදය පිළිබඳව මර්තිනව්ගේ හෝ නව ඉස්ක්‍රා සංකල්පය කෙලින්ම නිර්ධන පංතියේ ව්‍යාපාරය ධනපති පංතියට පාවාදීමට තුඩුදෙයි.

පැරණි ආර්ථිකවාදය අමතක වූ අයට, එය අධ්‍යයනය හෝ සිහිපත් නොකරන අයට, ආර්ථිකවාදයේ වර්තමාන පුනර්භවය තේරුම් ගැනීම අමාරු වනු ඇත. බර්න්ෂ්ටයින්වාදී "Credo"[52] ප්‍රකාශනය සිහිපත් කරන්න. 'තනිකරම නිර්ධන පංතික' අදහස් හා වැඩ සටහන් අනුව ඔව්හු පහත සටහන් නිගමනයට පිවිසියහ: සමාජ–ප්‍රජාතන්ත්‍රිකයන් වන අපි ආර්ථික විද්‍යාව ගැන, නියම කම්කරු පංති ව්‍යාපාරය ගැන, සියලුම දේශපාලන කපටකම් විවේචනය කිරීමේ නිදහස ගැන, සමාජ–ප්‍රජාතන්ත්‍රික කටයුතු නියම වශයෙන් වඩා ගැඹුරු කිරීම ගැන උනන්දු විය යුත්තෙමු. දේශපාලනය ලිබරල්වාදීන් සඳහාය. 'විප්ලවවාදයට' ඇද වැටීමෙන් දෙවියන් වහන්සේ අප බේරාගත්වා: ඉන් ධනපති පංතිය ආපසු හැරී යාමට ඉඩ තිබේ. "Credo" ප්‍රකාශනය යලිත් සම්පූර්ණයෙන් කියවන්නෙකුට හෝ ''රබෝචය මීසල්''[53] (1899 සැප්තැම්බර්) පත්‍රයේ අංක විශේෂ අතිරේකය කියවන්නකුට හෝ මෙම මූළු තර්කනයම දැක ගත හැකිය.



අහෝ සම්මත පිංගුත්තරවාදයේ න්‍යායාචාර්යවරුන් විසින් ග්‍රාම්‍ය කොට කල් තබාම විහිළුවක් කරන ලද එම දෙයම — සම්පූර්ණ රුසියානු 'මහා' විප්ලවයේ තක්සේරුවක් සේ යොදු ගෙන අද අප හමුවේ තිබේ! සමාජ–ප්‍රජාතන්ත්‍රිකයන් වන අපි විවේචනය කිරීමේ නිදහසත් පංති හැඟීම වඩා ගැඹුරු කිරීමත්, බැහැරින් සිට ක්‍රියා කිරීමත් ගැන වෙහෙසිය යුත්තෙමු. ඔවුන්ට ධනපති පංතියට ක්‍රියා කිරීමේ නිදහසත්, විප්ලවීය (ලිබරල් යනුවෙන් කියවන්න) නායකත්වය සඳහා නිදහස් ක්ෂේත්‍රයකුත්, ඉහළින් 'ප්‍රතිසංස්කරණ' ඇති කිරීමේ නිදහසත් තිබිය යුතුය.

විවේචනයේ ආයුධය වෙනුවට ආයුධ විවේචනය යොදු ගැනීමේ අවශ්‍යත්වය ගැන මාක්ස් කී දේ මාක්ස්වාදය මෙසේ විකෘත කලවුන් කිසි විටෙකත් විමසා බලා නැත.[54] මාක්ස්ගේ නම නිෂ්ඵල ලෙස ඇදගන්නා ඔවුහු ඇත්ත වශයෙන් ම ප්‍රැන්ක්පර්ට් ධනපති පංතික පුහුසෝෂාකාරයන්ගේ ජීවය අනුව උපක්‍රම පිළිබඳ යෝජනා කෙටුම්පත් කරති. මේ ප්‍රැන්ක්පර්ට් පුහුසෝෂාකාරයෝ ඒකාන්තවාදය නිදහසේ විවේචනය කොට ප්‍රජාතන්ත්‍රික විඥනය වඩාත් ගැඹුරු කළ නමුදු විප්ලව සමය ක්‍රියාවන්ගේ සමයක් බවත් ඉහළින් හා පහළින් කරන ක්‍රියාවන්ගේ සමයක් බවත් අවබෝධ කර ගැනුමට අසමත් වූහ. මාක්ස්වාදය පුහුසෝෂාවක් බවට පත්කළ ඔවුහු පෙරමුණේ සිටින ඉතාමත් අධිෂ්ඨාන සම්පන්න හා උද්‍යෝගිමත් විප්ලවකාරී පංතියේ දෘෂ්ටිය දුෂ්කර ප්‍රජාතන්ත්‍රික කාර්ය භාරයන් හමුවේ පසුබා ඒවා සම්පූර්ණ කිරීම ස්ත්‍රැවේ මහතාගේ පිරිසට පවරන ඉතාමත් නො දියුණු කොටසේ දෘෂ්ටිය බවට පත් කළහ.

සමාජ-ප්‍රජාතන්ත්‍රිකයන් විප්ලවකාරී ආණ්ඩුවකට හවුල් වීම නිසා ධනපති පංතිය විප්ලවයෙන් ආපසු හැරී ගියොත් ඒනිසා ඔවුන් විසින් විප්ලවයේ 'වේගය අඩු කරනු' ඇත.

රුසියන් කම්කරුවෙනි එයට සවන් දෙනු මැනවි: සමාජ–ප්‍රජාතන්ත්‍රිකයන් විසින් බියවද්දනු නො ලැබූ එමෙන්ම සාර්වාදය පරාජය කොට ලබන ජයග්‍රහණය නොව සාර්වාදය හා එකඟත්වයකට පැමිණීම බලාපොරොත්තු වන ස්ත්‍රැවේ අනුගාමිකයන් විසින් විප්ලවය කරනු ලබන්නේ නම් එහි වේගය වඩා දැවැන්ත වනු ඇත. ඉහත දී අප විසින් දක්වන ලද ප්‍රතිඵල දෙකකින් පළමුවැන්න සිදුවේ නම්, එනම් ෂිපොව් පන්නයේ ආණ්ඩුක්‍රමයක් සම්බන්ධයෙන් රාජාණ්ඩුවාදී ධනපති පංතිය ඒකාධිපත්‍යය සමඟ එකඟත්වයකට පැමිණේ නම් විප්ලවයේ වේගය වඩා දැවැන්ත වනු ඇත! මුළු පක්ෂයට මග පෙන්වීම අදහස් කරගෙන යෝජනා තුළ මේ බඳු නින්දජනක

දේ සඳහන් කරන නැතහොත් මෙබඳු 'උචිත' යෝජනා අනුමත කරන සමාජ–ප්‍රජාතන්ත්‍රවාදීන්, මාක්ස්වාදයේ ජීවය සම්පූර්ණයෙන් වනසා දැමූ පුහුසෝෂා වලින් කොතරම් අන්ධ වී තිබේ ද යත්, මෙම යෝජනා නිසා ඔවුන්ගේ වෙනත් ලක්සන වචන හුදෙක් පුරසාරම් බවට පෙරළෙන බව ඔවුන්ට නො පෙනේ. ''ඉස්ක්‍රා'' පත්‍රයේ පළ වූ ඔවුන්ගේ ඕනෑම ලිපියක් හෝ නැතහොත් අප විසින් නිතර සඳහන් කරනු ලැබූ මර්තිනව් අතින් ලියැවුණු අර සුප්‍රකට පත්‍රිකාව හෝ කියවා බලන්න. මහජන නැගිටීමක් ගැන, විප්ලවය අවසානය දක්වා ගෙන ගාම ගැන, චපල ධනපති පංතියට විරුද්ධ සටනේදී පොදු ජනයා කෙරෙහි විශ්වාසය තැබීමට උත්සාහ කිරීම ගැන එහි සඳහන් වී ඇති වීම් ඔබට පෙනෙනු ඇත. එහෙත් ධනපති පංතිය වෙන්වීම නිසා විප්ලවයේ වේගය අඩුවනු' ඇතැයි යන අදහස ඔබ විසින් පිළිගනු ලැබූ හෝ අනුමත කරනු ලැබූ වහාම මේ සියලුම විශිෂ්ට දේ පදනමක් නැති පුරසාරම් බවට පත්වේ. මහත්වරුනි, විකල්ප තිබේ. එක්කෝ, අප චපල අත්මාර්ථකාමී බියසුලු ධනපති පංතිය පසෙක දමා ජනතාවත් සමග එක්වී විප්ලවය ඉදිරියට ගෙන ගොස් සාර්වාදය පරාජය කොට සම්පූර්ණ ජයග්‍රහණයක් ලබා ගත යුතුය. නැතහොත්, ඔවුන් 'පසෙක දැමීම' පිළි නො ගෙන ධනපති පංතිය විප්ලවයෙන් ''ආපසු හැරී යාම' ගැන බියෙන් කටයුතු කළ යුතුය. ඒ තැන දී අප කරන්නේ ධනපති පංතියට ඒ චපල ආත්මාර්ථකාමී බියසුලු ධනපති පංතියට නිර්ධන පංතිය පවාදීමයි.

මා කී දේ වැරදි ලෙස විග්‍රහ කිරීමට සිතට නො ගන්න. චූවමනාවෙන් ම ද්‍රෝහි වීමක් ගැන ඔබට චෝදනා කරන්නේ යැයි ගතු නො කියන්න. නැත. සැම විටම, මඩ ගොහොරාව දෙසට බඩගාන ඔබ අවසානයේදී ඒ මඩ ගොහොරුවට ම බඩගා තිබේ. විප්ලව විරෝධී, ආත්මයක් නැති, අප්‍රාණික, බුද්ධිමය විලාසයකට පත්වන තෙක් 'ගැඹුරු' මාක්ස්වාදයේ බැවුමේ පල්ලමට නතර කළ නොහැකි හා ආපසු යා නොහැකි පරිදි පැරණි ආර්ථිකවාදීන් මෙන් ඔබද නොදැනුවත්වම වැටේ.

මහත්වරුනි, ඔබ කිසිවිටෙකත් 'විප්ලවයේ වේගය' තීරණය කරන නියම සමාජ බලවේග මොනවා දැයි සොයා බැලුවේ ද? වර්තමානයේ දී අපට ඉතා හිතකර ලෙස වර්ධනයව ඇති විදේශීය දේශපාලන බලවේග, ජාත්‍යන්තර එකතුවීම් මෙහි දී පැත්තකට දමමු. මෙහි දී අප සාකච්ඡා කරන්නේ රුසියාවේ අභ්‍යන්තර බලවේග ගැන නිසා අපේ සාකච්ඡාවෙන් ඒවා ඇත් කිරීම සාධාරණය. මෙම අභ්‍යන්තර සමාජ බලවේග පරීක්ෂා කර බලමු. ඒකාධිපත්‍යය, අධිරාජ්‍ය



උසාවිය, පොලීසිය, නිලබලවාදය, හමුදව, හා උසස් වංශවතුන් අතළොස්සකුත් විප්ලවයට විරුද්ධව පෙළ ගැසී සිටිති. ජනතාවගේ කෝපය වැඩි වන තරමටම, හමුද ගැන තැබිය හැකි විශ්වාසය ද අඩුවෙයි. එපමණටම නිලබලවාදයද වැනෙනසුලු වෙයි. තවද ධනපති පංතිය සමස්තයක් වශයෙන් දැන් විප්ලවයට පක්ෂපාතී වෙමින් නිතර නිතර ජනතාවගේ නාමයෙන් පමණක් නොව විප්ලවයේ නාමයෙන් ද විමුක්තිය ගැන උනන්දුවෙන් කථා කරයි*. එහෙත් න්‍යායිකව ද අපේ ලිබරල් වාදීන්, සෙමස්ත්වො වාදීන් හා අස්වබෂ්ජේනිය වාදීන් දිනපතා හා පැයක් පැයක් පාසා නිරීක්ෂණය කිරීමෙන්ද විප්ලවයට ආධාර දීමේ දී ධනපති පංතිය චපල, ආත්මාර්ථකාමී හා බියසුලු අන්දමින් ක්‍රියා කරන බව මාක්ස්වාදීන් වන අපි හැමදෙන දනිමු. ස්වකීය පටු ආත්මාර්ථකාමී බලාපොරොත්තු ඉටු වූ වහාම, ස්ථිරසාර ''ප්‍රජාතන්ත්‍රවාදයෙන්'' ''ආපසු හැරුනු'' වහාම (එය දැනටමත් ආපසු හැරමින් සිටී!) ධනපති පංතිය තොග පිටින් වැළැක්විය නොහැකි ලෙස ප්‍රතිවිප්ලවය දෙසට, ඒකාධිපත්‍යය දෙසට හැරී මහජනයාට හා විප්ලවයට විරුද්ධව යනු ඇත. එහිදී ඉතිරි වන්නේ ''ජනතාව'' යි. එනම්, නිර්ධන පංතිය හා ගොවි ජනතාවය. අවසානය දක්වා යාම ගැන විශ්වාසය තැබිය හැක්කේ නිර්ධන පංතිය කෙරෙහි පමණි. මන්දයත් එය ප්‍රජාතන්ත්‍රික විප්ලවය පසු කොට බොහෝ ඈතට යන හෙයිනි. නිර්ධන පංතිය සමූහාණ්ඩුවක් සඳහා ඉදිරියෙන්ම සිට සටන් කරන්නේද, ධනපති පංතිය ආපසු හැරී යාමේ හැකියාව ගණන් ගන්නා මෙන් කරන මෝඩ නොවැදගත් උපදෙස් පිළිකුල් සහගතව ප්‍රතික්ෂේප කරන්නේද එම නිසාය. ගොවි ජනතාවට අර්ධ — නිර්ධන මෙන්ම සුළු ධනේශ්වර කොටස් විශාල සංඛ්‍යාවක්ද ඇතුළත් වෙති. මේ නිසා එයද අස්ථාවර වෙන හෙයින් තරයේම පංති පක්ෂයක් වටා රොක්වීමට නිර්ධන පංතියට බල කෙරේ. එහෙත් ගොවිජනයා ගේ අස්ථිර බව ධනපති පංතියේ අස්ථිර බවට වඩා රැඩිකල් වශයෙන් වෙනස් වෙයි. මන්දයත් පුද්ගලික දේපල අයිතිය පිළිබඳ එක් ප්‍රධාන ක්‍රමයක් වන විශාල ඉඩම් ජනසතු කිරීම් ගැන තරම්, පුද්ගලික දේපල අයිතිය සම්පූර්ණයෙන්ම රැක ගැනීම කෙරෙහි ඔවුන් දැනට උනන්දුවක් නො දක්වන හෙයිනි. මේ නිසා සමාජවාදීන් නොවී හා සුළු ධනපති

---

* ''L'Humanité''[55] හි ජොරේස් මහතා විසින් පළ කරන ලද ස්ත්‍රුවේ මහතා විසින් ජොරේස් වෙත යවන ලද විවෘත ලිපියද මේ සම්බන්ධයෙන් වැදගති. එම ලිපිය ස්ත්‍රුවේ මහතා විසින් ''අස්වබෂ්ජේනිය'' අංක 72 හිද පළ කරන ලදී.

පංතියෙන් බැහැර නොවී හෝ ප්‍රජාතන්ත්‍රික විප්ලවයේ සම්පූර්ණ විශ්වාසී හා ඉතාමත් රැඩිකල් අනුගාමිකයින් වීමට ගොවි ජනතාවට හැකිකම තිබේ. ගොවි ජනයාගේ බුද්ධිය අවදි කරන විප්ලවකාරී සිදුවීම් වල ප්‍රගතිය ධනපති පංතියේ ද්‍රෝහිකම් හා නිර්ධන පංතියේ පරාජය නවත්වනු නො ලැබුවේ නම් ගොවි ජනතාව එසේ වනු ඇත. මේ කොන්දේසියට යටත්ව නිසැකවම ගොවි ජනතාව විප්ලවයේ හා සමූහාණ්ඩුවේ බලපවුරක් වනු ඇත. මන්ද යත් අර්ධ දාස ක්‍රමයේ මඩ වගුරෙන් ගොඩ ඒම සඳහා, පීඩනයේ හා අසරණ භාවයේ අන්ධකාරයෙන් මැත්වීම සඳහා, භුවමාරු භාණ්ඩ නිෂ්පාදනයේ රාමුව තුළ කළ හැකි තරමින් තම ජීවන තත්ත්වයන් උසස් කර ගනු සඳහා තමන්ට නියම වශයෙන් අවශ්‍යව ඇති (''සමාජවාදී විප්ලවකාරීන්'' සිතන පරිදි ධනවාදය අහෝසි කිරීමට නොව) තමන් බලාපොරොත්තු වන, තමන් ආශා කරන සෑම දෙයක්ම — ගොවිජන ප්‍රතිසංස්කරණ පිළිබඳ සෑම දෙයක්ම ගොවිජනයාට ලබාදිය හැක්කේ සම්පූර්ණයෙන් ජයග්‍රාහි වන විප්ලවයකට පමණක් වන බැවිනි.

හැරත් ගොවි ජනතාව විප්ලවයට බැඳී සිටින්නේ මූලික ගොවිතැන් ප්‍රතිසංස්කරණ පමණක් බලාපොරොත්තුවෙන් නොව ඔවුන් ගේ පොදු ස්ථිර අපේක්ෂාවන් ද අනුවය. නිර්ධන පංතියට විරුද්ධව සටන් කිරීමට පවා ජනතාවට ප්‍රජාතන්ත්‍රවාදය අවශ්‍ය වේ. මන්ද යත් ස්වකීය අපේක්ෂාවන් නියම ලෙස ප්‍රකට කරමින් බහුතර පිරිස ලෙසින් වැඩි දෙනා ලෙසින් ඔවුන්ට ප්‍රධාන තැන ලබා දිය හැක්කේ ප්‍රජාතන්ත්‍රික පාලන ක්‍රමයකට පමණක් වන බැවිනි. ගොවිජනයා වඩ වඩා ප්‍රබුද්ධ වන තරමට (ජපානය සමඟ යුද්ධයෙන් පසුව,[56] පාසැල් මිනුම් දන්ඩෙන් ප්‍රබුද්ධත්වය මැනීමට පුරුදුව සිටි බොහෝ දෙනා බලාපොරොත්තු නොවූ වේගයකින් ඔවුහු ප්‍රබුද්ධත්වය ලබමින් සිටිති.) වඩ වඩා ස්ථිර බවෙන් හා අධිෂ්ඨානයෙන් යුතුව දෘඩි ප්‍රජාතන්ත්‍රික විප්ලවයකට කැමති වෙති. මන්දයත්, ජනතාවට පරමාධිපත්‍යය හිමිවීම ගැන බියවීමට ධනපති පංතියට මෙන් ඔවුන්ට කිසි හේතුවක් නොමැති හෙයිනි. හැරත් එබඳු තැනක් ලැබීමෙන් ප්‍රයෝජන ගැනීමට ඔවුහු කැමති වෙති. බොළඳ රාජාණ්ඩු වාදයෙන් ඈත් වීමට පටන්ගත් වහා ම ප්‍රජාතන්ත්‍රික සමූහාණ්ඩුවක් පිහිටුවීම ගොවි ජනයා ගේ පරමාදර්ශය වනු ඇත. මන්ද යත්, ධනපති පංතික කොටස් වෙළෙන්දන්ගේ හැඟීමෙන් යුත් රාජාණ්ඩු ක්‍රමයෙන්ද (ඉහළ මන්ත්‍රණ සභාවක් ආදිය ඇතුළුව) ගොවි ජනතාවට අද මෙන්ම අයිතිවාසිකම් රහිතවීම, පීඩනය හා නූගත්කම හිමිවන බැවිනි.



වෙනසකට ඇති වන්නේ යුරෝපීය ආණ්ඩුක්‍රම වාදයේ සායම් වලින් තරමක් ඔප මට්ටම් වීම පමණි.

ධනපති පංතිය තොග වශයෙන් ස්වභාවයෙන්ම හා අනිවාර්ය ලෙස ලිබරල් රාජාණ්ඩුවාදී පක්ෂය යටතට පැමිණීම සඳහා උත්සහ කරන අතර ගොවි ජනයා වැඩි වශයෙන් විප්ලවකාරී හා සමූහාණ්ඩුවාදී පක්ෂයේ නායකත්වය යටතට පැමිණීම සඳහා උත්සාහ දරන්නේ ඒ හෙයිනි. ධනපති පංතිය ප්‍රජාතන්ත්‍රික විප්ලවය අවසානය දක්වා ගෙන යෑමට අසමත් වන්නේත් ගොවිජනයා එසේ කිරීමට සමත් වන්නේත් එසේ ම, එහිලා උදවු කිරීමට අප සියලු ප්‍රයත්නයන් යෙදවිය යුතු වන්නේත් ඒ නිසාය.

මෙය අමුතුවෙන් නොකිවමනාය. අ ආ වැනිය. සියලුම සමාජ ප්‍රජාතන්ත්‍රිකයන් ඉතා හොඳින් දන්නේය ආදි වශයෙන් විරෝධයක් මතු කළ හැකිය. නැත. ප්‍රශ්නය එය නොවේ. ධනපති පංතිය ඈත්වීම නිසා විප්ලවයේ ''වේගය'' ''අඩු වනු ඇතැයි'' කියන අයට මෙය තේරුම් ගත නොහැකිය. එබඳු පුද්ගලයෝ අපේ ගොවිජන වැඩ සටහනෙහි අදහස තේරුම් නො ගෙන එහි කටපාඩම් කර ගත් වචන පමණක් උච්චාරණ කරති. එසේ නොවේ නම්, සමස්ත මාක්ස්වාදී ලෝක දර්ශනයෙන් හා අපේ වැඩ සටහනෙන් අනිවාර්යයෙන්ම මතු වන ගොවින් ගේ හා නිර්ධන පංතියේ විප්ලවීය ප්‍රජාතන්ත්‍රික අඥදයකත්වය පිළිබඳ සංකල්පයට ඔවුහු බිය නො වෙති. රුසියානු මහා විප්ලවයේ වේගය, ධනපති පංතියේ බලාපොරොත්තු සීමාවෙන් නතර නො කරති. එබඳු පුද්ගලයෝ, තමන්ගේ අමූර්ත මාක්ස්වාදී විප්ලවීය වදන්, තමන්ගේම මූර්ත මාක්ස් විරෝධී විප්ලව විරෝධී යෝජනා වලින් පරාජය කරවති.

ජයග්‍රාහී රුසියානු විප්ලවයක දී ගොවි ජනතාව සතු කාර්යභාරය හොඳින් හඳුනන්නෝ ධනපති පංතිය ආපසු හැරී ගිය විප්ලවයේ වේගය අඩුවන බව කීමට කල්පනා නො කරති. මන්දයත්, ඇත්තෙන්ම, ධනපති පංතියේ විප්ලවයෙන් ආපසු හැරී ගිය පසු හා ගොවි ජනතාව ක්‍රියාශීලී විප්ලවකාරීන් ලෙස නිර්ධන පංතිය සමග උරෙනුර ගැටී සටන් බිමට පිවිසි විට පමණක් රුසියානු විප්ලවය ඇත්ත වශයෙන් නියම වේගයකින් ක්‍රියාත්මක වන හෙයිනි. ධනපති ප්‍රජාතන්ත්‍රික විප්ලව සමයේදී ළඟා කර ගත හැකි පුළුල්තම විප්ලවීය වෙගයෙන් ගමන් ගන්නා බැවිනි. එය ස්ථිරව අවසානය දක්වා ගෙන යනු පිණිස අපේ ප්‍රජාතන්ත්‍රික විප්ලවය, ධනපති පංතියේ අනිවාර්ය චපල බව මර්දනය කිරීමට තරම් ශක්තිමත් වන බලවේග කෙරෙහි බලාපොරොත්තු තැබිය යුතුය (එනම්, හරි වැටහීමක් නො මැතිකමින් කොකේසියානු

ඉස්ක්‍රාවාදීන් බියක් දක්වන්නාවූ ද, ''ධනපති පංතිය ඉවත් කිරීමට'' නියම වශයෙන් ම සමත් වන්නාවූ ද බලවේග කෙරෙහි බලාපොරොත්තු තැබිය යුතුය).

ඒකාධිපත්‍යයේ විරෝධය බලයෙන් මැඩ ධනපති පංතියේ අස්ථිරභාවය ක්‍රියාවිරහිත කිරීම සඳහා නිර්ධන පංතිය තමන් ළඟට ගොවි බහු ජනතාවද සම්බන්ධ කර ගනිමින් ප්‍රජාතන්ත්‍රික විප්ලවය සමාප්තිය කරා ගෙන යා යුතුය. ධනපති පංතියේ විරෝධය බලයෙන් මැඩ ගොවීන්ගේ හා සුළු ධනපති පංතියේ අස්ථිරභාවය ක්‍රියාවිරහිත කිරීම සඳහා නිර්ධන පංතිය තමන් ළඟට ජනගහනයේ අර්ධ නිර්ධන පංතික බහු ජනතාව සම්බන්ධ කර ගනිමින් සමාජවාදී විප්ලවය ජයග්‍රහණය කළ යුතුය. විප්ලවයේ ගමන් වේගය ගැන නව ඉස්ක්‍රා කණ්ඩායම තමන් ගේ සියලු තර්ක වලින් එතරම් පටු ලෙස ඉදිරිපත් කරන නිර්ධන පංතියේ කටයුතු මේවාය.

විප්ලවයේ ගමන් ''වේගය'' ගැන කරන සාකච්ඡා වලින් නිතරම අමතක කෙරුනද, එක් කරුණක් අමතක කළ යුතු නැත. ප්‍රස්තුතය වී ඇත්තේ මෙම ප්‍රශ්නයෙන් පැන නඟින දුෂ්කරතා නොව එය විසඳනු සඳහා අප සොයන මාර්ගය බව අමතක කළ යුතු නොවේ. කාරණය වී ඇත්තේ විප්ලවයේ වේගය බලවත් හා අනභිබවණීය කිරීම පහසුද නැතහොත් දුෂ්කර ද යන වග නොව, මෙම වේගය වඩා බලවත් කරනු සඳහා අප ක්‍රියා කළ යුත්තේ කෙසේද යන වගය. අපේ අදහස් වෙනස් වන්නේ නියම වශයෙන් ම අපේ ක්‍රියාකාරිත්වයේ මූලික ස්වභාවයත්, එය යොමු විය යුතු දිශාවත් සම්බන්ධයෙනි. අප මෙය අවධාරනය කරන්නේ නො සැලකිලිමත් ප්‍රවේසම් රහිත පුද්ගලයන් විසින් බොහෝවිට වෙනස් ප්‍රශ්න දෙකක් අවුල් කරන හෙයිනි. එනම්, ගත යුතු දිශාව නැතහොත් මාර්ග දෙකකින් එකක් තෝරා ගැනීම පිළිබඳ ප්‍රශ්නය සහ අපේ අරමුණ ළඟා කර ගැනීමේ පහසුකාවය හෝ නියමිත මාවතක් ඔස්සේ එය ළඟා කර ගැනුමට පවත්නා සමීපතාවය පිළිබඳ ප්‍රශ්නයයි.

අප අන්තිමට දැක්වූ ප්‍රශ්නය ගැන ඉහත කරුණු විමසා නැත. මන්ද යත් ඒ පිළිබඳව පක්ෂය තුළ කිසිම මතභෙදයක් හෝ වෙනසක් ඇති වී නො මැති හෙයිනි. එහෙත් එම ප්‍රශ්න ඉතාම වැදගත් මෙන්ම සියලුම සමාජ–ප්‍රජාතන්ත්‍රිකයන්ගේ අවධානය යොමු විය යුත්තකි. ව්‍යාපාරය තුළට කම්කරු පංතිය පමණක් නොව ගොවිජනයාද ඇද ගැනීමේ පවත්නා දුෂ්කරතාවය අමතක කිරීම සමාව දිය නො හැකි සර්වශුභවාදයකි. මෙමෙ දුෂ්කරතා බොහෝ විට ප්‍රජාතන්ත්‍රික විප්ලවයක් අවසානය දක්වා ගෙන යාමට ගත් ප්‍රයත්න බිඳ දැමූ



බාධකයක්වී ඇත. ජනතාවට එරෙහි වූ රාජාණ්ඩුවාදී ආරක්ෂාවක් ස්වරූපයෙන් ''ප්‍රයෝජන ගෙන ඇත්තේත්'' හෝ අස්වබඡ්ජේනිය වාදයේ ''නිර්මල බව රැකගත්තේත්'' චපල ආත්මාර්ථකාමී ධනපති පංතියයි. එහෙත් යමක් දුෂ්කර වීම යනුවෙන් එය කළ නොහැකි බවක් අදහස් නොවේ. වැදගත් දෙයනම් තෝරාගත් මාවත නිවැරැදි එක බව ඒත්තු ගැනීමයි. එම ඒත්තු ගැනීමෙන් පුදුම සහගතදේ කළ හැකි විප්ලවීය ශක්තිය හා විප්ලවීය උද්‍යෝගය සිය ගුණයෙන් වැඩිවේ.

තෝරා ගත යුතු මාර්ගය පිළිබඳ ප්‍රශ්නය සම්බන්ධයෙන් වර්තමාන සමාජ-ප්‍රජාතන්ත්‍රිකයන් අතර මතභේදය කෙතරම් ගැඹුරු ද යන වග, නව ඉස්ක්‍රාවාදීන්ගේ කොකේසියානු සාකච්ඡා සභාවේ යෝජනාවත් රුසියානු සමාජ ප්‍රජාතන්ත්‍රික කම්කරු පක්ෂයේ තුන්වැනි සම්මේලනයේ යෝජනාවත් එකට සසඳා බැලීමෙන් එක් වරම පෙනී යයි. ධනපති පංතිය චපල වන අතර සහතික වශයෙන් ම ඔවුන් විප්ලවයේ ජයග්‍රහණයන් අපෙන් උදුරා ගැනීමට තැත් කරනු ඇති බව සම්මේලන යෝජනාවෙන් ප්‍රකාශ වේ. එහෙයින් කම්කරු සහෝදරයිනි, සටනට වඩා උද්යෝගිමත්ව සූදනම් වන්න, සන්නද්ධ වන්න, ගොවිජනතාව ඔබේ පැත්තට දිනාගන්න! අපේ විප්ලවීය ජයග්‍රහණ සටනක් නොමැතිව අපි ආත්මාර්ථකාමී ධනපති පංතියට පවා නොදෙන්නෙමු. ධනපති පංතිය අස්ථිර වන අතර ඔවුන් විප්ලවයෙන් ආපසු හැරී යාමට ඉඩ ඇතැයි කොකේසියානු නව ඉස්ක්‍රාවාදීන්ගේ යෝජනාවෙන් ප්‍රකාශ වේ. එහෙයින් කම්කරු සහෝදරයිනි, තාවකාලික ආණ්ඩුවකට හවුල් වීමට කරුණාකර නො සිතන්න. මන්ද යත් ඔබ එසේ කළහොත් ධනපති පංතිය නිසැකව ම ආපසු හැරී ගොස් එයින් විප්ලවයේ වේගය අඩු වී යනු ඇත!

චපල ධනපති පංතියේ උදාසීන බව හා විරෝධය තිබුණ ද ඒ ගැන නො සලකා විප්ලවය අවසානය දක්වා ඉදිරියට ගෙන යන්නැයි එක් පාර්ශ්වයක් කියයි.

අනෙක් පාර්ශ්වය කියන්නේ චපල ධනපති පංතිය ආපසු හැරී යාමට ඉඩ ඇති හෙයින් විප්ලවය ස්වාධීනව අවසානය දක්වා ගෙන යාමට නො සිතන ලෙසයි.

මේ එකිනෙකට මුළුමනින් විරුද්ධ වූ මාර්ග දෙකක් නො වේද? එක් උපක්‍රම මාලාවක් විසින් අනික් උපක්‍රම මාලාව සම්පූර්ණයෙන් බැහැර කරන බව පැහැදිලි නොවේද? පළමුව කී දෙය විප්ලවකාරී සමාජ–ප්‍රජාතන්ත්‍රවාදයේ එකම නිවැරදි උපක්‍රමය වන බවත් දෙවැන්න තනිකර ම අස්වබඡ්ජේනිය වාදී උපක්‍රමය බවත් පැහැදිලි නොවේද?

## 13. අවසානය. අපට ජයගත හැකිද?

රුසියානු සමාජ-ප්‍රජාතන්ත්‍රවාදයේ පවත්නා තත්ත්වයන් පිළිබඳ මතුපිටින් දන්නා ජනයා හෝ ආර්ථිකවාදයේ දිනවල සිට පවත්නා පක්ෂ අභ්‍යන්තර අරගලයේ මුළු ඉතිහාසය පිළිබඳ දැනුමක් නැති හුදු නරඹන්නන් ලෙස විනිශ්චයට බසින්නෝ සැම සමාජ-ප්‍රජාතන්ත්‍රවාදී ව්‍යාපාරයකම ස්වභාවිකවම, අනිවාර්යයෙන් සමනය කළ නොහැකි ප්‍රවනතා දෙකක් පවතින්නේය යන සරල තර්කය දක්වමින් උපක්‍රම පිළිබඳ මතුව ඇති විශේෂයෙන් තුන්වන සම්මේලනයෙන් පසු මතුව ඇති වෙනස්කම් බොහෝ විට බැහැර කරති. එක් පැත්තක් සාමාන්‍ය, ජංගම හා දෛනික කටයුතු වලට, ප්‍රචාරය හා උද්ඝෝෂණය වර්ධන කිරීමේ, බලවේග සූදනම් කිරීමේ, ව්‍යාපාරය ගැඹුරු කිරීමේ අවශ්‍යතාවය ආදියට විශේෂ අවධානය යොමු කරන අතර අනෙක් පැත්ත සටන්කාමී ව්‍යාපාරයේ පොදු දේශපාලන විප්ලවීය කටයුතු වලට අවධානය යොමු කරමින් ජනතා නැගිටීමේ අවශ්‍යතාවය පෙන්වා දෙමින් විප්ලවකාරී ප්‍රජාතන්ත්‍රික ආඥාදායකත්වයක හා විප්ලවකාරී තාවකාලික ආණ්ඩුවක සටන් පාඨ ඉදිරිපත් කරන බව ඔව්හු කියති. එක් පැත්තක් විසින් වත් අතිශයෝක්තියට නැගිය යුතු නැත. අවස්ථා දෙකේම අන්ත නරකය (පොදුවේ ගත් කළ ලෝකයේ හැම තැනම නරකය) ආදී වශයෙන් ඔව්හු කියති.

එබඳු තර්කවල නිසැකයෙන්ම අඩංගු වන මගීන්ගේ (සහ විවෘත කොමා තුළ "දේශපාලන") බුද්ධියේ ලාබ සරල සත්‍යයන් මගින් බොහෝ විට පක්ෂයේ හදිසි සහ උග්‍ර අවශ්‍යතා අවබෝධ කර ගැනීමට ඇති නොහැකියාව වසන් කෙරේ. රුසියානු සමාජ–ප්‍රජාතන්ත්‍රිකයන් අතර වර්තමානයේ පවත්නා උපක්‍රමික වෙනස්කම් ගන්න. උපක්‍රම පිළිබඳ නව ඉස්ක්‍රා තර්කවල අපිට දකින්නට තිබෙන කටයුතු වල දෛනික සාමාන්‍ය අංශයට අවධාරනය යෙදීම තුළින් එපමණින්ම කිසි අනතුරක් හෝ උපක්‍රමික සටන්පාඨ පිළිබඳ මත වෙනසක් හෝ ඇතිවිය නොහැකි බව සත්‍යයකි. එහෙත් මෙම වෙනස කැපී පෙනීම සඳහා රුසියානු සමාජ-ප්‍රජාතන්ත්‍රවාදී කම්කරු පක්ෂයේ තුන්වන සම්මේලනයේ හා සාකච්ඡා සභාවේ යෝජනා සංසන්දනය කිරීම ප්‍රමාණවත්ය.

එසේනම් කලබලය කුමක්ද? පළමුවෙන්ම ව්‍යාපාරයේ ප්‍රවාහ දෙකක් පැවතීම හා අන්තවල හානිකර භාවය ගැන අමූර්ත ලෙස කතා කිරීම නොසෑහේ. නිශ්චිත ව්‍යාපාරයකට නිශ්චිත අවස්ථාවකදී වැළඳි රෝගය කුමක්ද සහ වර්තමානයෙහිදී පක්ෂයට නියම දේශපාලන



තර්ජනය ඇතිවන්නේ කුමකින්ද යනු කෙනෙකු විසින් දැනගත යුතුය. දෙවනුව, ඉදිරිපත් කරනු ලබන උපක්‍රමික සටන් පාඨ මගින් හෝ ඇතැම්විට යම් සටන්පාඨ නොතිබීමෙන් හෝ කිනම් නියම දේශපාලන බලවේග වාසි ලබන්නේදැයි කෙනෙකු දැන සිටිය යුතුය. යමෙකු නව-ඉස්ක්‍රාවාදීන්ට සවන් දෙන්නේ නම් සමාජ-ප්‍රජාතන්ත්‍රවාදී පක්ෂය ඉදිරිපිට තර්ජනයව ඇත්තේ ප්‍රචාරය හා උද්ඝෝෂණය, ආර්ථික අරගලය හා ධනේශ්වර ප්‍රජාතන්ත්‍රය විවේචනය අත්හැරීම සහ හමුද සූදනම් කිරීම්, සන්නද්ධ පහරදීම්, බලය අල්ලා ගැනීම ආදියෙහි පමණට වඩා යෙදී සිටීමය. ඇත්ත වශයෙන්ම පක්ෂයට නියම තර්ජනය එන්නේ හාත්පසින්ම වෙනත් පැත්තකිනි. ව්‍යාපාරයේ තත්වය පිළිබඳ හොඳින් දන්නා ඕනෑම කෙනෙකුට ඒ ගැන ප්‍රවේසමෙන් හා පූර්ණ ලෙස විමසිල්ලෙන් සිටින ඕනෑම කෙනෙකුට නව ඉස්ක්‍රාවාදීන්ගේ භීතියෙහි විහිළු ස්වභාවය නොපෙනී යා නොහැකිය. රුසියානු සමාජ–ප්‍රජාතන්ත්‍රවාදී කම්කරු පක්ෂයේ මුළු මහත් කටයුතු දැනටමත් නිශ්චිත හා වෙනස් නොවන හැඩයක් ගෙන තිබේ. ඒ අනුව අපගේ ප්‍රධාන අවධානය ප්‍රචාරය හා උද්ඝෝෂණය ක්ෂණික හා බහුජන රැස්වීම්, පත්‍රිකා හා දැන්වීම් බෙදහැරීම, ආර්ථික අරගලයට සහයෝගය දීම හා එම අරගලයේ සටන් පාඨ ඉදිරියට ගෙනයාම සඳහා යෙදවීම සහතික කෙරේ. මෙම කටයුතුවලට හැමවිටම හා නොවරදවාම සිය අවධානයෙන්, ශක්තියෙන් හා කාලයෙන් සියයට අනූ නවයක් යොදවන්නේ නැති එකද පක්ෂ කමිටුවක්, එකද දිසා කමිටුවක්, එකද මධ්‍යම නියෝජිත රැස්වීමක් හෝ එකද පැක්ටරි කණ්ඩායමක් නැත. මෙය අනූ ගණන්වල මැද භාගයේ සිට ස්ථිරසාර ලෙස තහවුරු වූවකි. ව්‍යාපාරය සමග කිසිදු ආශ්‍රයක් නැති උදවිය පමණක් එය දන්නේ නැත. විශාල වැදගත්කමක් ඇති ලෙසට පෙන්වමින් නව "ඉස්ක්‍රා" පත්‍රය මගින් පිළුණු සත්‍ය පුන පුනා කියන විට ඒවා ඒ සැටියෙන්ම පිළිගනු ඇත්තේ ඉතා බොළඳ හෝ තොරතුරු හරියාකාරව නොදත් හෝ ජනයා පමණි.

කාරණය වන්නේ ජනතා නැගිටීමේ පොදු දේශපාලන සටන්පාඨවල හා මුළු මහත් මහජන විප්ලවයට නායකත්වය දීමේ කටයුතු සම්බන්ධයෙන් අධිකතර උනන්දුවක් දක්වනු වෙනුවට ඊට පටහැනි පරිදි අප විසින් මෙම අංශය පිළිබඳව ඉතා කැපී පෙනෙන පසුගාමීත්වයක් දැක්වීමයි. මෙම පසුගාමීත්වය අපගේ විශාලතම දුර්වලකම වන අතර ව්‍යාපාරයට සැබෑ තර්ජනයක්ද වේ. මේ නිසා එම ක්‍රියාවන් විප්ලවකාරී ව්‍යාපාරයක තත්ත්වයේ සිට වචනයෙන් පමණක් විප්ලවකාරී ව්‍යාපාරයක තත්ත්වයට පිරිහීමටද පුළුවන. සමහර

තැන්වල දැනටමත් පිරිහෙමින් පවතී. පක්ෂයේ කටයුතු ගෙනයන සංවිධාන, කණ්ඩායම් හා කවයන් සිය ගණන් අතුරෙන් දැන් අලුත් සත්‍යයන් සොයාගත් මිනිසුන්ගේ විලාසයෙන් කතා කරන නව ''ඉස්ක්‍රා'' බක පණ්ඩිතයන් කියන ස්වරූපයේ දෛනික කටයුතු වල ආරම්භයේ සිටම නියැලුනේ නැති එකද සංවිධානයක්වත් නොමැත. අනෙක් අතට, ජනතා නැගිටීමක් සඳහා අනිවාර්ය කටයුතු පිළිබඳ අවබෝධයෙන් ඒවා ක්‍රියාවට නැගීමට පටන් ගත්, සාර්වාදයට විරුද්ධව මුළු මහත් මහජන විප්ලවය මෙහෙයවීමේ අවශ්‍යතාවය වටහා ගත්, ඒ සඳහා වෙනත් ඒවා නොමැතිව යම් නිශ්චිත ප්‍රගතිශීලි සටන්පාඨ ඉදිරිපත් කිරීමේ අවශ්‍යතාවය වටහා ගත් කණ්ඩායම් හා කවයන් ඔබට හමුවන්නේ අල්පතර සංඛ්‍යාවකි.

අපේ ප්‍රගතිශීලී හා අවංක විප්ලවීය කටයුතු වලදී අපි ඇදහිය නොහැකි තරම් පසු පසින් සිටිමු. බොහෝ අවස්ථාවලදී අපි එවා ගැන අවබෝධයවත් ලබා නැත. මෙම අංශයෙන් අප තුළවූ දුර්වලතාවය නිසා යම් යම් තැන්වල ධනේශ්වර ප්‍රජාතන්ත්‍රවාදය ශක්තිමත්වී ඇති බව දැකීමටද අපි අපොහොසත් වී සිටිමු. එහෙත්, සිදුවීම් ගමන් ගන්නා මාවතට හා කාලයාගේ අවශ්‍යතාවයන්ට පිටු පා සිටින නව ඉස්ක්‍රා ලේඛකයෝ ''පැරණි දේ අමතක නොකරන්න! අලුත් දෙයට වශී නොවන්න!'' යයි නොනවත්වා පුන පුනා කියති. සාකච්ඡා සභාවේ සියළුම වැදගත් යෝජනාවල නොවරදවා අඩංගු වන ප්‍රධාන කාරණය මෙයයි. මේ අතර සම්මේලන යෝජනා වලින් එපරිද්දෙන්ම නොවරදවාම ඔබට කියවීමට ලැබෙන්නේ මෙසේය. පැරණි දේ ස්ථිර කරන අතර (එය පැරණි වන හා විසඳී, සාහිත්‍යයේ යෝජනාවන්හි හා අත්දැකීම් මගින් වාර්තා වී ඇති හෙයින්ම එය නැවත නැවත වමාරා කන්නේ නැතිව) අපි නව කටයුත්තක් ඉදිරියට ගෙන එමු. ඊට අවධානය යොමු කරමු.නව සටන් පාඨයක් දියත් කරමු. එය වහා ක්‍රියාවට නගන මෙන් නියම විප්ලවීය සමාජ-ප්‍රජාතන්ත්‍රිකයන්ගෙන් ඉල්ලා සිටිමු.

සමාජ-ප්‍රජාතන්ත්‍රවාදී උපක්‍රමයන්හි ප්‍රවනතා දෙක පිළිබඳ කරුණු ඇත්ත වශයෙන්ම යෙදී ඇත්තේ එලෙසටය. විප්ලවකාරී සමය විසින් නව කටයුතු ඉදිරිපත් කොට තිබේ. ඒවා දැකිය නොහැකි වන්නේ සහමුලින්ම අන්ධ වූවන්ට පමණි. මෙම කටයුතු වකිතයකින් තොරව හැඳින ගන්නා සමහර ප්‍රජාතන්ත්‍රිකයෝ සන්නද්ධ නැගිටීම ප්‍රමාද කළ නොහැකිය, වහාම හා උද්යෝගිමත්ව ඊට සූදනම් වන්න, තීරණාත්මක ජයග්‍රහණයක් සඳහා එය නැතුවම බැරිබව සිහිපත් කරන්න, ජනරජයක් සඳහා තාවකාලික ආණ්ඩුවක් සඳහා නිර්ධන



පංතියේ හා ගොවි ජනතාවගේ විප්ලවකාරී–ප්‍රජාතන්ත්‍රික ආඥාදායකත්වයක් සඳහා සටන් පාඨ ඉදිරියට ගෙන එන්න ආදී වශයෙන් ප්‍රකාශ කරති. කෙසේ වෙතත්, තීරණාත්මක ජයග්‍රහණයක් සඳහාවූ කොන්දේසි නිශ්චය කළ නොහැකි හෝ පූර්ණ ජයග්‍රහණයක් දිනා ගැනීමේ අපේක්ෂාව සමග ගැලපෙන සටන් පාඨ ඉදිරිපත් කිරීමට අසමත් හෝ අනෙක් සමාජ-ප්‍රජාතන්ත්‍රිකයෝ පසු බසිති. කල් බලති. සටන් පාඨ වෙනුවට පෙරවදන් ලියති. අලුත් දේ දකිනු වෙනුවට පැරණි දේ ස්ථිර කරන අතර එය දුෂ්කර හා දීර්ඝ ලෙස වමාරා කති. අලුත් දේ මග හැරීම සඳහා නිදහසට කරුණු මවති.

මෙම වල්ගවාදයේ දේශපාලන ප්‍රතිඵලය අප ඇස් පනා පිට තිබේ. රුසියානු සමාජ–ප්‍රජාතන්ත්‍රවාදී කම්කරු පක්ෂයේ ''බහුතරය'' සහ විප්ලවීය ධනේශ්වර ප්‍රජාතන්ත්‍රය අතර සමගි සන්ධානයක් පිළිබඳ කතන්දරය එකද දේශපාලන කරුණකින්, ''බොල්ෂෙවික්වරුන්ගේ'' එකද වැදගත් යෝජනාවකින් හෝ රුසියානු සමාජ-ප්‍රජාතන්ත්‍රවාදී කම්කරු පක්ෂයේ තුන්වන සම්මේලනයේ එකද ලියවිල්ලකින් හෝ සනාථ නොවූ කතන්දරයක්ව පවතී. අනෙක් අතට, අස්වබෂ්ජේනිය මගින් නියෝජනය කරන අවස්ථාවාදී රාජාණ්ඩුවාදී ධනපති පංතිය නව ඉස්ක්‍රා කණ්ඩායම විසින් දේශනා කරනු ලබන ''මූලධම්'' යන්ගේ ප්‍රවනතාවයට දිගු කලක සිටම ආශිර්වාද කළ අතර තමන්ගේ අරමුණු සඳහා ඔවුන්ගේ මාධ්‍ය දැන් ඇත්ත වශයෙන්ම පාවිච්චි කරති. ''රහස්‍යභාවය'' ට හා ''කැරැලි'' වලට විරුද්ධව, විප්ලවයේ ''කාර්මික'' අංශය අතිශයෝක්තියට නැගීමට විරුද්ධව, ජනතා නැගිටීමේ සටන් පාඨය විවෘතවම ප්‍රකාශ කිරීමට විරුද්ධව අන්ත ඉල්ලීම් වල ''විප්ලවකාරිත්වය'' ට විරුද්ධව ආදි වශයෙන් එල්ල කරනු ලබන ඔවුන්ගේ හුරුබුහුටි වචන හා ''අදහස්'' ගලපා යොදති. කොකේසියානු ''මෙන්ෂෙවික්'' සමාජ-ප්‍රජාතන්ත්‍රවාදීන්ගේ මුළු සාකච්ඡා සභාවක යෝජනාව හා ඉස්ක්‍රා කර්තෘවරුන් මගින් එම යෝජනාව දුන් අනුමැතියෙන් මුළු ප්‍රශ්නයම මෙසේ දේශපාලන වශයෙන් සැකයෙන් තොරව ඉදිරිපත් කර තිබේ. විප්ලවීය ප්‍රජාතන්ත්‍රික ආඥාදායකත්වයක නිර්ධන පංතිය සහභාගි වීම නිසා ධනපති පංතිය ආපසු හැරී ගියහොත් කුමක් වේද? මෙම කාරණය ලුහුඬින් දක්වන අතර නිර්ධන පංතිය රාජාණ්ඩුවාදී ධනපති පංතියේ උපායයක් ලෙස පරිවර්තනය වීමට අවසාන සූදනම් කිරීම සපයයි. මෙසේ නව-ඉස්ක්‍රා මේ වල්ගවාදයේ දේශපාලන වැදගත්කම යම් පුද්ගලයෙකු අහම්බෙන් කරන නිරීක්ෂණයකින් නොව මුළු ප්‍රවනතාවයක් මගින්ම විශේෂයෙන්

අනුමත කරන ලද යෝජනාවක් මගින් සිද්ධිවාචිකව ඔප්පු කරනු ලැබීය.

මෙම කරුණු ගැන මෙනෙහි කරන ඕනෑම කෙනෙකුට සමාජ-ප්‍රජාතන්ත්‍රික ව්‍යාපාරයේ පවත්නා පැති දෙකක් හා ප්‍රවනතා දෙකක් ගැන කෙරෙන සුපුරුදු සඳහන් කිරීම්වල නියම වැදගත්කම අවබෝධ වනු ඇත. මෙම ප්‍රවනතාවයන්හි පූර්ණ පරිමාණයේ අධ්‍යයනයක් සඳහා කෙනෙකු විසින් බර්න්ෂ්ටයින්වාදය සලකා බැලිය යුතුය. බර්න්ෂ්ටයින්වාදීහුද මේ ආකාරයෙන්ම නිර්ධන පංතියේ නියම අවශ්‍යතා හා එහි බලවේග ගොඩ නැගීමේ කටයුතුද සියළු කටයුතු ගැඹුරු කිරීමේ හා නව සමාජයේ අංග සූදනම් කිරීමේ කටයුතු සහ ප්‍රචාරයේ හා උද්ඝෝෂණයේ කටයුතුද අවබෝධ කරගන්නේ තමන් බව අපේ දෙසවන් වලට ඇතුල් කිරීමට ඝෝෂා කරති. බර්න්ෂ්ටයින් මෙසේ කියයි. මෙසේ ''කිසිදු අවසාන අරමුණක්'' රහිතව ''ව්‍යාපාරය'' ශුද්ධත්වයට පත් කරන ආරක්ෂක උපක්‍රම පමණක් ශුද්ධත්වයට පත් කරන (''ධනේශ්වර පංතිය ආපසු හැරී යතැයි'' බියෙන් දේශනා කරන උපක්‍රම) දෙයම අවංකව පිළිගන්නා ලෙස අපි ඉල්ලා සිටිමු. මෙසේ විප්ලවීය සමාජ–ප්‍රජාතන්ත්‍රිකයන්ගේ ''ජැකොබින්වාදය''ට විරුද්ධව කම්කරුවන්ගේ පෙරදූරි බව අවබෝධ කරගැනීමට අසමත්වූ ''පාර්ලිමේන්තුවාදීන්'' ආදීන්ට විරුද්ධව බර්න්ෂ්ටයින්වාදීහු ගාලගෝට්ටියක් නැගූහ. ඇත්ත වශයෙන්ම හැමදෙනාම දන්නා පරිදි විප්ලවීය සමාජ–ප්‍රජාතන්ත්‍රිකයන් කිසිදිනෙක දෛනික සුළු වැඩ, බලවේග එකතු කිරීම ආදිය අත්හැරීමට සිතුවේ වත් නැත. ඔවුන් ඉල්ලා සිටි එකම දෙය අවසාන අරමුණ පිළිබඳ පැහැදිලි අවබෝධයක්, විප්ලවීය කටයුතු පිළිබඳ පැහැදිලි ඉදිරිපත් කිරීමකි. ඔවුන්ට වුවමනා කළේ අර්ධ-නිර්ධන පංති හා අර්ධ සුළුධනේශ්වර ස්ථර නිර්ධන පංතියේ විප්ලවීය මට්ටමට නැංවීම මිස එම මට්ටම ''ධනේශ්වර පංතිය ආපසු හැරී යතැ''යි ආදී වශයෙන් අවස්ථාවාදී ලෙස සලකා බැලීම් දක්වා පහත දැමීම නොවේ. ඇතැම්විට පක්ෂයේ බුද්ධිමත් අවස්ථාවාදී අංශය හා නිර්ධන පංති විප්ලවීය අංශය අතරවූ මෙම වෙනස පිළිබඳ ඉතාමත් විචිත්‍ර ප්‍රකාශනය dürfen wir siegen? ''අපට ජයගත හැකිද?'' යන ප්‍රශ්නය විය. අපට ජයග්‍රහණය කිරීමට අවසර තිබේද? අප ජයග්‍රහණය කිරීම අනතුරුදායක නොවේද? අප ජය ගත යුතුද? කෙසේ වෙතත්, පළමු බැල්මට පුදුමාකාර ලෙස පෙනෙන මෙම ප්‍රශ්නය නගන ලදී. එය නැගිය යුතු විය මන්ද යත් ජයග්‍රහණයට බියවූ බැවින් සහ එයින් කරදර ඇති වෙතැයි අනාවැකි පල කරමින් හා කෙළින්ම ජයග්‍රහණයට කැඳවන



සටන් පාය අවඥාවට ලක් කරමින් එයින් නිර්ධන පංතිය බිය වද්ද ඇත් කිරීමට ඔවුන් කටයුතු කළ බැවිනි.

අප අතරද, බුද්ධිමත්–අවස්ථාවාදී හා නිර්ධන පංතික විප්ලවකාරී නැඹුරුවීම් දෙකක් වශයෙන් එම මූලික බෙදීම පවතී. එහෙත් මෙහිදී වැදගත් වෙනසක් තිබේ. එනම්, අප මුහුණපා ඇත්තේ සමාජවාදී විප්ලවයක් පිළිබඳ ප්‍රශ්නයට නොව ප්‍රජාතන්ත්‍රික විප්ලවයක් පිළිබඳ ප්‍රශ්නයට ය. බැලූ බැල්මට මහා විහිළුවක් සේ පෙනෙන ''අපට ජයගත හැකිද?'' යන ප්‍රශ්නය අප අතරද මතුකොට තිබේ. ''ආඥාදායකත්ව දෙකක්'' නමැති ස්වකීය කෘතියෙන් එම පැනයම මතුකරන ලද්දේ මර්තිනව් විසිනි. අප හොඳින් සූදනම් වී ඉතා සාර්ථක ලෙස කැරැල්ලක් මෙහෙයවූවහොත් ඉන් අන්ත අභාග්‍යයක් ළඟාවන බවට ඔහු එම පොතෙන් අනාවැකි කියයි. විප්ලවකාරී තාවකාලික ආණ්ඩුවක් ගැන ලියවුනු සියලුම නව-ඉස්ක්‍රා ලිපි ලේඛනවලින් මේ ප්‍රශ්නය මතුකොට ඇති අතර ධනපති පංතික අවස්ථාවාදී ආණ්ඩුවකට මිලෙරාන්ගේ හවුල්වීම හා සුළුධන පංතික විප්ලවකාරී ආණ්ඩුවකට වර්ලේන්ගේ හවුල්වීම[57] සමකර දැක්වීම සඳහා කොතෙකුත් දැඩි එහෙත් නිෂ්ඵල ප්‍රයත්න දරා ඇත. ''ධනපති පංතිය අපසු හැරී යාමට ඉඩ ඇති නිසා'' යයි ප්‍රකාශ කරන යෝජනාවකින් එය මූර්තිමත් කොට දැක්වේ. විප්ලවකාරී තාවකාලික ආණ්ඩුවක් පිළිබඳ අපේ මතභේදය වලසා මරාදැමීමට පෙර උගේ හම බෙදගැනීම වැනියයි කෞට්ස්කි දැන් උපහාසයෙන් යුතුව කියතත්, එම උපහාසයෙන් පෙන්වන්නේ, දක්ෂ, විප්ලවකාරී සමාජ ප්‍රජාතන්ත්‍රිකයන් පවා කටකතා තුළින් පමණක් දන්නා දේ ගැන කතාකරනවිට එම වරදම කිරීමට ඉඩතිබෙන බව පමනි. ජර්මන් සමාජ–ප්‍රජාතන්ත්‍රවාදය වලසා මරා දැමීමට (සමාජවාදී විප්ලවයක් කිරීමට) තවමත් එතරම් ලංවී නැත. එහෙත් ප්‍රතිපත්තිමය හා ව්‍යවහාර දේශපාලනය අතින් බලනවිට, අප වලසා මැරීමට ''ඉදිරිපත්වමුද'' යන්න පිළිබඳ මතභේදය අතිශයින් වැදගත්ය.''තම වලසා මරාදැමීමට'' (ප්‍රජාතන්ත්‍රික විප්ලවයක් කිරීමට) තම ශක්තිය ලබා ගැනීම වෙත රුසියානු සමාජ–ප්‍රජතාන්ත්‍රිකයන් තවමත් එතරම් ලංවී නැත. එහෙත් අප ඌ ''මරාදැමීමට ඉදිරිපත්වමුද'' යන ප්‍රශ්නය රුසියාවේ සමස්ත අනාගතයටත් රුසියනු සමජ–ප්‍රජාතන්ත්‍රවාදයේ අනාගතයටත් ඉතා වැදගත්වෙයි. අපට 'ජයගත හැකියයි' ප්‍රත්‍යක්ෂ නොවීනම් ධෛර්යසම්පන්න ලෙස හා සාර්ථක ලෙස හමුදවක් ගොඩනැගිය හෝ රැස්කළ නොහැකියි.

අපේ පැරණි 'ආර්ථිකවාදීන්' දෙස හැරී බලමු. ඔව්හුද, තමන්ගේ විරුද්ධවාදීන්, ජැකොබින් වරුන් හා කුමන්ත්‍රනකරුවන් යයිද, (විශේෂයෙන් ''රබෝචිය දියල'' 10 වැනි කලාපය හා දෙවැනි සම්මේලනයේදී වැඩ සටහන පිළිබඳ විවාදයෙදී මර්තිනව් කළ කථාවත් කියවන්න) දේශපාලනයට මැදහත්වීමෙන් ඔවුන් මහජනයාගෙන් ඈත්වනු ඇතුයිද කම්කරුවන්ගේම උනන්දුව යානාදිය නොසලකා හැරීමෙන් කම්කරු පංති ව්‍යාපාරයේ මූලධර්ම අමතක කරන්නේයයිද ආදී වශයෙන්, සෝෂා නැගූහ. ඇත්ත වශයෙන්, ''කම්කරුවන්ගේම උනන්දුව'' යන්න මෙසේ කරපින්නාගත්තවුන් නම් නිර්ධන පංතියේ කාර්යභාරයන් පිළිබඳ තමන්ගේ පටු බොළඳ සංකල්ප කම්කරුවන් පිට පැටවීමට උත්සාහ කළ අවස්ථාවාදී බුද්ධිමත්තු වූහ. ඇත්තෙන්ම අර්ථිකවාදයට විරුද්ධවූවන් පැරණි ඉස්ක්‍රා වාදයෙන් කාහටත් පෙනෙන පරිදි සමාජ–ප්‍රජාතාන්ත්‍රික කටයුතුවල කිසිම අංශයක් අතහැර දැමූවේ හෝ පසුපසට ඇද දැමූවේ හෝ නැත. එසේම ඔවුන් ආර්ථික සටන මදකටවත් අමතක කළේද නැත. නමුත් ඒ අතරම, හදිසි දේශපාලන කාර්යභාරයන් පූර්ණ හා පුළුල් ලෙස ඉදිරිපත් කිරීමට ඔවුන්ට හැකිවූ අතර, කම්කරු පක්ෂය ලිබරල්වාදී ධනපති පංතියේ ''ආර්ථික'' වල්ගයක් බවට පෙරැළීමට ඔව්හු සම්පූර්ණයෙන් විරුද්ධ වූහ.

දේශපාලනය, ආර්ථක්‍රමය මත පදනම්වී ඇතැයි වචනාර්ථයෙන් පමනක් දැනගත් අර්ථවාදිහු, ඉන් අදහස්වන්නේ දේශපාලන සටන ආර්ථික සටන වශයෙන් සැලකිය යුතුබව යයි ''අවබෝධකර ගත්හ''. ප්‍රජාතාන්ත්‍රික විප්ලවයේ ආර්ථික පදනම ධනපති පංති විප්ලවයයි නව ඉස්ක්‍රා කාරයින් වචනාර්ථයෙන් උගත්හ. ඉන් අදහස්වන්නේ, නිර්ධන පංතියේ ප්‍රජාතාන්ත්‍රික ඉලක්ක ධනේෂ්වර මධ්‍යම ප්‍රතිපදවේ මට්ටමට පහත හෙළිය යුතුයයිද, ''ධනපති පංතිය ඉවත් විය හැකි'' සීමාව ඉක්මවා නොයා යුතුබව යයිද ''අවබොධ කරගත්හ''. කම්කරුවන්ගේම උත්සාහය අවදිකරවීමේ හා පිරිසිදු පංති ප්‍රතිපත්තියක් අනුගමනය කිරීමේ ව්‍යාජයෙන්, තමන්ගේ වැඩකටයුතු වඩාත් හරබර කිරීමේ ව්‍යාජයෙන්, ආර්ථිකවාදින් විසින් ඇත්තෙන්ම කරනු ලැබුවේ, කම්කරු පංතිය ලිබරල්වාදී ධනපති දේශපාලනඥයින් අතට පත්කිරීමයි. එනම් වාස්තවික වශයෙන් එම ප්‍රතිඵලයම ගෙන දෙන මාවතක් ඔස්සේ පක්ෂය ගමන්කරවීමයි. එම ව්‍යාජයෙන්ම නව ඉස්ක්‍රා කාරයයෝද ප්‍රජාතාන්ත්‍රික විප්ලවයේ දී නිර්ධන පංතියේ උවමනාවන් ධනපති පංතියට ඇත්ත වශයෙන්ම පාවාදෙමින්, කටයුතු කරන්නාහ. එනම් වාස්තවික වශයෙන් එම ප්‍රතිඵලයම දෙන මාවතක්



ඔස්සේ පක්ෂය ගමන්කරවන්නාහ. දේශපාලන සටනේදී නායකත්වය ගැනීම සමාජ–ප්‍රජාතන්ත්‍රිකයන් සතු කාරියක් නොව නියමවශයෙන් ලිබරල්වාදින් සතු කාරියකැයි අර්ථවාදිහු කල්පනා කළහ. එසේම ප්‍රජාතාතන්ත්‍රික විප්ලවය ක්‍රියාශිලීව සම්පූර්ණ කිරීම සමාජ–ප්‍රජාතාන්ත්‍රිකයන් සතු කටයුත්තක් නොව නියමවශයෙන් ප්‍රජාතාන්ත්‍රික ධනපති පංතිය සතු කාරියකැයි නව ඉස්ක්‍රාකාරයෝ කල්පනාකරති — ඔවුන් ඉදිරිපත් කරන තර්කය නම්, නිර්ධන පංතිය පුරෝගාමී හා වැදගත් තැන ගතහොත් ඉන් විප්ලවයේ ''ක්ෂේත්‍රය පටුවනු'' බවයි.

කොටින් කියතොත්, දෙවැනි පක්ෂ සම්මේලනයෙදී ඇතිවූ ප්‍රභවය අනුව පමණක් නොව, දැන් ප්‍රජාතාන්ත්‍රික විප්ලවයේදී නිර්ධන පංතිය සතු උපක්‍රමීය කාර්යභාරයන් ඉදිරිපත් කරන අකාරයෙන්ද, නව ඉස්ක්‍රාවාදීහු අර්ථිකවාදයේ රූකඩ වෙති. ඔව්හුද පක්ෂයේ බුද්ධිමත් අවස්ථාවාදී කණ්ඩායමක් හැටියට සිටිති. සංවිධාන ක්ෂේත්‍රයේදී, බුද්ධිමතුන්ගේ අරාජික පුද්ගලවාදයෙන් ගමන පටන්ගත් ඔව්හු, පක්ෂයේ ප්‍රකාශන කටයුතු පක්ෂ සංවිධානයෙන් වෙන් කිරීම, අනියම් හා සාමාන්‍යයෙන් අවස්ථා හතරකින් යුත් මැතිවරන පැවැත්වීම, ප්‍රජාතාන්ත්‍රික නියෝජනය වෙනුවට බොනපාට්වාදී ඡන්දබල ක්‍රමයක් ඇතිකිරීම, හා අවසාන වශයෙන් සියල්ලන් අතරේ ''එකඟත්වයක්'' පිළිබඳ ප්‍රතිපත්තිය අනුගමනය කිරීම ආදී, සාකච්ඡා සභාව විසින් අනුමතකරනු ලැබූ 'නීති'[58] පනවමින් ''අවුල්කිරීමේ ක්‍රියාමාර්ගයකින්'' අවසන් කළහ. පක්ෂ උපක්‍රම සම්බන්ධයෙන්ද ඔව්හු එම පල්ලම දිගේම ලිස්සාගියහ. 'සෙම්ස්ත්වෝ ව්‍යාපාරය පිළිබඳ සැලැස්ම'[59] මගින් සෙම්ස්ත්වෝ කාරයනට කරණ ලද දේශණා 'උසස්ම අන්දමේ පෙළපාලිය' යයි ඔවුන් ප්‍රකාශ කරණ ලද්දේ දේශපාලන ක්ෂේත්‍රයේ තිබෙන්නේ ආණ්ඩුව සහ ධනපති පංතිය වශයෙන් වූ ක්‍රියාකාරී බලවේගයන් දෙකක් පමණක්බව (ජනවාරි 9 දින ආසන්නයේදී!) පෙන්වා දෙමිණි. සන්නද්ධ වනසේ ආයාචනා කෙරෙන ඍජු ව්‍යවහාරික සටන් පාඨය අතහැර ඒ වෙනුවට, ''තමන් විසින්ම අවි දැරීමේ තදබල ආශාවකින් මහජනයා සන්නද්ධ කරන්නැ'' යි යන සටන්පාඨය යොදගත් ඔව්හු, සන්නද්ධකිරීම පිළිබඳ හදිසි බැරෑරුම් ප්‍රශ්නය ''වඩාත් ගම්භීර'' කළහ. අවිගත් ජනතා නැගිටීමක් හා තාවකාලික ආණ්ඩුවක් පිහිටුවීම මෙන්ම විප්ලවීය ප්‍රජාතාන්ත්‍රික ආඥදායකත්වයත් සමග සම්බන්ධවූ කාර්යභාරයන්, දැන් ඔවුන් විසින් තම නිල යෝජනා මගින් විකෘත කොට කප්පාදු කොට දමා තිබේ. ''ධනපති පංතියට ඉවත්වීමට ඉඩ නොදෙනු''යන අන්තිම යෝජනාවේ

මේ අවසාන හඬතුළින් ඔවුන්ගේ ගමන් මග අනුව පක්ෂය කොතැනකට ගමන්කරත්ද යන ප්‍රශ්නයට සම්පූර්ණ පිළිතුරු ලැබේ.

සමාජ හා ආර්ථික සන්දර්භය අතින් රුසියාවේ ප්‍රජාතාන්ත්‍රික විප්ලවය ධනපති පංතික විප්ලවයක් වෙයි. එහෙත් මේ මාක්ස්වාදී සත්‍ය නිගමනය නිකම් උච්චාරනය කිරීම පමණක් ප්‍රමානවත් නොවේ. එය හොඳින් තේරුම් ගෙන දේශපාලන සටන්පාඨ සකස්කිරීමේදී හොඳින් ප්‍රයෝජනයට ගත යුතුය. සාමාන්‍යයෙන්ම මෙකල ඇති සියලුම දේශපාලන අයිතිවාසිකම්, එනම්, ධනවාදී නිෂ්පාදන සම්බන්ධකම් ධනේශ්වර අයිතිවාසිකම් වන්නේය. විමුක්තිය සඳහා කරන ඉල්ලීමෙන් ප්‍රකට කරන්නේ මූලික වශයෙන්ම ධනපති පංතියේ උවමනාවන්ය. මෙම ඉල්ලීම පලමුවෙන්ම මතුකරන ලද්දේ ඔවුන්ගේ නියෝජිතයෝය. එය අනුගමනය කරන්නෝ ස්වාමි පක්ෂය ලෙසින් එසේ දිනාගත් අයිතිවාසිකම්, සැමතන්හිදීම, මධ්‍යස්ථ හා පරික්ෂාකාරී ධනපති පංතික උපකරනවල තත්ත්වයට පහත හෙලමින් එවා, සාමකාමී අවදියේදී නිර්ධන පංතිය මර්දනය කරන ඉතා සියුම් ක්‍රම ලෙසිනුත් කලබල ගහන අවදියේදී නිර්ධන පංතිය මර්දනය කරන කෲර මිලෙච්ඡ ක්‍රම ලෙසිනුත් ප්‍රයෝජනයට ගත්හ.

එහෙත් මේ නිසා, විමුක්තිය සඳහා කරන සටන ප්‍රතික්ෂේප කළ යුතු බවට හෝ සුළුකොට තැකිය යුතු බවට නිගමනය කළ හැක්කේ කැරලිකාර නරෝද්නික්වරුන්ට, අරාජිකවාදීන්ට හා ''ආර්ථිකවාදීන්ට'' පමනි. මේ බුද්ධිමත් විකෘත උගැන්වීම් නිර්ධන පංතිය මත පැටවිය හැක්කේ ඔවුන්ගේ කැමැත්තට පටහැනිව තාවකාලික වශයෙන් පමණකි. තමන්ට දේශපාලන විමුක්තිය අවශ්‍ය බව නිර්ධන පංතිය විසින් සැමවිටම ආවේනික හැඟීමෙන් යුතුව අවබෝධකරගෙන ඇත. එම නිදහසේ නුදුරු ප්‍රතිඵලය වනුයේ ධනපති පංතිය ශක්තිමත් වීම හා සංවිධානයවීම නමුත්, අන්කවරෙකුටත් වඩා ඔවුන්ට එය අවශ්‍ය විය. නිර්ධන පංතිය තමන්ගේ ගැලවීම ලැබීමට බලාපොරොත්තුවන්නේ, පංති සටන මගහැර යාමෙන් නොව එය වැඩි දියුණු කොට එහි අනාගත ඉඩකඩ, හැඟීම, සංවිධානය හා අධිෂ්ඨානය වැඩිකිරීම මගිනි. දේශපාලන සටනේ කාර්යභාරයන් පහත් තත්ත්වයට හෙලන කවරෙකු වුවද කරන්නේ, ජනතාවගේ ආරක්ෂකයා වන සමාජ–ප්‍රජාතන්ත්‍රවාදියා වෘත්තිය සංගම් ලේකම් කෙනෙකු බවට පත්කිරීමයි. ධනපති ප්‍රජාතාන්ත්‍රික විප්ලවයකදී නිර්ධනපංතියේ කාර්යභාරයන් පහත හෙලන කවරෙකු වුවද කරන්නේ, ජනතා විප්ලවයේ නායකයා වන සමාජ–ප්‍රජාතාන්ත්‍රිකයා නිදහස් වෘත්තීය සංගම් නායකයෙකු බවට පත්කිරීමයි.



**ඔව්, විප්ලවය මහජනයාගේයි.** මහජනතාව යන පදය ධනපති ප්‍රජාතන්ත්‍රිකයන් විසින් වැරදි ලෙස ප්‍රයෝජනයට ගනු ලැබීමට විරුද්ධව සමාජ–ප්‍රජාතාන්ත්‍රවාදය සටන් කර තිබේ. යුක්ති යුක්තව ඔව්හු දනුදූ එසේ කරති. මහජනතාව අතර ඇති පංති ප්‍රතිවිරොධතා අවබෝධ කිරීමට අසමත්වීම වසාගනු සඳහා එම පදය ප්‍රයෝජනයට නොගන්නාසේ එය කියා සිටී. නිර්ධන පංති පක්ෂයේ සම්පූර්ණ පංති ස්වාධීනතාවය තිබීමේ අවශ්‍යතාවය එය අවධාරනයෙන්ම පෙන්වා ඇත. එහෙත් එය, 'මහජනතාව' ''පංතිවලට'' බෙදා වෙන්කරයි. එසේ කරන්නේ, ඉදිරියට ගිය පංතිය ඒ තුළම හිරවී, ලෝකයේ ආර්ථික පාලකයන් ඇත්වේය යන බියෙන් තම ක්‍රියාකාරිත්වය කප්පාදුකොටගෙන, පටු ඉලක්කවලට සීමාවී සිටිනු සඳහා නොවේ. එසේ කරන්නේ, අතරතුරෙහි සිටින පංතීන්ගේ උදාසීනත්වයෙන් චපල බවෙන් හා අස්ථිර බවෙන් නොපෙලෙන ඉදිරියට ගිය පංතියට, වඩාත් දැඩි ශක්තියකින් හා උද්‍යොගයකින් යුතුව සමස්ත ජනතාවගේ නායකත්වය ගෙන, ඔවුන්ගේ අභිප්‍රායයන් සඳහා සටන්කිරීමට හැකිවනු පිනිසය.

ප්‍රජාතාන්ත්‍රික විප්ලවයේ ක්‍රියාශීලී දේශපාලන සටන්පාඨ වෙනුවට සියලු ලිංග හා විභක්ති අනුව ''පංතිය'' යන පදය පුරසාරම් වශයෙන් පුන පුනා උච්චාරනය කරමින් සිටින වර්තමාන නව ඉස්ක්‍රාකාරයන් නිතරම තේරුම්ගැනීමට අසමත්වන්නේද එයයි!

ප්‍රජාතාන්ත්‍රික විප්ලවය වනාහී ධනපති පංතික විප්ලවයකි. පරිහානියට පත්, නූගත් එහෙත් ආලෝකය හා සැපත සඳහා වෙහෙසෙන ගොවි ජනයාගේ ඉතා ප්‍රචලිත සටන්පාඨය වන — කළු නැවත බෙදීම හෝ ඉඩම් හා විමුක්තිය — යන සටන්පාඨයද ධනපති පංතික එකකි. ධනපති පංතික නිදහස හා ධනපති පංතික ප්‍රගතිය පිළිබඳ මාවත හැරෙනවිට, නිර්ධන පංතියට නියම නිදහස ලබාදෙන වෙනත් මාවතක් නැතිබව හා ඇතිනොවන බව මාක්ස්වාදීන් වන අපි දැනගත යුතුවෙමු. සම්පූර්ණ දේශපාලන විමුක්තියත්, ප්‍රජාතාන්ත්‍රික සමූහාණ්ඩුව හා ගොවිකම්කරු විප්ලවකාරී ප්‍රජාතාන්ත්‍රික ආඥාදායකත්වයත් වෙතට සමාජවාදය ළංකරන වෙනත් කිසිම මගක් දැනට නැතිවා මෙන්ම ඇතිවිය නොහැකිබවද අප විසින් අමතක කළ යුතු නැත. ඉදිරියට ගිය හා එකම විප්ලවකාරී පංතියේ — කිසිම සීමාවීමක්, සැකයක් හෝ ආපසු හැරීමක් නැතිව විප්ලවකාරී වූ පංතියේ, නියෝජිතයන් වශයෙන් අප විසින්, ප්‍රජාතන්ත්‍රික විප්ලවයේ කාර්යභාරයන් හැකිතරම් පුළුල් ලෙස, එඩිතර ලෙස හා උනන්දුවෙන්ද සමස්ත ජනතාවටම පිළිගැන්විය යුතුය. මෙම

කාර්යභාරයන් සුළු කොට තැකීම, න්‍යායය අනුව බලනවිට මාක්ස්වාදය විහිලුවක් බවට පත්කිරීමකි. අශ්ලීල ආකාරයට එය විකෘත කිරීමකි. ප්‍රායෝගික දේශපාලනයේදී ඉන් අදහස් වන්නේ, විප්ලවය ස්ථිර ලෙස ගෙනයාමේ කාර්යභාරයෙන් නිසැකවම ඉවත්වන ධනපති පංතියට විප්ලවයේ ඉදිරිමග පාවාදීමකි. විප්ලවයේ සම්පූර්ණ ජයග්‍රහණය පිළිබඳ මාවතේ රැඳුනු දුෂ්කරතා ඉතා විශාලය. තමන්ට හැකි සෑම ප්‍රයත්නයක්ම දැරීමෙන් පසුව, ඒවා ධනපති පංතියේ ද්‍රොහීබව, ප්‍රතිගාමීත්වයේ විරෝධය හා පොදුජනයාගේ නො දැනුවත් කම නිසාම පරාජයට පත්වන්නේනම්, එතැනදී නිර්ධන පංතියේ නියෝජියනට දෙස්පැවරීමට කිසිවෙකුට නුපුළුවන. එහෙත්, ජයග්‍රහණය කිරීමට ඇති බිය නිසා, ධනපති පංතිය ඉවත්වේය යන අදහස අනුව කටයුතු කිරීම නිසා, සමාජ–ප්‍රජාතාන්ත්‍රිකයන් විසින් ප්‍රජාතන්ත්‍රික විප්ලවයේ, විප්ලවීය ශක්තිය දුර්වල කොට විප්ලවීය ජීවය නසනු ලබයි නම්, එහිදී සෑම කෙනෙකුන්ම විසින්, ප්‍රධාන වශයෙන් පංති හැඟීමෙන් යුතු නිර්ධන පංතිය විසින් ඔවුන් හෙලා දකිනු ඇත.

විප්ලවය ඉතිහාසයේ ප්‍රවර්තක යන්ත්‍රය වේ යයි මාක්ස් කීය.[60] විප්ලව සූරාකෑමට හා පීඩනයට ගොදුරු වූවන්ගේ ප්‍රීති උත්සව වෙති. පොදුජනතාවට නව සමාජයක නිර්මාතෘවරයින් ලෙසින් ක්‍රියාශීලීව පෙරට පැමිණීමට විප්ලව සමයකදී මෙන් වෙනත් කිසිම කාලයකද නැරිය. අනුක්‍රමික ප්‍රගතිය පිළිබඳ පටු අශ්ලීල මට්ටම අනුව සමකර බලනවිට, එබඳු අවදියකදී, ප්‍රාතිහාර්ය දැක්වීමට මහජනයා සමත්වේ. එහෙත් එබඳු කාලවලදී, විප්ලවකාරී පක්ෂවල නායකයන්ද ස්වකීය ඉලක්ක වඩාත් සුබාවබොධී හා පැහැදිලි කළයුතු වෙයි. ඔවුන්ගේ සටන්පාඨ සෑම විටම පොදු ජනයාගේ විප්ලවීය පෙර දැරිබවට: ඉදිරියෙන් සිටිමින්, තනිකරම, සම්පූර්ණයෙන් තීරනාත්මක, ජයග්‍රහණයට ඉතාමත් කෙටි, සෘජු මාවත දක්වන්නාවූද, අපේ සමාජවාදී හා ප්‍රජාතන්ත්‍රවාදී උදර අපේක්ෂාවන් ශොභාමත්ව, පූර්ණත්වයෙන් දක්වන්නාවූද, පහන්ටැඹක් විය යුතුය. විප්ලවයට හා සෘජු මාර්ගයට බිය වෙමින් සමථයකට එළඹීමේ වක්‍ර දීර්ඝමාර්ග සෙවීම අස්වබෂ්ජේනිය ධනපති පංතියේ අවස්ථාවාදීන්ට බාරකරමු. බලයෙන් එබඳු මාර්ග දිගේ බඩගෑමට අපට සිදුවේනම්, එදිනෙද සුළු කටයුතු තුළින් අපේ යුතුකම් සම්පූර්ණ කිරීමට අපට හැකිවනු ඇත. එහෙත් ප්‍රථමයෙන් ඒ මාවත තෝරා ගැනීම නිර්දය උග්‍ර සටනකට බාරකරමු. සෘජු, තීරනාත්මක මාවත තෝරාගැනීම සඳහා, ආත්ම පරිත්‍යාගයෙන් නිර්දය සටනක් කිරීම, සඳහා පොදු ජනතාව



සතු මේ උද්‍යොගය හා විප්ලවකාමය ප්‍රයෝජනයට නොගන්නේ නම්, අපි විප්ලවයට ද්‍රොහීවූවන් හා එය පාවාදෙනන් වන්නෙමු. බියගුලු බවෙන් යුතුව අනාගත ප්‍රතිගාමීත්වය ගැන සිත්යොමුකිරීමට ධනපති අවස්ථාවාදීන්ට ඉඩදෙමු. ප්‍රතිගාමීත්වය දරුනු ස්වභාවයක් ගැනීමට දිව්රුම්දීම හෝ ධනපති පංතිය ඉවත්වීමට අදහස්කිරීම හෝ ගැන සිතමින් කම්කරුවන් බියට පත්වන්නේ නැත. සමාදනවලට එළඹීමට හෝ සහන ලබා ගැනීමට හෝ කම්කරුවෝ බලාපොරොත්තු නොවෙති. ඔවුන් උත්සාහ ගන්නේ, නිර්දය අන්දමින් ප්‍රතිගාමී බලවේග සුන්කර දැමීමට යි. එනම් ගොවීන්ගේ හා නිර්ධනයන්ගේ විප්ලවකාරී ප්‍රජාතාන්ත්‍රික ආඥාදායකත්වයක් පිහිටුවීමටයි.

ඇත්තෙන්ම, සූරාකන්නන් කම්කරු පංතියට වේදනා ගෙනදෙමින් සෙමින් සෙමින් සූරාකෑමේ යෙදෙන කැළඹිලි රහිත ''යාත්‍රාගමන'' පහසු කාල පරිච්ඡේදවලට වඩා, කලබල ගහන කුණාටු සහිත කාලවලදී අපේ පක්ෂය නමැති නැවට වැඩි අන්තරාය එල්ලවේ. ඇත්තෙන්ම ''අන්ත විරුද්ධ පක්ෂය'' ලෙසින් සිටීමේ කාරියට හෝ තනිකරම පාර්ලිමේන්තු ක්‍රමයේ සටනක යෙදීමට හෝ වඩා විප්ලවීය ප්‍රජාතන්ත්‍රික ආඥාදායකත්වය පිළිබඳ කාර්යභාරයන් දහස්වරකින් සංකීර්ණ හා දුෂ්කර වෙයි. එහෙත් වර්තමාන විප්ලවීය තත්ත්වය යටතේ, පහසු යාත්‍රාගමන හා අනතරු රහිත ''විරුද්ධ පක්ෂයේ'' මාර්ගය ඔනෑකමින්ම තෝරාගැනීමට හැකිවන කාහට වුවද, සමාජ ප්‍රජාතන්ත්‍රික කටයුතු මොහොතකට අත්හැරීමට සිදුවේ. විප්ලවය අවසාන වනතෙක් උද්‍යොගීමත් දවස් ගෙවී යනතෙක් බලා සිටීමට සිදුවේ. යලිත්, එදිනෙද උදාසීන ජීවිතය පටන්ගත්විට ඔහුගේ පටු ගතානුගතිකත්වයන් තවදුරටත් එතරම් අප්‍රසන්න තත්ත්වයක් නොදරයි, නැතහොත් ඉදිරියට ගිය පංතියේ කාර්යභාරයන් එතරම් විරූපී ලෙස විකෘතකිරීමක් නොවෙයි.

සම්පූර්ණ නිදහසත්, ස්ථිර ප්‍රජාතාන්ත්‍රික විප්ලවයක් හා සමුහාණ්ඩුවක් සඳහාත් සමස්ත ජනතාවගේ, විශෙෂයෙන්ම ගොවිජනයාගේ පෙරමුණ ගෙන සිටින්න! සමාජවාදය සඳහා සියලුම සූරාකනුලැබූවන්ගේ හා වෙහෙසවන්නන්ගේ පෙරමුණ ගෙන සිටින්න! විප්ලවකාරී නිර්ධන පංතියේ ව්‍යවහාරික ප්‍රතිපත්තිය එසේ විය යුතුය. විප්ලව කාලයේදී සෑම උපක්‍රමීය ප්‍රශ්නයක්ම කම්කරුවන්ගේ පක්ෂයේ සෑම ව්‍යවහාරික පියවරක්ම විසඳනු ලැබීම තීරනය කරන්නාවූත්, ආධාරවන්නාවූත් පංති ව්‍යාපාරයෝ එවායි.

## පසුවදන

# යළිත් වරක් ''අස්වබෂ්ජේනිය'' වාදය, යළිත් වරක් නව ''ඉස්ක්‍රා'' වාදය

අපේ පොත්පිංචේ 8 වැනි පරිච්ඡේදය වැයකළ ප්‍රශ්නය සම්බන්ධයෙන් අස්වබෂ්ජේනිය පත්‍රයේ 71—72 කලාපවලින්ද ඉස්ක්‍රා පත්‍රයේ 102—103 කලාපවලින්ද අතිරේක කරුනු සම්භාරයක් ලැබේ. මේ අනගි කරුණු සියල්ලම මෙහිදී දක්විය නොහැකි බැවින් අපි ඉතාමත් වැදගත් කරුණුවලට පමණක් සීමාවෙමු. පළමුවෙන්ම අස්වබෂ්ජේනිය කාරයන් විසින් වර්නා කරනු ලබන සමාජ–ප්‍රජාතන්ත්‍රවාදයේ එන ''යථාර්ථවාදයත්'' ඔවුන් එය වර්ණනා කිරීමට හේතුවත්, දෙවනුව විප්ලවය හා ආඥාදායකත්වය යන සංකල්ප අතර සබඳකමට හේතුත් දක්වමු.

## I. ලිබරල්වාදී ධනපති යථාර්ථවාදීන් විසින් සමාජ-ප්‍රජාතන්ත්‍රික 'යථාර්ථීන්' වර්ණනා කරනුයේ කුමටද?

''රුසියානු සමාජ-ප්‍රජාතන්ත්‍රවාදයේ භේදය'' හා ''පොදු නුවන ජයගැනීම'' යන මාතෘකා යටතේ (''අස්වබෂ්ජේනිය'' 72 කලාපයේ) පලවූ ලිපිවලින් ලිබරල්වාදී ධනපති පංතිකයන් විසින් සමාජ–ප්‍රජාතන්ත්‍රවාදය පිළිබඳව දැරූ, අදහස් දක්වයි. එම අදහස් පංති හැඟීමෙන් යුතු නිර්ධන පංතිකයන්ට මහත්සේ වැදගත්ය. සෑම සමාජ–ප්‍රජාතාන්ත්‍රිකයෙකු විසින්ම මෙම ලිපි සම්පූර්ණයෙන් කියවිය යුතු බවට හා එවායේ සෑම වැකියක්ම කල්පනාවට ගතයුතු බවට නිර්දේශ කිරීමට අපට නුපුලුවන. පළමුවෙන්ම අපි, මෙම ලිපි දෙකේම අන්තර්ගත වූ ඉතාම වැදගත් යෝජනාවන් මෙහිදී උපුටා දක්වමු:



''සමාජ-ප්‍රජාතාන්ත්‍රික පක්ෂය කොටස් දෙකකට බෙදූ, මතභේදවල නියම දේශපාලන අර්ථය තේරුම්ගැනීමට පිටස්තර නිරීක්ෂකයෙකුට සාමාන්‍යයෙන් අමාරුය'' යි ''අස්වබෂ්ජේනිය'' පත්‍රය පවසයි. ඉදිරිගමනේ යහපත තකා ඇතැම් එකඟවීම් අනුමත කරන ''සුළු පිරිසට'' වෙනස්වූ, ''වැඩි පිරිස'' වඩාත් සවාධීන හා නොවැනෙන සුලු කණ්ඩායම ලෙසින් නම්කිරීම සම්පූර්ණයෙන් නිවැරදි නොවේ. එසේම එය සම්පූර්ණ හැඳින්වීමක් ද නොවේ. කෙසේවුවද, මාක්ස්වාදී චින්තනයේ, සම්ප්‍රදායික මත ලෙනින් කණ්ඩායමටත් වඩා දැඩි උනන්දුවකින් සුළුපිරිස විසින් පිලිපදිනු ලැබේ. පහත සඳහන් හැඳින්වීම වඩාත් නිවැරදියි අපට හැඟේ. ''වැඩිදෙනාගේ මූලික දේශපාලන පිළිවෙත වනුයේ, තනිකර විප්ලවවාදය, කැරලිකාර බව, හා මහජනයාගේ නාමයෙන් කුමන හෝ සෑම මගක්ම අනුගමනයකරමින් ඔවුන් අතර කැරැල්ල ඇතිකොට වහා බලය අල්ලා ගැනීමේ උනන්දුවයි. මින් ''ලෙනින්වාදීන්'' එක්තරා පමණකට සමාජවාදී විප්ලවකාරීන්ට කිට්ටු වන අතරම, පංති සටන පිළිබඳ අදහස් යටකොට ඔවුන් සිත්තුළ සමස්ත රුසියන් ජනයාගේ විප්ලවය පිළිබඳ අදහස් ඉස්මතුකරයි. ප්‍රායෝගිකයේදී සමාජ–ප්‍රජාතාන්ත්‍රික උගැන්වීමේ බොහෝ පටු අදහස් අත්හරින ලෙනින්වාදීහු අනික් අතින් විප්ලවවාදයේ පටු අදහස්වලින් වෙලී, වහා කැරැල්ලක් සූදනම් කිරීමේ කටයුතු හැර සෙසු සියලු ප්‍රායෝගික කටයුතු ප්‍රතික්ෂේප කරමින් නීත්‍යානුකූල හා අර්ධ නීත්‍යනුකූල සියලු උද්ඝෝෂන ක්‍රමත් වෙනත් විරුද්ධවාදී නැඹුරුවීම් සමග ප්‍රායෝගික වශයෙන් ප්‍රයෝජනවත් සියලුම සම්මුති ආදියත් ප්‍රතිපත්ති වශයෙන් නොසලකා හරිති. මීට වෙනස්වන සුළු පිරිස මාක්ස්වාදී උගැන්වීම දැඩිව අනුගමනය කරන අතරම මාක්ස්වාදී ලෝක දැක්මේ යථාර්ථවාදී කොටස් රැකගනිති. මෙම කණ්ඩායමේ මූලික අදහස නම් ''නිර්ධන පංතියේ'' අපේක්ෂාවන් ධනපති පංතියේ අපේක්ෂාවන්ට සතුරුකිරීමයි. එහෙත් අනික් අතට, නිර්ධන පංතියේ සටන ඇතිවන්නේ, ඇත්තවශයෙන්ම සමාජ–ප්‍රජාතන්ත්‍රවාදයේ වෙනස්කළ නොහෙන මත විසින් නියම කරනු ලැබූ එක්තරා සීමාවන් තුළ මෙම සටනේ සියලු නිශ්චිත තත්ත්වයන් හා ඉලක්ක පිළිබඳ පැහැදිලි අවබෝධයක් සහිතව යථාර්ථවාදී සිහිබුද්ධිමත් ආකාරයෙනි. කණ්ඩායම් දෙකෙන් එකක්වත්, තමන්ගේ මූලික අදහස් සම්පූර්ණයෙන් දැඩිව ක්‍රියාත්මක නොකරයි. මන්ද යත්, දෘෂ්ටිමය හා දේශපාලන කටයුතුවල දී ඔවුන්, යටත් පිරිසෙන් සමාජවාදී විප්ලවකාරීන් කරන පරිදි, ''ලෙනින්වාදීන්'' නොසෙල්වෙන විප්ලවකාරීන් වීමෙන් වලක්වන්නාවූද, ඉස්ක්‍රාවාදීන් කම්කරු පංතියේ නියම දේශපාලන ව්‍යාපාරයේ ප්‍රායෝගික නායකයන් වීමෙන් වලක්වන්නාවූ ද, සමාජ–ප්‍රජාතන්ත්‍රවාදී ධර්මයේ දැඩි නියමයන්ගෙන් බැඳී ඇති බැවිනි.

මෙසේ ඉතා වැදගත් යෝජනාවල අඩංගු දේ උපුටා දැක්වීමෙන් පසුව ''අස්වබෂ්ජේනිය'' ලේඛකයා, ඒගැන නිශ්චිත අදහස් දක්වමින් ''තවදුරටත් තමන්ගේ සාමාන්‍ය'' කල්පනා ''පැහැදිලිකිරීමට උත්සාහ දරයි. තුන්වැනි සම්මේලනය සමග සසඳා බලනවිට ''සුළු

පිරිසගේ සාකච්ඡා සභාව අවිගත් කැරැල්ලක් සම්බන්ධයෙන් සම්පූර්ණයෙන්ම වෙනස්වූ ආකල්පයක් දරන්නේය'' යි පවසන ඔහු මෙසේද කියයි. ''අවිගත් කැරැල්ලක් කෙරේ දක්වන ආකල්පය සම්බන්ධයෙන් බලනවිට,''තාවකාලික ආණ්ඩුවක් පිළිබඳ වූ ඒ ඒ යෝජනා අතරද වෙනසක් වේ.''කම්කරුවන්ගේ වෘත්තීය සංගම් සම්බන්ධයෙන්ද එවැනිම වෙනසක් පෙනේ.කම්කරු පංතියට දේශපාලන අධ්‍යාපනය දීමේ හා ඔවුන් සංවිධානය කිරීමේදී, ඉතා වැදගත්වන මේ ආරම්භක ස්ථානය ගැන ''ලෙනින්වාදීහු'' තම යෝජනාවේ කිසිවක් සඳහන් නොකරති. අනික් අතින්, සුළු පිරිස එක්වී ඉතා දැඩි යෝජනාවක් සකස්කළහ.'' ලිබරල්වාදීන් සම්බන්ධයෙන් කණ්ඩායම් දෙකම එකම අදහස් දරති. එහෙත්, ලිබරල්වාදීන් කෙරෙහි දක්වන ආකල්පය සම්බන්ධයෙන් දෙවන සම්මේලනයේ දී අනුමත කරගත් ප්ලෙහානව්ගේ යෝජනාව එහෙම පිටින්ම වාගේ යළිත් ඉදිරිපත් කරන තුන්වැනි සම්මේලනය, තමන් විසින්ම අනුමත කරන ලැබූ ලිබරල්වාදීන් දෙස වඩා හිතවත් ලෙසින් බලන ස්තරවේර්ගේ යෝජනාව බැහැරකරයි. ගොවිජන ව්‍යාපාරය පිළිබඳ සම්මේලනයේ හා සාකච්ඡා සභාවේත් යෝජනා සමස්තයක් වශයෙන් සමාන වන නමුත්, ''වැඩි පිරිස'' ඉඩම්හිමියන්ගේ විශාල ගම්බිම් හා වෙනත් ඉඩම් විප්ලවකාරී ලෙස ජනසන්තක කිරීමේ අදහස් කෙරෙහි වඩා දැඩි උනන්දුවක් දක්වන අතර, ප්‍රජාතාන්ත්‍රික රාජ්‍යයක් හා පරිපාලන ප්‍රතිසංස්කරන ඉල්ලාසිටීම පදනම් කොටගෙන උද්ඝෝෂන කිරීමට ''සුළු පිරිසට'' උවමනා කෙරේ.

අවසාන වශයෙන් ''අස්වබෂ්ජේනිය'' පත්‍රයේ ලේඛකයා ''ඉස්ක්‍රා'' පත්‍රයේ සියවෙනි කලාපයෙන් මෙන්ෂේවික්වාදී යෝජනාවක් උපුටා දක්වයි. එහි ප්‍රධාන ඡේදය මෙසේයි. ''වර්තමානයේ දී, රහසේ සැඟවී කරන කටයුතුවලින් පමනක් පොදුජනයා ප්‍රමානවත් තරමින් පක්ෂ ජීවිතයට සම්බන්ධකර ගත නොහැකි බැවින්ද ඒ නිසා පක්ෂය නීතිවිරොධී සංවිධානයක් ලෙසින් යම්තරමකට පොදුජනයාට පෙනීයාහැකි බැවින්ද, පක්ෂය විසින් නීත්‍යනුකූල පදනමක් මත කම්කරුවන්ගේ වෘත්තීය සංගම් සටනේ නායකත්වය ගෙන එම සටන සමාජ–ප්‍රජාතාන්ත්‍රික කාර්ය භාරයන් සමග එක්කළ යුතුවෙයි.'' මෙම යෝජනාව සම්බන්ධයෙන් අදහස් දක්වන අස්වබෂ්ජේනිය පත්‍රය මෙසේද ප්‍රකාශ කරයි. ''උපායමාර්ග සම්බන්ධයෙන් සමාජ ප්‍රජාතන්ත්‍රවාදී පක්ෂයේ නිශ්චිත කොටසකට හරි අවබොධය ලැබීමේ සාක්ෂ්‍යක් වන මෙම යෝජනාව සාමාන්‍ය දැනීමේ ජයග්‍රහණයක් ලෙස අපි සාදරයෙන් අගයකරමු.''

අස්වබෂ්ජේනියවාදීන්ගේ වැදගත් අදහස් සියල්ලම දූත් පාඨකයා හමුවේ ඇත. වාස්තවික සත්‍යයට ගැලපේය යන මතය අනුව මෙම අදහස් නිවැරදියයි පිළිගැනීම ඇත්තෙන්ම ලොකුම වැරැද්ද වනු ඇත. ඒ තුළ සෑම පියවරක් පාසාම ඇති වැරදි සොයා ගැනීම සෑම සමාජ-ප්‍රජාතාන්ත්‍රිකයෙකුටම පහසු කාරියක් වනු ඇත. මෙම අදහස් ලිබරල්



ධනපති පංතියේ අපේක්ෂාවන් හා සිතුම්පැතුම්වලින් දැඩිලෙස වෙලීගොස් ඇති බවත්, ඒ නිසාම ඒවා සම්පූර්ණයෙන්ම (ඡන්දයෙන් අගතියට) ? පැමිණ එක් අතකට බරවී ඇතිබවත් අමතක කිරීම බොළඳ ක්‍රියාවක් වනු ඇත. උත්තල හෝ අවතල වීදුරුවකින් වස්තුවක් පිළිබිඹුකර දක්වන්නා සේම, ඔවුහු සමාජ–ප්‍රජාතාන්ත්‍රිකයන්ගේ අදහස් පිළිබිඹුකර දක්වති. එහෙත් අවසාන වශයෙන්, තමන්ට වාසිදයක වන, ළංවන හා පිළිගතහැකි සමාජ–ප්‍රජාතාන්ත්‍රික නැඹුරුවීම් මොනවාද යනවගත්, එසේම තමන්ට අනතුරු ගෙනදෙන සතුරු හා බාහිරවූද නැඹුරුවීම් මොනවාද යනවගත් පංතියක් වශයෙන් නිසැකවම හොඳින් දන්නා ධනපති පංතියේ නියම අපේක්ෂාවන් මෙම විකෘත ධනපති පංතික අදහස් තුළින් පිළිබිඹුවන බව අමතක කිරීම වඩාත් විශාල වරදක් වනු ඇත. මෙන්ෂේවික් හෝ වේවා බෝල්ෂේවික් හෝ වේවා සමාජ–ප්‍රජාතන්ත්‍රවාදය හරිහැටි අවබෝධ කරගැනීමට මොනම ධනපති දර්ශණිකයකුට හෝ ප්‍රචාරකයකුට හෝ නුපුළුවන. එහෙත්, ඔහු යම්තමින්වත්, නුවනැති ප්‍රචාරකයෙක් නම් තමන්ගේ ආවේනික පංති හැඟීමට නොරැවටෙනු ඇත. ඔහු විසින් එය විකෘත ලෙසින් ඉදිරිපත් කිරීමට ඉඩ, ඇතත් එනිසා, සමස්තයක් වශයෙන් නිවැරදිව, සමාජ-ප්‍රජතන්ත්‍රවාදයේ ඒ ඒ නැඹුරුවීම්වල, ධනපති පංතිය සඳහා ඇති, වැදගත්කම හඳුනාගැනීමට ඔහුට හැකිවනු ඇත. අපේ සතුරා ගේ ආවේනික පංති හැඟීම හා ඔහුගේ පංති අදහස්, පංති හැඟීමෙන් යුතු සෑම නිර්ධන පංතිකයෙකුගේම දැඩි අවධානයට සැමවිටම ලක්විය යුත්තේ ඒ නිසායි.

ඉදින්, අස්වබෂ්ජේනියවාදීන් විසින් ප්‍රකට කර ඇති පරිදි රුසියන් ධනපති පංතියේ ආවේනික පංති හැඟීමෙන් හෙළිවන්නේ කුමක්ද?

නව ඉස්ක්‍රාවාදීන්ගේ නැඹුරුවීම ගැන තමන්ගේ සම්පූර්ණ ප්‍රසාදය පලකරන ඔවුහු යථාර්ථවාදය, චිත්ත සංයමය, පොදු නුවන ජයගැනීම හා උපායමාර්ග පිළිබඳ ප්‍රශ්නය සම්බන්ධයෙන් හරි අවබෝධය ලැබීමට පටන් ගැනීම, ප්‍රායෝගික බව ආදිය සම්බන්ධයෙන් එය වර්ණනාවට ලක්කරන අතර තුන්වැනි සම්මේලනයේ නැඹුරුවීම ගැන අප්‍රසාදය පළකරමින්, පටු අදහස් දූරීම, විප්ලවකාමය, කැරැලිකාර බව, හා ප්‍රායෝගික වශයෙන් ප්‍රයෝජනවත් සම්මති අත්හැරීම සම්බන්ධයෙන් එය දෝෂදර්ශනයට ලක්කරති. ධනපති පංතියේ ආවේනික පංති හැඟීම නිසා, අපේ ලිපිලේඛන මගින් ඉදිරිපත් කෙරුනු ඉතා ප්‍රබල කරුණු විසින් නැවත නැවතත් ස්ඵුටකරනු ලැබූ දේ වන්නේ, නව ඉස්ක්‍රාවාදීන් අවස්ථාවාදීන් වන බවත්, වර්තමාන රුසියානු සමාජ–ප්‍රජාතාන්ත්‍රික

ව්‍යාපාරයේ විප්ලවකාරී කණ්ඩායම ඔවුන්ගේ විරුද්ධවාදීන් වන බවත්ය. ලිබරල්වාදීන් ඉහතකී අපගේ (නව ඉස්ක්‍රාවාදීන්ගේ) නැඹුරුවීමට පක්ෂපාත වන අතර දෙවනුව කී අපගේ නැඹුරුවීමට විරුද්ධවීම ස්වාභාවිකයි. කම්කරු පංතියේ ''ප්‍රායෝගික බව, චිත්ත සංයමය හා කල්පනා කාරී බව'' නිසා එනම්, ධනවාදය, ප්‍රතිසංස්කරන හා වෘත්තීය සමිති සටන ආදියට පමණක් කම්කරු පංති ක්‍රියාකාරීත්වය සීමාවීම නිසා, ධනපති පංතියට ලැබෙන වාසිය කෙතරම්ද යන වග, ධනපති පංතික දෘෂ්ටිවාදීන් වන ලිබරල්වාදීහු හොඳින් දනිති. තම පංති අපේක්ෂාවන් ඉදිරියට ගෙන යාමට හා රුසියානු මහජන විප්ලවයකදී නායකත්වය නියතව ගැනීමට, උත්සුක වන නිර්ධන පංතිය ''විප්ලවකාරී පටු අදහස් දැරීම'' ධනපති පංතියට, භයානක හා අන්තරාදායීවෙයි.

කලින් ''අස්වබෂ්ජේනිය''පත්‍රය හා ස්ත්‍රුවේ මහතාද විසින් වහරනු ලැබූ ආකාරයෙන් පැහැදිලි වන වෙනත් කරුනු අතර අස්වබෂ්ජේනිය කංඩායමේ ''යථාර්ථවාදය'' යන පදයෙන් ගෙන දෙන නියම තේරුම එයයි. මෙය අස්වබෂ්ජේනිය ''යථාර්ථවාදයේ'' නියම තේරුම බව නොපිළිගෙන සිටීමට ඉස්ක්‍රා පත්‍රයට නුපුලුවන. නිදසුනක් ලෙස, ඉස්ක්‍රා පත්‍රයේ 73—74 අතිරේකවල පළවූ ''හොඳම වේලාව පැමිණ තිබේ'' යන ලිපිය ගෙන බලමු. ''පක්ෂ සම්මේලනයේදී අකීමව් නියම අවස්ථාවාදීත්වයේ නියෝජිතයකුට වඩා අවස්ථාවාදියෙකුගේ අවතාරයක් ලෙසින් රඟපෑවේය'' යි කියමින් එම ලිපිය ලියූ ලේඛකයා (රුසියානු සමාජ–ප්‍රජාතාන්ත්‍රික කම්කරු පක්ෂයේ දෙවැනි සම්මේලනයේදී ''මාර්ෂ්'' මතවල දැඩිව එල්බගෙන සිටියෙකි) අවංකව තම අදහස් පල කළේය. ඒ සමගම, පහත පලවන උපවාක්‍යය සඳහන් කරමින් ''හොඳම වේලාව පැමිණ තිබේ'' යන ලිපිය ලියූ ලේඛකයාගේ අදහස් නිවැරදි කිරීමට ''ඉස්ක්‍රා'' පත්‍රයේ කතුවරු උනන්දු වූහ.

''මෙම අදහසට එකඟවීමට අපට නුපුලුවන. වැඩසටහන පිළිබඳ අකීමව් සහෝදරයාගේ අදහස්වල අවස්ථාවාදයේ පැහැදිලි සලකුනු දක්නට ලැබේ. මෑත පලවූ අස්වබෂ්ජේනිය කලාපයකදී අකීමව් සහෝදරයා ''යථාර්ථවාදී'' නැඹුරුවීම — ''යථාර්ථවාදී'' යන්න සංශෝධනවාදී යනුවෙන් කියවන්න — අනුව යන්නෙකැයි සඳහන් කල නිරීක්ෂකයා විසින්ම මේ බව පිළිගෙන තිබේ.''

මෙනයින්, අස්වබෂ්ජේනියේ ''යථාර්ථවාදය'' අවස්ථාවාදය විනා අන්කිසිවක් නොවන බව ඉස්ක්‍රා පද හොඳින් දැන සිටී. ලිබරල් යථාර්ථවාදය''ට (ඉස්ක්‍රා — නො: 102) පහර ගසන්නේනම්, තමන්ගේ



යථාර්ථවාදය නිසා ලිබරල්වාදීන්ගේ ප්‍රශංසාවට එය ලක්වූ අයුරු ගැන දන් ''ඉස්ක්‍රා'' පත්‍රය කිසිවක් නොකියයි. මීට හේතුව නම්, එබඳු ප්‍රශංසාවක් දන් විරෝධයට වඩා දිරවීමට අපහසු බැවිනි. උපායමාර්ග පිළිබඳ අවබෝධය අතින් දරන වැරදි ස්වභාවයේ එලයක් වශයෙන් නව ඉස්ක්‍රා කාරයන්ගේ සෑම යෝජනාවක් තුළම ගැබ්වී ඇති සමාජ–ප්‍රජාතාන්ත්‍රික ''යථාර්ථවාදය'' (අවස්ථාවාදය යනුවෙන් කියවන්න) හා ලිබරල් යථාර්ථවාදයත් අතර පවත්නා මිත්‍රත්වය එබඳු ප්‍රශංසාවෙන් (අස්වබෂ්ජේනිය විසින් පළමුවරට හෝ අහම්බෙන් නොකළ ප්‍රශංසාවෙන්) හොඳින්ම ඔප්පුවේ.

ඇත්තෙන්ම, ''මහජන'' විප්ලවයේදී රුසියානු ධනපති පංතියේ චපලබව හා ආත්මාර්ථකාමීබව, ස්ත්‍රුවේ මහතාගේ තර්කවලින්ද, කොතෙකුත් ලිබරල් පුවත්පත්වල අඩංගුවන කරුණු හා ඉන් නැගෙන හඬින්ද, එසේම, සෙම්ස්ත්ව වාදීන් හා බුද්ධිමතුන් වැඩිදෙනෙකුගෙන් පොදුවේ ත්‍රුබෙට්ස්කොයි, පෙත්‍රුන්කෙවිච්, රෝදිචේව් ආදීන් අනුගමනය කරන නොයෙක් දෙනාගේ දේශපාලන ප්‍රකාශවලින්ද දැනටමත් සම්පූර්ණයෙන් අනාවරනය වී ඇත. එක් අතකින් නිර්ධන පංතිය හා ''ජනතාව'' ස්වකීය විප්ලවයේදී, හිතුවක්කාර රාජාණ්ඩුවට විරුද්ධ වෙඩි උංඩ හා තුවක්කු ලෙසින් ප්‍රයෝජනවත් වන නමුදු, අනික් අතින් නිර්ධන පංතිය හා විප්ලවකාරී ගොවිජනයා ''සාර්වාදය පරාජය කොට තීරනාත්මක ජයග්‍රහණයක් ලබා'' ප්‍රජාතාන්ත්‍රික විප්ලවය අවසානය දක්වා ගෙන ගියහොත් ඔවුන් ඉතාමත් අන්තරායකාරී පිරිසක්වන බව, ධනපති පංතිය විසින් සැමවිටම පැහැදිලිව අවබෝධ කර නොගන්නා නමුත්, එය විටින් විට හොඳින් සිතා ගැනීමට ආවේනික පංති හැඟීම නිසා ඔවුන්ට හැකිවී තිබේ. විප්ලවයේදී ''මධ්‍යස්ථ'' තැනක් ගැනීමෙන් සෑහීමට පත්වෙන ලෙසත්, වඩාත් යථාර්ථවාදීව ප්‍රායෝගිකව හා ආත්ම සංයමයෙන් සිටින ලෙසත්, තමන්ගේ කටයුතුවලදී ''ධනපති පංතිය ඉවත් නොවන අයුරින්'' ක්‍රියාකරන ලෙසත් නිර්ධන පංතිය පොලඹවා ගැනීමට ධනපති පංතිය සෑම උත්සාහයක්ම ගන්නේ ඒ නිසායි.

තමන්ට කම්කරු පංති ව්‍යාපාරයෙන් බේරීමට නොහැකිබව ධනපති පංතික උගත්තු හොඳින්ම දනිති. ඔවුන් කම්කරු පංති ව්‍යාපාරයට විරුද්ධව නොඑන්නේ එහෙයිනි. නිර්ධන පංතියේ පංති සටනට එරෙහිව පෙරට නොඑන්නේ එහෙයිනි. කම්කරු පංති ව්‍යාපාරය සහ පංති අරගලය බ්‍රෙන්ටානෝ[61] හෝ හිර්ෂ්-ඩුන්කර් ආකාරයෙන් තේරුම් ගෙන වැඩ වර්ජන අයිතිය සහ නම්බුකාර පංති අරගලය උදෙසා කථිකත්වයේ සේවය ලබාදෙති. වෙනත් අයුරකින්

කියතොත්, කම්කරුවන් ඔවුන්ගේ ''කැරලිකාරකම'' ''පටු කාල්පනික විප්ලවකාමය'',''ව්‍යාපාරික වශයෙන් ප්‍රයෝජනවත් සම්මුති'' කෙරෙහි දක්වන විරුද්ධත්වය, ''සමස්ත ජනතාවගේ රුසියානු විප්ලවය'' මත ඔවුන්ගේ පංති සටනේ, නිර්ධන පංතික අවලතාවයේ මෙන්ම නිර්ධන පංතික අධිෂ්ඨානයේ හා''ජ්වීනියන් ජැකොබින්වාදයේ''සටහන් තැබීමට තබන බලාපොරොත්තු හා කරන ප්‍රකාශ ආදිය අත්හැරදමන්නේ නම් කම්කරුවන්ට වැඩවර්ජනය කිරීමේ හා වෘත්තීය සමිති තුළ සංවිධානය වීමේ අයිතිය ''පවරාදීමට'' (කම්කරුවන් විසින්ම දැනටමත් බොහෝදුරට දිනාගෙන ඇති දෙය) ධනපති පංතිය සම්පූර්ණයෙන්ම සූදනම්ය. (ධනපති) ආත්ම සංයමයත්, (ලිබරල්) ප්‍රායෝගික බවත්, (අවස්ථාවාදී) යථාර්ථවාදයත්, (බ්‍රෙන්ටානෝ) පංති සටනත්, (හිර්ෂ්-ඩුන්කාර්) වෘත්තීය සමිති[62] ආදියත් පිළිබඳ අදහස් කම්කරුවන් තුළට කාවද්දනු පිනිස — පොත්පත්,* දේශන,ප්‍රචාරක කථා — ඇතුලු නොයෙකුත් ක්‍රම හා මාර්ග අනුගමනය කරමින්, රටපුරා සිටින ධනපති බුද්ධිමතුන් සෑම ප්‍රයත්නයක්ම දරන්නේ ඒ නිසායි. පසුව සඳහන් කළ සටන්පාඨ දෙක බාහිර පෙනුමෙන් මාක්ස්වාදී සටන්පාඨ වලට සමානව පෙනෙන නිසාත්, ඇතැම් සුළු විකෘත කිරීම් හා සංශෝධනවලින් පසුව පැටලිය හැකිවාමෙන්ම, සමාජ–ප්‍රජාතාන්ත්‍රික සටන්පාඨ ලෙස පෙන්විය හැකි නිසාත් ඒවා යෙදීම ''රාජාණ්ඩුවාදී ප්‍රජාතාන්ත්‍රික පක්ෂයේ හෝ අස්වබෂ්ජේනිය පක්ෂයේ ධනපතීන්ට ප්‍රයෝගික වශයෙන් පහසු වන්නේය. නිදසුනක් දක්වතොත්, ''රස්වියෙත්''[63] නමැති නීත්‍යනුකූල ලිබරල් පත්‍රය (අපි ඒ ගැන සවිස්තරව ප්‍රොලිතාරි පාඨකයන්ට පසුව කියාදෙමු) පංති සටන, ධනපති පංතිය විසින් නිර්ධන පංතිය රවටනු ලැබීමට ඇති ඉඩකඩ, කම්කරු පංති ව්‍යාපාරය, හා නිර්ධන පංතියේ උද්‍යොගය ආදී ''නිර්භීත'' දේ ගැන, කොතෙකුත් සඳහන් කරයි. එයින් නොසැලකිලිමත් පාඨකයාත්, අවබෝධය නොමැති කම්කරුවාත් ''සමාජ-ප්‍රජාතන්ත්‍රවාදය'' අවංක එක කැයි යන විශ්වාසයට පහසුවෙන් එළඹීමට ඉඩ සැලසේ. එහෙත් එය නියම වශයෙන්ම සමාජ–ප්‍රජාතන්ත්‍රවාදයේ ධනපති පංතික අනුකරනයකි. පංති සටනේ සංකල්පය අවස්ථාවාදීව විකෘතිකිරීමක් හා දූෂනය කිරීමකි.

ධනපති පංතියේ මේ යෝධ (පොදු ජනයා කෙරෙහි බලපෑමේ පුලුල්බව අනුව) ගැලවීමේ උපක්‍රමය පතුලේ රැඳී ඇත්තේ, ප්‍රධාන

---

* ප්‍රකපෝවිච්ගේ ''රුසියාවේ කම්කරු ප්‍රශ්නය'' සසඳා බලන්න.



වශයෙන්ම කම්කරු පංති ව්‍යාපාරය, වෘත්තීය සමිති ව්‍යාපාරයක තත්වයට පහත හෙලීමත්, ''කම්කරුවන්ගේ සිත් සතන් තුළ රුසියානු සමස්ත මහජන විප්ලවයක අදහස්, මතුකොට පංති සටන පිළිබඳ අදහස් යටපත් කිරීමත්,'' ස්වාධීන ප්‍රතිපත්තියකින් (එනම්, ප්‍රජාතාන්ත්‍රික ආණ්ඩුදයකත්වයක් දෙසට යොමුකරනු ලැබූ විප්ලවකාරී ප්‍රතිපත්තිය) හැකිතරම් දුරට ඔවුන් ඈත්කිරීමත් පිණිස යෙමුවූ නැඹුරුවීමකි.

පාඨකයාට පෙනෙන පරිදි, අස්වබෂ්ජේනිය සූත්‍රය අප විසින් ඔලුවෙන් සිටුවා තිබේ. මේ වනාහී ප්‍රජාතාන්ත්‍රික විප්ලවයකදී නිර්ධන පංතියේ කාර්යභාරය පිළිබඳ ධනපති පංතික මතය හා සමාජ–ප්‍රජාතාන්ත්‍රික මතය යන මත දෙක හොඳින් ප්‍රකට කරන අනර්ඝ සූත්‍රයකි. නිර්ධන පංතිය වෘත්තීය සමිති ව්‍යාපාරයට සීමා කිරීමටත්, එනයින්; දේශපාලන සටන පිළිබඳව කම්කරුවන්ගේ සිත්තුළ ඇති අදහස් ''තනිකර කම්කරු පංති'' ව්‍යාපාරයක් පිළිබඳ අදහස් තුළින් යටපත් කළ, ''Credo'' ප්‍රකාශනයේ බර්න්ෂ්ටයින්වාදී කතුවරුන් අනුවම යමින්'' සමස්ත රුසියන් මහජන විප්ලවයක් පිළිබඳ ඔවුන්ගේ අදහස්, (බ්‍රෙන්ටානෝ) පංති සටනේ අදහස් තුළින් යටපත් කිරීමටත් ධනපති පංතියට උවමනා කෙරේ. අනික් අතින් සමාජ-ප්‍රජාතන්ත්‍රවාදයට උවමනාකරන්නේ, නිර්ධන පංතියේ පංති සටන, සමස්ත රුසියානු මහජන විප්ලවයේදී ඔවුන්ට ප්‍රධාන තැන හිමිවන තරම් දුරට දියුණු කිරීමයි. එනම්, එම විප්ලවය, ගොවිකම්කරු ප්‍රජාතාන්ත්‍රික ආණ්ඩුදයකත්වයක් කරා ගෙනයාමයි.

අපේ රටේ විප්ලවය සමස්ත ජනතාවගේ විප්ලවයකැයි ධනපති පංතිය නිර්ධන පංතියට කියයි. එහෙයින් ඔබ වෙනම පංතියක් වශයෙන්, ඔබේ පංති සටනට සීමාවෙමින්, ''සාමාන්‍ය දැනීමේ'' නාමයෙන් වෘත්තීය සංගම් හා ඒවා නීත්‍යනුකූල බවට පත්කිරීම කෙරෙහි ප්‍රධාන වශයෙන්ම අවධානය යොමුකළ යුතුය මෙම වෘත්තීය සංගම්, ''ඔබේ දේශපාලන අධ්‍යාපනයේ හා සංවිධානයේ ඉතාමත්ම වැදගත් ආරම්භක ස්ථානය'' ලෙසින් සැලකිය යුතුය. එසේම විප්ලවකාරී තත්වයක් පැනනැගිවිට, නව ඉස්ක්‍රාවාදී යෝජනා මෙන් වැඩිවශයෙන්ම ''දැඩි'' යෝජනා සකස්කරමින් ''ලිබරල්වාදීන්ට වඩා හිතකර ලෙසින් පක්ෂපාතී වන'' යෝජනා ගැන පරීක්ෂාකාරී උනන්දුව යොමු කළ යුතුය. ''කම්කරු පංතියේ නියම දේශපාලන ව්‍යාපාරයේ ප්‍රායෝගික නායකයන්'' වීමට ලැදිකමක් දක්වන නායකයන් ගැන වැඩි කැමැත්තක් දක්වමින් (දැනටමත් ඔබ, අවාසනාවන්ත ලෙස මේ ''අවිද්‍යාත්මක'' දේවධර්මයේ ''දැඩි

නියමයන්ට යටවී ඇත්නම්) ''මාක්ස්වාදී ලෝක දර්ශනයේ යථාර්ථවාදී මූලිකාංග රැකගත'' යුතුය.

අපේ රටේ විප්ලවය සමස්ත ජනතාවගේ විප්ලවයකැයි සමාජ-ප්‍රජාතන්ත්‍රවාදය නිර්ධන පංතියට කියයි. එහෙයින්, ඉතාමත් ප්‍රගතිශීලී හා එකම දෘඩ විප්ලවකාරී පංතිය වශයෙන් ඔබ, ඉතාමත් ක්‍රියාශීලී තැන පමණක් නොව නායකත්වයද ගෙන කටයුතු කිරීමට උත්සාහ ගත යුතුය. එහෙයින් ඔබ, පංති සටනේ පටුකාල්පනික සීමාවන්ට, එනම්, ප්‍රධාන කොටම වෘත්තීය සංගම් ව්‍යාපාරයට, සීමා නොවී, ඔබේ පංති සටනට වර්තමාන සමස්ත රුසියානු ප්‍රජාතාන්ත්‍රික මහජන විප්ලවයේ සියලුම ඉලක්ක පමණක් නොව, පසුකාලීන සමාජවාදී විප්ලවයේ ඉලක්කද ඇතුලුවන පරිදි එහි සීමාවන් පුලුල්කිරීමට උත්සාහ කළ යුතුය. එහෙයින්, වෘත්තීය සමිති ව්‍යාපාරය අතපසු නොකරන අතරම, ඉතාම සුළු නීත්‍යානුකූල ඉඩප්‍රස්ථාවලින් පවා ප්‍රයෝජන ගැනීම ප්‍රතික්ෂේප නොකරන අතරම, ඔබ විප්ලවීය කාල පරිච්ඡේදයකදී, සාර්වාදය පරාජයකොට සම්පූර්ණ මහජන ජයග්‍රහනයක් ලැබීමේත්, ප්‍රජාතාන්ත්‍රික සමූහාණ්ඩුවක් දිනාගැනීමේ හා නියම දේශපාලන විමුක්තිය ළඟාකරගැනීමේත් ඒකායන මාර්ගය ලෙසින් අවිගත් කැරැල්ලක් පිළිබඳ කාර්යභාරයත්, විප්ලවීය හමුදවක් පිහිටුවීමේ හා විප්ලවීය ආණ්ඩුවක් නිර්මානය කිරීමේ කාර්යභාරයනුත් ඉදිරියටම ගෙනා යුතුය.

මේ ප්‍රශ්නය සම්බන්ධයෙන් නව ඉස්ක්‍රා කාරයන්ගේ යෝජනාවලින් ඉදිරිපත් කෙරෙන, ස්වභාවයෙන්ම ධනපති පංතියට ප්‍රියවූ උදසීන, චපල පිළිවෙත ගැන කතා කිරීම පමණ ඉක්මවූ දෙයක් වනු ඇත. මන්දයත් ඔවුන් ගත් ''මග'' වැරදි එකක්ම වන හෙයිනි.

## II. මර්තිනව් සහෝදරයා යළිත් ප්‍රශ්නය 'අරුත්සරු' කරයි

''ඉස්ක්‍රා'' පත්‍රයේ අංක 102 හා 103 වැනි කලාපවල පලවූ මර්තිනව්ගේ ලිපි දෙස අපි දූන් හැරී බලමු. එංගල්ස්ගේ හා මාක්ස්ගේ උධෘතපාඨ රාශියක් පිළිබඳ අර්ථ නිරූපන සම්බන්ධයෙන් අපේ වරද හා ඔහුගේ නිවරද ඔප්පුකිරීමට මර්තිනව් දූරූ උත්සාහයන්ට ඇත්තෙන්ම අපි මෙහිදී පිළිතුරු නොදෙමු. මෙම ප්‍රයත්න කෙතරම් නිෂ්ඵලදයත්, මර්තිනව්ගේ ගැයීමේ උපක්‍රම කෙතරම් ප්‍රකටදයත්, එසේම ප්‍රශ්නය කෙතරම් පැහැදිලිද යත්, මේ



කරුණ ගැන නැවතත් මිඩංගුවීම කොහෙත්ම නොවටී. පෙරමුණ සැමතැනින්ම පසුබැසීමේදී මර්තිනව් විසින් අනුගමනය කරන ලද බොලඳ කූටොපක්‍රම පහසුවෙන් තේරුම්ගැනීමට සෑම බුද්ධිමත් පාඨකයෙකුම සමත්වනු ඇත. විශේෂයෙන්ම ''ප්‍රොලිතාරී'' පත්‍රයට සම්බන්ධ කණ්ඩායමක් විසින් දූනට පරිවර්තනය කරඉගන යනු ලබන ''බකූනින්වාදීන් ක්‍රියා කරන හැටි'' නමැති එංගල්ස්ගේ පොත් පිංචත්, මාක්ස්ගේ 1850 මාර්තුවේ ''කොමියුනිස්ට් සංගමයේ මධ්‍ය මණ්ඩලයේ දේශනය''ත්[64] සම්පූර්ණ කොට ප්‍රසිද්ධ කරනු ලැබූ විට එසේ තේරුම් ගැනීමට ඔවුන් සමත්වනු ඇත. මර්තිනව්ගේ පසුබැස්ම පාඨකයාට තේරුම්ගැනීම සඳහා, ඔහුගේ ලිපියෙන් ගත් එක උද්ධෘත පාඨයක් වූවද ප්‍රමාණවත් වෙයි.

''ඉස්ක්‍රා'' පත්‍රයේ නො: 103 වැනි කලාපයෙන් මර්තිනව් මෙසේ කියයි. ''තාවකාලික ආණ්ඩුවක් පිහිටුවීම විප්ලවය වැඩිදුරටත් ඉදිරියට ගෙනයාමෙහි ලා ක්‍රියාත්මක කළ හැකි යෝග්‍ය මගක් බව ''ඉස්ක්‍රා'' පත්‍රය පිළිගනී. එහෙත් අනාගතයේදී සමාජවාදී විප්ලවයක් සඳහා රාජ්‍ය යන්ත්‍රය සහමුලින්ම අල්ලාගැනීමේ අපේක්ෂාව නිසාම, සමාජ–ප්‍රජාතන්ත්‍රවාදීන් ධනපති පංතික තාවකාලික ආණ්ඩුවකට හවුල්වීම ප්‍රතික්ෂේප කරයි.'' වෙනත් අයුරකින් කියතොත්, ''ඉස්ක්‍රා'' පත්‍රය, විප්ලවකාරී ආණ්ඩුවක් භාණ්ඩාගාරයට හා බැංකුවලට වගකීම ගැනත් ''බන්ධනාගාර'' අත්පත් කරගැනීමට නොහැකිකම හා එහි අන්තරාය ගැනත් තමන් කෙරේ තිබුනු බිය පදනම් රහිත එකක් බව දූන් පිළිගනී. එහෙත් ''ඉස්ක්‍රා'' පත්‍රය ඉහතදී මෙන්ම දූනුදු කරන්නේ, ප්‍රජාතාන්ත්‍රික ආඥදායකත්වය සමාජවාදී ආඥදායකත්වය සමග එකට පටලවමින් කරුණු අවුල්කිරීම පමණකි. පසුබෑම වසන්කිරීම නොහැක්කාක් මෙන් මේ අවුලද වැලැක්විය නොහැකිය.

නමුත් ''නව ඉස්ක්‍රා'' පත්‍රයේ අතිපංඩිතයන් අතුරෙන් මර්තිනව්, පළමුවෙනි පංතියේ අතිපංඩිතයෙකු ලෙසින්, නැතහොත්, කුශලතා පූර්ණ අතිපංඩිතයෙකු ලෙසින් කැපී පෙනේ. ප්‍රශ්නය ''අරුත්සරුකිරීමට'' ගත් දැඩි ප්‍රයත්න නිසා එය අවුල්කර දමන ඔහු, තමන්ගත් මගෙහි සම්පූර්ණ ව්‍යාජභාවය මැනවින් පෙන්වන, අලුත් සූත්‍ර වෙතට එක්වරම මෙන් පිවිසෙයි. අර්ථවාදය පැවති කාලයේදී, ඔහු විසින්, ප්ලෙහානව්ගේ අදහස් ''අරුත්සරු කරමින්,''''ස්වාමි පක්ෂයට හා ආණ්ඩුවට විරුද්ධව ආර්ථික සටනක්'' යන සූත්‍ර සකස්කරනු ලැබූ අයුරු ඔබට මතක ඇත. මේ නැඹුරුවීමේ ව්‍යාජභාවය එතරම් හොඳින් පෙන්වන වෙන කිසිවක් අර්ථවාදීන්ගේ

සියලුම ලිපි ලේඛන අතුරෙන් වුව සොයාගැනීම අසීරු වනු ඇත. අද ද එය එසේමයි. මර්තිනව්, නව ''ඉස්ක්‍රා'' පත්‍රයට දැඩි උනන්දුවෙන් සේවයකරමින් කිසිවක් ප්‍රකාශ කරන සෑම විටකම, නව ''ඉස්ක්‍රා'' පත්‍රයේ ව්‍යාජ තත්ත්වය තක්සේරු කර දැක්වීම සඳහා අපටද අලුත් අනගි කරුණු සපයාදෙයි. ''ඉස්ක්‍රා'' පත්‍රයේ 102 වැනි කලාපයෙන් ඔහු ''ලෙනින් විසින්, විප්ලවය පිළිබඳ සංකල්පය වෙනුවට, ආඥාදායකත්වය පිළිබඳ සංකල්පය සූක්ෂම ලෙස ඉදිරිපත්කොට ඇතැයි'' පවසයි.

ඇත්ත වශයෙන්ම, නව ඉස්ක්‍රාකාරයන් විසින් අප වෙත එල්ලකර ඇති සියලුම චෝදනා මෙම චෝදනාවට සීමාකළ හැකිය. ඉදින්, මේ චෝදනාව සම්බන්ධයෙන් අපි මර්තිනව්ට කොතරම් කෘතඥවෙමුද! නව ඉස්ක්‍රා අදහස්වලට විරුද්ධව අප කරන සටනේදී, තමන්ගේ චෝදනාවේ ආකාරයෙන් සකස්කිරීමෙන්, ඔහු අපට කරන සේවය කෙතරම් විශාලද! ''ප්‍රොලිතාරී'' පත්‍රයට දෙන ප්‍රහාරයන් ''වඩාත් ගැඹුරු'' කරනු පිනිසත්, මෙම ප්‍රහාරයන් ''නියම ප්‍රතිපත්ති'' අනුව සකස් කරනු පිනිසත්, අපට විරුද්ධව නිතර නිතරම මර්තිනව් ලවා පහර දෙවන සේ අපි ''ඉස්ක්‍රා'' පත්‍රයේ කතුවරුන්ගෙන් උදක්ම ඉල්ලා සිටිය යුතුවෙමු. මන්දයත්, ප්‍රතිපත්ති සම්බන්ධයෙන් තර්ක කිරීමට මර්තිනව් ගන්නා උත්සාහය වැඩිවන තරමටම, ඔහුගේ තර්ක වඩාත් දුර්වල ලෙසින් පෙනෙන අතර නව ඉස්ක්‍රා අදහස්වල අඩුපාඩුකම්ද වඩාත් පැහැදිලිව අනාවරනය වේ. එසේම තමන්ගේ හා තම මිතුරන්ගේ නව ඉස්ක්‍රා ප්‍රතිපත්තිවල මුග්ධභාවය—reductio ad absurdum—වඩාත් සාර්ථක අයුරින් පෙන්වයි.

''වපිරියොද්'' හා ''ප්‍රොලිතාරී''පත්‍රයද විප්ලවය යන පදය වෙනුවට ආඥාදායකත්වය යන පදය ''අමුතුවෙන් යොදගනී.'' එබඳු ''අමුතු යෙදීමක්'' ඉස්ක්‍රා පත්‍රයට උවමනා නොවේ. එය එසේමයි, ගරුතර මර්තිනව් සහෝදරයානනි!ඔබ නොදැනුවත්වම විශාල සත්‍යයක් ඔබෙන් ප්‍රකාශ වී තිබේ. ''ඉස්ක්‍රා'' පත්‍රය විප්ලවයේ වලිගය අග එල්ලී සිටිමින්, තම කාර්යභාරයන් සම්බන්ධයෙන් මං මුලාවී අස්වබෂ්ජේනිය නියමයන් අනුව යන අතර,''වපිරියොද්''හා''ප්‍රොලිතාරී''යන පත්‍ර දෙක ප්‍රජාතාන්ත්‍රික විප්ලවය ඉදිරියට මෙහෙයවන සටන්පාඨ ඉදිරිපත් කරන බවට අප ගෙනා තර්කය මේ අලුත් සූත්‍ර මගින් ඔබ විසින් තහවුරු කර ඇත.

මර්තිනව් සහෝදරය ඔබට මෙය නොවැටහේද? ප්‍රශ්නය වැදගත් එකක් හෙයින් අපි ඔබට සවිස්තරව කරුනු හෙලිකිරීමට උත්සාහ ගන්නෙමු.



පුද්ගලික දේපල අයිතිය හා වෙළඳ ද්‍රව්‍ය මත ගොඩනැගුනු ආර්ථිකය සම්පූර්ණයෙන්ම පිළිගැනීමේ පිළිවෙත අනුගමනය කරන එසේම මෙම සීමාවන් පැනයා නොහැකි සමාජයේ නොයෙකුත් පංති, කණ්ඩායම් හා ජන කොටස් රාශියක් පරිසරය විසින් පොලඹවනු ලදුව සේවරී රාජාණ්ඩුවේත් පොදුවේ සමස්ත වැඩවසම් ක්‍රමයේත් නිෂ්ඵලභාවය පිළිගෙන විමුක්තිය සඳහා කරන උද්ඝෝෂනයට එක්වීමෙන්ම ප්‍රජාතාන්ත්‍රික විප්ලවයේ ධනපති පංතික ස්වභාවය පෙන්නුම් කරයි. එසේම ඉඩම් හිමියන්ගේ හා ධනපතියන්ගේ නොයෙකුත් වාග් ප්‍රවාහයන් මගිනුත් (ඇත්තෙන්ම කටින් පමණක්?) ''සමාජයේ'' ඉල්ලා සිටීම මගිනුත් මේ ''විමුක්තියේ'' ඇති ධනපති පංතික ස්වභාවය වඩ වඩා පැහැදිලිව ප්‍රකටවෙයි. ඒ අතරම, විමුක්තිය සඳහා කම්කරුවන් කරන සටන හා ධනපති පංතියේ සටන අතරත්, නිර්ධන පංතික ප්‍රජාතන්ත්‍රවාදය හා ලිබරල් ප්‍රජාතන්ත්‍රවාදය අතරත් පවත්නා මූලික වෙනසද වඩ වඩා කැපී පෙනෙයි. කම්කරු පංතියත් පංතිහැඟීමෙන් යුතු ඔවුන්ගේ නියෝජිතයනුත් ඉදිරියට ගමන්කරමින් මෙම සටන පෙරට ගෙනයන්නේ එය අවසානය දක්වා ගෙනයාමට බියක් නොදක්වමිනි. එපමනක්ද නොව, ප්‍රජාතාන්ත්‍රික විප්ලවයේ අන්තිම සීමාවන්ගෙන්ද බොහෝ ඈතට එය ගෙනයාමට උත්සාහ දරමිනි. චපල ආත්මාර්ථකාමී ධනපති පංතිය විමුක්තිය පිළිබඳ සටන්පාඨ පිළිගන්නේ, කුහක කමින් යුතුව අඩවශයෙන් පමණකි. විමුක්තියේ ධනපති පංතික මිතුරන්ගේ මේ කුහක කම පටන්ගන්නා තැන වෙන් කෙරෙන, නැතහොත්, විමුක්තියේ ධනපති මිතුරන් විසින් එය පාවාදෙනු ලබන සීමාව වෙන්කෙරෙන විශේෂ රේඛාවක් සලකුනු කිරීමට හෝ විශේෂ ''ස්ථාන'' දැක්වීමට හෝ ගන්නා සියලු ප්‍රයත්න අනිවාර්යයෙන්ම අසාර්ථක වනු ඇත. මන්දයත්, දහසකුත් එකක්, මාර්ග හා උපක්‍රමවලින් ස්වකීය පිළිවෙත හා සටන්පාඨ වෙනස්කිරීමටත්, නිරන්තරයෙන් වාසියගෙනදෙන අයුරු කටයුතු කරමින් හා රැවටිලිකාරකමින් මඳක් දකුණට හෝ වමට හැරීමෙන් පරිසරයට අනුරූපව හැඩගැසීමටත්, දෙපැත්තට මැදිවූ (සේවරී රාජාණ්ඩුවට හා නිර්ධන පංතියට) ධනපති පංතියට පුලුවන්වන හෙයිනි. නිර්ධන පංතික ප්‍රජාතන්ත්‍රවාදයේ කාර්යභාරය වනුයේ එබඳු අජීවී ''ස්ථාන'' නිර්මාණය කිරීම නොව, පැසීඑන දේශපාලන තත්ත්වය නොනවතා විවේචනය කිරීමත් ධනපති පංතියේ කල්තබා දැකිය නොහැකි අලුත් අලුත් චපලකම් හා පාවාදීම් අනාවරනය කිරීමත්ය.

නීතිවිරෝධී පුවත්පත් මගින් ස්ත්‍රූවේ මහතා කළ දේශපාලන ව්‍යාපාරවල ඉතිහාසයත්, සමාජ–ප්‍රජාතන්ත්‍රවාදය ඔහු සමග කළ සටනේ

ඉතිහාසයත් මෙනෙහි කරන්න. එවිට නිර්ධන පංතික ප්‍රජාතන්ත්‍රවාදයේ අනුගාමිකයා වන සමාජ–ප්‍රජාතන්ත්‍රවාදය විසින් මෙම කාර්යභාරයන් සම්පූර්ණ කරන ලද්දේ කෙසේ දැයි ඔබට හොඳින් පෙනී යනු ඇත. ස්ත්‍රැවේ මහතා කටයුතු පටන්ගත්තේ, ''අයිතිවාසිකම් හා බලතල සහිත සේම්ස්ත්වො සභාවක්'' (''ලිබරල්වාදයේ හැනිබල්වාදීන් සහ සෙම්ස්ත්වො අතවරයට පත්කළෝ''* යන හිසින් ''සර්යා''[65] පත්‍රයේ පළවූ මගේ ලිපිය බලන්න) යන තනිකරම ෂිපොව් අනුගාමී සටන් පාඨයකිනි. සමාජ–ප්‍රජාතන්ත්‍රවාදය විසින් ඔහුගේ වැරදි හෙළිදරව් කොට, ඔහු නිශ්චිත ආණ්ඩුක්‍රමවාදී වැඩසටහනක් දෙසට ''යොමුකරන ලදී.'' මේ යොමුකිරීම සිදුවූ අවස්ථාවේදී, විප්ලවීය සිදුවීම් විශේෂ වේගයකින් වැඩියාමේ හේතුවෙන් සටන, ප්‍රජාතන්ත්‍රවාදයේ ඊළඟ ප්‍රශ්නය වෙතට මාරුවිය. එම ප්‍රශ්නය නම්, සාමාන්‍ය වශයෙන් ආණ්ඩුක්‍රමයක් ලබාගැනීම නොව, සර්ව ජන හා සමාන ඡන්දබලයත්, කෙලින්ම මහජනයා විසින් මන්ත්‍රීන් තෝරාගැනීමට හා රහස් ඡන්දයත් ඉඩලැබෙන ආණ්ඩුක්‍රමයක් ලබාගැනීමයි. ''සතුරාගෙන්'' මේ අලුත් භූමියද ''උදුරාගැනීමෙන්'' පසුව (අස්වබෂ්ජේනිය පෙරමුණ විසින් සර්වජන ඡන්දය අනුමතකරනු ලැබීම) අපි තවදුරටත් ඉදිරියට යාමට පටන්ගනිමු. මන්ත්‍රීසභා දෙකකින් යුතු ක්‍රමයේ කුහක බව හා ව්‍යාජ භාවයත් සර්වජන ඡන්දය අස්වබෂ්ජේනියවාදීන් විසින් සම්පූර්ණයෙන් පිළිගෙන නැතිවගත් අපි පෙන්වන්නෙමු. ඔවුන්ගේ රාජාණ්ඩුවාදය ගෙන හැර දැක්වූ අපි ඔවුන්ගේ ප්‍රජාතන්ත්‍රවාදයේ කපටි ස්වභාවයද පෙන්වාදුනිමු. වෙනත් අයුරකින් කියතොත්, ධනපතියන්ගේ මේ අස්වබෂ්ජේනිය වීරයන් විසින් ශ්‍රේෂ්ඨ රුසියන් විප්ලවයේ අපේක්ෂාවන් පාවාදෙන අයුරු පෙන්වා දුනිමු.

අවසන් වශයෙන්, සෛවරී රාජාණ්ඩුවේ ම්ලේච්ඡ දඩබ්බර ස්වභාවයත්, සිවිල් යුද්ධයේ යෝධ ඉදිරිගමන, හා රාජාණ්ඩුවාදීන් රුසියාව ඇද දැමූ තත්ත්වයේ අසරන භාවයත්, අන්තිමටම ගුඩුවූ ඔලුගෙඩිවලට පවා දැනෙන්නට විය. විප්ලවය ප්‍රත්‍යක්ෂ සත්‍යයක් බවට පත්වී තිබුනි. විප්ලවයක් සිදුවන බව පිළිගැනීම සඳහා විප්ලවවාදීයෙකුවීම තවදුරටත් අනවශ්‍ය විය. සියල්ලන්ගේ ඇස්හමුවේ පිරිහී ගිය සෛවරී රාජාණ්ඩුව තවදුරටත් ගරාවැටෙන්නට විය. එක්තරා ලිබරල්වාදියෙකු (ග්‍රෙදෙස්කුල් මහතා) විසින් නීත්‍යනුකූල පුවත්පත් මගින් සඳහන් කරන ලද පරිදි, මෙම ආණ්ඩුවට

* 1901 දී පළමු වරට පළවිය. ලෙනින්. සම්පූර්ණ කෘතීන්, 5 වෙළුම, 31—80 පිටු. — සංස්කාරක



නියම වශයෙන්ම විරුද්ධත්වය පලවන්නට විය. මතුපිටින් පෙනෙන්නට තිබුනු ශක්තිය කොතෙක් වුවද, සෛවරී රාජාණ්ඩුව අකර්මන්‍ය දුර්වල එකක් බව ඔප්පු විය. වැඩී එන විප්ලවයත් සමග ඇතිවූ සිදුවීම්වලින්, පනපිටින් සිටියදීම කුනුවී දිරායන මේ පරපුටු ජීවිතාද්‍රිය නිකම්ම දියවී යන්නට විය. නියම වශයෙන් ගැඩගැසී එන සබඳකම් මත තම ක්‍රියාකාරිත්වය ගොඩ නගාගැනීමට සිදුවූ (නැත හොත් වඩා හොඳින් කියන්නේ නම්, තම දේශපාලන යටිකූට්ටු වැඩ) ලිබරල් ධනපති පංතියට, විප්ලවය පිළිගැනීමේ අවශ්‍යතාවය පෙනෙන්නට විය. එසේ කරන්නේ ඔවුන් විප්ලවවාදීන් වන නිසා නොවේ. විප්ලවවාදීන් නොවන අතරම විප්ලවයේ ජයග්‍රහණය දෙස කෝපයෙන් රවා බලමින් ඔවුන් එසේ කරන්නේ තම සිතට විරුද්ධ නමුත්, අවශ්‍යතාවය අතහැරිය නොහැකි නිසායි. විප්ලවය ඉස්මතු කිරීම ගැන ඔවුහු සෛවරී රාජාණ්ඩුවට චෝදනා කරති. මන්දයත්, එය සම්මුතියකට එළඹීමට නොකැමැතිව, ජීවිතයත් මරනයත් අතර සටනක් පතන හෙයිනි. උපන් වංචනික තැරැව්කාරයන් වන ඔවුහු සටන හා විප්ලවය පිළිකුල් කරති. එහෙත් නොකැමැත්තෙන් වුවද විප්ලව බිමට පා තැබීමට පරිසරය අනුව ඔවුන්ට සිදුවී තිබේ. මන්දයත්, ඔවුන්ගේ පා රඳවා ගැනීමට වෙනත් බිමක් නැති බැවිනි.

ඉතා හාස්‍යජනක මෙන්ම බොහෝ පාඩම් ලැබිය හැකි අද්භූත දර්ශනයක් අපි නරඹමින් සිටිමු. ධනපති ලිබරල්වාදී ගනිකාවෝ විප්ලවයේ අළංකාර සළුවෙන් තම සිරුරු වසාගැනීමට උත්සාහ ගනිති. දැන් අස්වබෂ්ජේනිය කාරයන් — risum teneatis, amici!* — විප්ලවයේ නාමයෙන් කතා කිරීමට පටන්ගෙන ඇත!!! තමන් ''විප්ලවයට බිය නොවන'' බව අපට දිව්රා කීමට (අංක 72 ''අස්වබෂ්ජේනිය'' කලාපයේ ස්ත්‍රැවේ මහතා) ඔවුන් පටන්ගෙන තිබේ!!! ''විප්ලවයේ ඉදිරියෙන්ම සිටින'' බවට ඔවුහු දැන් හඬනගා කියති.

මේ වනාහී, ධනපති ලිබරල්වාදයේ ප්‍රගතිය පමණක් නොව, ඊටත් වැඩියෙන් පිළිගැනීමට සිදුවී ඇති, විප්ලවීය ව්‍යාපාරයේ නියම ප්‍රගතිය හා ජයග්‍රහණ පෙන්වා දෙන අතිශයින් වැදගත් සිදුවීමකි. විප්ලවයේ පැත්ත ගැනීම තමන්ට වැඩි වාසියක් ගෙනදෙන්නක් බව ධනපති පංතියට පවා දැනෙන්නට වී තිබේ. රාජාණ්ඩුව එතරම්ම දුර්වලවී ඇත. අනික් අතට, සමස්ත ව්‍යාපාරයම අලුත් හා වඩා උසස් තත්ත්වයකට පත්වී ඇතිබව ඔවුහු කරන මේ සිදුවීම් විසින් අප වෙත තවත් අලුත් හා වඩාත් උසස් කාර්යභාරයන් ඉදිරිපත් කෙරේ. යම්

* — සිනා නොවන්න මිත්‍රවරුනි!

යම් ධනපති පංතික දෘෂ්ටිවාදීන්ගේ පුද්ගලික අවංකකම කෙසේ වුවද, ධනපති පංතිය විසින් විප්ලවය පිළිගනු ලැබීම අවංක කාරියක් විය නොහැක. ව්‍යාපාරයේ මේ උසස් අවස්ථාවේදී පවා, ආත්මාර්ථකාමීත්වය හා චපලබවත්, සමථයකට පැමිණීමේ අදහස් හා සුළු සුළු ප්‍රතිගාමී කපටිකම් ආදියත් ඇතුලු නොකර සිටීමට ධනපති පංතියට නුපුළුවන. අපේ වැඩ සටහනේ නාමයෙන් හා එය පුලුල් කිරීමේ නාමයෙන්, දැන් අප විසින් විප්ලවයේ හදිසි නිශ්චිත කාර්යභාරයන් වෙනස් අන්දමකට සකස්කළ යුතුවෙයි. ඊයේ දිනට ප්‍රමාණවත් වූ දේ අදට ප්‍රමාණවත් නොවේ. උසස් ප්‍රජාතාන්ත්‍රික සටන්පාඨයක් ලෙසින්, විප්ලවය පිළිගැනීම සඳහා කළ උද්ඝෝෂනය ඊයේ දිනට ප්‍රමාණවත් විය. එහෙත් එය අදට ප්‍රමාණවත් නොවේ. විප්ලවය විසින් එය පිළිගනු සඳහා ස්ත්‍රුවේ මහතා පවා පොලඹවා තිබේ. මේ විප්ලවයේ හදිසි හා අවශ්‍යතම කාර්යභාරයන් පිළිබඳ මූලූ සන්දර්භයම දැන්, ඉදිරියට ගිය පංතිය විසින් හරියටම විග්‍රහ කළ යුතුය. විප්ලවය පිළිගන්නා අතරම ස්ත්‍රුවේ මහතා ප්‍රමුඛ ඔහුගේ අනුගාමිකයෝ නැවත නැවතත් ඔවුන්ගේ බූරු කන් ප්‍රදර්ශනය කරමින්, සාමකාමී අවසානයක් දැකීමේ ඉඩකඩත් බලය ලබාගැනීම සඳහා නිකොලායි විසින් අස්වබ්ෂ්ජේනිය කාරයනට කරන අසරන හඬගෑමත්, පිළිබඳ පැරණි ගීතයද ගායනා කරති. අස්වබ්ෂ්ජේනියවාදීන් විප්ලවය පිළිගන්නේ වඩාත් ප්‍රවේසම් සහිතව සිටිමින් එය මගහැරීමට, හා පාවාදීමටය. ''විප්ලවය'' යන සටන්පාඨය දැන් ප්‍රමාණවත් නොවන බව නිර්ධන පංතියට මෙන්ම සමස්ත ජනතාවටම පෙන්වාදීම මෙකල අපේ යුතුකම වන්නේය. විප්ලවයේ මූලූ සන්දර්භය සම්බන්ධයෙන්ම පැහැදිලි හා පැටලිලි රහිතවූත්, හා තීරණාත්මකවූත් විග්‍රහයක් ඇතිකරගැනීමේ අවශ්‍යතාවය කෙතරම් දැයි අප විසින් පෙන්වාදිය යුතුව තිබේ. විප්ලවයේ ''තීරණාත්මක ජයග්‍රහණය'' ප්‍රකටකිරීමට සමත් එකම සටන්පාඨය වූ — 'ගොවි කම්කරු විප්ලවීය ප්‍රජාතාන්ත්‍රික ආඥාදායකත්වයක්' — යන සටන්පාඨයෙන් එම විග්‍රහය අපට ලැබේ.

වැරදි ලෙස පද වහරෙහි යෙදීම දේශපාලනයේදී දක්නට ලැබෙන සුලභ ක්‍රියාවකි. නිදසුනක් දක්වතොත්, ''සමාජවාදීයා'' යන පදය, ඉංග්‍රීසි ධනපති පංතික ලිබරල්වාදය අනුගමනය කරන්නන් විසිනුත් (''දැන් අපි සියලුදෙන සමාජවාදීන් වෙමු'' යි “We all are socialists now'' හාර්කෝර්ට් පැවසීය) බිස්මාර්ක්ගේ හිතවතුන් විසින් මෙන්ම, XIII වැනි ලියෝ පාප්වහන්සේගේ මිතුරන් විසිනුත් ප්‍රයෝජනයට ගෙන ඇත. ''විප්ලවය'' යන පදයද එසේ වැරදි ලෙස වහරට ගැනීමට හොඳටම ඉඩ ඇති අතර, සංවර්ධනයේ එක්තරා අවස්ථාවකදී එබඳු වැරදි වහර වැලැක්මටද බැරිය. ස්ත්‍රුවේ මහතා විප්ලවයේ නාමයෙන් කතාකිරීම ආරම්භකළ විට මට නිතැතින්ම ටියේර් මතක්විය. පෙබරවාරි විප්ලවයට දින කිහිපයකට පෙර, ධනපති පංතියේ දේශපාලන දූෂිතභාවය හොඳින් ප්‍රකට කරන මේ කපටියා මහජන කැලඹීමක ඉව දැනී, තමන් විප්ලව පක්ෂයට අයත් යයි පාර්ලිමේන්තු වේදිකාවේදී ප්‍රකාශයට පත්කළේය! අස්වබ්ෂ්ජේනිය කාරයන් විප්ලව පක්ෂය දෙසට හැරීමේ දේශපාලන අර්ථයද ටියේර්ගේ ක්‍රියාවට සම්පූර්ණයෙන්ම සමාන වෙයි (මාක්ස්ගේ ''ප්‍රංශයේ සිවිල් යුද්ධය'' කියවන්න). රුසියානු ටියේර්වරුන් තමන් විප්ලව පක්ෂයට අයත්වන බව ප්‍රකාශ කිරීමෙන් පෙනීයන්නේ, 'විප්ලවය', යන සටන්පාඨය දැන් ප්‍රමාණවත් නොවන තේරුමක් නැති එකක් බවට පත්වී ඇති අතර ඉන් කිසිම කාර්යභාරයක් නියමවශයෙන් පෙන්වා නොදෙන බවයි. මන්දයත් දැන් විප්ලවය ප්‍රත්‍යක්ෂයක් බවට පත්ව ඇතිවා මෙන්ම විවිධාකාර පිරිස් ඒ පැත්තට රොක්වන හෙයිනි.

ඇත්තෙන්ම, මාක්ස්වාදී දෘෂ්ටිකෝණය අනුව විප්ලවය යනුවෙන් අදහස් කරන්නේ කුමක්ද? යල් පැනගිය දේශපාලන බාහිර සංස්ථාව ප්‍රචන්ඩ අන්දමින් බිඳ දැමීමයි. එම දේශපාලන බාහිර සංස්ථාව හා අලුත් නිෂ්පාදන සබඳකම් අතර ප්‍රතිවිරෝධතාවය, යම්කිසි අවස්ථාවකදී එය බිඳවැටීමට හේතුවීමයි. සෛවරී රාජ්‍යපාලනයත්, ධනවාදී රුසියාවේ සමස්ත සංස්ථාව හා ධනපති ප්‍රජාතාන්ත්‍රික සංවර්ධනයේ සියලු අවශ්‍යතාවයනුත් අතර ප්‍රතිවිරෝධතාවය දැන් එය බිඳවැටීමට හේතුවී ඇත. දිගුකාලයක් තිස්සේ එම ප්‍රතිවිරෝධතාවය කෘතීම වශයෙන් රඳවා තැබීම නිසා දැන් එය වඩාත් දැඩිව සිදුවේ. බාහිර සංස්ථාව දැන් සෑම සන්ධියකින්ම පුපුරායමින් ශක්තිය හමුවේ යටයමින්, දිනෙන් දින දුර්වලවෙමින් තිබේ. දැන් ඉතා විවිධාකාරවූ පංතීන්ගේ හා කංඩායම්වල නියෝජිතයින් මගින් මහජනතාව ස්වකීය ප්‍රයත්නයන් තුළින් තමන් සඳහා අලුත් සංස්ථානයක් ගොඩනගා ගත යුතුය. සංවර්ධනයේ එක්තරා අවස්ථාවකදී පැරණි බාහිර සංස්ථාවේ නිෂ්ප්‍රයෝජන බව සෑම දෙනටම පැහැදිලිවෙයි. එහිදී හැම දෙන විසින්ම විප්ලවය පිළිගනු ලබයි. දැන් ඇති කාර්යභාරය නම්, නව බාහිර සංස්ථාවක් ඉදිකල යුත්තේ කුමන පංතීන් විසින්ද යනවගත්, ඔවුන් විසින් එය කළ යුත්තේ කෙසේද යනවගත් විග්‍රහකොට දැක්වීමයි. මෙය විග්‍රහකොට නියම නොකරනු ලැබුවේ නම්, වර්තමානයේදී ''විප්ලවය'' යන සටන් පාඨය තේරුමක් නැති හිස් එකක් වනු ඇත. මන්දයත්,

හිතුවක්කාර රාජාණ්ඩුවේ දුර්වල කම විසින්, මහා ආදිපාදවරුන් හා ''මස්කෝවිස්කිය වියදමස්ති''[66] පවා ''විප්ලවවාදීන්'' කරනු ලබන බැවිනි!මේ කරුන විග්‍රහකොට නියම කරනුනොලබන්නේ නම්,ඉදිරියට ගිය පංතියේ වඩාත් දියුණු ප්‍රජාතාන්ත්‍රික කාර්යභාරයන් ගැන කතාකිරීමට නොහැකි වනු ඇත. ''ගොවි කම්කරු ප්‍රජාතාන්ත්‍රික ආඥාදායකත්වය'' යන සටන් පාඨයෙන් මේ අර්ථ විග්‍රහය ලැබේ. මෙම සටන්පාඨයෙන්, නව බාහිර සංස්ථාව ''නිර්මාණය කරන්නන්'' විශ්වාසය තැබිය යුතු හා ඔවුන්ට එසේ විශ්වාසය තැබිය හැකිවන්නේ කුමන පංතීන් කෙරෙහි ද යනවගත්, නව බාහිර සංස්ථාවේ ලක්ෂණත් (සමාජවාදී ආඥාදායකත්වයෙන් වෙනස්වන 'ප්‍රජාතාන්ත්‍රික' ආඥාදායකත්වයක්) එය ගොඩනැගිය යුත්තේ කෙසේද යනවගත් (ආඥාදායකත්වය නම්, මහජනයා අතුරෙන් විප්ලවකාරී පංතීන් සන්නද්ධ කොට, නැග එන ප්‍රචන්ඩ විරුද්ධවාදීකම් ප්‍රචන්ඩ ලෙසින්ම මැඩපැවැත්වීමයි) විග්‍රහ කෙරේ. විප්ලවකාරී ප්‍රජාතාන්ත්‍රික ආඥාදායකත්වය පිළිබඳ මෙම සටන්පාඨය පිළිගැනීමට, විප්ලවකාරී හමුදාවක්, විප්ලවකාරී ආණ්ඩුවක් හා විප්ලවකාරී ගොවිජන සභා පිළිබඳ සටන්පාඨය පිළිගැනීමට, දැන් අකමැතිවන කවරෙක් වුවද, එක්කෝ, විප්ලවයේ කාර්යභාරයන් අවබෝධ කිරීමට කොහෙත්ම නොහැකි එසේම වර්තමාන තත්ත්වය විසින් ඉදිරිපත් කර ඇති අලුත් හා වඩා උසස් කාර්යභාරයන් විග්‍රහ කිරීමට අසමත් කෙනෙක් වෙයි. නැතහොත්, ජනතාව රවටමින් විප්ලවය පාවාදෙමින් ''විප්ලවය' යන සටන්පාඨය වැරදි ලෙස වහරන්නෙක් වෙයි.

මර්තිනව් සහෝදරයා ඇතුලු ඔහුගේ මිතුරන් මින් පළමු කී ගනයට අයත් වෙති.ස්ත්‍රැවේ මහතා සහ''ආණ්ඩුක්‍රමවාදී ප්‍රජාතාන්ත්‍රික'' සෙම්ස්ත්ව පක්ෂයේ සියලු දෙනම දෙවැනිව කී ගනයට අයත් වෙති.

මර්තිනව් සහෝදරයා කෙතරම් දක්ෂ නුවනැති පුද්ගලයෙක්ද යත්, විප්ලවය වැඩීයාම නිසා ආඥාදායකත්වය යන සටන්පාඨයෙන් එහි කාර්යභාරයන් විග්‍රහකිරීමට අවශ්‍ය වූ වකවානුවේදීම, විප්ලවය යන පදය වෙනුවට ආඥාදායකත්වය යන පදය යොදගැනීම ගැන ඔහු චෝදනා කළේය. ඇත්තෙන්ම, මර්තිනව් සහෝදරයා යලිත්, වල්ගා කොනේ එල්ලී සිටීමටත්, අන්තිම අවස්ථාව ආසන්නව තිබියදී වල්මත්ව, තමන් අස්වබෂ්ජේනිය මට්ටමට පහළබැසීමටත් තරම් අවාසනාවන්තයෙකු විය. ''විප්ලවය'' (වචනයෙන්) පිළිගනිමින්, ගොවි කම්කරු ප්‍රජාතාන්ත්‍රික ආඥාදායකත්වය (එනම් ක්‍රියාවෙන් කරන විප්ලවය) පිළිගැනීම ප්‍රතික්ෂේපකිරීම දැන් උචිතවන්නේ අස්වබෂ්ජේනිය දේශපාලන පිළිවෙතටය. එනම්, ලිබරල් රාජාණ්ඩුවාදී



ධනපති පංතියේ අපේක්ෂාවන්ටය. දැන් ලිබරල්වාදී ධනපති පංතිය ස්ත්‍රැවේ මහතාගේ වචන තුළින් විප්ලවයට පක්ෂපාතිත්වය ප්‍රකාශ කරයි. පංති හැඟීමෙන් යුතු නිර්ධන පංතිය විප්ලවකාරී සමාජ–ප්‍රජාතාන්ත්‍රිකයන්ගේ වදන් මගින් ගොවි කම්කරු ආඥාදායකත්වය ඉල්ලා සිටී. මෙහි දී නව ''ඉස්ක්‍රා'' පත්‍රයේ අති පංඩිතයෝ, අර්බුදයට මැදිහත්වෙමින්, විප්ලවය යන පදය 'වෙනුවට' ආඥාදායකත්වය යන පදය නොයෙදීමට ප්‍රවේශම් වන්නැයි මොරදෙති. ඉදින්, නව ඉස්ක්‍රා කාරයන් ගත් වැරදි මග නිසා ඔවුන් දිගටම අස්වබෂ්ජේනිය කාරයන්ගේ වලිගා කොනේ එල්ලී බඩගෑමට කැපවන බව බොරුවක්ද?

ප්‍රජාතන්ත්‍රවාදය අනුමත කිරීමේදී, අස්වබෂ්ජේනිය කාරයන් (සමාජ–ප්‍රජාතාන්ත්‍රිකයන්ගේ අනුබලය ඇතිව) ඉහළට නගිනබව අපි පෙන්වාදී ඇත්තෙමු. මුලදී අපේ මතභේදයට හේතුවූයේ ෂිපොව් ක්‍රමයද (අයිතිවාසිකම් හා බලතල සහිත සෙම්ස්ත්ව සභාවක්) නැතහොත් ආණ්ඩුක්‍රමවාදයද යන ප්‍රශ්නයයි. ඉන් පසුව ප්‍රශ්නය වූයේ සීමිත සංඛ්‍යාවක ඡන්ද බලය දීමද නැතහොත් සර්වජන ඡන්දයද යන්නයි. ඊටත් පසුව ප්‍රශ්නය වූයේ විප්ලවය පිළිගැනීමද නැතහොත් රාජාණ්ඩුව සමග තැරැව්කාර ගනුදෙනුවක්ද යන්නයි. දැන් අවසාන වශයෙන් ප්‍රශ්නය වී ඇත්තේ, ගොවි කම්කරු ආඥාදායකත්වයෙන් තොරව විප්ලවය පිළිගැනීමද නැතහොත් ප්‍රජාතාන්ත්‍රික විප්ලවයේදී එම පංතීන්ගේ ආඥාදායකත්වය පිළිබඳ ඉල්ලීම පිළිගැනීමද යන්නයි. අස්වබෂ්ජේනිය කාර මහත්වරුන්, විසින් (දැනට සිටින අයත් ඊට පසුව ධනපති ප්‍රජාතන්ත්‍රවාදයේ වාමාංශික කොටසට ඇතුලුවන අයත් අතර වෙනසක් නොවේ) තවත් පියවරක් ඉහළට තැබීමට, එනම්, (ඇත්තෙන්ම මේ වන විට, මර්තිනව් සහෝදරයා තවත් පියවරක් ඉහළට තබයි) යථාකාලයේදී ආඥාදායකත්වය පිළිබඳ සටන් පාඨයද පිළිගැනීමට ඉඩතිබේ. එසේම එය සිදුවිය හැකිය. රුසියන් විප්ලවය නොනවත්වා සාර්ථකව ඉදිරියටයමින් තීරණාත්මක ජයග්‍රහණයක් ලබනවිට අනිවාර්යයෙන්ම එසේ සිදුවනු ඇත. එවිට සමාජ–ප්‍රජාතන්ත්‍රවාදයේ තත්ත්වය කුමක් වනු ඇත්ද? වර්තමාන විප්ලවයේ සම්පූර්ණ ජයග්‍රහණයෙන්, ප්‍රජාතාන්ත්‍රික විප්ලවයේ අවසානයත්, සමාජවාදී විප්ලවයක් සඳහා කරන තීරණාත්මක සටනේ ආරම්භයත් සලකුණු කෙරෙනු ඇත. වර්තමාන ගොවිජනයාගේ ඉල්ලීම් සඵලවීමත්, ප්‍රතිගාමිත්වය සහමුලින් අතුගා දැමීමත් ප්‍රජාතාන්ත්‍රික සමූහාණ්ඩුවක් දිනාගැන්මත් යන කරුනු විසින් ධනපති පංතියේ පමණක් නොව සුළුධනපති පංතියේද විප්ලවවාදය කෙලවර කෙරෙනු ඇත.

එසේම ඉන් සමාජවාදය සඳහා නිර්ධන පංතිය ගෙනයන නියම සටනේ ආරම්භයද සලකුණු කෙරෙනු ඇත. ප්‍රජාතාන්ත්‍රික විප්ලවයේ සම්පූර්ණ බව වැඩිවූ තරමටම, මේ අලුත් සටන වැඩියාමේ, වේගය, පුලුල් බව, පිරිසිදුබව හා තීරණාත්මක බවද වැඩිවනු ඇත. ''ප්‍රජාතාන්ත්‍රික'' ආඥදායකත්වයක් පිළිබඳ සටන් පාඨයෙන්, වර්තමාන විප්ලවයේ ඓතිහාසික වශයෙන් සීමිතවූ ස්වභාවයත්, සියලු පීඩනයෙන් හා සූරාකෑම්වලින් කම්කරු පංතියට සම්පූර්ණ විමුක්තිය ලබාගනු සඳහා නව සමාජ ක්‍රමය පදනම් කොටගෙන අලුත් සටනක් ගෙනයාමේ අවශ්‍යතාවයත් ප්‍රකට කරයි. වෙනත් අයුරකින් කියතොත්, විප්ලවය පමණක් නොව විප්ලවයේ සම්පූර්ණ ජයග්‍රහණයත් මුදුන් පැමිනි ප්‍රත්‍යක්ෂයක් බවට පත්වූ විට, ප්‍රජාතාන්ත්‍රික ධනපති පංතිය හෝ සුළු ධනපති පංතිය තවත් පියවරක් ඉහළට නගිනවිට, (ඇත්තෙන්ම, අනාගත අලුත් මර්තීනව්ලාගේ භ්‍රාන්ත විලාප හඬ මධ්‍යයේ) අපි ප්‍රජාතාන්ත්‍රික ආඥදායකත්වය පිළිබඳ සටන්පාඨය ''අතහැර ඒ වෙනුවට'' නිර්ධන පංතියේ සමාජවාදී ආඥදායකත්වයක් පිළිබඳ, එනම්, සම්පූර්ණ සමාජවාදී විප්ලවයක් පිළිබඳ සටන් පාඨය යොදගන්නෙමු.

## III. ආඥදායකත්වය පිළිබඳ විකෘත ධනපති පංතික අර්ථ නිරූපනය හා ඒ පිළිබඳ මාක්ස්ගේ මතය

1848 දී නව රයින් පත්‍රයේ පලවූ මාක්ස්ගේ ලිපිවලට සටහන් ලියන මේරින්ග්, එකල ධනපති පංතික පොත්පත් මගින් මෙම පත්‍රයට එල්ල කළ එක් චෝදනාවක් නම්, ''ප්‍රජාතන්ත්‍රවාදය දිනාගැනීමේ එකම ක්‍රමය ලෙසින් වහාම ආඥදායකත්වයක් ඇතිකරනසේ'' එම පත්‍රය මගින් ඉල්ලන ලදැයි කියන (Marx, Nachlass, 3 වෙළුම, 53 පිටුව)[67] චෝදනාව බව පවසයි. විකෘත ධනපති පංතික අදහස් අනුව ආඥදායකත්වය හා ප්‍රජාතන්ත්‍රවාදය යන පද අතර අන්‍යොන්‍ය වශයෙන් කිසිදු සම්බන්ධයක් නැත. පංති සටන් න්‍යාය අවබෝධකරගැනීමට අසමත්ව, දේශපාලන පොරපිටියේදී නොයෙකුත් ධනපති පංතික කණ්ඩායම් හා පිල්වල පුහුසෝෂා පිළිගැනීමට පුරුදුවූ ධනපති පංතිය, ආඥදායකත්වය යනුවෙන් අදහස් කරන්නේ, ප්‍රජාතන්ත්‍රවාදයේ සියලු හිමිකම් හා සියලු නිදහස අහෝසිකරදමා ආඥදායකයාගේ පුද්ගලික, සුහසිද්ධිය තකා බලයෙන් සියලුම අයුතු ප්‍රයෝජන ලැබීමත් කෲරකම් කිරීමත් යයි



කල්පනාකරයි. කොටින් කියතොත්, ආඥදායකත්වය පිළිබඳ සටන් පාඨය සඳහා ''එපිරියෝද්'' හා ''ප්‍රොලිතාරි'' යන පුවත්පත් දක්වන පක්ෂපාතිත්වය ලෙනින් තුළ ''ස්වකීය වාසනාව උරගාබැලීමට ඇති තදබල ආශාව'' ලෙසින් දක්වමින්, නව ඉස්ක්‍රා පත්‍රයෙන් තම ''අලුත් ව්‍යාපාරය'' මෙහෙයවන මර්තීනව්ගේ ලිපි ලේඛන තුළ දිවෙන්නේද මේ විකෘත ධනපති පංතික අදහසයි. පුද්ගලික ආඥදායකත්වයෙන් වෙනස්වන පංති ආඥදායකත්වය යන පදයේ අදහසත්, සමාජවාදී ආඥදායකත්වයේ කාර්යභාරයන්ගෙන් වෙනස්වන ප්‍රජාතාන්ත්‍රික ආඥදායකත්වයේ කාර්යභාරයන් මොනවාද යනවගත් මර්තීනව්ට තේරුම්කරදීම සඳහා ''නව රයින් පත්‍රයේ'' අදහස් සොයාබැලීම නිෂ්ඵල නොවනු ඇත.

1848 සැප්තැම්බර් 14 දින ''නව රයින් පත්‍රය'' මෙසේ ලීවේය!: ''විප්ලවයකින් පසු සෑම තාවකාලික රාජ්‍ය සංවිධානයකටම ආඥදායකත්වයක්, ධෛර්ය සම්පන්න ආඥදායකත්වයක් අවශ්‍යවේ. ආඥදායකව ක්‍රියා නොකිරීම ගැන, පැරණි ආයතනවල ඉතිරි කොටස් බිඳදමා විනාශ නොකිරීම ගැන පටන්ගැනීමේ සිටම අපි කැම්ප්හවුසන්ට (1848 මාර්තු 18 පසු ඇමති මණ්ඩලයේ ප්‍රධානියා) චෝදනා කළෙමු. හර් කැම්ප්හවුසන් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවාදී සිහින දකිමින් නැලවි නැලවී සිටින අතරවාරයේ, රජයේ නිලධාරින් අතර හා හමුදව තුළ තම තත්ත්වයන් ශක්තිමත් කරගත් පරාජිත පක්ෂය (එනම්, ප්‍රතිගාමී පක්ෂය) තැනින් තැන විවෘත සටන්වල පවා යෙදීමට පටන්ගත්තේය.''[68]

කැම්ප්හවුසන්ගේ ඇමති මණ්ඩලය සම්බන්ධයෙන් ''නව රයින් පත්‍රයේ'' පලවූ දීර්ඝ ලිපිවලින් සවිස්තරව දක්වා ඇති සියලු දේ, මෙම වචනවලින් නිගමන කිහිපයකින් කැටිකර දක්වන්නේ යයි මේරින්ග් යුක්ති යුක්තව සඳහන් කරයි. මාක්ස්ගේ මෙම වදන්වලින් අපට කියා දෙන්නේ කුමක්ද? ඉන් අපට කියා දෙන්නේ, විප්ලවකාරී තාවකාලික ආණ්ඩුවක් ආඥදායකව ක්‍රියාකළ යුතුම බවත් (ආඥදායකත්වය සටන්පාඨයට බියව සටන්කිරීම නිසා ඉස්ක්‍රා පත්‍රයට කොහෙත්ම වටහා ගැනීමට බැරිවූ අදහසක්) එබඳු ආඥදායකත්වයක කාර්යභාරය නම්, පැරණි ආයතනවල ඉතිරි කොටස් විනාශකර දැමීම බවත්ය (ප්‍රතිවිප්ලයට විරුද්ධ සටන පිළිබඳ රුසියානු සමාජ-ප්‍රජාතාන්ත්‍රික කම්කරු පක්ෂයේ තුන්වෙනි සම්මේලනයේ යෝජනාවෙන් හරියටම ක්‍රමය දක්වා ඇති අතර, අප විසින් ඉහතින් පෙන්වාදෙන ලද අයුරු සාකච්ඡා සහා යෝජනාවෙන් අතහැර දමා ඇත). විප්ලවය හා විවෘත සිවිල් යුද්ධය පවතින කාල පරිච්ඡේදයකදී ''ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවාදී

සිහින දැකීම'' ගැන මාක්ස් විසින් ධනපති ප්‍රජාතාන්ත්‍රිකයන් දෝෂදර්ශනයට ලක්කරනලද බව තුන්වෙනුට හා අවසන් වශයෙන් මෙම වදන්වලින් පැහැදිලිවේ. 1848 ජූනි 6 දින ''නව රයින් පත්‍රයේ'' පළවූ ලිපියෙන් එම වදන්වල තේරුම විශේෂයෙන්ම පැහැදිලිවෙයි. මාක්ස් එය මෙසේ සඳහන් කළේය. ''ආණ්ඩුක්‍රම සම්පාදක ජාතික මන්ත්‍රන සභාවක් පළමුවෙන්ම ක්‍රියාශීලී, — විප්ලවීය ක්‍රියාශීලී — මන්ත්‍රන සභාවක් විය යුතුය. එහෙත්, ප්‍රැන්ක්පර්ට් මන්ත්‍රන සභාව ආණ්ඩුවට රිසියේ කටයුතු කිරීමට ඉඩහරිමින් පාර්ලිමේන්තු ක්‍රමය ගැන පාඨශාලීය අභ්‍යාසවල නිරත වෙයි. මෙම උගත් සභාව, හොඳින් කරුනු සළකා බැලීමෙන් පසුව, හැකි හොඳම න්‍යාය පත්‍රය හා හැකි හොඳම ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව සකස්කලායයි සිතමු. එහෙත්, ඒ අතරවාරයේ ජර්මන් ආණ්ඩුව න්‍යාය පත්‍රයට බයිනේත්තුව ඇතුලු කළේ නම්, හැකි හොඳම න්‍යායය පත්‍රයේ හා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ ඇති ප්‍රයෝජනය කුමක්ද?''[69]

ආඥාදායකත්වය යන සටන් පාඨයේ තේරුම එයයි. ''ආණ්ඩුක්‍රම සම්පාදක මන්ත්‍රන සභාවක් සංවිධානය කිරීමේ තීරණය'' තීරණාත්මක ජයග්‍රහණයක් ලෙසින් හඳුන්වනු ලබන හෝ, ''අන්ත විප්ලවීය විරුද්ධ පක්ෂය ලෙසින් සිටීමට'' අප කැඳවන යෝජනා කෙරෙහි මාක්ස්ගේ ආකල්පය කුමක් වනු ඇතිද යනවග මෙයින් අපට විනිශ්වය කළ හැකිය.

ජාතීන්ගේ ජීවිතය පිළිබඳ ප්‍රධාන ප්‍රශ්න නිරාකරනය කරනු ලබන්නේ බලයෙන් පමණකි. සාමාන්‍යයෙන් පළමුවෙන්ම ප්‍රචන්ඩ ක්‍රියාවලට, සිවිල් යුද්ධයට බසින්නේ ප්‍රතිගාමී පංතීන්මය. ජනවාරි 9 දිනෙන් පසුව සෑමතැනකදීම රුසියානු සේවරී පාලකයන් විසින් ක්‍රමානුකූලව හා එකාකාරව කරන ලද පරිදි, පළමුවෙන්ම ''න්‍යාය පත්‍රයට බයිනේත්තුව ඇතුලු කරන්නේ'' ඔවුහු මය. එබඳු තත්ත්වයක් පැනනැගීමෙන් පසුව, බයිනේත්තුව නියම වශයෙන්ම දේශපාලන න්‍යායය පත්‍රයේ ප්‍රධාන තැනට පැමිනීමෙන් පසුව, අවිගත් කැරැල්ල නැතිවම බැරි හදිසි දෙයක් බවට පත්වීමෙන් පසුව, පාර්ලිමේන්තු ක්‍රමය පිළිබඳ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවාදී සිහින හා පඨශාලීය අභ්‍යාස වනාහී ධනපති පංතික ක්‍රමයට විප්ලවය පාවාදීම සඳහා තබන කඩතුරාවක් පමණක් වෙයි. ධනපති පංතිය විප්ලවයෙන් ''ඉවත්වීම'' සඟවන පටලයක් වෙයි. එහෙයින්, නියම විප්ලවීය පංතිය විසින් ඉදිරියට ගෙනයා යුත්තේ ආඥාදායකත්වය පිළිබඳ සටන් පාඨයමය.

ආඥාදායකත්වයේ කාර්යභාරයන් සම්බන්ධයෙන් මාක්ස් කල්තබාම ''නව රයින් පත්‍රයේ''මෙසේ සඳහන් කළේය.''ජාතික මන්ත්‍රී මණ්ඩලය යල්පැනගිය ආණ්ඩුවල ප්‍රතිගාමී ප්‍රයත්නයන්ට විරුද්ධව



ආඥාදායක ලෙස ක්‍රියාකළ යුතුව තිබුනි. එවිට, ඊට පක්ෂපාතීවන මහජන මතයේ බලවේගය සියලුම බයිනේත්තු සුනුවිසුනු කිරීමට තරම් ශක්තිමත් වන්නට තිබුනි..... එහෙත් මේ මන්ත්‍රී මණ්ඩලය, මහජනයා තමන් සමග ගෙනයාම හෝ ඔවුන් විසින් ගෙනයනු ලැබීම හෝ වෙනුවට ජර්මන් ජනතාව වෙහෙසට පත්කරයි.''[70] මාක්ස්ගේ අදහස අනුව, ජාතික මන්ත්‍රී මණ්ඩලය විසින් ''මහජනයාගේ ස්වතන්ත්‍රභාවය පිළිබඳ ප්‍රතිපත්තියට පටහැනිව ජර්මනිය තුළ නියම වශයෙන් පවත්නා සෑම දෙයක්ම පාලනය කෙරෙන් තුරන් කළ'' යුතුව තිබුනි. ඉන්පසුව එම මන්ත්‍රී මණ්ඩලය විසින් ''විප්ලවය තුළින් දිනාගත් මහජන ස්වතන්ත්‍රභාවය, සියලු ප්‍රහාරයන්ට මුහුණදී රැකගනු පිනිස තමන් ගෙන යන විප්ලවීය පිළිවෙත තහවුරු''[71] කළයුතුව තිබුනි.

මෙනයින් 1848 දී, මාක්ස් විප්ලවීය ආණ්ඩුවක් හමුවේ තැබූ කාර්යභාරයන් හරය විසින්, මූලික වශයෙන්, ප්‍රතිවිප්ලවයෙන් ආරක්ෂාව සැලසීමත් ජනතාවගේ ස්වතන්ත්‍රභාවයට පටහැනි වූ සෑමදෙයක්ම තුරන්කිරීමත් විය. මෙය විප්ලවකාරී, ප්‍රජාතාන්ත්‍රික ආඥාදායකත්වයට වඩා වැඩියමක් නොවීය.

තවදුරටත් කරුනු දක්වීමේදී, මාක්ස්ගේ අදහස් අනුව මෙම කාර්යභාරයන් සම්පූර්ණ කළහැකි වන්නේත් එසේ කළයුතු වන්නේත්, (නියම වශයෙන් ජනතාවගේ ස්වතන්ත්‍ර භාවය පිළිබඳ ප්‍රතිපත්තිය සම්පූර්ණයෙන් ක්‍රියාවේ යොදවා ප්‍රතිවිප්ලවය පරාජයකිරීම) කුමන පංතින් විසින්ද? එහිදී මාක්ස් 'ජනතාව' ගැන කියයි. එහෙත් ඔහු සෑමවිටම 'ජනතාවගේ' සමගිය හා ජනතාව අතර පංති සටනක් නැතිවීම පිළිබඳ සුළු ධනපති පංතික මුළා විශ්වාසයන්ට විරුද්ධව සටන්කළ බව අපි දනිමු. ''ජනතාව'' යන පදය වහරට ගැනීමේදී මාක්ස් පංති භේදය අමතක නොකළ අතර විප්ලවය අවසානය දක්වා ගෙනයාමට සමත් නිශ්චිත කොටස් එක්කොට දැක්වූයේය.

මාර්තු 18 දින බර්ලින්හි නිර්ධන පංතිය ජයග්‍රහණය කිරීමෙන් පසුව විප්ලවයේ ප්‍රතිඵල දෙයාකාර බව ඔප්පු වී යයි සඳහන් කළ ''නව රයින් පත්‍රය'' මෙසේ ලිවේය. ''එක් අතකින් ජනතාව සන්නද්ධකිරීම, එක්වීමේ අයිතිය හා ජනතාවගේ ස්වතන්ත්‍රභාවයත් නියම වශයෙන්ම දිනාගෙන ඇති අතර අනික් අතින්, රාජාණ්ඩුව හා කැම්ප්හවුසන් හාන්සෙමාන් ඇමති මණ්ඩලය එනම් ධනපති පංතික නියෝජිතයන්ගේ ආණ්ඩුව ආරක්ෂාවී තිබේ. මෙනයින් විප්ලවය අනිවාර්යයෙන්ම දෙපැත්තකට විහිදී යායුතු වූ ප්‍රතිඵල කාණ්ඩ දෙකකින් යුක්ත විය. ජනතාව ජයග්‍රහණය ලබා තිබේ. ඔවුන් තීරණාත්මක ප්‍රජාතාන්ත්‍රික ස්වභාවයෙන් යුතු උරුමයන් දිනාගෙන

ඇත. එහෙත් නියම බලය ලැබී ඇත්තේ ඔවුන් අතට නොව ධනපති පංතිය අතටයි. කොටින් කියතොත් විප්ලවය සම්පූර්ණ වී නැත. මහජනයා ඇමති මණ්ඩලයක් පිහිටුවීමට ධනපති පංතියට ඉඩදුන් අතර ධනපති පංතිය පැරණි ප්රුසියන් වංශවතුන් හා නිලධාරි පැලැන්තිය සමග එක්වීමෙන් තම ප්රයත්නයන් කුමක්දැයි ඔප්පු කළේය. ආර්නිම්, කනිට්ස් හා ෂ්වේරින් ඇමති මණ්ඩලයට එක්වූහ.

කවදත් විප්ලව විරෝධී වූ ඉහළ ධනපති පංතිය, ජනතාව කෙරෙහි බියවෙමින්, එනම්, කම්කරුවන් හා ප්රජාතාන්ත්රික ධනපති පංතිය කෙරෙහි බියවෙමින් ප්රතිගාමීන් සමග ආරක්ෂක හා ප්රහාරක සම්මුතියකට එළඹුනාහ.'' (ඉරිගැසීම අපේය.)[72]

මෙනයින්, ''ආණ්ඩුක්රම සම්පාදක මන්ත්රන සභාවක් සංවිධානය කිරීමේ තීරණයක්'' පමණක් නොව එය නියම වශයෙන්ම පිහිටුවීම පවා විප්ලවයේ තීරණාත්මක ජයග්රහණයක් සඳහා ප්රමානවත් නොවේ. අවිගත් සටනකදී ලබන අර්ධ ජයග්රහණයකින් පසුව වුවද (1848 මාර්තු 18 දින යුද හමුද පරදවා බර්ලින්හි කම්කරුවන් ජයලැබීම) "අසම්පූර්ණ'' විප්ලවයකට, ''අවසානය දක්වා ගෙන නොගිය'' විප්ලවයකට ඉඩ තිබේ. එසේනම් එය සම්පූර්ණ කිරීම රඳාපවත්නේ කුමක් මතද? කැරැල්ල අවසන්වූ හැටියේම පාලන බලය අත්වන්නේ පෙත්රුන්කේවිච් හා රෝදිචෙව් කණ්ඩායමටද එනම්, කැම්ප්හවුසන් හා හාන්සෙමාන් කණ්ඩායමටද නැතහොත් 'ජනතාව' හෙවත් කම්කරුවන් හා ප්රජාතාන්ත්රික ධනපති පංතිය අතටද යන ප්රශ්නය උඩ එය රඳා පවතී. පළමුව සඳහන් කළ සිදුවීමේදී, ධනපති පංතියට බලය ලැබෙනු ඇති අතර, නිර්ධන පංතියට ''විවේචන නිදහස,'' ''අන්ත විප්ලවීය විරුද්ධ පක්ෂය ලෙසින් සිටීමේ නිදහස'' හිමිවනු ඇත. එහිදී ජයග්රහණය කළ වහාම ධනපති පංතිය ප්රතිගාමීන් සමග සම්මුතියකට එළඹෙනු ඇත. (නිදසුනක් දක්වතොත්, සාන්ත පීටර්ස්බර්ග් කම්කරුවන් ආණ්ඩුවේ හමුද සමග කළ වීදි සටනින් අර්ධ ජයග්රහණයක් පමණක් ලබා පෙත්රුන්කේවිච් හා පිරිසට ආණ්ඩුවක් පිහිටුවීමට ඉඩහලේනම් රුසියාවේද මෙය සිදුවනු නියතය.) දෙවැනිව කී සිදුවීමේදී විප්ලවීය ප්රජාතාන්ත්රික ආඥාදායකත්වයක්, එනම්, විප්ලවයේ සම්පූර්ණ ජයග්රහණයක් ලැබීමට ඉඩ ලැබේ.

''ප්රජාතාන්ත්රික ධනපති පංතිය (demokratische Bürgerschaft) යනුවෙන් මාක්ස් නියම වශයෙන් අදහස් කළේ කව්රුන්ද, ධනපති පංතියෙන් වෙන්කොට කම්කරුවන් සමග මහජනයා නමින් ඔහු විසින් හඳුන්වනු ලැබූ ''ප්රජාතාන්ත්රික ධනපති පංතිය'' යනුවෙන් මාක්ස්



නියම වශයෙන් අදහස් කළේ කවුරුද යන්න දැන් පැහැදිලිව විග්රහ කරගත යුතුවෙයි.

1848 ජූලි 29 දින ''නව රයින් පත්රයේ'' පළවූ ලිපියකින් උපුටාගෙන පහත සඳහන් කරන ඡේදයෙන් මේ ප්රශ්නයට පැහැදිලි පිළිතුරක් ලැබේ: ''... 1848 ජර්මන් විප්ලවය, 1789 ප්රංශ විප්ලවයේ හාස්යජනක කනපිට අනුකරනයක් පමණි.

''බැස්ටිල් බලකොටුවට පහරදීමෙන් සති තුනකට පසුව 1789 අගෝස්තු 4 දින ප්රංශ ජනතාව එක් දිනකින් සියලු වැඩවසම් සේවාවන් සියතට ගත්හ.

''මාර්තු සටනින් මාස හතරකට පසුව 1848 ජූලි 11 දින වැඩවසම් සේවාවන් විසින් ජර්මන් ජනතාව සියතට ගන්නා ලදී. Teste Gierke cum Hansemanno*

''1789 ප්රංශ ධනපති පංතිය තම මිතුරන්වූ ගොවීන් මොහොතකටවත් අත්හැර නොදැමූහ. තම පාලනයේ පදනම නම්, පිටිසරබද පෙදෙස්වල වැඩවසම් ක්රමය විනාශ කර දමා නිදහස් ඉඩම්හිමි (grundbesitzenden) ගොවි පංතියක් බිහිකිරීම බව ඔවුහු දත්හ.

''1848 ජර්මන් ධනපති පංතිය කිසිඳු පැකිලීමක් නැතිව තමන්ගේ ඉතාමත් ස්වාභාවික මිතුරන් වූත්, තමන්ගේ මාංශය මෙන්ම, වංශවතුන්ට විරුද්ධව කටයුතු කිරීමේදී ශක්තිය සඳහා නැතිවම බැරි පිරිසක් වූත් ගොවිජනයා අතහැර දැමූහ.

''වැඩවසම් හිමිකම් දිගටම පැවැත්වීම හා (බොරුවට) නිදහස් කිරීමේ ව්යාජයෙන් ඒවා අනුමත කිරීමත්, 1848 ජර්මන් විප්ලවයේ ප්රතිඵල විය. කන්දක් විලිලා මී පැටවකු වැදුයේය.''[73]

---

* ''සාක්ෂ්ය: ගීර්කෙ මහතා සහ හාන්සෙමාන් මහතා.'' හාන්සෙමාන් විශාල ධනේශ්වර පංතිය නියෝජනය කළ ඇමතිවරයෙකි. (රුසියානු සමානත්වය: ත්රුබෙට්ස්කොයි හෝ රෝදිචෙව් ආදීන්). ගීර්කෙ හාන්සෙමාන් ඇමති මන්ඩලයේ කෘෂිකර්මාන්ත ඇමතිවරයා ය. වචනයෙන් 'වන්දි රහිතව' 'වැඩවසම් බර අහෝසි කිරීමේ' 'එඩිතර' සැලැස්මක් ඔහු සකස් කළේය. එහෙත් එයින් ඇත්ත වශයෙන්ම සිදුවූයේ සුළු හා නොවැදගත් බර අහෝසි කරන අතර වඩාත් වැදගත් ඒවා රැකීම හෝ ඒවාට වන්දි ගෙවීමයි. ගීර්කෙ මහතාද 'ගොවි ඉඩම් අයිතිය පුළුල් කිරීමට' ආශාකරන මුත් ඉඩම්හිමියන් අමනාප කිරීමට අකැමැති රුසියානු කබ්ලුකොව්ලා, මනුයිලව්ලා, හෙර්සෙන්ෂ්ටයින්ලා හා ගොවියාගේ එබඳු වෙනත් ලිබරල් මිත්රයන් බඳු කෙනෙකි.

මෙය බොහෝ කරුණු උගන්වන ඡේදයකි. ඉන් වැදගත් කරුණු හතරක් පෙන්වයි. 1) ජර්මන් ධනපති පංතිය විසින් පොදුවේ ප්‍රජාතන්ත්‍රවාදය පමණක් නොව, විශේෂයෙන් ගොවිජනයාද පාවාදීම නිසා, අසම්පූර්ණ ජර්මන් විප්ලවය, සම්පූර්ණවූ ප්‍රංශ විප්ලවයට වඩා වෙනස් එකක් වන බවත්, 2) ප්‍රජාතාන්ත්‍රික විප්ලවයත් සම්පූර්ණ කිරීමේ පදනම නිදහස් ගොවිජන පංතියක් නිර්මානය කිරීම බවත්, 3) එබඳු පංතියක් නිර්මානය කිරීමෙන් වැඩවසම් සේවාවන් අහෝසි කිරීම හා වැඩවසම් ක්‍රමය විනාශකර දැමීම අදහස් වන නමුත්, එයින් සමාජවාදී විප්ලවයක් අදහස් නොවන බවත්, 4) ගොවිජනයා, ධනපති පංතියේ ''ඉතාමත් ස්වාභාවික'' මිතුරන් වන බව, එනම් ගොවිජනයා නොමැතිවූ ප්‍රජාතාන්ත්‍රික ධනපති පංතිය ප්‍රතිගාමිත්වය ඉදිරියේ ''දුර්වල'' වන බවත්, එම කරුණු හතර වෙයි.

නිශ්චිත ජාතික විශේෂතාවලට සුදුසු පරිදි ඉඩදෙමින් වැඩවසම් ක්‍රමය වෙනුවට දසක්‍රමය යොදගත්විට මේ සියලු නිගමන 1905 රුසියාවට සම්පූර්ණයෙන් ගැලපේ. මාක්ස් විසින් පැහැදිලි කරන ලද පරිදි, ජර්මනියේ අත්දැකීම්වලින් පාඩම් ගන්නාවිට, විප්ලවයේ තීරණාත්මක ජයග්‍රහණයක් සඳහා ගොවි කම්කරු විප්ලවීය ප්‍රජාතාන්ත්‍රික ආඥාදායකත්වය පිළිබඳ සටන් පාඨය හැර වෙන සටන් පාඨයක් පිළිගැනීමට අපට නුපුලුවන් බවට සැකයක් ඇතිවිය නොහේ. 1848 දී මාක්ස් විසින්, විරෝධය දක්වන ප්‍රතිගාමීන්ට හා ද්‍රෝහී ධනපති පංතියට විරුද්ධව ඉදිරිපත් කරන ලද 'ජනතාව' ප්‍රධාන වශයෙන් සමන්විත වන්නේ නිර්ධන පංතියෙන් හා ගොවිජනයාගෙන් බවට සැකයක් නැත. රුසියාවේද, ලිබරල් ධනපති පංතිය හා අස්වබඡ්ජේනිය පෙරමුණේ මහත්වරුන් ගොවිජනයා පාවාදෙමින් සිටිනු මෙන්ම දිගටම එසේකරන බවටද, එනම්, ව්‍යාජ ප්‍රතිසංස්කරණවලට සීමාවී, ගොවීන් හා ඉඩම්හිමියන් අතර තීරණාත්මක සටනේදී ඉඩම්හිමියන්ගේ පැත්ත ගන්නා බවට කිසි සැකයක් නැත. මෙම සටනේදී, අවසානය දක්වා ගොවීන්ට සහයෝගය දීමට හැකිවන්නේ නිර්ධන පංතියට පමණකි. අවසානයේදී රුසියාවේද, ගොවිජන සටන සාර්ථකවීමෙන්, එනම්, ඉඩකඩම් සියල්ලම ගොවීන්ට පැවරීමෙන්, ප්‍රජාතාන්ත්‍රික විප්ලවය සම්පූර්ණ වන අතර, එය විප්ලවය කෙලවර දක්වා ගෙන යාමේ සමාජ ආධාරය වන බවට සැකයක් නැත. එහෙත් කිසිසේත්ම, එය, සමාජවාදී විප්ලවයක් හෝ, සුලුධනපති පංතික දෘෂ්ටිවාදීන් හා සමාජවාදී විප්ලවකාරීන් කියන අන්දමේ ''සමාජ සන්තක කිරීමක්'' හෝ නොවේ. ගොවිජන කැරැල්ල සාර්ථක වීමෙන්, ප්‍රජාතාන්ත්‍රික විප්ලවය ජයග්‍රහණය කිරීමෙන්, සිදුවන්නේ, ප්‍රජාතාන්ත්‍රික



සමූහාණ්ඩුවක් පදනම කොටගෙන සමාජවාදය සඳහා කරන අවංක තීරණාත්මක සටනට මග හෙලිකිරීම පමනි. මෙම සටනේදී, ඉඩම් හිමි පංතියක් වශයෙන්, ගොවීන්, දැන් ප්‍රජාතන්ත්‍රවාදය සඳහා කරන සටනේදී ධනපති පංතිය අනුගමනය කරන ද්‍රෝහී චපල පිළිවෙතම අනුගමනය කරනු ඇත. මේ බව අමතක කිරීම, සමාජවාදය අමතක කිරීමකි. නිර්ධන පංතියේ නියම අපේක්ෂාවන් හා කාර්යභාරයන් සම්බන්ධයෙන් තමන් මෙන්ම සෙසු අයද රවටා ගැනීමකි.

1848 දී මාක්ස් දැරූ අදහස් ඉදිරිපත් කිරීමේදී අඩුපාඩුකම් ඇති නොවනු පිනිස, එකල ජර්මන් සමාජ-ප්‍රජාතන්ත්‍රවාදය (හෙවත් එම කාලයේ ව්‍යවහාරය අනුව නිර්ධන පංතියේ කොමියුනිස්ට් පක්ෂය) සහ වර්තමාන රුසියානු සමාජ–ප්‍රජාතන්ත්‍රවාදය අතර ඇති එක් වැදගත් වෙනසක් සඳහන් කිරීම අවශ්‍යවේ. ඒ ගැන මෙරින්ග් මේසේ කියයි:

''නව රයින් පත්‍රය'' 'ප්‍රජාතන්ත්‍රවාදයේ හොරනෑවක්' ලෙසින් දේශපාලන පොරපිටිය තුළ පෙනී සිටියේය. එහි පලවූ සියලු ලිපි මැදින්, දිවෙන රතු හුය හඳුනාගැනීම පහසුය. එහෙත්, ධනපති පංතියට එරෙහිව නිර්ධන පංතියේ අපේක්ෂාවන් රකිනුවට වඩා, එමගින් කෙලින්ම ඒකාධිපති ක්‍රමයට හා වැඩවසම් ක්‍රමයට විරුද්ධ ධනපති විප්ලවයේ අපේක්ෂාවන් ඉදිරියට ගෙනයන ලදී.සති දෙකකට වරක් මේ පත්‍රය සමග,මෝල්ගේ සහ ෂැපර්ගේ කර්තෘත්වයෙන් සකස්වූ,කොලොං කම්කරු සංගමයේ විශේෂ ප්‍රචාරක පත්‍රයක්[74] පලවූ නමුත්, විප්ලව කාලයේදී, වෙනම කම්කරු පංති ව්‍යාපාරයක් ගැන මෙහි සඳහන්වූයේ ඉතා සුලුවශයෙනි. ''නව රයින් පත්‍රයේ'' ඉතාමත් දක්ෂ ලේඛකයා වූ ස්ටෙපන් බෝර්න්, පැරිස් හා බ්‍රසල්ස්හිදී මාක්ස්ගේ හා එංගල්ස්ගේ ශිෂ්‍යයෙකු ලෙසත්, 1848 දී බර්ලින් නුවර මේ පත්‍රයේ වාර්තාකරු ලෙසත් කටයුතු කළ නමුත්, මෙම පත්‍රය එකල ජර්මනියේ කම්කරු පංති ව්‍යාපාරය කෙරෙහි දැක්වූ අල්ප අවධානය දකින වර්තමාන පාඨකයන් මවිත වනු ඇත. කම්කරුවන් අතර තමන් ගෙන ගිය උද්ඝෝෂන කටයුතු අනුමත නොකරන එකද වචනයක්වත් මාක්ස්ගෙන් හා එංගල්ස්ගෙන් නොපැවසුනු බව තම මතක සටහන් ලියන බෝර්න් පවසයි. එහෙත් යටත් පිරිසෙයින් මේ උද්ඝෝෂන ගෙනයන ක්‍රම ගැනවත් ඔවුන් අප්‍රසාදය දක්වන්නට ඇතිබව එංගල්ස්ගේ පසුකාලීන ප්‍රකාශවලින් පෙනේ. ජර්මනියේ වැඩි කොටසක එකල සම්පූර්ණයෙන් නොදියුනු තත්ත්වයක පැවති නිර්ධන පංතියේ පංතිහැඟීමට, කොමියුනිස්ට් ප්‍රකාශනයේ අදහස් අනුව නොගැලපෙන සහන දීමට බෝර්න්ට සිදුවූ හෙයින්, මාක්ස්ගේ හා එංගල්ස්ගේ අප්‍රසාදය යුක්ති යුක්ත විය. එහෙත් තමන් ගෙන ගිය උද්ඝෝෂනය සාපේක්ෂ

වශයෙන් උසස් මට්ටමකින් පවත්වා ගැනීමට බෝර්න් සමත් වූ හෙයින් එම අප්‍රසාදය යුක්ති යුක්ත නොවේ. ධනපති පංති විප්ලවය හැකිතරම් දුරට ගෙනයාම කම්කරු පංතියේ මූලික අපේක්ෂාව බව කල්පනා කිරීමේදී මාක්ස් හා එංගල්ස් ඓතිහාසික හා දේශපාලන වශයෙන් නිවැරදිවූ බවට සැක නැත... එහෙත් මාක්ස් හා එංගල්ස් විසින් 1849 අප්‍රේල් මාසයේදී, විශේෂ කම්කරු සංවිධානයකට පක්ෂව ප්‍රකාශයක් කොට, නැගෙනහිර ප්‍රැසියාවේ නිර්ධන පංතිය විසින් සූදනම් කෙරුනු කම්කරු සම්මේලනයට සහභාගිවීමට තීරණය කරනු ලැබීමෙන්, ශ්‍රේෂ්ඨ පුද්ගලයන්ගේ අදහස් වෙනස්කිරීමට කම්කරු පංති ව්‍යාපාරය පිළිබඳ මූලික හැඟීම කෙතරම් සමත්වන්නේද යන වග පිළිබඳ කදිම සාක්ෂියක් ලැබේ.''

මෙසේ, මාක්ස් හා එංගල්ස් විසින් විශේෂ කම්කරු සංවිධානයකට පක්ෂව ප්‍රකාශයක් කරන ලද්දේ, විප්ලවකාරී පුවත්පත පලකිරීම ආරම්භවී අවුරුද්දක් පමණ ගෙවී ගියපසු 1849 අප්‍රේල් (''නව රයින් පත්‍රය'' පලකිරීම ආරම්භවූයේ 1848 ජූනි 1 දිනය) මාසයේදීය! එතෙක් ඔවුන් කළේ ස්වාධීන කම්කරු පක්ෂයක් සමග කිසිම සංවිධානමය බැඳීමකින් තොරව ''ප්‍රජාතාන්ත්‍රික ප්‍රචාරක පත්‍රයක්'' පලකිරීම පමනි. අපේ වර්තමාන කල්පනාවන් අනුව, වියනොහැකි, දුර්දන්ත ක්‍රියාවක් සේ පෙනෙන මෙම කාරනයෙන්, එකල ජර්මන් සමාජ–ප්‍රජාතන්ත්‍රවාදී පක්ෂය හා මෙකල රුසියානු සමාජ–ප්‍රජාතන්ත්‍රවාදී කම්කරු පක්ෂය අතර කෙතරම් විශාල වෙනසක් තිබේද යන වග පැහැදිලිව පෙන්වාදෙයි. එසේම ජර්මන් ප්‍රජාතාන්ත්‍රික විප්ලවය තුළ (1848 දී ජර්මනිය ආර්ථික හා දේශපාලන වශයෙන් නොදියුණුවූ නිසාත් රාජ්‍යයක් වශයෙන් සමගි නොවූ නිසාත්) ව්‍යාපාරයේ නිර්ධන පංතික අංග හා ඒතුළ ඇති නිර්ධන පංතික බලපෑම ප්‍රකට වූයේ කෙතරම් සුළුවෙන්ද යනවගත් ඉන් පෙන්වයි. ස්වාධීන නිර්ධන පංතික පක්ෂයක් සංවිධානය කිරීමේ අවශ්‍යතාවය ගැන මෙම වකවානුවේදීත්, ඉන් මඳකලකට පසුවත් මාක්ස් විසින් කොතෙකුත් කරනලද ප්‍රකාශ තක්සේරුකිරීමේදී මේ බව අමතක නොකළ යුතුය. ප්‍රජාතාන්ත්‍රික විප්ලවයේ අත්දැකීම්වල ඵලයක් වශයෙන් මාක්ස් මෙම නිගමනයට බැස්සේ, ඉන් අවුරුද්දක් පමණ ගෙවී ගියාට පසුවය. මන්දයත්, එකල ජර්මනියේ වටපිටාව එතරම් දූෂිතවූ, සුළු ධනපති පංතික එකක් වූ හෙයිනි. මේ නිගමනය අපට, ජාත්‍යන්තර සමාජ–ප්‍රජාතන්ත්‍රවාදයේ අවුරුදු පනහක අත්දැකීම්, පිළිබඳ පැරණි හා ස්ථිර කරුණු පිඩුකිරීමකි. රුසියානු සමාජ–ප්‍රජාතාන්ත්‍රික කම්කරු පක්ෂය සංවිධානය කිරීම අප ආරම්භකළේ ඒ ඇසුරෙනි. අප ගැන බලනවිට, විප්ලවකාරී නිර්ධන



පංතික පුවත්පත් නිර්ධන පංතියේ සමාජ-ප්‍රජාතාන්ත්‍රික පක්ෂයෙන් බැහැරව සිටීම ගැන හෝ ඒවා මොහොතකටවත් හුදෙක් ''ප්‍රජාතන්ත්‍රවාදයේ ප්‍රචාරක පත්‍ර'' ලෙසින් පලකිරීම ගැන හෝ ප්‍රශ්නයක් ඇතිවිය නොහැක.

එහෙත් මාක්ස් හා ස්ටේපන් බෝර්න් අතර පෙනෙන්නට නොතිබුනු වෙනස අප අතර වඩාත් වැඩුනු ස්වරූපයකින් පෙනෙන්නට තිබේ. ඊට හේතුව නම්, අපේ විප්ලවයේ ප්‍රජාතාන්ත්‍රික දිය ධාරාව තුළ නිර්ධන පංති ප්‍රවාහය වඩා බලවත් ලෙස ප්‍රකටවීමයි.ස්ටේපන් බෝර්න් ගෙනගිය උද්ඝෝෂනය සම්බන්ධයෙන් මාක්ස් හා එංගල්ස් තුළ තිබෙන්නට ඇති අප්‍රසාදය සම්බන්ධයෙන් කියන මේරින්ග් ඒගැන සඳහන් කරන්නේ ඇඟ බේරා ගනිමින් සුළු වශයෙනි. 1885 දී එංගල්ස් "Enthüllungen über den Kommunistenprozeß zu Köln." Zürich 1885* සඳහා පෙරවදනෙහි බෝර්න් ගැන සඳහන් කළේ මෙසේය:

කොමියුනිස්ට් සංගමයේ[75] සාමාජිකයෝ සැමතැනදීම, මෙම පෙරමුණ විප්ලවීය සටන පිළිබඳ අනර්ඝ පාසැලක් බව ඔප්පුකරමින්, අන්ත ප්‍රජාතාන්ත්‍රික ව්‍යාපාරයේ ඉදිරියෙන්ම සිටියහ. සංගමයේ ක්‍රියාශීලී සාමාජිකයෙකු ලෙසින් බ්‍රසල්ස් හා පැරිස් යන නගරවල කටයුතුකළ, වර්න සංයොජක ස්ටේපන් බෝර්න්, බර්ලින්හි ''කම්කරු සහෝදර'' සංවිධානයක් ("Arbeiterverbrüderung'') ඇතිකළේය. සෑහෙන තරම් ප්‍රචලිත වූ එය 1850 වන තෙක් පැවැත්තේය. බෝර්න් බොහෝ කුශලතා පරිපූර්ණ තරුණයකු වූ නමුත්, ඔහු, ලොකු දේශපාලකයෙකු බවට පත්වීමට පමණට වඩා ඉක්මන් වූවෙක් විය. තමන් වටා පිරිසක් රැස්කරගැනීමේ අදහසින් Kreti und Plethi බොහෝ සෙයින් විවිධාකාරවූ කොටස් සමග ''සහෝදර'' බැමි ඇතිකරගත් නමුත් ඔහු ප්‍රතිවිරෝධී නැඹුරුවීම් සමගි කිරීමට හෝ අර්බුද විසඳීමට සමතෙක් නොවීය. එහි ඵලයක් වශයෙන් සංගමයේ නිල ප්‍රකාශන වලින්, ''කොමියුනිස්ට් ප්‍රකාශනයේ'' අදහස් කෘතීම කල්පනාවන්ගෙන් හා බලාපොරොත්තුවලින් මෙන්ම ලුයි බ්ලාන්ගේ හාප්රුදෝන්ගේ ඇතැම් අදහස් හා ආරක්ෂකවාදයේ අදහස්වලින් ව්‍යාකූල කරන ලදී. කොටින් කියතොත් ඔවුන්ට උවමනා කළේ සියලුම දෙන සතුටු කිරීමටය (Allen alles sein). විශේෂයෙන්ම, වැඩවර්ජන, වෘත්තීය සංගම් හා නිෂ්පාදක සමුපකාර පිහිටුවන ලද නමුත්, එවැනි දේ කල්පවත්නා පදනමක් මත සාර්ථක කළ හැක්කේ ඒ සඳහා

* කොලොං කොමියුනිස්ට් නඩු විභාගය පිළිබඳ අනාවරනයන් — ශූරිච්, 1885. — සංස්කාරක.

ක්ෂේත්‍රයවූ දේශපාලන ජයග්‍රහණ මගින් ඒවා දිනාගැනීමෙන්ය යන ප්‍රශ්නය ඔහුට අමතක විය. පසුව, ප්‍රතිගාමිත්වයේ ජයග්‍රහණ නිසා සහෝදර සංවිධානයේ නායකයින්ට, විප්ලවීය සටනේදී කෙලින්ම වැඩකොටසක් ඉටුකිරීමේ අවශ්‍යතාවය අවබෝධ වූ විට, ස්වාභාවිකවම, ඔවුන් වටා කලින් රැස්කරගෙන සිටි නොදියුණු ජනතාව ඔවුන් අත්හැර ගියහ. 1849 ඩ්රෙස්ඩන් කැරැල්ලට සහභාගි වූ බෝර්න් යන්තම් ඉන් දිවිගලවාගත්තේය. කම්කරු සහෝදර සංවිධානයද නිර්ධන පංතියේ මහා දේශපාලන ව්‍යාපාරයෙන් බැහැරවූ වෙනම පෙරමුණක් සේ කටයුතු කළ අතර, බොහෝ සෙයින්ම එය ලිපිලේඛන තුළ පමණක් පැවතුන එකක් විය. එහි වැඩකටයුතු කොතරම් වැදගැම්මක් නැතිවීද යත්, 1850 තෙක් එම සංවිධානයත්, ඊට බොහෝ අවුරුදු ගණක් පසුවන තෙක් එහි ශාඛාවනුත් මැඩලීමට ප්‍රතිගාමීන්ට අවශ්‍ය නොවීය. දේශපාලන නායකයෙකුගේ තැනට නොව ස්විස් මහාචාර්යවරයෙකුගේ තැනට පත් බෝර්න් (ඔහුගේ නියම නම Buttermilch)* තවදුරටත් මාක්ස්ගේ වදන් බාහිර ඔපයෙන් යුතු වදන්වලට පරිවර්තනය නොකරන අතර නිවට රෙනාන්ගේ අදහස් තමන්ට පුරුදු ජර්මන් බසට නගයි.''[77]

ප්‍රජාතාන්ත්‍රික විප්ලවයේදී සමාජ-ප්‍රජාතන්ත්‍රවාදයේ උපාය මාර්ග දෙක එංගල්ස් විසින් විනිශ්චය කරන ලද්දේ එසේය.

'ආලෝකය දකින්නේය' යනුවෙන් රාජාණ්ඩුවාදී ධනපති පංතියේ ප්‍රශංසාව දිනාගන්නා තරමේ අයුක්ති සහගත උද්‍යෝගයකින් යුතුව

---

* එංගල්ස් පරිවර්තනය කිරීමෙහිදී ප්‍රථම සංස්කරණයෙහි Butter milch" (මුදවපු කිරි. සංස්කාරක) යන වචනයක් පුද්ගලනාමය නොව පොදු නාමයක් ලෙස ගැනීමෙන් මට වැරැදීමක් සිදුවිය. මෙම වැරැදීම ස්වාභාවිකවම මෙන් මෙන්ෂෙවික් වරුන්ගේ ඉමහත් සන්තුෂ්ටියට හේතුවිය.මා විසින් 'එංගල්ස් අරුත්සරු කර තිබේ' යයි කල්ට්සොව් ලිවීය. (''දෙවසර'' යන සංග්‍රහයේ යළි පළවූ ලිපියක් ගැනය). ප්ලෙහානව් ''තවාරිෂ්'' හිදී පවා මෙම වැරැදීම යළි මතක් කරයි.[76] කොටින් කිවහොත්, 1848 ජර්මනියේ පැවැති බෝර්න් ප්‍රවනතාවය (අපේ ආර්ථිකවාදීන්ට සමාන) හා මාක්ස්වාදී ප්‍රවනතාවය යන කම්කරු පංති ව්‍යාපාරයේ ප්‍රවනතා දෙක වසං කිරීම සඳහා අනගි අවස්ථාවක් එයින් ඔවුන්ට පැදින. බෝර්න්ගේ නමට අදුලවුවද, ප්‍රතිවාදියකුගේ වැරැදීමකින් අයුතු ප්‍රයෝජන ගැනීම ස්වාභාවික වීමකට වැඩි දෙයකි. එහෙත්, පරිවර්තනයක නිවැරැදි කිරීමක් උපක්‍රම දෙකක් පිළිබඳ ප්‍රශ්නයේ හරය වසන් කිරීම සඳහා පාවිච්චි කිරීම නියම ප්‍රශ්නය මග හැරීමකි. (1907 මුද්‍රණයට කර්තෘ විසින් සටහන සපයන ලදී — සංස්කාරක)



අපේ නව ඉස්ක්‍රාකාරීන්ද 'අර්ථවාදය' දෙසට තල්ලුවේ. ඔවුහුද, 'උද්‍යෝගය', 'ප්‍රජාතන්ත්‍රවාදය' හා 'ස්වතන්ත්‍රභාවය' ආදී සටන්පාඨවලින් නොදියුණු මහජනයාගේ සිත් කපටි ලෙස ඇදගනිමින් ''අර්ථවාදීන්'' වර්ණනා කරමින්, තමන්වටා සුළු පිරිස් රැස්කරගනිති. ඔවුන්ගේ වෘත්තීය සංගම්ද බොහෝ විට පවතින්නේ හ්ලෙස්තකොව්[78] පන්නයේ නව ඉස්ක්‍රා පත්‍රයේ පිටු අතර පමණකි. ඔවුන්ගේ සටන්පාඨ හා යෝජනාද ''නිර්ධන පංතියේ මහා දේශපාලන ව්‍යාපාරය'' පිළිබඳ කාර්යභාරයන් තේරුම්ගැනීමට එබඳුම අසමත්කමක් දක්වයි.

1905 ජූනි-ජූලි වලදී ලියන ලදී.

1905 ජූලි මාසයේදී ලියවිල්ලක් සේ ජිනීවා හිදී ප්‍රථම වරට මුද්‍රණය කරන ලදී.

## සටහන්

1 ''ප්‍රජාතන්ත්‍රික විප්ලවයේදී සමාජ-ප්‍රජාතන්ත්‍රවාදයේ උපක්‍රම දෙකක්'' 1905 ජූනි-ජූලි මාසවලදී ලෙනින් විසින් ජිනීවාහිදී ලියන ලදී. රු. ස. ප්‍ර. ක. පක්ෂයේ මධ්‍යම කාරක සභාව විසින් 1905 ජූලි අගදී පොත ජිනීවාහි පළ කරනු ලැබීය. එම වර්ෂයේම රුසියාව තුළ රු. ස. ප්‍ර. ක. පක්ෂයේ මධ්‍යම කාරක සභාව විසින්ද, දෙවන වර පක්ෂයේ මොස්කව් කමිටුව විසින්ද (එවර පිටපත් 10,000) නැවත මුද්‍රණය කරන ලදී.

පොත රට පුරාම, විශේෂයෙන් සාන්ත පීටර්ස්බර්ග්, මොස්කව්, කසාන්, තිප්ලිස් හා බකූ වල නීතිවිරෝධී ලෙස බෙදා හරිනු ලැබීන. 1907 පෙබරවාරි මාසයේදී සාන්ත පීටර්ස්බර්ග් මුද්‍රණ දෙපාර්තමේන්තුව විසින් එය තහනම් කරන ලද අතර එය විනාශ කරන මෙන් එම වර්ෂයේම මාර්තු මාසයේදී සාන්ත පීටර්ස්බර්ග් උසාවිය නියෝග කළේය.

එසේ වුවද, වී. අයි. ලෙනින්ගේ මේ ඉතා වැදගත් කෘතිය විනාශකර දැමීමට සාර් රජයට බැරිවිය.

''ප්‍රජාතන්ත්‍රික විප්ලවයේදී සමාජ-ප්‍රජාතන්ත්‍රවාදයේ උපක්‍රම දෙකක්'' නැමැති කෘතිය 1907 නොවැම්බර් මස මැද භාගයේදී පීටර්ස්බර්ග්හි මුද්‍රණය කොට ප්‍රසිද්ධ කළ ''දොළොස් වසරක් තිස්සේ'' ලියන ලද ලිපි එකතුව පළමුවැනි කාණ්ඩයට ලෙනින් ඇතුළු කළේය. ලෙනින් එම පොතට අලුතින් සටහන් එකතු කළේය. එම කාණ්ඩයට ලියන ලද සංඥාපනයක් මගින් පොතේ වැදගත්කම ගැන ඔහු මෙසේ ලියුවේය: ''මෙන්ශෙවිකයින් සමග ඇති වූ මූලික උපක්‍රම පිළිබඳව භේදය මෙහි සටහන් කරමු; ලන්ඩන්හි පවත්වන ලද රු. ස. ප්‍ර. ක. (බොල්ශෙවික්) පක්ෂයේ තුන්වෙනි

සම්මේලනයේදී සහ ජිනීවාහි පවත්වන ලද මෙන්ෂෙවික් සාකච්ඡා සභාවේදී ඉදිරිපත් කරන ලද යෝජනා මගින් එම මතභේද සැහෙන ලෙස තහවුරු විය, නිර්ධන පංතියට අයත් කාර්යභාරයන් අනුව බලන විට, අපේ ධනපති විප්ලවයේ තක්සේරුව පිළිබඳව මූලික වෙනසක් ඇති විය.''

2 ''පොටෙම්කින්'' සන්නද්ධ නෞකාවේ කැරැල්ල 1905 ජූනි 14 (27) ද හටගත්තේය. නැවේ සේවකයෝ සමස්ත මහා වැඩවර්ජනයක් පැවති ඔඩෙස්සා වරායට නැව ගෙන ආහ. කෙසේ වෙතත් ඔඩෙස්සා කම්කරුවෝ හා ''පොටෙම්කින්'' සේලරුවෝ ඒකාබද්ධ ක්‍රියා සඳහා පැන නැගුණු වාසිදයක තත්ත්වයන් ප්‍රයෝජනයට නොගත්හ. තම සාමාජිකයන් රැසක්ම අත් අඩංගුවට ගැනීම නිසා ඔඩෙස්සා බොල්ෂෙවික් සංවිධානය දුර්වලව තුබූ අතර එහි සමගියක්ද නොවීය. සන්නද්ධ නැගිටීමකට විරුද්ධවූ මෙන්ෂෙවික්වරු කම්කරුවන් හා සේලරුවන් ප්‍රහාරක ක්‍රියාවන් ගැනීමෙන් වැළැක්වූහ. ''පොටෙම්කින්'' විනාශ කරන ලෙස සාර් ආණ්ඩුව මුළු කළු මුහුදු නාවික හමුදවට අණ කළ මුත් සේලරුවෝ එම නෞකාවට වෙඩි තැබීම ප්‍රතික්ෂේප කළහ. තම නැව් ආපසු ගෙනයාමට නිලධාරීන්ට සිදුවිය. දින එකොළහක් කළු මුහුදේ සැරි සැරීමෙන් පසුව ආහාර හා ගල් අඟුරු හිඟය නිසා රුමේනියානු වරායකට ගොස් අධිකාරයට යටත් වීමට ''පොටෙම්කින්'' සේවක පිරිසට සිදුවිය. සේලරුවන්ගෙන් බොහෝ දෙනෙක් විදේශ ගතවම සිටියහ. රුසියාවට ආපසු ගියවුන් අත් අඩංගුවට ගෙන යුද්ධාධිකරණය ඉදිරියට පමුණුවන ලදී.

''පොටෙම්කින්'' කැරැල්ල අසාර්ථක විය. එහෙත් විශාල නාවික හමුද නැවක් විප්ලවයට එකතු වීම නිසා ඒකාධිපත්‍යයට විරුද්ධ අරගලයේ වර්ධනයේ වැදගත් අවධියක් සලකුණු විය.

3 ''ප්‍රොලිතාරි'' (නිර්ධනයා) — රු. ස. ප්‍ර. ක. පක්ෂයේ නිල පුවත්පත වූ නීතිවිරෝධී බොල්ෂෙවික් සතිපතා ප්‍රකාශණයකි. පක්ෂයේ තුන්වන සම්මේලනයේදී සම්මත වූ යෝජනවක් අනුව එය පළ කරන ලදී.

1905 මැයි සිට නොවැම්බර් දක්වා ජිනීවාහි පළ කළ ''ප්‍රොලිතාරි'' කලාප විසි හයක් නිකුත් විය.

4 නරෝද්නික්වාදය — 1860—1870 අවුරුදුවලදී රුසියන් විප්ලවවාදී ව්‍යාපාරයේ පැන නැගි සුළු ධනපතිවාදී ප්‍රවණතාවයකි. සාර්ගේ



අත්තනෝමතික පාලනය විනාශ කිරීමට සඳහා හා රදළ ඉඩම් හිමියන්ගේ ඉඩම් ගොවීන්ට බෙදදීම සඳහා නරෝද්නික්වාදීහු සටන් කළහ. රුසියාවේ ධනපති සම්බන්ධකම්වල වර්ධනයේ නියාමානුකූලත්වය නොපිළිගත් ඔවුහු එයට අනුකූලව නිර්ධන පංතිය ප්‍රධාන බලවේගය හැටියට පිළිනොගත් අතර ගොවිජනතාව සහ ගම්බද ජනපද සමාජවාදයේ කලල රූපය ලෙස සිතූහ. සාර්ගේ අත්තනෝමතික පාලනයට විරුද්ධව සටන් කිරීමට ගොවිජනතාව පොළඹවාලීමට උත්සාහ ගත් ඔවුහු ගම්බද 'ජනතාව' වෙත ගියහ. එහෙත් ඔවුනට සහය නොලැබිණ.

සමාජයේ වාස්තවික මත පදනම් නොකළ බැවින් නරෝද්නික්වාදීන්ගේ සමාජවාදය මනෝරාජික විය. විප්ලවවාදී ප්‍රජාතන්ත්‍රවාදයේ සිට ලිබරල්වාදය දක්වා නරොද්නික්වාදය අවධි කීපයකට මූණ පැවේය.

1880—1890 ගණන් වලදී නරෝද්නික්වාදය සාර්වාදය සමග සමාදනවීමේ මඟක් ගෙන, කුලාකයින්ගේ අයිතිවාසිකම් ආරක්ෂා කරමින් මාක්ස්වාදයට විරුද්ධව සටන් කෙළේය.

5 සමාජවාදී විප්ලවවාදියෝ (එස්ආර්) — රුසියාවේ සුළු ධනේශ්වර පක්ෂයකි.

විවිධ නරෝද්නික් කණ්ඩායම් හා කව බද්ධවීමෙන් 1901 අගදී හා 1902 දී එය බිහිවිය.

නිර්ධන පංතිකයා හා සුළු දේපළ හිමියා අතර පංති වෙනසක් නුදුටු එස්ආර්වරු, පංති ස්ථරකරනය හා ගොවිජනතාව අතරවූ ප්‍රතිවිරොධතා ගණන් නොගෙන විප්ලවයේ නිර්ධන පංතියේ මෙහෙයුම් කාර්‍ය්‍ය භාරය ප්‍රතික්ෂේප කළහ. ඔවුන්ගේ මත නරෝද්නික්වාදයේ හා සංශෝධනවාදයේ අදහස් සාර සංග්‍රහ ලෙස මිශ්‍ර කිරීමකි. ඒකාධිපත්‍යයට විරුද්ධ ප්‍රධාන සටන් ක්‍රමය ලෙස එස්ආර්වරුන් දේශනා කළ පුද්ගල ත්‍රස්තවාදය විප්ලවීය ව්‍යාපාරයට මහත්සේ හානිදයක වූ අතර විප්ලවීය අරගලයට බහුජනතාව සංවිධානය කිරීමටද ඉන් බාධා පැමිණින.

1917 පෙබරවාරි ධනේශ්වර ප්‍රජාතන්ත්‍රික විප්ලවයේ ජයග්‍රහණයෙන් පසුව සමාජවාදී විප්ලවවාදීහු මෙන්ෂෙවික්වරුන් හා ව්‍යවස්ථාදයක ප්‍රජාතන්ත්‍රවාදීන් සමග එකතුව ප්‍රතිවිප්ලවීය ධනේශ්වර ඉඩම් හිමි තාවකාලික ආණ්ඩුවේ ප්‍රධාන ආධාරකරුවෝ වූහ. කෙරෙන්ස්කි, අව්ක්සෙන්තියෙව් හා චෙර්නෝව් වැනි පක්ෂ නායකයෝ එම ආණ්ඩුවේ සාමාජිකයෝ

වූහ. විශාල ඉඩම් හිමි අයිතිය අහෝසි කළ යුතුය යන ගොවිජන ඉල්ලීමට සහයෝගය දැක්වීම අත්හල සමාජවාදී විප්ලවවාදී පක්ෂය ඊට ප්‍රතිවිරුද්ධ ලෙස එම අයිතිය පවත්වාගෙන යාම සඳහා ඉදිරිපත් වූහ. තාවකාලික ආණ්ඩුවේ එස්ආර් සාමාජිකයෝ ඉඩම් හිමියන්ට අයත් ඉඩම් අල්ලා ගත් ගොවීන්ට විරුද්ධව දන්ඩන පියවර අනුමත කළහ. ශ්‍රේෂ්ඨ ඔක්තෝබර් සමාජවාදී විප්ලවයට පසු එස්ආර්වරු සෝවියට් බලයට විරුද්ධව ක්‍රියාකාරී ලෙස සටන් කළහ.

6 අකීමව්වාදය — වී.පී.අකීමව් (මහ්නොවෙට්ස්) 'ආර්ථිකවාදයේ' සම්භාවනීය නියෝජිතයෙකි. අන්ත අවස්ථාවාදීන්ගෙන් එකෙකි.

7 'ආර්ථිකවාදය' — 19 වැනි සියවස අවසානයේදී සහ විසිවැනි සියවසේ මුලදී රුසියන් සමාජ–ප්‍රජාතන්ත්‍රවාදය තුළ පැන නැගි අවස්ථාවාදී ප්‍රවණතාවයකි, ජාත්‍යන්තර අවස්ථාවාදයේ එක් විවිධත්වයකි. 'ආර්ථිකවාදීහු' කම්කරු පංති ව්‍යාපාරය වැටුප් වැඩිකර ගැනීම, ශ්‍රම තත්ත්වයන් යහපත් කර ගැනීම ආදියට පමණක් සීමාකළහ. දේශපාලන සටන ලිබරල්වාදී ධනපති පංතියට අයත් කාර්යයක් බව කියා සිටි ඔවුහු කම්කරු පංතියේ දේශපාලන පක්ෂයේ නායකත්වය ප්‍රතික්ෂේප කළහ. සාංසිද්ධික කම්කරු පංති ව්‍යාපාරය පිළිගත් ඔවුහු විප්ලවවාදී න්‍යායයේ වැදගත්කම අඩුකොට තැකූහ. මාක්ස්වාදී පක්ෂයේ සමාජවාදී සවිඥනයක් කම්කරු පංති ව්‍යාපාරය තුළට ගෙනඒමේ අවශ්‍යතාවය ප්‍රතික්ෂේප කළ 'ආර්ථිකවාදීහු' එමගින් ධනවාදී දෘෂ්ටියට මග හෙළි කළහ. සමාජ–ප්‍රජාතන්ත්‍රවාදී ව්‍යාපාරයේ විසුරුණු ගතියට හා ආධූනිකත්වයට පක්ෂපාතවූ 'ආර්ථිකවාදියෝ' එය ආරක්ෂා කරමින් කම්කරු පංතියේ මධ්‍යගත පක්ෂයක් සෑදීමේ අවශ්‍යතාවයට විරුද්ධව නැගී සිටියහ.

8 ''අස්වබෂ්ජේනිය'' (විමුක්තිය) — පී. ස්ත්‍රූවේගේ සංස්කාරකත්වය යටතේ 1902—1905 අවුරුදුවලදී විදේශ ගතව දෙසතියකට වරක් පළවූ සඟරාවකි. රුසියානු ලිබරල් ධනේශ්වර පංතියේ හොරණෑව වූ එය නිරතුරුවම මධ්‍යස්ථ රාජාණ්ඩුවාදී ලිබරල්වාදයේ අදහස් පළ කළේය. 1903 දී සඟරාව වටා ''විමුක්තියේ සංගමය'' වර්ධනය වී 1904 ජනවාරියේදී නිශ්චිතව හැඩගැසී 1905 ඔක්තෝබර් දක්වා පැවතුනි. ''අස්වබෂ්ජේනිය'' කණ්ඩායම ව්‍යවස්ථාදයක



ප්‍රජාතන්ත්‍රික පක්ෂයේ (කැඩෙට්වරුන්) න්‍යෂ්ටිය සෑදීය. 1905 ඔක්තෝබරයේදී බිහිවූ මෙම පක්ෂය රුසියාවේ ලිබරල් රාජාණ්ඩුවාදී ධනේශ්වර පංතියේ ප්‍රධාන පක්ෂය බවට පත්විය.

''ඉස්ක්‍රා'' (ගිනි පුපුර) — පළමුවැනි රුසියානු මාක්ස්වාදී නීතිවිරෝධී පුවත්පතයි. 1900 දෙසැම්බර් මස විදේශයේදී වී. අයි. ලෙනින් විසින් ආරම්භ කරන ලද එය රහසිගතව රුසියාවට ගෙන්වන ලදී. රුසියානු සමාජ-ප්‍රජාතන්ත්‍රවාදීන් දෘෂ්ටිමය ලෙස සමගි කිරීමේදීද, විසිරී සිටි පලාත්බද සංවිධාන විප්ලවවාදී මාක්ස්වාදී පක්ෂයක් තුළ එකරාශී කිරීමේදීද ''ඉස්ක්‍රා'' මහඟු සේවයක් ඉටු කළේය. රු. ස. ප්‍ර. ක. පක්ෂයේ දෙවන සම්මේලනයෙන් අනතුරුව ප්ලෙහානව්ගේ උදව් සහිතව මෙන්ෂෙවික්වරු ''ඉස්ක්‍රා'' වේ බලය ඇල්ලූහ. 1903 නොවැම්බරයේ අංක 52 කලාපයේ සිට ''ඉස්ක්‍රා'' මෙන්ෂෙවික්වරුන්ගේ නිල පුවත්පත විය. 1905 ඔක්තෝබර් වන තෙක් එය පළවිය.

10 මෙන්ෂෙවික්වාදියෝ — රුසියානු සමාජ-ප්‍රජාතන්ත්‍රවාදයේ අවස්ථාවාදී ප්‍රවණතාවයකි.

1903 දී පවත්වන ලද රුසියානු සමාජ–ප්‍රජාතන්ත්‍රවාදයේ කම්කරු පක්ෂයේ දෙවැනි සම්මේලන වාරයේදී පක්ෂයේ මධ්‍යම සංවිධානවලට ඡන්දය තේරීමේදී ලෙනින්ගේ නායකත්වයෙන් යුත් විප්ලවවාදී සමාජ-ප්‍රජාතන්ත්‍රවාදීන්ට බහුතර (එතැන් සිට 'බොල්ෂෙවික්' නමින් ඔවුන් හැඳින්විණි) ඡන්ද සංඛ්‍යාවක්ද, අවස්ථාවාදීන්ට අල්පතර (එතැන් සිට ඔවුන් 'මෙන්ෂෙවික්' නමින් හැඳින්විණි) ඡන්ද සංඛ්‍යාවක් ද ලැබුණේය.

1905—1907 විප්ලවය සමයේදී මෙන්ෂෙවිකයෝ විප්ලවයේ කම්කරු පංති ආධිපත්‍යයට විරුද්ධවද, කම්කරු පංතියේ සහ ගොවීන්ගේ සමගියට විරුද්ධවද නැගී සිටි අතර, ලිබරල් මත දරන ධනපති පංතිය විප්ලවයේ නායකයා වශයෙන් පෙනී සිටිය යුතු බව කියමින් ඔවුන් සමග සම්මුතියකට එන ලෙස ඉල්ලා සිටියහ. 1905—1907 විප්ලවයේ පරාජයෙන් පසු වසරවලදී ප්‍රතිගාමිත්වය පැන නැගි විට, මෙන්ෂෙවික්වරුන්ගෙන් වැඩිදෙනෙක් ලික්විඩේටර් වාදීන් බවට පත්වූහ: කම්කරු පංතියේ විප්ලවවාදී නීතිවිරෝධී පක්ෂය විසුරුවා හරින ලෙස ඔවුහු ඉල්ලා සිටියහ. 1917 පෙබරවාරි මාසයේදී ඇතිවූ ධනපති-ප්‍රජාතන්ත්‍රවාදී විප්ලවයේ ජයග්‍රහණයෙන් ඉක්බිතිව, තාවකාලික ආණ්ඩුවට ඇතුළු වූ මෙන්ෂෙවික්වාදීහු

එම ආණ්ඩුවේ අධිරාජ්‍යවාදී ප්‍රතිපත්තිවලට ආධාර දෙමින්, සමාජවාදී විප්ලවයට සූදානම්වීමට විරුද්ධව සටන් කළහ.

ඔක්තෝබර් සමාජවාදී විප්ලවයෙන් අනතුරුව මෙන්ෂෙවික්වරු එළිපිටම ප්‍රතිවිප්ලවවාදී පක්ෂයක් ලෙස පෙනී සිටිමින්, සෝවියට් බලය පෙරළා දැමීම සඳහා කුමන්ත්‍රණ හා කැරළි සංවිධාන කොට ඒවාට සහභාගි වූහ.

11 බුලිගින් කොමිසම — 1905 පෙබරවාරියේදී අධිරාජ්‍යයාගේ අණක් පරිදි පිහිටුවන ලදී. අභ්‍යන්තර කටයුතු පිළිබඳ ඇමති බුලිගින්ගේ නායකත්වයෙන් පිහිටුවනු ලැබූ හෙයින් මේ නම ඇතිවිය. මෙම කොමිසම උපදේශ බලතල සහිතව රාජ්‍ය ඩූමාවක් පිහිටුවීමට පනතක්ද, ඩූමා මැතිවරණය සඳහා නීතිරීති ද කෙටුම්පත් කළාය. 1905 අගෝස්තු 6 (19) සාර්ගේ ප්‍රකාශනය සමග එම පනත හා නීතිරීති ද ප්‍රසිද්ධ කරන ලදී.

බොල්ෂෙවික්වරු බුලිගින් ඩූමාව ක්‍රියාශීලීව වර්ජනය කරන මෙන් කියා සිටියහ. විප්ලවයේ බලපෑම යටතේ ඩූමාව කැඳවීමට ආණ්ඩුව ගත් උත්සාහය ව්‍යර්ථ විය.

12 ව්‍යවස්ථාදායක ප්‍රජාතන්ත්‍රික පක්ෂය (කැඩෙට්වරු) — රුසියාවේ ලිබරල් රාජාණ්ඩුවාදී ධනේශ්වර පංතියේ ප්‍රධාන පක්ෂයයි. 1905 දී ආරම්භ කරන ලද එහි සාමාජිකත්වය ධනේශ්වර පංතියේ නියෝජිතයන්ගෙන්, ඉඩම් හිමි පංතියේ සෙම්ස්ත්වො නායකයන්ගෙන් සහ ධනේශ්වර බුද්ධිමතුන්ගෙන් සමන්විත විය. වැඩකරන ජනතාව රැවටීම සඳහා 'ජනතා නිදහසේ පක්ෂය' යි කුහක ලෙස තමන්ව හඳුනාගත් කැඩෙට්වරු ඇත්ත වශයෙන්ම ව්‍යවස්ථාදායක රාජාණ්ඩුවක් ඉල්ලීමෙන් ඔබ්බට නොගියහ. පළමුවන ලෝක මහා සංග්‍රාමයේදී සාර් ආණ්ඩුවේ ද්‍රෝහි විදේශ ප්‍රතිපත්තියට ක්‍රියාශීලී සහයෝගය දුන් ඔව්හු 1917 පෙබරවාරි ධනේශ්වර ප්‍රජාතන්ත්‍රවාදී විප්ලවයේදී රාජාණ්ඩුව බේරා ගැනීමට කළ හැකි හැම දෙයක්ම කළහ. ධනේශ්වර තාවකාලික ආණ්ඩුවේ නායක තනතුරු දැරූ ඔව්හු ජනතාවගේ වුවමනාවන්ට විරුද්ධ ප්‍රතිවිප්ලවීය ප්‍රතිපත්තියක් ගෙන ගියහ. ශ්‍රේෂ්ඨ ඔක්තෝබර් සමාජවාදී විප්ලවය ජයගත් විට කැඩෙට්වරු සෝවියට් සභාවල පරම හතුරන් වූහ. ඔව්හු සියලු සන්නද්ධ ප්‍රතිවිප්ලවීය ක්‍රියාවන්ට හා ආක්‍රමණිකයන්ගේ ව්‍යාපාරවලට සහභාගි වූහ. ආක්‍රමණිකයන්ගේ හා සුදු හමුදාවල අන්ත පරාජයෙන් පසු විදේශයන්ට පැනගිය ඔව්හු



එහිදීද ඔවුන්ගේ සෝවියට් විරෝධී ප්‍රතිවිප්ලවීය ක්‍රියා තවදුරටත් ගෙනගියහ.

13 මිලෙරාන්වාදය — ප්‍රංශයේ ප්‍රතිගාමී ධනේශ්වර ආණ්ඩුවට 1899 දී ඇතුළ් වූ ප්‍රංශ සමාජවාදී ප්‍රතිසංස්කරණවාදී මිලෙරාන්ගේ නමින් හැඳින්වෙන අවස්ථාවාදී ප්‍රවනතාවයකි.

14 පැරිස් කොමියුනය — 1871 පැරිසියේ නිර්ධන පංතික විප්ලවය විසින් නිර්මාණය කරන ලද ඉතිහාසයේ පළමුවැනි අත්හදබැලීම වූ නිර්ධන පංතියේ ආඥාදායකත්වයය, කම්කරු පංතියේ විප්ලවවාදී ආණ්ඩුවය. 1871 මාර්තු 18 සිට මැයි 28 දක්වා දවස් 72 ක් එම ආණ්ඩුව පැවතිණි.

15 1905 ජනවාරි 9 — සාර්ගේ අණ පිට සාන්ත පීටර්ස්බර්ග් කම්කරුවන්ගේ සාමකාමී පෙළපාළියකට සොල්දාදුවන් විසින් මෘග ලෙස වෙඩි තබන ලද්දේ මෙදිනය. ගපොන් පූජකවරයාගේ නායකත්වය යටතේ පෙළපාළිකරුවෝ සාර්ට පෙත්සමක් බාරදීම සඳහා සිසිර මාලිගය කරා ගමන් ගනිමින් සිටියහ. නිරායුධ කම්කරුවන් මෙසේ අමු අමුවේ මරා දැමීම නිසා ''ඒකාධිපත්‍යය භංග වේවා'' යන සටන් පාඨය යටතේ රුසියාව පුරාම බහුජන දේශපාලන වැඩ වර්ජන රැල්ලක් හා පෙළපාළි පැන නැගුනි.

ජනවාරි 9 සිදුවීම් 1905—1907 විප්ලවයේ ආරම්භය සලකුණු කළහ.

16 ෆ්‍රැන්ක්ෆර්ට් පාර්ලිමේන්තුව — පොදු ජර්මන් ජාතික සභාවය; 1848 ජර්මනියේ මාර්තු විප්ලවයෙන් පසු පිහිටුවන ලදී. රාජ පරමවාදයට සහ ජර්මනිය කුඩා ආණ්ඩුවලට බෙදී වෙන්වී සිටීමට විරුද්ධව තීරණාත්මක ලෙස සටන් කිරීම සඳහා ජනතාව සංවිධානය කරනවා වෙනුවට, පාර්ලිමේන්තුව අධිරාජ්‍යයාගේ ව්‍යවස්ථාව ගැන ඵලරහිත සාකච්ඡා හා විවාද කිරීමට මුළු කාලයම යෙදවිය.

17 ''නව රයින් පත්‍රය'' ("Die Neue Rheinische Zeitung") 1848 ජූනි 1 සිට 1849 මැයි 19 දක්වා පළවිය. එහි කලමනාකාරිත්වය කාල් මාක්ස් හා ෆ්‍රෙඩ්රික් එංගල්ස් දැරූහ. මාක්ස් ප්‍රධාන කර්තෘ විය. ප්‍රතිගාමීන් විසින් මර්දනය කිරීම නිසා අංක 301 කලාපයෙන් පසු එය නතර විය. "Die Neue Rheinische Zeitung" පිළිබඳව කාල්

මාක්ස් හා ෆ්‍රෙඩ්රික් එංගල්ස්; තෝරාගත් කෘති, 1958, මොස්කව්, 2 වෙළුම, 328—337 පිටු බලන්න.

18 ''සමාජ-ප්‍රජාතන්ත්‍රිකයා'' — මෙන්ෂෙවික්වරුන් විසින් ජෝර්ජියානු බසින් පළ කරන ලද පුවත්පතකි. 1905 අප්‍රේල් හා නොවැම්බර් අතර කාලයේදී තිප්ලිසියේ පළවිය.

''සෙම්ස්කි සබෝර් හා අපේ උපක්‍රමය'' යන ලිපිය (''සමාජ-ප්‍රජාතන්ත්‍රිකයා'', 1905 අප්‍රේල් 7 (20) අංක 1 කලාපය) කොකේසියානු බොල්ෂෙවික්වරුන්ගේ නායකයා වූ එන්. ජෝර්දනියා විසින් ලියන ලදී. ''ප්‍රජාතන්ත්‍රික විප්ලවයේදී සමාජ-ප්‍රජාතන්ත්‍රවාදයේ උපක්‍රම දෙකක්'' නමැති පොතේ හත්වන පරිච්ඡේදයෙහි ලෙනින් විසින් මෙම ලිපිය සවිස්තරව විවේචනයට භාජනය කරනු ලැබින. (මෙම පොතේ 55 වැනි පිටු බලන්න).

19 කළු සියය — විප්ලවීය ව්‍යාපාරයට විරුද්ධව සටන් කිරීම සඳහා සාර්වාදී පොලිසිය විසින් පිහිටුවන ලද රාජාණ්ඩුවාදී කල්ලිවල නමයි. ඔව්හු විප්ලවවාදීන් මැරූහ. ප්‍රගතිශීලී බුද්ධිමතුන්ට විරුද්ධ ප්‍රහාර සංවිධානය කළහ. යුදෙව් විරෝධී සංහාර දියත් කළහ.

20 '' ශිපොව් ව්‍යවස්ථාවක්'' — සෙම්ස්ත්වො දක්ෂිණාංශයේ මධ්‍යස්ථ ලිබරල් නායකයකු වූ ඩී. ෂිපොව් විසින් සම්පාදනය කරන ලද රාජ්‍ය ව්‍යුහයේ කෙටුම්පතට ලෙනින් දුන් නමයි. විප්ලවයේ ඉදිරිමග අඩාල කිරීමේ සහ සෙම්ස්ත්වො සභාවලට වාසි වන පරිදි සාර්වාදී ආණ්ඩුවෙන් යම් සහන දිනා ගැනීමේ උත්සාහයක් වශයෙන් සාර් උපදේශක නියෝජිත ආයතනයක් පිහිටුවීමට ෂිපොව් යෝජනා කළේය. එබඳු ගනුදෙනුවක් කිරීමෙන් මධ්‍යස්ථ ලිබරල්වාදීන්ට වුවමනා කළේ බහුජනතාව රවටා, රාජාණ්ඩුව රැක ගන්නා අතරම තමන් සඳහා යම් දේශපාලන අයිතීන් දිනා ගැනීමය.

21 නීත්‍යානුකූල මාක්ස්වාදය — 1890 ගණන් වලදී රුසියාවේ ධනපති-ලිබරල්වාදී බුද්ධිමතුන් අතර පැන නැගි සමාජ දේශපාලන ප්‍රවණතාවයකි. තමන් මාක්ස්වාදීන් යැයි කියාගත් ''නීත්‍යානුකූල මාක්ස්වාදීහු'' මාක්ස්වාදී න්‍යායයේ ''විප්ලවවාදී අධ්‍යාත්මය'' මත ධනපති ක්‍රමයේ නොවැළැක්විය හැකි විනාශය පිළිබඳ උගැන්වීමද, සමාජවාදී විප්ලවය පිළිබඳවද, සමාජවාදය කරා පරිවර්තනය වීම පිළිබඳවද උගැන්වීමද සම්පූර්ණයෙන් විසිකරමින්, රදළ සමාජයිය-



ආර්ථික සැකැස්ම නොවැළැක්විය හැකි සේ ධනපති සැකැස්මක් දක්වා වෙනස්වීමේ න්‍යාය පමණක් වෙන් කර ගත්හ. අනතුරුව නීත්‍යානුකූල මාක්ස්වාදීහු, මාක්ස්වාදී සතුරන් වූවෝ ධනපති කැඩෙට් පක්ෂයේ නායකයින් බවට පත්වූහ.

22 ''රුස්කය ස්තරිනා'' (රුසියානු පුරාණය) — 1870 සිට 1918 දක්වා සාන්ත පීටර්ස්බර්ග්හි පළවූ මාසික ඉතිහාස සඟරාවකි.

23 කාල් මාක්ස්ගේ ''ෆුයෙර්බාහ් පිළිබඳ තීසිස'' නැමැති කෘතියෙන්ය.

24 8 වැනි සටහන බලන්න

25 ''රුස්කිය වියදමස්ති'' (රුසියානු සටහන්කරණය) — 1863 සිට 1918 දක්වා මොස්කව්හි පළ කරන ලද පුවත්පතකි. 1905 දී එය ව්‍යවස්ථාදායක-ප්‍රජාතන්ත්‍රිකයන්ගේ දක්ෂිණාංශයේ නිල පුවත්පත විය. ඔක්තෝබර් විප්ලවයෙන් පසු සෙසු ප්‍රතිවිප්ලවීය පුවත්පත් මෙන්ම එයද නතර විය.

26 ''සින් අතියවෙස්ත්ව'' (පිතෘ භූමියේ පුතා) — 1856 සිට 1900 දක්වාද, 1904—1905 දීද සාන්ත පීටර්ස්බර්ග්හි පළවූ ලිබරල් දිනපතා පුවත්පතකි. ඊට ලිපි සැපයූවන් අස්වබෂ්ජේනිය ප්‍රවනතාවය හා නරෝද්නික්වාදයේ විවිධ ප්‍රභේද නියෝජනය කළහ.

27 ''නාෂ ෂිස්න්'' (අපේ ජීවිතය) — 1904 සිට 1906 දක්වා වරින් වර සාන්ත පීටර්ස්බර්ග්හි පළවූ ලිබරල් දිනපතා පුවත්පතකි.

28 ''නාෂි ද්නි'' (අපේ දින) — 1904—1905 දී සාන්ත පීටර්ස්බර්ග්හි පළවූ ලිබරල් දිනපතා පුවත්පතකි. 1905 දෙසැම්බර් 7 (20) න් පසු යළි පළ කිරීමට පටන් ගත් මුත් පළවූයේ කලාප දෙකක් පමණි.

29 කාල් මාක්ස් හා ෆ්‍රෙඩ්රික් එංගල්ස් විසින් ලියන ලද ''කොමියුනිස්ට් පක්ෂයේ ප්‍රකාශනය'' බලන්න.

30 සෙම්ස්ත්වොවාදියා 1864 දී රුසියාවේ මධ්‍යම ගුබේර්නියාවල පිහිටුවන ලද ඉතා දැඩි සීමා සහිත බලය ඇති ප්‍රාදේශීය ස්වයං පාලන සංවිධානවල නායකයින් මෙනමින් හැඳින් විණි.

සෙම්ස්ත්වොවාදීන් අතර සාර්ගේ අත්තනෝමතික පාලනයට විරුද්ධ අදහස් ඇති බුද්ධිමතුන්ගේ සහ ලිබරල්වාදී ඉඩම් හිමියන්ගේ නියෝජිතයෝද වූහ. එහෙත් විරුද්ධමත දරුවද සෙම්ස්ත්වොවරු

ඒ අතරම විප්ලවය තවත් දුර වර්ධනය වෙතියි බියවූහ. 1905 ඔක්තෝබර් 17 දසාර්ගේ ප්‍රකාශනය සතුටින් පිළිගත් සෙම්ස්ත්වොවරු එය ''ව්‍යවස්ථාදායක යුගයක ආරම්භය'' බව කියා සිටියහ. එහෙත් සත්‍යය නම් එම ප්‍රකාශනය ජනතාව විප්ලවවාදී සටන් වලින් වෙනත් අතකට යොමු කරවීම පිණිස කරන ලද බොරු පොරොන්දු සහිත උපක්‍රමයක් පමණක් විය.

31 ''කරපටියේ මිනිසා'' — ඒ නමින්ම ඇති චෙකොෆ්ගේ කතාවක ප්‍රධාන චරිතය සියලු නව නිපැයුම් හා පෙරදැරි බව පිළිකුල් කරන පටු කල්පනා සහිත පිංගුත්තරයෙකුගේ සංකේතයකි.

32 ලෙනින් සඳහන් කරන්නේ "Aus dem literarischen Nachlaß von Karl Marx, Friedrich Engels und Ferdinand Lassalle. Herausgegeben von Franz Mehring", Band III, Stuttgart, 1902, S. 211. (ප්‍රාන්ස් මේරින්ග් විසින් සංස්කරණය කරන ලද ''කාල් මාක්ස්ගේ, ප්‍රෙඩරික් එංගල්ස්ගේ සහ පර්ඩිනාන්ඩ් ලසාල්ගේ සාහිත්‍යමය දයාදයෙනි'', 3 වෙළුම, ස්ටුට්ගාට්, 1902, 211 පිටුව).

33 ජිරොන්ඩවාදියෝ සහ ජැකොබින්වාදියෝ — දහඅට වැනි සිය වසේ අවසාන භාගයේදී, ප්‍රංශ ධනපති විප්ලවය සමයේ ධනපති පංතියේ දේශපාලන කණ්ඩායම් දෙකකි. ජිරොන්ඩවරු — විප්ලවය හා ප්‍රතිවිප්ලවය අතර වැනෙමින්, රාජාණ්ඩුව සමග සම්මුති ඇති කර ගැනීමේ මග ගත් මධ්‍යම ප්‍රතිපදවාදී ධනපතීන්ගේ අයිතිවාසිකම් ප්‍රකාශ කළහ.

ජැකොබින්වරු — රාජ පරමවාදය සහ රදළවාදය නැතිකර දැමීමේ අවශ්‍යතාවය ස්ථිර ලෙසම පිළිගත් ධනපති පංතියේ වඩාත් තීරණාත්මක නියෝජිතයින් හා විප්ලවවාදී ප්‍රජාතන්ත්‍රවාදීන් මෙනමින් හැඳින්වූහ. රුසියානු සමාජ-ප්‍රජාතන්ත්‍රවාදයේ අවස්ථාවාදී ප්‍රවණතාවයේ නියෝජිතවරුන් වන මෙන්ෂෙවිකයින්, සමාජ-ප්‍රජාතන්ත්‍රවාදයේ ජිරොන්ඩවරුන් හැටියට ලෙනින් හැඳින් වීය.

34 'ජනතා නියෝජිතයන්ගේ' සම්භාෂණය — 1905 ජූනි මස 6 (19) දෙවැනි නිකොලායි සාර් රජ සෙම්ස්ත්වොවරුන්ගේ නියෝජිත මණ්ඩලයක් පිළිගැනීම පිළිබඳවය. එම නියෝජිත මණ්ඩලය මහජන නියෝජිතයින් පත් කරන ලෙස ඉල්ලා සාර් රජුට පෙත්සමක් භාර දුන්නේය. ''පුනරුත්ථාපන රාජ්‍ය ක්‍රමයක්'' ඇතිකිරීමට එමගින් ඔවුහු සාර්ගේ කැමැත්ත ඉල්ලා සිටියහ. එම පෙත්සම මගින්



සර්වජන ඡන්දයක් හෝ ඡන්දදායකයින්ගේ සමාන අයිතියක් හෝ රහසේ ඡන්දය දීමට අයිතියක් හෝ ඉල්ලා නොසිටි අතර මැතිවරණයේ නිදහස ආරක්ෂා කිරීමක්ද ඉල්ලා නොසිටිනු ලදී.

35 බෂිබුසුක්වරු — 18 වැනි — 19 වැනි සියවස් වලදී තුර්කි යුද්ධ හමුදවට අයත්වූ නිත්‍ය සේවාවට අයත් නොවන සේනාංකය. ඔවුහු විනය ගරුක නොවූ අතර කෲර එමෙන්ම කොල්ල කෑමෙහි රිසි පිරිස් වූහ.

36 වපිරියොද්වරු, සම්මේලන කණ්ඩායම නැතිනම් ප්‍රොලිතාරිවරු — බොල්ෂෙවික්වරුන් මේ නම්වලින් හඳුන්වන ලදී. බොල්ෂෙවික්වරුන් විසින් කැඳවන ලද තුන්වැනි සම්මේලනය,ඔවුන් විසින් නිකුත් කරන ලද ''වපිරියොද්'' (ඉදිරිමග) සහ ''ප්‍රොලිතාරි'' (නිර්ධනයා) නැමැති පුවත්පත් අනුව මෙසේ හැඳින්විණි.

37 මෙම සඳහන ලිබරල්වාදීන් කෙරෙහිවූ ආකල්පය පිළිබඳව ස්තරවේර් (ඇ. නි. පොත්රෙසව් නමැති මෙන්ෂෙවික්වාදියාගේ මනෝභාවය) විසින් ඉදිරිපත් කරන ලදුව රු.ස.ප්‍ර.ක.පක්ෂයේ දෙවන සම්මේලනය (1903) මගින් අනුමත වූ යෝජනාව ගැනය.

38 මෙම සඳහන 1905 මැයි (14—15 (27—28) දිනවල ත්සුෂිමා දූපත අසල සිදුවූ සාර්ගේ නාවුක හමුදාවේ පරාජයෙන් කෙළවරවූ නාවුක ගැටුමක් පිළිබඳවය.

39 ''පාර්ලිමේන්තු ක්‍රෙටිනිසම (මනෝ විකලත්වය)'' යන පදය ලෙනින්ගේ ලිපිවල බහුලව දැකිය හැකිය. එය මාක්ස් විසින් හඳුන ලද පදයකි.

පාර්ලිමේන්තු ක්‍රමය සර්වබලධාරි යයිද, පාර්ලිමේන්තු කටයුතු දේශපාලන අරගලයේ එකම කටයුත්ත ලෙසද සැලකූ අවස්ථාවාදීන් හට ලෙනින් විසින් මෙම පදය යොදන ලදී.

40 1895 දී ඔක්තෝබර් 6—12 වැනි දිනවල බ්‍රෙස්ලෝහි පැවති ජර්මන් සමාජ-ප්‍රජාතන්ත්‍රවාදී පක්ෂයේ සම්මේලනයෙහි ගොවිජන වැඩ පිළිවෙළේ කෙටුම්පත පිළිබඳ විවාදයෙහිදී මතභේද අනාවරනය විය. ඉඩම් ප්‍රතිසංස්කරණ වැඩ පිළිවෙළේ කෙටුම්පත බරපතළ

වැරදි සහිත වූ අතර නිර්ධන පංතියේ පක්ෂය පොදුජන පක්ෂයක් දක්වා පරිවර්තනය කිරීමේ ප්‍රවණතාවයක් විශේෂයෙන් එම වැඩ පිළිවෙළේ සඳහන් විය. අවස්ථාවාදීන් හැරුණුවිට එම වැඩ පිළිවෙළට අ. බෙබෙල් සහ වී. ලිබ්ක්නෙහ්ට්ද පක්ෂවූහ. එම කෙටුම්පත පක්ෂ සම්මේලනයේදී කාල් කෞට්ස්කි, ක්ලාරා සෙට්කින් සහ තවත් සමාජ-ප්‍රජාතන්ත්‍රවාදීන් විසින් දැඩි ලෙස විවේචනය කැරිණි. ඉඩම් ප්‍රතිසංස්කරණ වැඩ පිළිවෙළේ කොමිසන් සභාව විසින් ඉදිරිපත් කරන ලද එම යෝජනාව බහුතර ඡන්දයෙන් (යෝජනාවට විරුද්ධව ඡන්ද 158 පක්ෂව 63) සම්මේලනය ප්‍රතික්ෂේප කළාය.

41 "රබෝචිය දියල" (කම්කරුවන්ගේ ව්‍යාපාරය) — "විදේශගත රුසියානු සමාජ-ප්‍රජාතන්ත්‍රිකයන්ගේ සංගමයේ" නිල ප්‍රකාශන ලෙස 1899 අප්‍රේල් හා 1902 පෙබරවාරි අතර කුර වරින් වර ජිනීවාහි පළවූ ආර්ථිකවාදී සඟරාවකි. "රබෝචිය දියල" සඟරාව බර්න්ෂ්ටයින්වාදී සටන්පාඨය වන 'මාක්ස්වාදය විවේචනයේ නිදහස්' ට අනුබල දුන් අතර නිර්ධන පංතියේ දේශපාලන සටන ආර්ථික අරගලයට යටපත් කරන්නාවූ අවස්ථාවාදී දෘෂ්ටිය ප්‍රචාරය කළේය. කම්කරු ව්‍යාපාරයේ ස්වයං බලය ඉදිරිපිට හිස පහත් කළ එය පක්ෂයේ නායක ක්‍රියාකාරිත්වය ප්‍රතික්ෂේප කරමින් ගොවීන්ගේ විප්ලවවාදී හැකියාවන්ද ඉවතලූහ.

42 9 වැනි සටහන බලන්න.

43 මෙම සඳහන ලෙනින්වාදී "ඉස්ක්‍රා" වේ සැලසුම පිළිබඳ නදියෂ්දින් විසින් පුවත් මගින් කරන ලද පහරදීම ගැනය (නදියෂ්දින් යනු යෙ. ඕ. සෙලෙන්ස්කිගේ ව්‍යවහරයකි). "කළ යුත්තේ කුමක්ද?" යන පොත මගින් 1902 තරම් ඉහතදී ලෙනින් මෙම පහරදීම විවේචනය කළේය.

44 "ප්‍රැන්ක්පර්ට් පත්‍රය" ("Frankfurter Zeitung") — 1856 සිට ජර්මනියේ විශාල මූල්‍ය කණ්ඩායම් නියෝජනය කළ දිනපතා පත්‍රයකි.

45 බර්න්ෂ්ටයින්වාදය — ජාත්‍යන්තර සමාජ-ප්‍රජාතන්ත්‍රවාදයේ මාක්ස්වාදයට විරුද්ධ අවස්ථාවාදී ප්‍රවනතාවයකි. 19 වන ශතවර්ෂය අවසානයේදී ජර්මනියේ උපන් එය ධනේශ්වර ලිබරල්වාදයේ



ජීවය අනුව මාක්ස්ගේ විප්ලවය පිළිබඳ න්‍යායය සංශෝධනය කිරීමට උත්සාහ ගත් එ. බර්න්ෂ්ටයින් නමින් හැඳින්වේ.

46 ජොරේස්වාදියෝ — ප්‍රංශ සමාජවාදී ව්‍යාපාරයේ දක්ෂිණාංශික, ප්‍රතිසංස්කරණවාදී අංශයේ නායක ජාන් ජොරේස් අනුගමනය කළවුන් මෙනමින් හැඳින්විණ. විවේචනය කිරීමේ නිදහස යටතේ මාක්ස්වාදයේ මූලික පදනම් සංශෝධනය කිරීමට ඉදිරිපත් වූ ජොරේස්වාදියෝ නිර්ධනීන් හා ධනපතීන් අතර පංති සහයෝගිතාවය දේශනා කළහ. ජොරේස්වාදියෝ ප්‍රතිසංස්කරණවාදී ප්‍රතිපත්ති පදනම් කරගත් ප්‍රංශ සමාජවාදී පක්ෂය 1902 දී පිහිටවූහ.

47 මෙම සඳහන "වපිරියොද්" නමැති බොල්ෂෙවික් පුවත්පතේ අංක 13 හා 14 කලාපයන්හි පළවූ ලෙනින්ගේ "සමාජ-ප්‍රජාතන්ත්‍රවාදය හා තාවකාලික විප්ලවකාරී ආණ්ඩුව" සහ "නිර්ධන පංතියේ හා ගොවිජනතාවගේ විප්ලවීය ප්‍රජාතන්ත්‍රික ආඥාදායකත්වය" යන ලිපි පිළිබඳවය.

48 ලෙනින් අදහස් කරන්නේ පැරිස් කොමියුනයේ පැරණි සාමාජිකයන්ගේ බ්ලන්කීවාදී කණ්ඩායම විසින් 1874 දී ලන්ඩන්හි පළකළ වැඩ පිළිවෙළයි.

බ්ලන්කීවාදීන් යනු කීර්තිමත් විප්ලවවාදියකු සහ මනෝරාජික සමාජවාදයේ නියෝජිතයෙකුවූ ලුවී ඔගුස්ත් බ්ලන්කී විසින් නායකත්වය දුන් ප්‍රංශ සමාජවාදී ව්‍යාපාරයේ අනුගාමිකයන්ය.

ලෙනින් ලියූ පරිදි බ්ලන්කීවාදීහු කල්පනා කළේ "මිනිස් වර්ගයා වැටුප් වහල් භාවයෙන් මුදා ගනු ඇත්තේ නිර්ධන පංතික පංති අරගලයෙන් නොව බුද්ධිමතුන් අල්පතර කණ්ඩායමක් විසින් සැලසුම් කරන කුමන්ත්‍රණයක් මගින්" බවය. නැගිටීමක් සාර්ථක වීම සඳහා අවශ්‍ය මූර්ත තත්ත්වයන් ගැන සැලකිල්ලක් නොදැක්වූ ඔවුහු විප්ලවීය පක්ෂයක් වෙනුවට කුමන්ත්‍රණකරුවන් අතලොස්සක් ආදේශ කිරීමෙන් බහුජනතාව සමග සම්බන්ධකම් කෙරෙහි ඔවුන් තුළ වූ නොසැලකිලි භාවය පෙන්නුම් කළහ.

49 ජර්මන් සමාජ-ප්‍රජාතන්ත්‍රවාදී පක්ෂයේ ඒර්ෆුර්ට් වැඩ සටහන ඒර්ෆුර්ට්හි පැවති සම්මේලනයකදී 1891 ඔක්තෝබරයේදී අනුමත කරනු ලැබින... ධනපති ක්‍රමය නොවැළැක්විය හැකිසේ විනාශය කරා යන අතර ඒ වෙනුවට සමාජවාදී නිෂ්පාදන ක්‍රමය ඇතිවන

බව කියන මාක්ස්වාදී උගැන්වීම මත එම වැඩ පිළිවෙළ පදනම් විය. කම්කරු පංතිය දේශපාලන සටන් අරගල යෙදීමේ වැදගත් කමද, එම සටනේ පක්ෂයේ මගපෙන්වන ක්‍රියාකලාපයද ආදිය වැඩ පිළිවෙළ මගින් අවධාරණය කැරිණි. එහෙත් එර්පුර්ට් වැඩ පිළිවෙළ අවස්ථාවාදයේ ඉල්ලීම්වලට සැහෙන ලෙස ඉඩ දුන්නේය. එම වැඩ පිළිවෙළ පිළිබඳ දීර්ඝ විවේචනයක් ෆ්‍රෙඩ්රික් එංගල්ස් විසින් කරන ලදී. (''සමාජ-ප්‍රජාතන්ත්‍රවාදී පක්ෂයේ 1891 වැඩ පිළිවෙළට විවේචනයක්''); එය සැබවින්ම දෙවැනි ජාත්‍යන්තරයේ අවස්ථාවාදය විවේචනය කරන්නකි; පක්ෂයට එර්පුර්ට් වැඩ පිළිවෙළ එක්තරා විධියක ආදර්ශයක් විය. එසේවුවද, ජර්මන් සමාජ-ප්‍රජාතන්ත්‍රවාදී පක්ෂයේ නායකත්වය එංගල්ස්ගේ මේ විවේචනය පක්ෂ සාමාජිකත්වයෙන් සඟවා තැබීය, අවසාන වශයෙන් වැඩ පිළිවෙළ සකස් කිරීමේදී ඔහු විසින් කළ ඉතා වැදගත් විවේචන සැලකිල්ලට නොගන්නා ලදී. නිර්ධන පංතික ආඥාදායකත්වය පිළිබඳව එර්පුර්ට් වැඩ පිළිවෙළ නිහඬව සිටීම අවස්ථාවාදය ඉදිරියේ කරන ලද බියසුලු පසුබැසීමක් බවත්, එය එම වැඩ පිළිවෙළේ ප්‍රධාන අඩුපාඩුව බවත් වී. අයි. ලෙනින් පෙන්වා දුන්නේය.

50 බකුනින්වාදය — ආරාජිකවාදී දෘෂ්ටියේ නායකයකුවූද, මාක්ස්වාදයේ සහ විද්‍යාත්මක සමාජවාදයේ සතුරකුවූද ඇම්. ඒ. බකුනින්ගේ දේශපාලන මත මෙනමින් හැඳින්වේ. බකුනින්වාදයේ මූලික පදනම නිර්ධන පංතික ආඥාදායකත්වය ඇතුළුව සියලු අන්දමේ රජයන් ප්‍රතික්ෂේප කිරීමය. නිර්ධන පංතියේ සමස්ත ලෝක ඓතිහාසික කාර්ය භාරය නොවටහා ගැනීමය. කම්කරු පංති ව්‍යාපාරයේ උපක්‍රමවලට හා මාක්ස්වාදී න්‍යායට විරුද්ධව බකුනින්වාදීහු දැඩි අරගලයක් ගෙනගියහ. ඔවුන්ගේ උපක්‍රම වන කුමන්ත්‍රණ, ක්ෂණික කැරළි හා ත්‍රස්තවාදය සහාසික දේ වූ අතර නැගිටීම පිළිබඳ මාක්ස්වාදී උගැන්වීමට සතුරු විය.

බකුනින්වාදීන්ගේ න්‍යායය හා උපක්‍රම කාල් මාක්ස් හා ෆ්‍රෙඩ්රික් එංගල්ස් දැඩි ලෙස හෙළා දුටහ. ''වියරු වැටුණු සුළු ධනපති පංතිය සිය ගැළවීම'' සඳහා ඉදිරිපත් කළ ලෝක දෘෂ්ටියක් ලෙස එය වී. අයි. ලෙනින් හැඳින්විය.

51 ''ප්‍රොලිතාරි'' අංක 3 කලාපයේ ලෙනින්ගේ ''තාවකාලික විප්ලවකාරී ආණ්ඩුව ගැන'' නමැති ලිපිය පළ කරන ලදී (දෙවැනි ලිපිය). එමගින් වී. අයි. ලෙනින්, ෆ්‍රෙඩ්රික් එංගල්ස්ගේ ලිපියක්, ''බකුනින්වාදීන් ක්‍රියා කරන හැටි, 1873 ගිම්හානයේදී ස්පාඤ්ඤයේ නැගිටීම පිළිබඳව සටහන්'' උපුටා දක්වයි. ලෙනින් විසින් පෙන්වාදෙන බකුනින්වාදීන්ගේ යෝජනාව එම ලිපියෙන් විවේචනය වේ.

52 "Credo" (''ක්‍රිඩෝ'') — 'ආර්ථිකවාදීන්' ගේ කණ්ඩායමක් විසින් 1899 දී කළ ප්‍රකාශනයට දුන් නමකි. මෙම ප්‍රකාශනය රුසියානු 'ආර්ථිකවාදී' අවස්ථාවාදය පිළිබඳ ඉතාමත්ම විවෘත ප්‍රකාශනයයි. ලෙනින් ප්‍රකාශනයට විරුද්ධව 'ආර්ථිකවාදීන්' හෙලා දකිමින් තියුණු විවේචනයක් (''රුසියානු සමාජ-ප්‍රජාතන්ත්‍රවාදීන්ගේ විරෝධයක්'') පළ කළේය.

53 ''රබෝචය මීසල්'' (කම්කරුවන්ගේ චින්තනය) — 'ආර්ථිකවාදීන්' ගේ නිල ප්‍රකාශනයයි. 1897 ඔක්තෝබර් සිට 1902 දෙසැම්බර් දක්වා පළවිය.

54 ''අයිතිය පිළිබඳ හෙගල්ගේ දර්ශනවාදී අයිතිය විවේචනය කිරීම'' නැමැති සිය කෘතිය පිළිබඳ මාක්ස්ගේ ප්‍රකාශනයක් මින් අදහස් කෙරේ.

55 "L'Humanité" (මිනිස් සංහතිය) — ප්‍රංශ සමාජවාදී පක්ෂයේ නිල ප්‍රකාශනය ලෙස 1904 දී ජාන් ජොරේස් විසින් ආරම්භ කරන ලද දිනපතා පුවත්පතකි. (1920 දෙසැම්බර්) ටුවර්ස් සම්මේලනයෙහිදී ප්‍රංශ සමාජවාදී පක්ෂය භේදවීමෙන් හා ප්‍රංශ කොමියුනිස්ට් පක්ෂය පිහිටුවීමෙන් අනතුරුව වහාම එය කොමියුනිස්ට් පක්ෂයේ නිල පුවත්පත විය.

56 1904—1905 රුසියන්-ජපන් යුද්ධය ගැනය.

57 ප්‍රංශ කම්කරු ව්‍යාපාරයේ ක්‍රියාකාරයෙකුත් පළමුවන ජාත්‍යන්තරයේ නායකයෙකුත් වූ ලුයි එෂෙන් වර්ලේන්ගේ 1871 දී පැරිස් කොමියුනයේ මණ්ඩල සභාවේ සාමාජිකත්වය මින් අදහස් කෙරේ.

58 මෙම සඳහන 1905 ජිනීවාහි පැවති මෙන්ෂෙවික් සාකච්ඡා සභාව මගින් අනුමත කරනු ලැබූ 'සංවිධාන නීති රීති' ගැනය.

59 ධනපති ලිබරල්වාදීන්ගේ සහ සෙම්ස්ත්වො වරුන්ගේ මාර්ගයෙන් ආණ්ඩුවට ඉල්ලීම් ඉදිරිපත් කරමින් 'ධනපති විරුද්ධ පක්ෂය මත සංවිධානාත්මක ලෙස බලපෑම', සමාජ-ප්‍රජාතන්ත්‍රවාදීන්ගේ ප්‍රධාන කාර්ය භාරය ලෙස පෙන්වන ලිපියක් 1904 සරත් සමයේදී මෙන්ෂෙවික්වාදී ''ඉස්ක්‍රා'' පුවත්පතේ කතු මඩුල්ල විසින් ප්‍රසිද්ධ කරන ලදී. එම 'සෙම්ස්ත්වො ව්‍යාපාරයේ සැලැස්ම' මගින් නිර්ධන පංතියේ බලය ගැනද, දේශපාලන සටන් අරගල ගෙනයාමට නිර්ධන පංතියේ ශක්තිය ගැන සහ ස්වාධීන විප්ලවවාදී ක්‍රියා සඳහා ඇති ශක්තිය ගැනද මෙන්ෂෙවික් වරුන් අවිශ්වාස කරන බව පැහැදිලිව පෙනිණි. සංවිධානාත්මක අවස්ථාවාදයේ සිට උපක්‍රමකාරී අවස්ථාවාදය දක්වා ගිය මෙන්ෂෙවික්වාදීන්ගේ පළමුවැනි පියවර 'සෙම්ස්ත්වො ව්‍යාපාරයේ සැලැස්ම' විය.

60 කාල් මාක්ස්. '1848 සිට 1850 දක්වා වූ ප්‍රංශයේ පංති සටන ගැනය.' බලන්න.

61 ''පංති සටන පිළිබඳව බ්‍රෙන්ටානෝ අවබෝධය'', 'බ්‍රෙන්ටානෝවාදය' — කම්හල් පිළිබඳව ව්‍යවස්ථා ඇති කිරීමෙන් සහ වෘත්තීය සමිති මගින් ධනපති ක්‍රමයේ රාමුව තුළ කම්කරු ප්‍රශ්න විසඳීමේ හැකියාව දේශනා කරන, ''නිර්ධන පංතියේ විප්ලවවාදී නොවන 'පංති' සටන් පිළිගන්නා ලිබරල් ධනවාදී උගැන්වීමකි'' (ලෙනින්). ධනපති දේශපාලන ආර්ථිකයේ කැටෙඩර්-සමාජවාදී නිකායේ එක් ප්‍රධාන නියෝජිතයකු වූ එල්. බ්‍රෙන්ටානෝගේ මත දරන්නන් මෙනමින් හැඳින්වේ.

62 හිර්ෂ්-ඩුන්කර් වෘත්තීය සමිති — 1868 දී ජර්මනියේදී හිර්ෂ් හා ඩුන්කර් නමැති ධනේශ්වර ලිබරල්වාදීන් දෙදෙනෙකු විසින් ආරම්භ කරන ලදී. ධනේශ්වර ආර්ථික විද්‍යාඥ බ්‍රෙන්ටානෝ මෙන් මොවුහුද 'පංති වුවමනාවන් එකිනෙක පෑහීම' දේශනා කළහ. ධනේශ්වර පංතියට විරුද්ධ විප්ලවීය පංති අරගලයෙන් කම්කරුවන් වෙනතකට යොමු කළහ.වෘත්තීය සමිති අන්‍යොන්‍යාධාර සමිතිවල හා අධ්‍යාපනික කටයුතුවල සීමාවට කොටු කළහ.

63 ''රස්වියෙත්'' (අරුණෝදය) — 1905 මාර්තු සිට නොවැම්බර් දක්වා පිටර්ස්බර්ගයේ පළ කරන ලද නීත්‍යානුකූල ලිබරල්වාදී දිනපතා පුවත්පත.



64 ''බකුනින්වාදීන් ක්‍රියා කරන හැටි, 1873 ගිම්හානයේදී ස්පාඤ්ඤයේ නැගිටීම පිළිබඳව සටහන්'' යන එංගල්ස්ගේ ලිපිය රු. ස. ප්‍ර. ක. පක්ෂයේ මධ්‍යම කාරක සභාව විසින් ලෙනින්ගේ සංස්කාරකත්වය යටතේ රුසියන් බසට පරිවර්තනය කොට පොත් පිංචක් ලෙස 1905 දී ජිනීවාහි පළ කරන ලදී. දෙවන මුද්‍රණයක් 1906 දී සාන්ත පීටර්ස්බර්ග්හි පළවිය.

1850 මාර්තුවේදී මාක්ස් හා එංගල්ස් විසින් ලියන ලද ''කොමියුනිස්ට් සංගමයට මධ්‍යම කාරක සභාව විසින් කරන දේශනය'' 1906 සාන්ත පීටර්ස්බර්ග්හි ''මෝලත්'' ප්‍රකාශකයන් විසින් පළ කරන ලද ''කොමියුනිස්ට්වරුන්ගේ කොලොං නඩු විභාග'' නමැති මාක්ස්ගේ පොත් පිංචට අතිරේකයක් වශයෙන් රුසියන් බසින් පළ කරනු ලැබිනි.

65 ''සර්යා'' — මාක්ස්වාදී-විද්‍යාත්මක දේශපාලන සඟරාවකි. ''ඉස්ක්‍රා'' කර්තෘ මණ්ඩලය විසින් ජර්මනියේ ස්ටුට්ගාට්හි 1901—1902 වසර වලදී නීත්‍යානුකූලව පළකරන ලදී. කලාප හතරක් (පොත් තුනක්) පමණක් පිටවිය.

66 ''මස්කෝව්ස්කිය වියදමස්ති'' (මොස්කව් සටහන් කරු) — 1756 දී මොස්කව් විශ්ව විද්‍යාලය විසින් අරඹන ලද පුවත්පතකි. එය ඉඩම් හිමියන්ගේ හා පූජකයන්ගේ ඉතා ප්‍රතිගාමී රාජාණ්ඩුවාදී කොටස්වල අදහස් ප්‍රකාශ කළාය. 1905 සිට එය කළු සියයේ ප්‍රධාන නිල ප්‍රකාශනයක් විය. 1917 ඔක්තෝබර් විප්ලවයට පසු තහනම් කරනු ලැබිනි.

67 ෆ්‍රා. මෙරින්ග් විසින් ''කාල් මාක්ස්ගේ, ෆ්‍රෙඩරික් එංගල්ස්ගේ සහ පර්ඩිනන්ඩ් ලසාල්ගේ සාහිත්‍යමය දායාදයෙනි'' යන පොතට ලියන ලද සංඥාපනය වි. අයි. ලෙනින් උපුටා දක්වයි. (“Aus dem literarischen Nachlaß von Karl Marx, Friedich Engels und Ferdrinand Lasalle. Herausgegeben von Franz Mehring,” Band III Stuttgart, 1902, 53).

68 කාල් මාක්ස්. ''අර්බුදය සහ ප්‍රතිවිප්ලවය.''

69 ''ෆ්‍රැන්ක්පර්ට් වාමාංශික පක්ෂයේ සහ ෆ්‍රැන්ක්පර්ට් රැඩිකල් ප්‍රජාතන්ත්‍රවාදී පක්ෂයේ වැඩ පිළිවෙළවල්.''

70 ''ප්‍රැන්ක්පර්ට් වාමාංශික පක්ෂයේ සහ ප්‍රැන්ක්පර්ට් රැඩිකල් ප්‍රජාතන්ත්‍රවාදී පක්ෂයේ වැඩ පිළිවෙළවල්.''

71 ප්‍රෙඩ්රික් එංගල්ස්ගේ ''ප්‍රැන්ක්පර්ට් රැස්වීම'' නැමැති ලිපිය වී. අයි. ලෙනින් උපුටා දක්වයි.

72 ප්‍රෙඩ්රික් එංගල්ස්. ''විප්ලවය ගැන බර්ලින් විවාදය.''

73 කාල් මාක්ස්. ''රදළ වන්දි ගෙවීම කල් දැමීමේ පණත.''

74 කොලොං කම්කරු සංගමයේ නිල පුවත්පතේ මුල් නම "Zeitung des Arbeiter-Vereines zu Köln" (''කොලොං කම්කරු සංගමයේ පත්‍රය'') විය. උපශීර්ෂය "Freiheit, Brüderlichkeit, Arbeit" (''නිදහස, සහෝදරත්වය, ශ්‍රමය'') විය. 1848 අප්‍රෙල් හා ඔක්තෝබර් අතර කලාප 40 ක් පළවිය. එම පුවත්පත පළ කිරීම නැවැත්වීමෙන් ඉක්බිතිව, 1848 ඔක්තෝබර් 26 ද සිට කොලොං කම්කරු සංගමය "Friheit, Brüderlichkeit, Arbeit" පුවත්පත ප්‍රසිද්ධ කළේය. එය 1849 ජූනි 24 දක්වා කලාප 32 පළ කළේය.

75 කොමියුනිස්ට් සංගමය — 1847 ගිම්හානයේ මාක්ස් හා එංගල්ස් විසින් පිහිටුවන ලද ප්‍රථම ජාත්‍යන්තර සංවිධානය ය. මග පෙන්වන ලද්දේ කාල් මාක්ස් හා ප්‍රෙඩ්රික් එංගල්ස් විසිනි. ඔවුහු එම සංගමයේ විධානයක් පරිදි එහි වැඩ පිළිවෙළ එනම් ''කොමියුනිස්ට් පක්ෂයේ ප්‍රකාශනය'' ලියූහ. කොමියුනිස්ට්වරුන්ගේ සංගමය 1852 නොවැම්බර් දක්වා පැවති අතර එය ජාත්‍යන්තර කම්කරු සහෝදරත්වයේ (පළමුවැනි ජාත්‍යන්තරයේ) පූර්වජයා විය. කොමියුනිස්ට්වරුන්ගේ සංගමයේ ප්‍රධාන නායකයෝ පසුකලෙක පළමුවැනි ජාත්‍යන්තරයේ මගපෙන්වීමේ ක්‍රියා කොටසක් ඉටු කළහ.

76 1907 සැප්තැම්බර් 26 (ඔක්තෝබර් 9) ද ''තවාරිෂ්'' පුවත්පතේ අංක 381 දරන කලාපයේ ගියෝර්ගි ප්ලෙහානව් විසින් පළකරන ලද ''එය කළ හැකිද?'' නැමැති ලිපිය ගැනය.

''තවාරිෂ්'' (සහෝදරයා) — 1906 මාර්තු සිට 1908 ජනවාරි දක්වා සාන්ත පීටර්ස්බර්ග්හි පළවූ දිනපතා පත්‍රයකි. නිල වශයෙන් කිසිදු පක්ෂයක ප්‍රකාශණයක් නොවුවද එය ඇත්ත වශයෙන්ම වාමාංශික ව්‍යවස්ථාදායක-ප්‍රජාතන්ත්‍රිකයන්ගේ හොරණෑව විය. එහි මෙන්ෂෙවික්වරුන්ගේ ලිපිද පළ විය.

77 ප්‍රෙඩ්රික් එංගල්ස්ගේ ''කොමියුනිස්ට් සංගමයේ ඉතිහාසයට.''

78 හ්ලෙස්තකොව් — ''ඉන්ස්පෙක්ටර් ජනරාල්'' නැමති රුසියානු ලේඛක ගොගොල්ගේ හාස්‍යාන්ත නාට්‍යයේ ප්‍රධාන චරිතයයි — සාඩම්බර කයිවාරු කාරයකු හා බොරුකාරයෙකි.

අකිමව් (මහ්නෝවෙට්ස්), ව්ලදිමිර් පිත්රෝවිච් (1872—1921) — රුසියානු සමාජ–ප්‍රජාතන්ත්‍රවාදී, මෙන්ෂෙවිකයෙකි, රුසියානු ආර්ථිකවාදයේ සම්භාවනීය නියෝජිතයෙකි, අන්ත අවස්ථාවාදීන්ගෙන් කෙනෙකි. — 61, 118 වැනි පිටු.

ආර්නිම්–සූකොව්, හෙන්රික් ඇලෙක්සාන්දර් (1798—1861) — පෘසියානු රාජ්‍යතන්ත්‍රිකයෙකි, ජර්මනියේ පෘසියානු රාජාණ්ඩුවේ ආධිපත්‍යයේ එක් අනුගාමිකයෙකි.1848 දී (මාර්තු — ජූනි මාසවලදී) කැම්ප්හවුසන්ගේ ඇමති මණ්ඩලයේ විදේශ කටයුතු භාර ඇමති ධූරය ඉසිලීය. — 136 වැනි පිටුව.

එංගල්ස්, ෆ්‍රෙඩ්රික් (1820—1895) — විද්‍යාත්මක කොමියුනිස්ට් වාදයේ මූලාරම්භකයෙකි. ජාත්‍යන්තර නිර්ධන පංතික ව්‍යාපාරයේ නායකයකු හා ගුරුවරයකු වන මොහු කාල් මාක්ස්ගේ මිතුරා සහ සගයාය.— 78, 84, 85, 122, 139, 140, 142 වැනි පිටු.

කබ්ලුකොව්,නිකොලායි ඇලෙක්සෙයෙවිච් (1849—1919) — රුසියානු ආර්ථික විද්‍යාඥයෙකි. ලිබරල්-නරෝද්නික්වාදියෙකි. මොස්කව් විශ්වවිද්‍යාලයේ මහාචාර්ය වරයෙකි. පංති සටනේ ක්‍රියාකලාපය හා වැදගත්කම පිළිබඳ මාක්ස්වාදයට විරුද්ධවිය, පංතීන් අතර සමාදනය දේශනා කළේය. — 137 වැනි පිටුව.

කැම්ප්හවුසන්, ලූඩොල්ෆ් (1803—1890) — ප්රුසියානු රාජ්‍ය නායකයෙකි, රයින් ලිබරල් ධනපතීන්ගේ එක් නායකයෙකි. 1848 මාර්තු 29 ද සිට ජූනි 20 ද දක්වා ප්රුසියානු ධනපති ලිබරල් ආණ්ඩුවේ ප්‍රධානියා වූයේය. — 133, 135, 136 වැනි පිටු.

කනිට්ස්, අව්ගුස්ට් (1783—1852) — ප්රුසියානු ජනරාල් කෙනෙකි. 1848 මැයි මාසයේදී කැම්ප්හවුසන්ගේ ආණ්ඩුවේ යුද ඇමති ධුරය ඉසිලීය. — 136 වැනි පිටුව.

කෞට්ස්කි, කාල් (1854—1938) — ජර්මන් සමාජ-ප්‍රජාතන්ත්‍රවාදී ව්‍යාපාරයේ සහ දෙවැනි ජාත්‍යන්තරයේ නායකයෙකි. ඔහු මුලදී මාක්ස්වාදියකු වුවද, පසුව මාක්ස්වාදය පාවාදෙන්නකු විය. අවස්ථාවාදයේ ඉතාම භයානක සහ හානිදායක වර්ගය වන මධ්‍යවාදයේ (කෞට්ස්කිවාදයේ) න්‍යායාචාර්ය වරයාය. ජර්මන් සමාජ-ප්‍රජාතන්ත්‍රවාදී ව්‍යාපාරයේ න්‍යායාත්මක සඟරාව වන "Die Neue Zeit" (නවීන කාලය) සඟරාවේ කර්තෘවරයාය. 60, 61, 107 වැනි පිටු.

කල්ට්සොව්, ඩී. (ගින්ස්බුර්ග්, බරිස් අබ්රාමවිච්) (1863—1920) — රුසියානු සමාජ-ප්‍රජාතන්ත්‍රවාදියෙකි. රු: ස: ප්‍ර: ක: පක්ෂයේ (1903) දෙවැනි සම්මේලනයේදී ඉස්ක්‍රාවාදී-මෙන්ෂෙවිකයෙකි. සම්මේලනයට පසුව මෙන්ෂෙවික් වාදියකු වූ ඔහු පුවත්පත් කීපයකටම ලිපි ලියුවේය. — 142 වැනි පිටුව.

ක්‍රිචෙව්ස්කී, බරිස් නිකලායෙවිච් (1866—1919) — රුසියානු සමාජ-ප්‍රජාතන්ත්‍රවාදියෙකි, ආර්ථිකවාදයේ එක් නායකයෙකි. 1899 දී ''රබෝචිය දියල'' පුවත්පතේ කතුකම කළේය. පුවත්පත මගින් ඔහු බර්න්ෂ්ටයින්වාදී අදහස් ප්‍රචාරය කළේය. රු:ස:ප්‍ර:ක: පක්ෂයේ දෙවැනි සම්මේලනයට ඉක්බිතිව සමාජ-ප්‍රජාතන්ත්‍රවාදී ව්‍යාපාරයෙන් ඈත්විය. — 61 වැනි පිටුව.

ගපොන්, ගියොර්ගි අපලොනවිච් (1870—1906) — පූජකයෙකි, 1905 ජනවාරි 9 ද සාර් රජවෙත පෙත්සමක් රැගෙන ගිය පීටර්ස්බර්ග් කම්කරුවන්ගේ පෙළපාලිය සංවිධාන කළේය. — 48 වැනි පිටුව.

ගෙර්සෙන්ෂ්ටයින්, මිහයිල් යාකව්ලෙවිච් (1859—1906) — රුසියානු ආර්ථික විද්‍යාඥයෙකි, මොස්කව් කෘෂිකාර්මික ආයතනයේ මහාචාර්යවරයෙකි, කැඩෙට් පක්ෂයේ නායකයෙකි, කෘෂිකර්ම හා ඉඩම් ප්‍රශ්නය පිළිබඳව එම පක්ෂයේ න්‍යායාචාර්යවරයාය. 137 වැනි පිටුව.

ගීර්කෙ — හන්සෙමාන්ගේ ආණ්ඩුවේ 1848 ඉඩම් පිළිබඳ පෘසියානු ඇමතිවරයාය. ප්රුසියානු මන්ත්‍රී මණ්ඩලයේ සාමාජිකයෙකි. — 137 වැනි පිටුව.



ග්‍රෙදෙස්කුල්, නිකොලායි අන්ද්‍රෙයෙවිච් (උපත 1864) — නීතිවේදියෙකි, ප්‍රකාශයෙකි, කැඩෙට්වාදියෙකි. ''මීර්'' නැමැති පුවත්පත මුද්‍රණය කිරීමට 1905 දී සහභාගි විය. එම පුවත්පත 'ආණ්ඩුවිරෝධී' ස්වරූපයක් ඇති ලිපි පළකිරීම නිසා, 1905 දෙසැම්බර් මාසයේදී තහනම් කරන ලදී. — 126 වැනි පිටුව.

ජොරේස් ජාන් (1859—1914) — ප්‍රංශ සමාජවාදී ව්‍යාපාරයේ ප්‍රධාන නායකයෙකි. "L'Humanité" පුවත්පතේ මූලාරම්භකයා සහ කතුවරයාය. ප්‍රංශ සමාජවාදී පක්ෂයේ දක්ෂිණාංශික අවස්ථාවාදී අංශයේ නායකයාය. එසේවුවද ජොරේස් අධිරාජ්‍යවාදයට විරුද්ධව ක්‍රියාශීලී ලෙස සටන් කෙළේය. පළමුවැනි ලෝක මහා යුද්ධය ආසන්නයේදී ඔහු කුලියට මිනීමරන මිලිටරි වාදියකු අතින් මැරුම් කෑවේය. — 97 වැනි පිටුව.

ට්‍රොට්ස්කී (බ්‍රොන්ෂ්ටෙයින්), ලෙව් දවීදවිච් (1879—1940) — රුසියානු සමාජ–ප්‍රජාතන්ත්‍රවාදියෙකි.රු: ස: ප්‍ර: ක: පක්ෂයේ (1903) දෙවැනි සම්මේලනයේදී මෙන්ෂෙවික් ඉස්ක්‍රාවාදියකු විය. සම්මේලනයට පසුව සමාජවාදී විප්ලවයේ න්‍යායික හා ප්‍රායෝගික සියලු ප්‍රශ්නවලදී බොල්ෂෙවික්වාදයට විරුද්ධව සටන් කෙළේය. 1905—1907 විප්ලවයේ පරාජයෙන් පසු 'ප්‍රක්ෂන් නොසැදීමට' මුවාවී ලික්විඩේටර්වරුන්ගේ පිළිවෙත අනුගමනය කෙළේය. 1917 පෙබ්‍රවාරි ධනපති-ප්‍රජාතන්ත්‍රවාදී විප්ලවයට ඉක්බිතිව පිට රට සිට රුසියාවට පෙරළා පැමිණි ට්‍රොට්ස්කී රු.ස.ප්‍ර.ක. (බොල්ෂෙවික්) පක්ෂයේ VI සම්මේලනයේදී පක්ෂයට බැඳුණේය. එසේවුවද ඔහු බොල්ෂෙවික්වාදය නොපිළිගත්තේය. ලෙනින්වාදයට සහ පක්ෂයේ දේශපාලන ප්‍රතිපත්තියට විරුද්ධවද රහසේ සහ ප්‍රසිද්ධියේ සටන් කෙළේය.

ඔක්තෝබර් සමාජවාදී විප්ලවයෙන් අනතුරුව උසස් තනතුරු කීපයක්ම ඉසිලීය. ට්‍රොට්ස්කිගේ පක්ෂ විරෝධී ක්‍රියා නිසා 1927 දී පක්ෂයෙන් නෙරපා දමන ලදී, 1929 දී සෝවියට් සංගමයෙන් නෙරපූ අතර 1932 දී ඔහුගේ රටවැසිභාවය අවලංගු කරනලදී. — 8, 61 වැනි පිටු.

ටුරාටි, පිලිප්පො (1857—1932) — ඉතාලි කම්කරු පංති ව්‍යාපාරයේ

නායකයෙකි, ඉතාලි සමාජවාදී පක්ෂයේ සංවිධායෙකු වූ මොහු එහි දක්ෂිණ ප්‍රතිසංස්කරණවාදී අංශයේ නායකයාය. 72, 85 වැනි පිටු.

ටියේර්, අඩොල්ෆ් (1797 1877) — ප්‍රංශ ධනපති ඉතිහාසඥයෙක් සහ රාජ නායකයෙකි. 1836—1840 කාලයේදී අගමැති ධුරය දැරීය. 1849—1851 ව්‍යවස්ථාදායක මන්ත්‍රණ සභාවේ සාමාජිකයකු විය. 1871 ඇමති මණ්ඩලයේ සභාපති ධුරයද, 1871—1873 ප්‍රංශ සමූහාණ්ඩුවේ ජනාධිපති ධුරයද ඉසිලීය. පැරිස් කොමියුනය විනාශ කළ අළුගෝසුවාය. — 129 වැනි පිටුව.

ත්‍රුබෙට්ස්කොයි, සෙර්ගේයි නිකලායෙවිච් (1862—1905) — කුමාරයෙකි; දේශපාලන දෘෂ්ටිය අනුව ලිබරල්වාදියෙකි. විඥානවාදී දර්ශනිකයෙකි. මධ්‍යම ප්‍රතිපදවක් සහිත ව්‍යවස්ථාවක් ඉදිරිපත් කරමින් සාර්වාදය තහවුරු කිරීමට වැයම් කෙළේය. — 119, 137 වැනි පිටු.

දහතුන්වැනි ලියෝ පාප් වහන්සේ (ජොආකිනු වින්චෙන්තො, පෙච්චි සිටුවරයා) (1810—1903) — 1878 පාප් ධුරයට තෝරා ගන්නාලදී ධනපති සමාජයේ තත්ත්වයන්ට ගැළපෙන පරිදි කතෝලික ආගම සකස් කිරීමට සහ පාප් පදවියේ දේශපාලන බලය පුනරුත්ථාපනය කිරීමට වැර දැරීය. — 128 වැනි පිටුව.

දෙවැනි නිකොලායි (රුධිරු නිකොලායි) (1868—1918) — අවසාන රුසියානු අධිරාජයාය. 1894 සිට 1917 රුසියාවේ සිහසුන හෙබවීය. — 52, 128 වැනි පිටු.

නදියෂ්දින්, එල්. (සෙලෙන්ස්කි, යෙව්ගේනි ඕසිපවිච්) (1877—1905) — රුසියානු සමාජ-ප්‍රජාතන්ත්‍රවාදියෙකි. 'ආර්ථික වාදීන්ට' ආධාර දුන් අතර ''පොදු ජනතාව කුපිත කරවීමේ මාධ්‍යයක් හැටියට ත්‍රස්ත වාදය දේශනා කළේය. ලෙනින්වාදී ඉස්ක්‍රා පුවත්පතට විරුද්ධව ක්‍රියා කළේය. රු:ස:ප්‍ර:ක: පක්ෂයේ (1903) දෙවැනි සම්මේලනයට පසුව මෙන්ෂෙවික්වාදී පුවත්පත් හා සඟරාවලට ලියුවේය. — 66 වැනි පිටුව.

පෙත්රුන්කේවිච්, ඉවාන් ඉල්යිච් (1844—1928) — රුසියාවේ කැඩේට් පක්ෂයේ මූලාරම්භකයෙක් සහ නායකයෙකි. එම පක්ෂයේ



මධ්‍යම කාරක සභාවේ සභාපති වරයාය. පක්ෂයේ මධ්‍යම පුවත්පත වන ''රේච්'' හි ප්‍රකාශකයාය. පළමුවැනි රාජ්‍ය දූමා සභාවේ සාමාජිකයෙකි. — 52, 119, 136 වැනි පිටු.

ප්ලෙහානව්, ගියොර්ගි වැලෙන්තිනවිච් (1856—1918) — රුසියානු හා ජාත්‍යන්තර සමාජවාදී ව්‍යාපාරයේ සම්භාවනීය නායකයෙකි. රුසියාවේ මාක්ස්වාදය ප්‍රචාරය කළ පුරෝගාමියාය.''ශ්‍රම විමුක්තිය'' නමැති පළමුවැනි මාක්ස්වාදී කණ්ඩායමේ මූලාරම්භකයාය. රු. ස. ප්‍ර. ක. පක්ෂයේ (1903) දෙවැනි සම්මේලනයෙන් පසුව අවස්ථාවාදීන් සමග සමාදනවීමේ ප්‍රතිපත්තියක් අනුගමනය කළේය. අනතුරුව මෙන්ෂෙවිකයින් සමග එකතු විය. — 116, 123, 142, 149, වැනි පිටු.

ප්‍රකපෝවිච්, සෙර්ගේයි නිකලායෙවිච් (1871—1955) — රුසියානු ආර්ථික විද්‍යාඥයෙකි, ප්‍රකාශකයෙකි, 'ආර්ථික වාදයේ' ප්‍රධාන නියෝජිතයෙකි 'සොයුස් ඔස්වබෂ්ජේනියෙ' නැමැති ලිබරල් රාජාණ්ඩුවාදී සංවිධානයේ ක්‍රියාශීලී සාමාජිකයෙකි. බර්න්ෂ්ටයින්-ලිබරල්වාදී මත අනුව කම්කරු ප්‍රශ්නය ගැන පොත් ලියූ කතුවරයෙකි. — 120 වැනි පිටුව.

පොත්රෙසව්, ඇලෙක්සාන්දර් නිකලායෙවිච් (ස්තරවේර්) (1869—1934) — මෙන්ෂෙවික්වාදයේ එක් නායකයෙකි. 1905—1907 විප්ලවයේ පරාජයෙන් පසු ලික්විඩේටර්වාදය වැළඳ ගත්තේය. රු. ස. ප්‍ර. ක. පක්ෂයේ (1903) දෙවැනි සම්මේලනයේදී මෙන්ෂෙවික් ඉස්ක්‍රාවාදියෙක් විය. මෙන්ෂෙවික් පුවත්පත් සහ සඟරා කීපයකම ප්‍රධාන තැනක් ගත්තේය. — 58, 62, 116, වැනි පිටු.

පුයෙර්බාහ්, ලුඩ්විග් අන්ද්‍රෙයස් (1804—1872) — ප්‍රධාන පෙළේ ජර්මන් ද්‍රව්‍යවාදී දර්ශනිකයෙකි. අදේවවාදියෙකි. — 35 වැනි පිටුව.

බෙබෙල් අව්ගුස්ට් (1840—1913) — ජර්මන් සමාජ-ප්‍රජාතන්ත්‍රවාදයේ සහ ජාත්‍යන්තර කම්කරු පංති ව්‍යාපාරයේ සම්භාවනීය නායකයෙකි. — 60, 61 වැනි පිටු.

බර්න්ෂ්ටයින් එඩ්වර්ඩ් (1850—1932) — ජර්මන් සමාජ-ප්‍රජාතන්ත්‍රවාදී පක්ෂයේ අන්ත අවස්ථාවාදී පිළේ සහ දෙවැනි ජාත්‍යන්තරයේ නායකයාය. සංශෝධනවාදයේ සහ ප්‍රතිසංස්කරණ වාදයේ න්‍යායාචර්ය වරයාය. — 106 වැනි පිටුව.

බිස්මර්ක්, ඔට්ටෝ එඩ්වර්ඩ් ලියෝපෝල්ඩ් (1815—1898) — ජ්රුසියාවේ හා ජර්මනියේ රාජ්‍ය නායකයෙකි, රාජ්‍ය තන්ත්‍රිකයෙකි. ජර්මන් අධිරාජ්‍යයේ පළමුවැනි චාන්සලර්වරයාය.

ඔහු ජ්රුසියානු ආධිපත්‍යය යටතේ ජර්මනිය බලාත්කාරයෙන් එක්සත් කළේය. — 128 වැනි පිටුව.

බ්ලාන්, ලුයි (1811—1882) — ප්‍රංශ ජාතික සුළු ධනපතිවාදී සමාජවාදියෙකි, ඉතිහාසඥයෙකි. ධනපති ක්‍රමය යටතේ පංතිමය ප්‍රතිවිරුද්ධතාවයන් විසඳාලිය නොහැකිය යන මතය නොපිළිගත් හෙතෙම නිර්ධන පංතික විප්ලවයේ සතුරකු විය. ධනපති පංතිය සමග එකඟවීමේ ප්‍රතිපත්තිය පිළිගත්තේය. 1848 ධනපති විප්ලවය පැවැති සමයේදී තාවකාලික රජයට ඇතුළු විය.

1848 අගෝස්තු මාසයේදී ජූලි කැරැල්ල පරාජයට පත්වූ පසු එංගලන්තයට සංක්‍රමණය විය. ඔහු ප්‍රංශයට පෙරළා පැමිණියේ 1870 දීය. 1871 දී ජාතික සභාවට තෝරාපත් වුවද, පැරිස් කොමියූනයට සම්බන්ධ නොවී, එහි විරුද්ධ කරුවන්ගේ පැත්ත ගෙන සිටියේය. අනතුරුව වැදගත් දේශපාලන ක්‍රියා කලාපයක් ඉටු නොකළේය. — 141 වැනි පිටුව.

බෝර්න්,ස්ටේපන් (සැබෑ නම සිමාන් බුත්තෙර් මිල්ඡ් ය) (1824—1898) — ජර්මන් කම්කරු පංති ව්‍යාපාරයේ ප්‍රතිසංස්කරණවාදී ප්‍රවණතාවයේ එක් නියෝජිතයෙකි, කොමියුනිස්ට් සංගමයේ සාමාජිකයෙකි. 1848 දී ජර්මන් විප්ලවය පටන් ගත් පසු බර්ලිනයට පැමිණියේය, ඔහුගේ උනන්දුව යටතේ බර්ලින් කම්කරුවන්ගේ මධ්‍යම කාරක සභාවද, ඉන් ඉක්බිතිව කම්කරු සහෝදරත්වයේ සංවිධානයද සාදන ලදී. දේශපාලන අරගල වලින් කම්කරු පංති ව්‍යාපාරය ඈත් කිරීමට උත්සාහ ගත් ඔහු එය සුළු ආර්ථික ප්‍රතිසංස්කරණ දිනා ගැනීමේ මග ඔස්සේ යැවීමට තැත් කළේය. 1849 මැයි මාසයේදී ඩ්රෙස්ඩන් කැරැල්ලට ඔහු සහභාගි විය. එය පරාජය වීමෙන් අනතුරුව ස්විට්සර්ලන්තයට සංක්‍රමණය විය. ඉක්මනින්ම ඔහු කම්කරු පංති ව්‍යාපාරයෙන් ඈත් විය. — 139, 141, 142 වැනි පිටු.

බුලිගින්, ඇලෙක්සාන්දර් ග්‍රිගොරියෙවිච් (1851—1919) — සාර් රුසියාවේ රාජ්‍ය නායකයෙකි. විශාල ඉඩම් හිමියෙකි. 1905 දී ස්වදේශ කටයුතු භාර ඇමති ධුරය ඉසිලීය. රුසියාවේ උත්සන්න වූ විප්ලවීය නැගීම දුර්වල කිරීම පිණිස රාජ්‍ය දූමා සභාව කැඳවීමේ කෙටුම්පත් පිළියෙල කිරීම මෙහෙයැවීය. විප්ලවයේ කැරැලි නිසා



දූමාවේ එම සැසි වාරය නොකැඳවිණි. 1905 ඔක්තෝබර් 17 ද සාර්වාදී ප්‍රකාශනයෙන් පසු බුලිගින් තනතුරු වලින් නිදහස් කරන ලදී. ඔහු දේශපාලන භූමියෙන් ඉවත්විය. — 58, 59 වැනි පිටු.

මනුයිලව්, අලෙක්සාන්දර් අපලෝනවිච් (1861—1929) — රුසියානු ආර්ථික විද්‍යාඥයෙකි. කැඩෙට් පක්ෂයේ ප්‍රධාන නායකයෙකි. රුස්කියෙ වියදමස්ති, පුවත්පතේ එක් කතු වරයෙකි. — 137 වැනි පිටුව.

මාක්ස්, කාල් (1818—1883) — විද්‍යාත්මක කොමියුනිස්ට්වාදයේ මූලාරම්භකයාය. ශ්‍රෙෂ්ඨතම චින්තකයෙකි. ජාත්‍යන්තර නිර්ධන පංතියේ නායකයා සහ ගුරුවරයාය. — 23,35, 51, 77, 85, 95, 112, 122,129, 132, 133, 134, 135, 136, 138, 139, 140, 141, වැනි පිටු.

මාර්තව්, එල්. (ට්සෙදෙර්බාඋම්, යූලි ඔසිපවිච්) (1873—1923) — රුසියානු සමාජ-ප්‍රජාතන්ත්‍රවාදියෙකි, මෙන්ෂෙවික් නායකයෙකි. 1900 දී ''ඉස්ක්‍රා'' පුවත්පත පිළියෙළ කිරීමට සහ පළ කිරීමට සහභාගි විය. එහි කර්තෘ මණ්ඩලයේ සමාජිකයෙක් විය. රු:ස:ප්‍ර:ක: පක්ෂයේ (1903) දෙවැනි සම්මේලනයට ''ඉස්ක්‍රා'' පුවත්පතේ නියෝජිතයකු ලෙස සහභාගි විය. එහිදී අවස්ථාවාදී අල්පතර සංඛ්‍යාවට නායකත්වය දුන්නේය. එද සිට මෙන්ෂෙවික්වාදී මධ්‍යම සංවිධානවල නායකයෙකු වූ මොහු මෙන්ෂෙවික්වාදී පුවත්පත්වල කතුවරයාද විය. — 74 වැනි පිටුව.

මර්තිනව්, අ. (පිකර්, ඇලෙක්සාන්දර් සමොයිලවිච් (1865—1935) — ආර්ථිකවාදයේ එක් නායකයෙකි, මෙන්ෂෙවික්වාදයේ ප්‍රමුඛ නායකයෙකි, පසුකලෙක කොමියුනිස්ට් පක්ෂයට බැඳුණේය.

1900 දී ආර්ථිකවාදීන්ගේ සඟරාව වන ''රබෝචිය දියල'' හි කර්තෘ මණ්ඩලයේ සාමාජිකයෙක් විය. රු.ස.ප්‍ර.ක. පක්ෂයේ දෙවැනි සම්මේලනයේදී ''ඉස්ක්‍රා'' විරෝධියකු විය. 1905—1907 විප්ලවය පරාජය වීමෙන් පසුව ලික්විඩේටර්වාදියෙක් විය. — 19,22, 24, 72, 73, 74, 80, 96, 107, 108, 122, 124, 130, 131, 132, 133 වැනි පිටු.

මේරින්ග්, ෆ්‍රාන්ස් (1846—1919) — ජර්මන් කම්කරු පංති ව්‍යාපාරයේ සම්භාවනීය නායකයෙකි. ජර්මන් සමාජ-ප්‍රජාතන්ත්‍රවාදයේ වාමාංශයේ එක් නායකයෙකි. ජර්මන් කොමියුනිස්ට් පක්ෂයේ මූලාරම්භකයෙකි. — 51, 132, 133, 139, 141, වැනි පිටු.

මිලෙරාන් ඇලෙක්සාන්දර් එතියෙන් (1859—1943) — ප්‍රංශ සමාජවාදී ව්‍යාපාරයේ අවස්ථාවාදී ව්‍යාපාරය මෙහෙයැවූ දේශපාලනඥයෙකි. 1899 දී ඔහු වල්දෙක්-රුසෝගේ ප්‍රතිගාමී ධනපති ආණ්ඩුවට ඇතුළු විය. 1904 දී සමාජවාදී පක්ෂය විසින් ඔහු නෙරපන ලදින්, ඔහු හිටපු සමාජවාදීන් (බ්‍රියාන්, විවියානි) සමග එකතුව ස්වාධීන සමාජවාදීන්ගේ පක්ෂයක් පිහිට වීය. 1920—1924 ප්‍රංශ සමූහාණ්ඩුවේ ජනාධිපති ධූරය දැරීය. — 107 වැනි පිටුව.

මෝල්, ඉඔසිප් (1813—1849) — ජර්මන් හා ජාත්‍යන්තර කම්කරු පංති ව්‍යාපාරයේ සම්භාවනීය නායකයෙකි. කොමියුනිස්ට් සංගමයේ මධ්‍යම කාරක සභාවේ සාමාජිකයෙකි. බාදන් — ප්පාල්ස්ක් කැරැල්ලට සහභාගි විය. — 139 වැනි පිටුව.

රෙනාන්, එර්නස්ට් ජෝසප් (1823—1892) — ප්‍රංශ ආගමික ඉතිහාසඥයෙකි, විඥානවාදී — දර්ශනිකයෙකි. කිතුනු දහම මුල් කාලයේදී පැතිරයාම ගැන ලියූ පොත් නිසා ඔහු ප්‍රසිද්ධියට පත් විය. ඔහු, දේශපාලන දෘෂ්ටිය අනුව ප්‍රජාතන්ත්‍රවාදයේ සහ 1871 පැරිස් කොමියුනයේ විවෘත හතුරකු විය. — 142 වැනි පිටුව.

රෝදිචෙව්, ප්යෝදර් ඉස්මයිලවිච් (උපත 1856) — කැඩේට් පක්ෂයේ නායකයෙකි, එහි මධ්‍යම කාරක සභිකයෙකි. දෙවරක්ම රාජ්‍ය දූමා සභාවේ මන්ත්‍රීවරයෙකු විය. — 119, 136, 137, වැනි පිටු.

ලෙනින්, ව්ලදීමීර් ඉල්යිච් (1870—1924) 60, 115, 124, 133 වැනි පිටු.

වර්ලේන්, ලුයී එෂෙන් (1839—1871) — ප්‍රංශ ජාතික විප්ලවවාදියෙකි. 1871 පැරිස් කොමියුනයේ සම්භාවනීය නායකයෙකි. 1865 දී පළමුවැනි ජාත්‍යන්තරයට බැඳුණු ඔහු එහි පැරිස් අංශයේ එක් සංවිධායකයකු සහ නායකයකු විය. 1871 දී ජාතික මුරභට සේවයේ මධ්‍යම කාරක සභාවේ සමාජිකයකු විය. පැරිස් කොමියුනය පැවති කාලයේදී එහි ආණ්ඩුවේ සාමාජිකයකු වූ ඔහු කොමියුනයේ වාමාංශික අල්පතර කොටසට එක් විය. වර්සේල්වරුන් පැරීසිය ආක්‍රමණය කළ විට, කපොලුවල විරෝදර ලෙස සටන් කළේය. 1871 මැයි 28 ද වර්සේල්වරුන් විසින් අල්ලා ගනු ලැබ, වද හිංසාවලට භාජනය කොට නඩු ඇසීමක් නැතිව ඔහු මරා දමන ලදී. — 107 වැනි පිටුව.



ෂැපර්, කාල් (1812—1870) — ජර්මන් හා ජාත්‍යන්තර කම්කරු පංති ව්‍යාපාරයේ සම්භාවනීය නායකයෙකි. සාධාරණත්වයේ සංගමයේ එක් නායකයෙකි. කොමියුනිස්ට් සංගමයේ මධ්‍යම කාරක සභාවේ සාමාජිකයෙකි. 1848—1849 ජර්මනියේ විප්ලවයට සහභාගි විය. 1850 දී කොමියුනිස්ට් සංගමය භේද බින්න වූ අවස්ථාවේදී අන්තවාදී — අතිධාවනකාරී අංශයේ නායකයකු වීය. 1856 දී යළිත් මාක්ස්ට සමීප විය. පළමුවැනි ජාත්‍යන්තරයේ ප්‍රධාන මණ්ඩලයේ සාමාජිකයෙකි. — 139 වැනි පිටුව.

ෂ්වෙරින්, මක්සිමිලියාන් (1804—1872) — පෘසියානු දේශපාලනඥයෙකි. ප්‍රතිගාමී වංශාධිපතිත්වයේ හා නිලධාරිවාදයේ නියෝජිතයෙකි. 1848 මාර්තු — ජූනි මාසවලදී කැම්ප්හවුසන්ගේ ඇමති මණ්ඩලයේ ආගම, අධ්‍යාපනය හා වෛද්‍ය විද්‍යාව පිළිබඳ ඇමති ධූරය ඉසිලීය. ෆ්‍රැන්ක්පර්ට් ජාතික සභාවේ මන්ත්‍රීවරයෙක් වූ ඔහු දක්ෂිණාංශික ප්‍රතිගාමීන්ට එකතු විය. 1859—1862 ස්වදේශ කටයුතු භාර ඇමති ධූරය දැරීය. සිය ජීවිතයේ අවසාන භාගයේදී ඔහු විශාල ධනපතීන්ගේ වුවමනාවන් නියෝජනය කරන ජාතික ලිබරල් පක්ෂයට එකතු විය. — 136 වැනි පිටුව.

ස්ත්‍රුවේ, ප්යොතර් බෙර්න්ගාර්දවිච් (1870—1944)—රුසියානු ආර්ථික විද්‍යාඥයෙකි, ප්‍රකාශයෙකි, කැඩේට් පක්ෂයේ නායකයෙකි. 1900 ගණන්වලදී 'නීත්‍යානුකූල මාක්ස්වාදයේ' සම්භාවනීය නියෝජිතයාය, කාල් මාක්ස්ගේ ආර්ථික හා දර්ශනික උගැන්වීම් වලට 'එකතු කිරීම්' හා 'විවේචන' ලියූ ඔහු මාක්ස්වාදය හා කම්කරු පංති ව්‍යාපාරය ධනපති පංතියේ වුවමනාවන්ට ගැළපෙන සේ සකස් කිරීමට උත්සාහ කෙළේය. — 7, 20, 45, 50, 60, 61, 62, 63, 64, 65, 67, 70, 71, 94, 95, 97, 118, 119, 125, 127, 128, 129, 130 වැනි පිටු.

හාන්සෙමාන්, ඩේවිඩ් යුස්ටස් (1790—1864) — පෘසියානු දේශපාලන නායකයෙකි, විශාල ජර්මන් ධනපතියෙකි, රයින්හි ලිබරල් ධනපතීන්ගේ එක් නායකයෙකි. කැම්ප්හවුසන්ගේ සහ අවුඑර්ස්වාල්ඩ්ගේ කැබිනට් මණ්ඩලවල 1848 මාර්තු — සැප්තැම්බර් මාසවලදී මුදල් ඇමති ධූරය දැරීය. අවුඑර්ස්වාල්ඩ්ගේ කැබිනට් මණ්ඩලය තුළ හාන්සෙමාන් ප්‍රධාන ක්‍රියා කලාපයක් ඉටු කළේය. එම වකවානුවේ ආණ්ඩුව, 'හාන්සෙමාන්ගේ ආණ්ඩුව' නමින්

හැදින්විණි. ප්‍රතිගාමීත්වය සමග එකඟතාවයට පැමිණීමෙන් පාවාදීමේ ප්‍රතිපත්තියක් අනුගමනය කෙළේය. 1848—1849 වසරවලදී විප්ලවය පරාජයවීමත් සමගම දේශපාලන භූමියෙන් ඉවත් විය. — 135, 136, 137 වැනි පිටු.

<u>හාකෝට්, විලියම් ජෝර්ජ් ග්‍රැන්විල් වෙනබෙල්ස් වර්නන්</u> (1827—1904) — නිලධාරියෙකි. 1894—1898 අවුරුදු වලදී බ්‍රිතාන්‍ය ලිබරල් පක්ෂයේ නායකයාය. කීපවරක්ම ආණ්ඩුවේ වගකිවයුතු නිල ඉසිලීය. — 128 වැනි පිටුව.

Internet Archive
New Marxist Study Group

http://slmarxist.yolasite.com
slmarxist@ymail.com